# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017 සැප්තැම්බර් 11** වන සඳුදා
2017 புரட்டாசி 14 திங்கட் கிழமை
Monday 11th September 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09. 52 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.52 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.52 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදනය
## ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරදියාන හා දඹුවවත්ත කසළ කළමනාකරණ ව්‍යාපෘති හා සම්බන්ධව අත්සන් කරනු ලැබ ඇති ගිවිසුම්වල පිටපත් අද දින ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා තිබෙන බව කාරුණිකව දැනුම් දෙනවා.

2017.06.06 දින පළාත් සභා රැස්වීමේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කර සිටින ලද පරිදි කටයුතු කරමින් සභා ලේකම්තුමා විසින් බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අධ්‍යක්ෂතුමාගෙන් කරන ලද ඉල්ලීම අනුව, එම අධ්‍යක්ෂතුමා විසින් 2017.08.22 දිනැති හා අංක WP/WMA/L/MS/04 දරන ලිපිය මගින් ඉංග්‍රීසි භාෂාවෙන් යුත් එම ගිවිසුම් පිටපත් එවා ඇති බව වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙනවා.

# ලිපි ලේඛන පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමා මගින් මෙම පළාත් සභාවේ අදහස් විමසා එවා ඇති "විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත" මෙම සභාවට පිළිගන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම පනත් කෙටුම්පතේ පිටපත් පසුගිය සභා රැස්වීම්වලදී ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා තිබුණා. ඒ නිසා අපි එය නැවත වරක් ඉදිරිපත් කළේ නැහැ.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017.09.04 දිනැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ගරු ඔබතුමන්ලා වෙත ඉදිරිපත් කරනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, අද දින සභා රැස්වීමේ වැඩ කටයුතු, පොදු කටයුතු විෂයය සඳහා පමණක් සීමා විය යුතු අතර, එම වැඩ කටයුතු සඳහා රීති අංක 15(4), 57(1), 57(3), 57(4) හා 57(5) හි විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතුය" යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## විසිවන ආණ්ඩුක්‍ර ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත : (පළාත් සභාවේ අදහස් විමසීම)
THE BILL TO AMEND TWENTIEH COUNSTITUTION : (INQUIRING VIEWS OF THE PROVINCIAL)

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි,

*"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය*
*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත*
*(විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය - පනත් කෙටුම්පත.)*

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඌ 2 අනු ව්‍යවස්ථාව අනුව මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරනු පිණිස, අතිගරු ජනාධිපතිතුමන් විසින් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත එවන ලදුව, ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම පළාත් සභාව වෙත යොමු කරන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත (විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය - පනත් කෙටුම්පත) පිළිබඳව, මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළඹෙන තීරණයන්ට අනුකූලව පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයන් අතිගරු ජනාධිපතිතුමන් වෙත වාර්තා කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවීමට ක්‍රියා කළ යුතු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි"* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අනුව අපට තිබෙනවා න්‍යාය පත්‍රය අනුව පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීමේ අවස්ථාව. එම අවස්ථාව ඔබතුමා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, දැන් ගරු ආණ්ඩුකාරතුමා විසින් විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් පනත් කෙටුම්පතක් අපේ පළාත් සභාවට යොමු කරලා තිබුණා. නමුත් මෙය අපි පරිශීලනය කිරීමේදී අපට පැහැදිලි වුණා, මෙම පනත් කෙටුම්පත අපි සභාවේ සම්මත කිරීම තුළින් බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයකු හැටියට මට තිබෙන බලතලත්, ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාට තිබෙන බලතලත්, ගරු ආණ්ඩුකාරතුමාට තිබෙන බලතලත් මේ මගින් අහෝසි වෙලා, පාර්ලිමේන්තුවට යන බව. එතකොට එසේ පාර්ලිමේන්තුවට යාම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය උල්ලංඝනය වීමක්. එයට පටහැනියි. ඒ නිසා අපි මේ කාරණය සම්බන්ධයෙන් වගකිවයුතු අයගෙන් මේ සඳහා සංශෝධන ඉල්ලුවා. නමුත් අදටත් අපට ඒ සංශෝධන ලැබුණේ නැහැ. නමුත් අපට දැන ගන්නට ලැබිලා තිබෙනවා, රජය ඒ වාගේම ගරු අධිකරණය තුළ අද මේ පිළිබඳව සාකච්ඡා වෙනවා. ඊයේ උදේ 10.00 වන විටත් අවස්ථාව තිබුණා, අධිකරණයට ගිහිල්ලා තිබුණු අයට තමන්ගේ අදහස් එවන්නය කියලා ඊයේ උදේ 10.00 වන තෙක් උසාවිය නියෝග දීලා තිබුණා. එතකොට දැන් අපට දැන ගන්නට ලැබිලා තිබෙන ආකාරයට උසාවියෙන් දෙන සංශෝධන ගරු කථානායකතුමාට ලැබෙන්නේ ලබන බදාදා. නමුත් ජනාධිපතිතුමා කලින් අපට - ජනාධිපතිතුමාගේ නියමය පරිදි ජනාධිපති ලේකම්තුමා මාවත්, ගරු ආණ්ඩුකාරතුමාවත් අමතන ලද ලිපි අනුව බස්නාහිර පළාත් සභාවේ අදහස අපි අද ලබා දිය යුතුව තිබෙනවා.

අපට එහාට යන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා පොදුවේ පළාතේ මහ ඇමතිවරයා හැටියට, බස්නාහිර පළාතේ මහ ඇමතිවරයා හැටියට මේ එවලා තිබෙන සංශෝධනයට මට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා තමයි අපි මේකට සංශෝධන ඉදිරිපත් කළේ. අපි අතිගරු ජනාධිපතිතුමාටත්, මේ වගකිවයුතු අයටත් ඉදිරිපත් කරපු ඒ ලිපිය[1] මම හිතන්නේ මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා මම කියවන්න කැමැතියි.

*අතිගරු ජනාධිපතිතුමා,*
*ජනාධිපති ලේකම් කාර්යාලය,*
*කොළඹ 01.*

*අතිගරු ජනාධිපතිතුමනි,*

***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ පනත් කෙටුම්පත***

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ මාගේ නිරීක්ෂණ මේ සමඟ ඔබතුමාගේ අවධානය පිණිස ඉදිරිපත් කරමි.*

ගැටළුවක් තිබෙනවාද? නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මහ ඇමතිතුමා, අපි බැලුවේ තව ටිකක් පහසු වෙන්න එම ලිපියේ පිටපතක් ගරු මන්ත්‍රීවරුන් අතර බෙදා බෙදන්නයි මම මේ උත්සාහ කළේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමා මගින් බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්තුමාට මම යෝජනා කරනවා. මම මේ ප්‍රකාශ කරන කෙටුම්පතේ පිටපතක් ඉක්මණින් ගරු මන්ත්‍රීවරුන් අතට යවන්න කියලා. ඔබතුමා මගින් සභා ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේක සභාවට බෙදන්නය කියලා.

*මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මූලික අරමුණ සියළුම පළාත් සභාවලට මන්ත්‍රීවරු තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම එකම දිනයක පැවැත්වීමයි. මෙමගින් ජනතා පරමාධිපත්‍ය කිසිදු බාධාවකින් තොරව ඉටු වන බැවින් මෙවැනි සංශෝධනයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් මා එය ඉතා අගය කරමි. පසුගිය කාලය තුළ ඒ ඒ පළාත් සභාවල ඡන්ද විමසීම් වෙන් වෙන් දිනවල පැවැත්වීම හේතුවෙන් ජයග්‍රහණයන් ලබා ගත් නමුත් එමගින් ජනතා පරමාධිපත්‍යයේ නිසි පිළිඹිබුවක් නොලැබුන බව නොරහසකි. එමගින් ඇ ඇ අනු ව්‍යවස්ථාවේ සංශෝධනය සම්බන්ධයෙන් අපගේ එකඟතාවය මෙයින් පළ කරමු.*

*එසේ වුවද මෙම මූලික අරමුණ ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ක්‍රමවේදය ඇතුළත් යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළාත් සභාවල බලය පාර්ලිමේන්තුවට පැවරීමේ වගන්තිය සම්බන්ධයෙන් එකඟවීමේ හැකියාවක් නොමැත.*

*19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව පාර්ලිමේන්තු ධූර කාලයක් ක්‍රියාත්මක වී පාර්ලිමේන්තුව තීරණය නොකරන තාක් වසර 4 ක් ගත වන තෙක් ජනාධිපතිවරයාට වුවද විසුරුවා හැරිය නොහැක. එසේම දැනට පවත්නා නීතියට අනුව තේරී පත් වන පළාත් පාලන ආයතනයක් විසුරුවා හැරීමක් වෙනුවෙන් ක්‍රියාත්මක වීමට ඇති සීමිත හැකියාව පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා වශයෙන් සිදු කළ යුත්තේ ද එවැනි තත්ත්වයකට අදාළ වන ප්‍රබල චෝදනා පළාත් පාලන ආයතනයට එරෙහිව ඇත්නම් ඒ පිළිබඳව කරනු ලබන පරීක්ෂණ කොමිෂන් සභා පනතට අදාළ බලතල ඇති විනිසුරුවරයෙකුගෙන් සමන්විත පරීක්ෂණ කොමිෂන් සභාවක වාර්තාවක කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසුවයි. එබැවින් පළාත් සභාවක් වැනි උපජාතික මට්ටමේ පාලන ස්වරූපයක් වෙනුවෙන් පාර්ලිමේන්තුව තීරණය කරන ආකාරයට විසිරීයාමට කරුණු යෙදීම උචිත ද යන්න සැළකිය යුතුව ඇත.*

*තවද, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ව්‍යවස්ථාව යටතේ සඳහන් විධිවිධාන අනුව*

[1] කථාව අවසානයේ පළ කර ඇත.

*පාර්ලිමේන්තුවට පළාත් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් වීමට යම් අවකාශයක් ඇත. එහෙත් එම අවකාශය හට ගනු ලබන්නේ යම් පළාතක පරිපාලනය ක්‍රියාත්මක කිරීමට නොහැකි තරමට සුවිශේෂී හේතු යෙදී ඇති බවට පළාත් සභාවට අනුරූපී පළාත් ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන වාර්තාවක අනුකූලව ජනාධිපතිවරයා විසින් කරනු ලබන ප්‍රකාශනයක් මගින්ය. එසේ නොමැතිව එය පාර්ලිමේන්තුව අදහස් කරන අවස්ථාවකදී සිදු වන්නක් නොවනු ඇත.*

*නමුත් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇතුළත් 154 ඉ ඉ (යෝජිත) ව්‍යවස්ථාව අනුව පළාත් ආණ්ඩුකාරවරයා වෙත 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙහි 154 ආ (8) (ඇ) ව්‍යවස්ථාවට අනුකූලව ලැබී ඇති බලතල ප්‍රකාරව යම් පළාත් සභාවක් විසුරුවා හැරීම සිදුවුවහොත්, එසේ විසුරුවා හරින ලද දිනයේ සිට විසුරුවා හැරිය යුතු දිනයැයි පාර්ලිමේන්තුව තීරණය කරන දිනය දක්වා කාලය තුළ පළාත් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත පැවරෙන්නේය.*

*මෙම තත්ත්වය 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ඊ, 154 උ සහ 154 ඌ මගින් පළාත් සභාවලට ලබා දී ඇති බලයත්, 154 ඔ මගින් පළාත් සභාවේ පරිපාලනය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ලබා දී ඇති බලයත් හීන කරවන්නකි. ඒ අනුව යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතෙහි 154 ඉ ඉ අනු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් එකඟවීමට හැකියාවක් නොමැති බව මෙයින් දන්වමි.*

*යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඇ ඇ අනු ව්‍යවස්ථාවේ දෙවැනි ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු යැයි යෝජනා කරමි.*

*"එසේ වුවද, ඒ නිශ්චිත දිනය, අවසානයට සංස්ථාපනය කරන ලද පළාත් සභාවේ ධූර කාලය ඉකුත් වන දිනයට පසු දිනයක් නොවිය යුතු අතරම ඊට වසරකට පෙර දිනයක් ද නොවිය යුතුය."*

යන සංශෝධනය අපි මුලදී සාකච්ඡා කරපු සංශෝධනය. එයත් අපි සංශෝධනය කරලා තිබෙනවා. විශේෂයෙන් අපි දීර්ඝ වශයෙන් කථා කරලා මේ පිළිබඳව දැනුමක් තිබෙන නීතිඥවරුන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව අවබෝධයක් තිබෙන විවිධ අයත් එක්ක සාකච්ඡා කරලා මම අද මෙම සභාවට මේ යෝජනාව කරන්න කැමැතියි. මොකක්ද මම කරන යෝජනාව. මම මේක සම්පූර්ණයෙන්ම අපි වෙත එවා තිබෙන විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ඇ ඇ. පළාත් සභා ඡන්ද විමසීම. ඒ පනත් කෙටුම්පතේ කියන්නේ,

*"සියලුම පළාත් සභාවලට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම එකම දිනයක පවත්වනු ලැබිය යුතු අතර, (මේ පරිච්ඡේදයේ "නිශ්චිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සියලුම පළාත් සභා විසිරෙන දිනය පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය."*

අපි ඒකට විරුද්ධ වෙනවා. මේකට අපි විරුද්ධ වෙනවා.

එසේ වුවද, ඒ නිශ්චිත දිනය, මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන විට අවසානයට සංස්ථාපනය කරන ඇති පළාත් සභාවේ ධූර කාලය ඉකුත් වන දිනට පසු දිනයක් නොවිය යුතුය.

එතකොට අපේ සංශෝධනය ගරු සභාපතිතුමනි. මම මේ බස්නාහිර පළාත් සභාවේ සියලුම දෙනා වෙනුවෙන් මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ.

සියලුම පළාත් සභාවලට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම එකම දිනයක පවත්වනු ලැබිය යුතු අතර, (මෙම පරිච්ඡේදයේ නිශ්චිත දිනය යනුවෙන් සඳහන් කරනු ලබන) සියලුම පළාත් සභාවන්හි ඡන්දය විමසීම් දිනය මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමෙන් පසු පළමුවන වරට පවත්වන පළාත් සභා ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් පමණක් වන විට එම නිශ්චිත දිනය පාර්ලිමේන්තුව තීරණය කළ යුතුය.

ඒ කියන්නේ, මේ ඉදිරියේදී එන පළාත් සභාවට පමණක්. නිශ්චිත දිනයකදී විසුරුවීමේ බලය පාර්ලිමේන්තුවට ගියාට අපි එකඟයි කියන එකයි කියන්නේ. හරිද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හරි. හරි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක තමයි අපේ යෝජනාව.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නැතිව බැලන්ස් කරන්න බැහැ නේ මේක.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඕවා ඉතින් පෙර වැරදි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*එසේ වුවද ඒ නිශ්චිත දිනය මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන විට අවාසනයට සංස්ථාපනය කරන ඇති පළාත් සභාවේ ධූර කාලය ඉකුත් වන දිනට පූර්වාසන්න මාස හයක කාල සීමාව ඇතුළත දිනයක් විය යුතුය.*

ඒක අපට ප්‍රශ්නයක් නැහැ. අප්‍රේල් වෙනකල් යන්න. පළාත් නවයම මැද තැනකට ඒම සම්බන්ධයෙන් අපේ විරෝධතාවයක් නැත. එතකොට මේ පනත් කෙටුම්පතේ කියනවා - මම හිතන්නේ, මේක තිබෙන නිසා තමුන්නාන්සේලාට මම කියන්න අවශ්‍ය වෙන්නේ නැහැ. එතකොට මේ සඳහන් කරලා තිබෙන කාරණාවන් දැන් ඉ, අ, ආ, - එතකොට පාර්ලිමේන්තුව විසින් පළාත් සභාවක බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බව කියන මේ සියලු කාරණා - අපි එකම දිනයක පැවැත්විය යුතුයි කියන කාරණාවට අමතරව තිබෙන සෙසු ව්‍යවස්ථා, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට තිබෙන බලතල ලබා ගැනීම සම්බන්ධ ආදී සියල්ලම. මේ පනත් කෙටුම්පතින් ඉදිරිපත් කර තිබෙන සෙසු ව්‍යවස්ථා ඉවත් විය යුතු යැයි බස්නාහිර පළාත් සභාව යෝජනා කරන්නීය යන යෝජනාව තමයි ගරු සභාපතිතුමනි, මම යෝජනා කරන්නේ. අදහස් කරන්නේ.

ඒ නිසා මම හිතන්නේ මෙම කාරණාව පිළිබඳව මම පක්ෂ සහ විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටින්නේ ඇති වෙලා තිබෙන තත්ත්වය අනුව දැනට අනිවාර්යයෙන්ම මේ පළාත් සභා සම්බන්ධයෙන් තීන්දුවක් ගැනීමට රජයට, පාර්ලිමේන්තුවට, 2/3 ක ඡන්දයක එකඟතාවය තුළ ගත යුතුව තිබෙනවා, අද මේ සම්බන්ධයෙන් වර්තමානයේ පැන නැගිලා තිබෙන වර්තමාන තත්ත්වය අනුව. නමුත් පැවතුනු කිසිම සභාවක් ඒ අයගේ අදහස සභාව මතු කළත් - නමුත් මේ සඳහා ආණ්ඩුවට, රජයට, ජනාධිපතිතුමාට මේ සම්බන්ධව සංශෝධනයක් ඉදිරිපත් වෙලා නැහැ. අපේ මතයක් ප්‍රකාශ වෙලා නැහැ ගරු සභාපතිතුමනි. කිසිම පළාත් සභාවකින් මතයක් ප්‍රකාශ වෙලා නැහැ. නැහැනේ? අහලා නැහැ. ඒ නිසා මම යෝජනා කරන්නේ, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 2. මේ පරිච්ඡේදය මම කියවන්නම්. මේ පරිච්ඡේදයේ විධිවිධාන හෝ නව වන උපලේඛනය හෝ සංශෝධිත කිරීම සඳහා හෝ ඉවත් කිරීම සඳහා වන පනත් කෙටුම්පතක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබීමට පෙර ඒ පිළිබඳව යොමු කිරීමේ නිශ්චය කොට දැක්වෙන කාල සීමාවක් ඇතුළත අදහස් ප්‍රකාශ කිරීම පිණිස - ගරු සභාපතිතුමනි, ඔබතුමා මීට මොහොතකට පෙර මා වෙත කරන ලද ප්‍රකාශයට අනුව මේ ඔබට කියන්නේ. අදහස් ප්‍රකාශ කිරීම පිණිස ජනාධිපතිවරයා විසින් සෑම පළාත් සභාවක් වෙතම යොමු කරනු ලැබ ඇත්නම් මිස සහ ඒ සෑම සභාවක්ම එම සංශෝධනය හෝ ඉවත් කිරීමට හෝ එකඟ වන්නා වූ අවස්ථාවක එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ බහුතරයක් විසින් සම්මත කරනු ලැබිනි නම් හෝ - හරිද? මම හිතන්නේ මේ කාරණය පැහැදිලියි.

මම මේක දිගටම කියන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ කියන්නේ, අපට මේ සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උ 2 අනුව පළාත් සභාවකට ඉදිරිපත් කරලා තිබෙන මේ කෙටුම්පත සම්බන්ධයෙන් මතය ප්‍රකාශ කිරීමේ, අදහස ප්‍රකාශ කිරීමේ අයිතියක් අපට ලැබී තිබෙනවා. අපේ අදහස ජනාධිපතිතුමාට යැවීමේ අවස්ථාවක් තිබෙනවා. ඒ නිසා ඒ අනුව මම ඔබතුමාට යෝජනා කරනවා. මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස්, යෝජනා අරගෙන අපි බෙදීමකින් තොරව මගේ සංශෝධන යෝජනාව අතිගරු ජනාධිපතිතුමා වෙත යොමු කිරීමට බස්නාහිර පළාත් සභාවේ එකඟතාවය ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***සංශෝධිත ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Amended, Question proposed*

දිනය / திகதி / Date 2017.08.27

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

ඉසුර දේවප්‍රිය

இசுற தேவப்பிரிய

Isura Dewapriya

ප්‍රධාන අමාත්‍ය - බස්නාහිර පළාත

முதலமைச்சர் - மேல் மாகாணம்

Chief Minister - Western Province

[illegible]

[illegible]

Minister of Finance & Plan Implementation, Engineering Services, Law & Order, Local Government & Provincial Administration, Economic Promotion, Power & Energy, Environmental Affairs, Water Supply & Drainage and Tourism

අතිගරු ජනාධිපතිතුමා,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ සභාත් සටහන</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ මාගේ නිරීක්ෂණ මේ සමග ඔබ තුමාගේ අවධානය පිණිස ඉදිරිපත් කරමි.

මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මූලික අරමුණ, සියළුම පළාත් සභාවලට මන්ත්‍රීවරු තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීම එකම දිනයක පැවැත්වීමයි. මෙමගින් ජනතා පරමාධිපත්‍ය කිසිදු බාධාවකින් තොරව ඉටුවන බැවින් මෙවැනි සංශෝධනයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් මා එය ඉතා අගය කරමි. පසුගිය කාලය තුළ ඒ ඒ පළාත් සභාවල ඡන්ද විමසීම් වෙන් වෙන් දිනවල පැවැත්වීම හේතුවෙන් ජයග්‍රහණයන් ලබාගත් නමුත් එමගින් ජනතා පරමාධිපත්‍යයේ නිසි පිළිබිඹුවක් නොලැබුන බව නොරහසකි. එමගින් ඇ ඇ අතු ව්‍යවස්ථාවේ සංශෝධනය සම්බන්ධයෙන් අපගේ එකඟතාවය මෙයින් පළ කරමු.

එසේ වුවද මෙම මූලික අරමුණ ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ක්‍රමවේදය ඇතුලත් යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළාත් සභාවල බලය පාර්ලිමේන්තුවට පැවරීමේ වගන්තිය සම්බන්ධයෙන් එකඟවීමේ හැකියාවක් නොමැත.

19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව පාර්ලිමේන්තු ධූර කාලයක් ක්‍රියාත්මක වී පාර්ලිමේන්තුව නිරණය නොකරන තාක් වසර 4 ක් ගත වන තෙක් ජනාධිපතිවරයාට වුවද විසුරුවා හැරිය නොහැක. එසේම දැනට පවත්නා නීතියට අනුව තේරී පත්වන පළාත් පාලන ආයතනයක් විසුරුවා හැරීමක් වෙනුවෙන් ක්‍රියාත්මක වීමට ඇති සීමිත හැකියාව පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා වශයෙන් සිදු කළ යුත්තේ ද එවැනි තත්වයකට අදාළ වන ප්‍රබල චෝදනා පළාත් පාලන ආයතනයට එරෙහිව ඇත්නම් ඒ පිළිබඳව කරනු ලබන පරීක්ෂණ කොමිෂන් සභා පනතට අදාළ බලතල ඇති විනිසුරුවරයෙකුගෙන් සමන්විත පරීක්ෂණ කොමිෂන් සභාවක වාර්තාවක කරුණු සැළකිල්ලට ගැනීමෙන් පසුවයි. එබැවින් පළාත් සභාවක් වැනි උපජාතික මට්ටමේ පාලන ස්වරූපයක් වෙනුවෙන් පාර්ලිමේන්තුව තීරණය කරන ආකාරයට විසිරියාමට කරුණු යෙදීම උචිත ද යන්න සැළකිය යුතුව ඇත.

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 511, කොළඹ 07.
"சிராவஸ்தி மந்திரய", 32, சேர் மாகஸ் பெர்னாண்டோ மாவத்தை, த.பெ. 511, கொழும்பு 07.
"Srawasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, P.O. Box 511, Colombo 07.
E-mail : chiefmin@wpc.gov.lk/chiefminister@wpc.gov.lk

දුරකථන / தொலைபேசி / Telephone 011-2686410

ෆැක්ස් / தொலைநகல் / Fax 011-2675560

තවද, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ව්‍යවස්ථාව යටතේ සඳහන් විධිවිධාන අනුව පාර්ලිමේන්තුවට පළාත් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් වීමට යම් අවකාශයක් ඇත. එහෙත් එම අවකාශය හට ගනු ලබන්නේ යම් පළාතක පරිපාලනය ක්‍රියාත්මක කිරීමට නොහැකි තරමට සුවිශේෂී හේතු යෙදී ඇති බවට පළාත් සභාවට අනුරූපී පළාත් ආණ්ඩුකාරවරයගෙන් ලැබෙන වාර්තාවක අනුකූලව ජනාධිපතිවරයා විසින් කරනු ලබන ප්‍රකාශනයක් මගින්ය. එසේ නොමැතිව එය පාර්ලිමේන්තුව අදහස් කරන අවස්ථාවකදී සිදුවන්නක් නොවනු ඇත.

නමුත් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇතුළත් 154 ඉ ඉ ( යෝජිත ) ව්‍යවස්ථාව අනුව පළාත් ආණ්ඩුකාරවරයා වෙත 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙහි 154 ආ ( 8) (ඇ) ව්‍යවස්ථාවට අනුකූලව ලැබී ඇති බලතල ප්‍රකාරව යම් පළාත් සභාවක් විසුරුවා හැරීම සිදුවුවහොත්, එසේ විසුරුවා හරින ලද දිනයේ සිට විසුරුවා හැරිය යුතු දිනයැයි පාර්ලිමේන්තුව තීරණය කරන දිනය දක්වා කාලය තුළ පළාත් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත පැවරෙන්නේය.

**මෙම තත්වය 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ඊ, 154 උ සහ 154 ඌ මගින් පළාත් සභාවලට ලබා දී ඇති බලයත්, 154 ඔ මගින් පළාත් සභාවේ පරිපාලනය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ලබා දී ඇති බලයත් හීන කරවන්නනකි . ඒ අනුව යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතෙහි 154 ඉ ඉ අනු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් එකගවීමට හැකියවක් නොමැති බව මෙයින් දන්වමි.**

යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඇ ඇ අනු ව්‍යවස්ථාවේ දෙවන ඡේදය පහත සඳහන් පරිදි සංශෝධන විය යුතු යැයි යෝජනා කරමි.

**" එසේ වුවද, ඒ නිශ්චිත දිනය, අවසානයට සංස්ථාපනය කරන ලද පළාත් සභාවේ ධූර කාලය ඉකුත් වන දිනයට පසු දිනයක් නොවිය යුතු අතරම ඊට වසරකට පෙර දිනයක්ද නොවිය යුතුය"**

154 ආ ව්‍යවස්ථාවේ ( 8) වන අනු ව්‍යවස්ථාවේ ( ඇ) ඡේදයේ විධිවිධාන හේතුව නිසා හෝ යම් නීතියක නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් හේතුවක් නිසා හෝ යම් පළාත් සභාවක් විසුරුවා හරිනු ලබන අවස්ථාවකදී ඒ පළාත් සභාව බලතල නිශ්චිත දිනය තෙක් ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඔ යටතේ ලබා දීඇති විධි විධාන පරිදි එනම් පහත සඳහන් පරිදි ක්‍රියාත්මක වීම සුදුසු බව මගේ නිරීක්ෂණයයි.

(අ) පළාතේ පරිපාලන සතු සියලුම කර්තව්‍ය හෝ ඉන් කිසිවක් හෝ ආණ්ඩුකාරවරයා වෙත හෝ පළාත් සභාව නොවන එම පළාතේ වෙනත් යම් මණ්ඩලයක් හෝ අධිකාරයක් වෙත පැවරී ඇති හෝ ඔහු හෝ එය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි සියලුම බලතල හෝ ඉන් කිසිවක් හෝ තමන් වෙත පවරා ගත හැක්කේය.

(ආ) පළාත් සභාවේ බලතල පාර්ලිමේන්තුව විසින් හෝ එහි බලය යටතේ ක්‍රියාත්මක කළ යුතු බව ප්‍රකාශ කළ හැක්කේය.

( ඇ) ප්‍රකාශනයේ පරමාර්ථ සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ලෙස හෝ උචිත ලෙස ජනාධිපතිවරයාට පෙනී යන ආකාරයේ ආනුෂංගික විධි විධාන සැලැස්විය හැක්කේය.

ඉහත කරුණු පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු වෙතැයි අපේක්ෂා කරමි.

මෙයට - විශ්වාසී

ඉසුරු දේවප්‍රිය
ප්‍රධාන අමාත්‍ය
බස්නාහිර පළාත

154 ඈ ඈ

සියලු ම පළාත් සභා වලට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේ චන්ද විමසීම එකම දිනයක පවත්වනු ලැබිය යුතු අතර (මෙම පරිච්ඡේදයේ "නිශ්චිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සියලු ම පළාත් සභාවන්හි චන්දය විමසීම් දිනය, මෙම ව්‍යවස්තාව ක්‍රියාත්මක වීමෙන් පසු පළමු වන වරට පවත් වන පළාත් සභා චන්ද විමසීම සම්බන්ධයෙන් පමණක් වන විට එම නිශ්චිත දිනය පාර්ලිමේන්තුව තීරණය කල යුතු ය.

එසේ වුවද එම නිශ්චිත දිනය මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවන දිනය වන විට අවසානයට සංස්ථාපනය කරන ඇති පළාත් සභාවේ ධූර කාලය ඉකුත් වන දිනට පූර්වාසන්න මස හයක කල සීමාව ඇතුලත දිනයක් විය යුතු ය.

සෙසු ව්‍යවස්ථා ඉවත් විය යුතුය.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ 62 වන වගන්තියේ සඳහන් වෙනවා. ඔබතුමාගේ අවධානය 62 වන වගන්තියට යොමු කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ගෙනෙන ලද ඒ සංශෝධනය ඒ තුළට අන්තර්ගත වෙලාද ගෙන එන්නේ කියලා මම ඔබතුමාගෙන් විමසනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද රීති ප්‍රශ්නය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ යෝජනාවකට අපට ඒක බලපාන්නේ නැහැ. මොකද, 154 උ 2 හි පැහැදිලිවම කියලා තිබෙනවා, එවැනි යෝජනාවක් සාකච්ඡා කරන්න පුළුවන් කියන එක.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංශෝධනය, ඒක පැහැදිලිව කියලා තිබෙනවා. මහ ඇමතිතුමා ඒ ගැන කියෙව්වා. මහ ඇමතිතුමා ඒ සම්බන්ධව පැහැදිලිව ප්‍රකාශ කළා. ඒකේ පැහැදිලිවම කියලා තිබෙනවා, ජනාධිපතිතුමා විසින් එවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ යෝජනාවක් සාකච්ඡාවට ගන්න පුළුවන්. ඒක කිසිම තැනක -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

යෝජනාවක් සාකච්ඡා කරන්න පුළුවන්. මේ 62 රීතිය අනුව ඒකට සංශෝධන ගේන්න පුළුවන්ද කියලයි මම අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මීට පෙරත් එවැනි සංශෝධන ගෙනැත් තිබෙනවා. ඊට අමතරව, 58 රීතියෙත් ඒ සම්බන්ධව ඉඩ දීලා තිබෙනවා. 56 රීතියෙත් ඉඩ දීලා තිබෙනවා. ඒ නිසා ගැටළුවක් වෙන්නේ නැහැ. 56 රීතියෙත් ඒ සම්බන්ධව ඉඩකඩ ලබා දීලා තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, අදාළ රීතියේ පැහැදිලි කිරීම තිබෙන්නේ ගරු මන්ත්‍රීවරයෙක් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාවක් සම්බන්ධව ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව. ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවෙන් අපට 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් බලය පවරා තිබෙනවා, පාර්ලිමේන්තුව සිය පනතක් සංශෝධනය කිරීම පිළිබඳ මත විමසීමේදී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව. හැබැයි, ඒකෙත් පැහැදිලි කිරීම් දිගටම නැහැ. නමුත් මේ අවස්ථාවේදී අපේ රීතිවලත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලි කිරීම්වලටත් අමතරව බාහිර ප්‍රශ්නයක් මතු වෙනවා නම්, අධිකාරී බලය යටතේ ඒකට පිළිතුරු සැපයීමේ පූර්ණ වගකීම ගරු සභාපතිතුමාට පැවරෙනවා. ඒ නිසා මේ විවාදයක් කරලා හෝ මන්ත්‍රීවරන්ගේ මතය පැහැදිලි කිරීම සම්බන්ධව කිසිම බාධාවක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධාවක් නැහැ ඉතින්. ඒක තමයි මම කිව්වේ. ඒ අනුව ආණ්ඩු පක්ෂයෙන් සහ විපක්ෂයෙන් කථික ලැයිස්තු දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් පුංචි ඉල්ලීමක් කරනවා. ගරු මහ ඇමතිතුමා ලිපියක් කියෙව්වා, අතිගරු ජනාධිපතිතුමාට යවපු. ඒ ලිපිය අපට කඩිනමින් ලබා දෙන්නය කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් එවනවා අපි ඒක. ඒ අනුව මේ පිළිබඳව විවාදය ආරම්භ කිරීමට මම ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් දෙන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාවේදී කාලය ලබා දීම ගැන.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා. කාලය පිළිබඳ ගැටළුවක් මතු වෙනවා. මගේ විනාඩි 06 ක් කියලා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මතු වෙන්නේ නැහැ. රීති අත්හිටුවලා යන්නේ. එහෙම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ගරු සභානායකතුමා ඔබතුමන්ලා එවලා තිබෙන කථික ලැයිස්තුවේ ආණ්ඩු පක්ෂයෙන් 30 ක් ඉන්නවා. විපක්ෂයේ කථික ලැයිස්තුවේ 07 ක් ඉන්නවා. මට කරන්න දෙයක් නැහැ ඉතින්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම නම් ගරු සභාපතිතුමනි, විනාඩි 06 ක් මදි. අපේ කාලය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට විනාඩි 10 ක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, අපි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ආණ්ඩු පක්ෂයට දෙන්නේ පහයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමතිතුමාගේ ප්‍රකාශය හා සම්බන්ධව මගේ අදහස් ප්‍රකාශ කිරීම පටන් ගන්නම්. අද මේ විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ සභාවේ -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මන්ත්‍රීවරුන් සීමා කරන්න කාලය පිළිබඳ ප්‍රශ්නයත් එක්ක සූදානමකට ඉඩක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පැහැදිලි නැහැ ඔබතුමා කියපු එක ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මේ විවාදයේ මන්ත්‍රීවරුන් ප්‍රමාණය සීමා කරනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට එහෙම සීමා කරන්න බැහැ. රීති අත්හිටුවලා තිබෙන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

කාලය සීමා කරන්නත් බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒත් බැහැ. එහෙම සීමා කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසි වන සංශෝධනය කියලා මට තේරුම් යන විධියට මම හිතන්නේ නැහැ මේ සද්ද කරන කවුරුවත් හරියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය කියවලා තිබෙනවාය කියලා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔබතුමා විතරයි කියවලා තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේගොල්ලෝ අද මේක සම්මත කරලා යැව්වාට පස්සේ අර දිවි නැගුම වාගේ පස්සේ ඇවිල්ලා කියයි අපි කර ගත්තේ මෝඩ කමක් කියලා. ඒ නිසා අපේ කෑ ගහපු මන්ත්‍රීතුමිය කිව්වා නේ ඇවිල්ලා, අපි කරපුවා වාගේ ඕගොල්ලොත් මෝඩ වැඩ කරන්න එපා කියලා. ඉතින් ඒ නිසා ආයිත් තව මාසයක් දෙකක් ගිහිල්ලා කියයි අයියෝ

[ගරු ශ්‍රීනාත් පෙරේරා]

අපි ආයිත් මෝඩ වැඩක් කර ගත්තාය කියලා. මේ විසි වන සංශෝධනයට මම එකඟයි. මොකද, මේ විසි වන සංශෝධනය කියන්නේ, හරියට තේරුම් අරගෙන තිබුණා නම් මොකක්ද කියලා ඒක පැහැදිලි වෙනවා. මම ඒක මොකක්ද කියලා කියන්න යන්නේ නැහැ. මොකද, ඒක කිව්වොත් මෙතැන ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා අපේ මහ ඇමතිතුමා, අපි එකඟතාවයෙන් මේක අපේ අදහස් එක්ක යවමු කිව්වාම මම එකඟයි. මොකද, මේකේ අපේ අදහස් කියන්නේ අපට මේකට සංශෝධන එකතු කරන්න බැහැ. මේක අපේ අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. නමුත් මේකට සංශෝධනයක් යවන්න පුළුවන් කියලා කවුරු හරි හිතාගෙන ඉන්නවා නම් මම ඉතාමත් කනගාටු වෙනවා, ඒ වාගේ කට්ටිය මේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය කියවන්නේ නැතිව තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි ජනාධිපතිතුමාත්, ආණ්ඩුවත් මේ විසි වන සංශෝධනයෙන් ප්‍රධාන ලෙස බලාපොරොත්තු වෙන්නේ -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඡන්දය කල් දාන එක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ ඡන්දය කල් දැමීම නොවෙයි. ඡන්දය වේලාසන තියන එක.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඡන්දයට භය වෙලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඡන්දයට භය වෙලා තමයි මේ කට්ටිය කෑ ගහන්නේ. මම තමුන්නාන්සේලාට අභියෝගයක් කරනවා, මේක කල් යන්නේ නැහැ. මේක වේලාසන තියනවාය කියලා. ඒ නිසා තමුන්නාන්සේලා ලෑහැස්ති වෙන්න ඡන්දයකට යන්න වේලාසන. 2019 වන තෙක් මේ පළාත් සභාව යන්නේ නැහැ. ඒ නිසා ඡන්දයකට ලෑහැස්ති වෙන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අපෝ ලෑහැස්තියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් තමුන්නාන්සේලා, ඒකාබද්ධ විපක්ෂය ඡන්දය නේ ඉල්ලුවේ. දැන් මේ ඡන්දයක් දෙන්න යන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වගකීමෙන්ද කියන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම වගකීමෙන් කියන්නේ. මම වගකීමෙන් කියනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, එතුමාට එවැනි ප්‍රකාශයක් කරන්න අයිතියක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අයිතියක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට අයිතියක් තිබෙනවා. ඇයි මට අයිතියක් නැත්තේ? මට අයිතියක් තිබෙනවා ප්‍රකාශයක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට එහෙම කියන්න -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මේ ආණ්ඩුවේ එක පාර්ශවයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ප්‍රකාශ කරන්නේ මගේ මතය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ මතය වෙන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ මතය මම කියන්නේ. මහ ඇමතිතුමාගේ මතය නොවෙයි මම කියන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ නිසා මෙතුමාට ඕනෑ විධියට මේක කරන්න බැහැ. මේ ආණ්ඩුවේ අපිත් ඉන්නවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහ ඇමතිතුමාට සංශෝධන යවන්න අයිතියක් තිබෙනවා වාගේම, මට මගේ මතය කියන්න අයිතියක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මහ ඇමතිතුමා කොහොමද සංශෝධන යවන්නේ එහෙම නම්. මට කියන්න ඒක පොඩ්ඩක්. මහ ඇමතිතුමා ලැයිස්තුවක් කිව්වා මම සංශෝධන යවනවාය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක 154 උ 2 පනතේ තිබෙන එක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහ ඇමතිතුමාට සංශෝධනයක් යවන්න බැහැ. මහ ඇමතිතුමාට අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පැහැදිලිව කියලා තිබෙනවා ඒක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකක්ද කියලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මහ ඇමතිතුමා කිව්වේ. මට ආයිත් කියන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකක්ද? ඒක තමයි මම කිව්වේ, ඒක හරියට තේරුම් අරගෙන නැහැයි කියලා. හරියට තේරුම් ගත්තා නම් පාර්ලිමේන්තුවට බලය තිබෙනවා, ජනාධිපතිතුමාට බලය තිබෙනවා, දැන් වුණත් මේක විසුරුවන්න. මේ පළාත් සභාව විසුරුවන්න ජනාධිපතිතුමාට බලය තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, අද මේ පනත් කෙටුම්පත පිළිබඳව යළිත් සංශෝධනය කරන්න ඕනෑ කියලා අදහස මතු වුණේ අපි විසින් එවන ලද ඔය සංශෝධනයට අනුවයි. ඒ නිසා මම එතුමාට කියනවා, අවබෝධයෙන් කථා කරන්නය කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සංශෝධන ඇතිව කිව්වාට - ඔබතුමා නේ කියන්නේ සංශෝධන ඇතිව කියලා. ව්‍යවස්ථාවේ බලන්න. සංශෝධන අපට ඉදිරිපත් කරන්න පුළුවන් කියලා කොහේද තිබෙන්නේ? එහෙම එකක් ව්‍යවස්ථාවේ නැහැ. ඔය හිතේ ආසාවට කියා ගන්න කථා. කමක් නැහැ. ඔබතුමා සන්තෝෂ වෙනවා නම් ඒක හොඳයි. අපිත් සතුටුයි. අපිත් සතුටුයි එහෙම සන්තෝෂ වෙනවා නම්. නමුත් ගරු සභාපතිතුමනි, මේ 13 වන සංශෝධනයේ ඉතාමත් පැහැදිලිව තිබෙනවා. මේකේ පළමුවැනි වගන්තියම කියවලා බැලුවොත්, මේක ඕනෑ වෙලාවක විසුරුවන්න පුළුවන්. මේකේ ජනාධිපතිතුමාට බලය තිබෙනවා. ඒක පළමුවැනි සංශෝධනයෙන් කියන්නේ. පළමුවැනි එකෙන් කියන්නේ මොකක්ද? පළමුවැනි එකෙන් කියන්නේ වෙන වෙනම තියන්න ඕනෑ නම් පුළුවන් කියලා. ඒක තමයි පළමුවැනි වගන්තියෙන් කියන්නේ. 13 වන සංශෝධනය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හැබැයි, මහ ඇමතිතුමාගේ අභිමතය තිබෙන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහ ඇමතිතුමාගේ අභිමතය ඕනෑ නැහැ. ආණ්ඩුකාරවරයා වාර්තාවක් දුන්නාම මේක අත්හිටුවලා පාර්ලිමේන්තුවට බලය ගන්න පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

එහෙම ගන්නේ කොහොමද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කවුද කියන්නේ. කියවලා බලන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාව නොමග යවනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මෛත්‍රීපාල සේනානායකට එරෙහිව මහින්දසෝම නඩුවේ ඉතා පැහැදිලිව කියලා තිබෙනවා, මේ සියලු බලතල පාවිච්චි කරන්නේ මහ ඇමතිතුමාගේ අනුමැතියට යටත්ව කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අහගත්තාද?

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහ ඇමතිතුමාගේ අනුමැතිය අනුව එකක් විතරයි තියන්නේ. අනික් එක කියවන්න. (බාධා කිරීම්) පොඩ්ඩක් ඉන්න. කියන්න දෙන්න. එකක් විතරයි කියෙව්වේ. අනික් එක කියවලා බලන්න මොනවාද කියන්නේ කියලා. මහ ඇමතිතුමාගේ එකඟතාවය අනුව කියන්නේ එකක් විතරයි. ඊට පස්සේ තියෙනවා, පළාත් සභාවේ අක්‍රමිකතා තිබෙනවා නම්, මූල්‍යමය ප්‍රශ්න තිබෙනවා නම්, ඒකට කමිටුවක් පත් කරලා -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එහෙම නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම නැහැයි කියන්නේ ඕගොල්ලෝ නේ? දැන් බලය තිබෙන්නේ ඕගොල්ලන්ට නොවෙයි නේ? ආණ්ඩුකාරතුමාට, ජනාධිපතිතුමා ඕඩරයක් දුන්නොත් මේක ප්‍රශ්නයක් තිබෙනවාය කියලා වාර්තාවක් එවන්නය කියලා යවන්නේ නැද්ද? ඒකයි අපි කියන්නේ. මේ ඕනෑ වෙලාවක බලය තිබෙන කෙනෙකුට මේක විසුරුවන්න පුළුවන් කියලයි. මම කියන්නේ. හරි. ඔබතුමන්ලා එකඟව යවලා බලන්නකෝ මොනවාද වෙන්නේ කියලා. ඊට පස්සේ අපි කථා කරමු. තව මාස දෙකක් තුනක් ගියාට පස්සේ.

ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසි වන සංශෝධනය මගින් බලාපොරොත්තු වෙන්නේ මොනවාද කියලා අපි තේරුම් ගන්න ඕනෑ. අද මේ රටේ තිබෙන විශාලතම ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය තමයි, අද ආණ්ඩුව එක පැත්තක. ජනාධිපතිතුමා එක පැත්තක. පළාත් සභා අද වෙන පැත්තක තිබෙන්නේ. මේක තමයි ඇත්ත කථාව. ඇත්ත යථාර්ථය මේක. මේක පිළිගන්න බැරි නම් තමුන්නාන්සේලා බොරුවට මේක ගැන කථා කරන්න එපා. කවදාවත් මහින්ද රාජපක්ෂ ජනාධිපති වෙලා ඉද්දී වත් තමන්ගේ බලය පළාත් සභාවත්, පළාත් පාලන ආයතනත් තියා ගන්න හැදුවා මිසක්, දෙන්න හැදුවේ නැහැ කවුරුවත්. ඒකම තමයි මේ වෙන්න යන්නේ. ඒක තමයි යථාර්ථය. මේ ජනාධිපතිතුමා එක පැත්තක. රජය, ආණ්ඩුව එක පැත්තක. පළාත් සභාව වෙන පැත්තක. ඉතින් මේකේ දේශපාලන යථාර්ථය තමුන්නාන්සේලාට තේරුම් ගන්න බැරි නම් මට කරන්න දෙයක් නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒක ප්‍රජාතන්ත්‍රවාදය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේලා තව මාසයක් දෙකක් ගිහිල්ලා ඇවිල්ලා ආයිත් ඇවිල්ලා කියයි අනේ, ඇත්ත තමයි කිව්වේ කියලා.

මේක විසුරුවන්න ඕනෑ නම් මේක ඕනෑ ක්‍රමයකින් විසුරුවන්න පුළුවන්. බොරුවට නීති කථා කරලා වැඩක් නැහැ මෙතැන. ජනාධිපතිතුමාට හිතුනොත් හෙට මේක විසුරවන්න, විසුරවන්න පුළුවන්. එතුමාට ඕනෑ හේතුවක් දක්වන්න විතරයි. හේතුවක් දක්වන්න විතරයි ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙම විසුරුවන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හරි. මේක ඇරලා බලන්න කෝ මොනවාද කියන්නේ කියලා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ජනාධිපතිතුමා තමයි විසුරුවා හැරියේ. ඒක ආපහු -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නිකම් විසුරුවලා හරින්න බැහැ. හේතුවක් ඇතිව විසුරුවන්න පුළුවන්. මේකේ බලය පාර්ලිමේන්තුවට ගන්න පුළුවන් හේතුවක් ඇතිව. හේතුවක් හදා ගන්න එක මහ ලොකු දෙයක්ද? හේතුවක් හදා ගන්න බැරිද? ඒ නිසා මේකට මම එකඟයි. මොකද, මේ පළාත් සභාව ඇත්තටම - මේ පළාත් සභාවට මම හැමදාමත් විරුද්ධයි. ඇත්තටම මේ පළාත් සභාවෙන් වෙන දෙයක් නැහැ. මේක තනිකරම සුදු අලියෙක්. මේ සුදු අලියා රකින්න - මේ පළාත් සභා ක්‍රමය උතුරයි නැගෙනහිරයි සනසවන්න ගෙනාපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක්. ඒ ව්‍යවස්ථාව උතුරටයි නැගෙනහිරටයි විතරක් තියන්න බැරි නිසා මුළු රටේම තිබ්බා. අද මුළු රටේම මේ පළාත් සභා තියෙන්නේ ඒකයි. ඒක තමයි යථාර්ථය. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, තව විනාඩියක් දෙන්න. දැන් අපේ නීතිඥ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මම ඉතාමත් ගරු කරනවා. නීතිය හොඳින් දන්නවා. නමුත් දේශපාලන යථාර්ථයත් එක්ක අපි පොඩ්ඩක් හිතලා බැලුවොත්, නීතියට අනුවම දේශපාලනයත් ක්‍රියාත්මක වෙනවාද කියලා අපට තේරුම් ගන්න පුළුවන් මේ වෙන්න යන්නේ මොකක්ද කියලා. ඒ නිසා නීතිය පැත්තෙන්ම බලලා, දේශපාලනයත් එක්ක ඒකට අමුණා ගෙන ඔබතුමා කියනවා නම් මේක විසුරුවන්න බැහැයි කියලා. මම ඉතාමත් කනගාටු වෙනවා, ජනාධිපති නීතිඥවරයෙක් හැටියට. මහ ඇමතිතුමා අද ඔය කියවපු සංශෝධන, අරවා මේවා ඔක්කොම බොරු කථා. ගියාට පස්සේ ඕක පඩයකටවත් ගණන් ගන්නේ නැහැ. ඔය සංශෝධන ආණ්ඩුව පඩයකටවත් ගණන් ගන්නේ නැහැ. ආණ්ඩුවට ඕනෑ දේ තමයි ඊට පස්සේ ක්‍රියාත්මක වෙන්නේ. ආණ්ඩුවේ පාර්ලිමේන්තුවේ එන සංශෝධන විතරයි ක්‍රියාත්මක වෙන්නේ කියන එක මම ඉතාමත් පැහැදිලිව වගකීමෙන් කියනවා. ඒ නිසා කනගාටු වෙනවා, ඔය සංශෝධන ගෙන ඒම ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ යෝජනාව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මා වෙත කථික ලැයිස්තුවක් එවලා තිබෙනවා. කථිකයෝ 30 ක් ඉන්නවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමතිතුමා ඉදිරිපත් කරපු ලිපියේ කොපියක් නැතිව අපට කථා කරන්න විධියක් නැහැ. එහෙම නම් කොපිය එනකල් සභාව පොඩ්ඩක් කල් තියන්න. ඒකේ වගන්ති ටික අපි කියවලා බලන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේකේ බුද්ධිමත් පිරිසක් ඉන්නවා නේ? ඒක බෙදලා දීලා එපැයි ඔබතුමා මේක පටන් ගන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, විනාඩි පහකට කල් තබලා ඒක ලබා දෙන්න. දැන් මහ ඇමතිතුමා කියවපු එකේ කොපියක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොපියක් අපි දෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ. දුන්නේ නැහැ. එක්කෝ විනාඩි පහකට නතර කරලා ඒක සභාගත කරලා ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එකසිය ගණනක් ප්‍රින්ට් කරන්න ඕනෑ නේ? මෙහෙම යමු. ඒක ඉක්මණින් එවන්නම්. දැනට මේ ටික යමු. ඒ නිසා මම ඉතාමත් ගෞරවයෙන් කථික ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, නියමිත වෙලාවට කථාව අවසන් කරන්න. පස්වරු 2.30, 3.00 පමණ වෙයි මේක ඉවර කරන කොට. කොහොමත් සවස 3.00 විතර වෙනවා. ප්‍රශ්නයක් නැහැ. දිවා ආහාරය ලැහැස්ති කරලා තිබෙන්නේ. ආණ්ඩු පක්ෂයෙන් මම රජිත හපුආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා. පසුගිය කාල සීමාව පුරාම රටේ ආන්දෝලනයකට තුඩු දුන්න, විශේෂයෙන්ම පළාත් සභාවන් තුළ ආන්දෝලනයකට තුඩු දුන්න මේ විසි වන ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් නවක මන්ත්‍රීවරයෙකු විධියට, පසු පෙළ මන්ත්‍රීවරයෙකු විධියට අදහසක් පළ කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ පනත මේ සංශෝධනය දිහා බලපුවාම මේ සංශෝධනයේ ප්‍රධාන කරුණු කිහිපයක් තිබෙනවා. පළාත් සභාවක් විධියට අපට 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අපට හිමි වුණු බලය ආපසු පාර්ලිමේන්තුවට පවරා ගැනීමේ දෙයක් මේ තුළ ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම අපි ගත්තාම මෙතෙක් කාලයක් අපි දන්නවා. පළාත් සභාව විසුරවීමේ බලය තිබුණේ ගරු ආණ්ඩුකාරතුමාගේ ඉල්ලීම පරිදි. ඒ වාගේම මහ ඇමතිතුමාගේ අභිමතය පරිදි තමයි පළාත් සභාව විසුරවීමේ - මෙතුමන්ලා වෙන කථාක්. සභාවේ තවත් කථාවක්. ඒ නිසයි මම නිහඬ වුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය සාකච්ඡාවලට යන්න එපා. එතුමාට අවස්ථාව දෙන්න. ඔබතුමා කථා කරන්න.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, දැන් මේ බලය, පළාත් සභාවට තිබුණු බලය තමයි අද පාර්ලිමේන්තුවට පවරා ගන්න හදන්නේ. එතකොට එක පැත්තකින් මහ ඇමතිතුමාගේ අභිමතය පරිදි, ආණ්ඩුකාරතුමාගේ ඉල්ලීම පරිදි කරන්න අවස්ථාව තිබුණා. අනික් පැත්තෙන් පළාත් සභාවේ ධූර කාලය අවසන් වූ දිනයක මැතිවරණ කොමිෂන් සභාව හෝ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නම් කරන දිනයකදී මැතිවරණය පැවැත්වීමේ හැකියාව තිබුණා. නමුත් අද මේ ගෙනැල්ලා තිබෙන සංශෝධනය යටතේ ගරු සභාපතිතුමනි, මේක යටතේ සිද්ධ වෙන්නේ ඒ තිබුණු බලතල දෙකම, එක පැත්තකින් මැතිවරණ කොමසාරිස්වරයාට තිබුණු ඒ බලයත්, අනික් පැත්තෙන් පළාත් සභාවක් විධියට මහ ඇමතිවරයාට, ආණ්ඩුකාරවරයාට තිබුණු බලයත් අනික් පැත්තෙනුත් ප්‍රජාතන්ත්‍රවාදී නොවන ක්‍රමයකින් අද පාර්ලිමේන්තුවට පවරා ගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පළාත් සභාවක මන්ත්‍රීවරු විධියට, පළාත් සභාවක් විධියට අපට එකඟතාවයකට එන්න පුළුවන්කමක් නැහැ. ඒ තමයි පළමුවැනි කාරණාව.

ඊළඟ කාරණාව ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාව විසුරුවායින් පස්සේ පළාත් සභාවේ කටයුතු කර ගෙන යාමේ, ඒ පරිපාලන බලය නැවතත් පාර්ලිමේන්තුවට පවරා ගන්න පුළුවන් කියන වගන්තියක් මේ යෝජනාව ඇතුළේ තිබෙනවා. එතකොට ඒ කියන්නේ පළාත් සභාව යම්කිසි නිශ්චිත දවසකට තියන තුරු කිසියම් ඕනෑම දවසක මේක

විසුරුවා හරින්න පාර්ලිමේන්තුවට අපි බලය දීලා තිබෙනවා. එහෙම විසුරුවා හැරියායින් පස්සේ ඒ අතරතුර කාලය - ගරු සභාපතිතුමනි, කථා කරලා වැඩක් නැහැ නේ? කාටද මේ කථා කරන්නේ. මන්ත්‍රීවරු එක දිහාවක. සභාපතිතුමන්ලා තව කථාවක්. කාටද මේ කථා කරන්නේ අපි. මොකටද මේ කථාව? ගරු සභාපතිතුමනි, මේ පරිපාලනය කිරීමේ බලයත් අපි බන්දේසියක තියලා ආපහු පාර්ලිමේන්තුවට දෙනවා. එතකොට මේ පාර්ලිමේන්තුවට දීම ඇතුලේ අපි පළාත් සභා මන්ත්‍රීවරු විධියට, පළාත් සභාවක් විධියට නිවටයෝ වෙන්නයි මේ හදන්නේ. එතකොට ඒක අපට පෙනි පෙනී, අපි ඒක දැක දැක අපට කිසිසේත් පුළුවන්කමක් නැහැ මේකට අපේ අනුමැතිය, අපේ කැමැත්ත ප්‍රකාශ කරන්න.

ඊළඟට ගරු සභාපතිතුමනි, අපි අවසානයෙන් මේක කල්පනා කරලා බැලුවාම - දැන් ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වේ මේ ඡන්දයක් ඉක්මණින් තියන්න තමයි මේ පනත ගේන්නේ කියලා. හැබැයි, මේක අධ්‍යයනය කරලා බලපුවාම අපට තේරෙනවා, මේකේ මේ ඡන්දයක් තිබීමේ අවශ්‍යතාවය නොවෙයි තිබෙන්නේ. දැන් ඉදිරියේදී පළාත් සභා තුනක ධූරකාලය අවසන් වීමට නියමිතයි. එතකොට ඒ ධූර කාලය අවසන් වෙන්න තිබෙන පළාත් සභාවල ඡන්දය නොතියා ඒවා තවදුරටත් ඉදිරියට අරගෙන ගිහිල්ලා යම්කිසි නිශ්චිත දවසකදී, පාර්ලිමේන්තුව තීරණය කරන දවසකදී ඡන්දය තියන්න තමයි මේ උවමනාව. ඒ කියන්නේ මේක කල් දා ගැනීමේ උවමනාවක් තමයි අද තිබෙන්නේ.

අද අපි බලමු ගරු සභාපතිතුමනි, කාටද මේ ඡන්දය කල් දා ගන්න උවමනා වෙලා තිබෙන්නේ කියලා. අද මේ ඡන්දය කල් දා ගන්න, මට හිතෙන්නේ මේ එක්සත් ජාතික පක්ෂයට ලොකු උවමනාවක් නැහැයි කියන එකයි මගේ පුද්ගලික මතය. මොකද, පක්ෂයක් විධියට ඒගොල්ලෝ ආණ්ඩු පක්ෂයේ ඉන්නේ. ආණ්ඩු පක්ෂයක් විධියට ඒගොල්ලෝ වැඩ කර ගෙන යනවා. ඒ නිසා ඒගොල්ලන්ට ඡන්දයකට මුහුණ දීමේ හැකියාවක් තිබෙනවා. හැබැයි, අද මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ තිබෙන අර්බුදය ඇතුළේ මේ කණ්ඩායම් දෙකකට බෙදුනාට පස්සේ එක කණ්ඩායමක් ඡන්දයකට ලැහැස්තියි. ඒකාබද්ධ විපක්ෂය ප්‍රමුඛ කණ්ඩායමක් වෙන පක්ෂයකින් ඡන්දයට ඉදිරිපත් වෙන්න ලැහැස්තියි. හැබැයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අද ගැටළුවක් තිබෙනවා, ඡන්දයකට යන්න. ඡන්දයකට ගියොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කොතැනටද එන්නේ කියන එක පිළිබඳව ගැටළුවක් තිබෙනවා. ඒ නිසා අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තමයි අනියමින් හරි මේ උවමනා වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ප්‍රධාන ඒ මෛත්‍රී පිලේ කණ්ඩායමට තමයි අද උවමනා වෙලා තිබෙන්නේ ඡන්දය කල් දා ගන්න. ඒ නිසා අපි ඒකට ඉඩ දෙනවාද කියන එක පිළිබඳව අපට යම්කිසි ගැටළුවක් තිබෙනවා. මොකද, අපට අවශ්‍ය ඡන්දයක්. දැන් අද රටේ එදා ජනවාරි මාසේ අට වැනිදා දීපු ඒ ජනමතය අද වෙනස් වෙලා තිබෙනවා. ඒ ජනමතය වාගේම පාර්ලිමේන්තු මැතිවරණය - අගෝස්තු මාසයේදී ජනතාව දීපු මතය අද වෙනස් වෙලා තිබෙනවා. ඒ සංයුතිය අද පාර්ලිමේන්තුවේ විකෘති වෙලා තිබෙනවා. ඒ නිසා අද ජනතාව බලාගෙන ඉන්නවා කිසියම් හෝ ඡන්දයක් ජනතාවට ලැබෙන තුරු. ඒ මේ ජනතාවගේ කැමැත්ත, මතය ප්‍රකාශ කරන්න. ඒ තිබෙන අවස්ථාව තමයි ගරු සභාපතිතුමනි, මේ අහුරන්න හදන්නේ. ඒ නිසා අපි ඒකට විරුද්ධයි. අපි ඒකට කැමැති නැහැ.

නමුත් දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි. මේක අපි සියලු දෙනාම පිළිගන්නවා. මේ සංශෝධනය හරහා අපේ තිබෙන බලතල ආපසු පවරා ගන්නවාය කියලා. අපි හැමෝම මේකට විරුද්ධයි. අපේ හෘදය සාක්ෂියට එකඟව අපි කල්පනා කරලා බැලුවොත් අපි සියලු දෙනාටම මේකට පක්ෂ වෙන්න පුළුවන්කමක් නැහැ. හැබැයි, අපි අපේ දේශපාලන මති මතාන්තරත් එක්ක, අපේ නායකයෝ කියන දේවලුත් එක්ක, අද මේකට අපි මතයක් ප්‍රකාශ කරන්නේ නැතිව - ගරු සභාපතිතුමනි, අපි මතයක් ප්‍රකාශ කරන්නේ නැතිව මේක ආපහු යවන්නයි මේ හදන්නේ. ජනාධිපතිතුමා අපෙන් ඉල්ලලා තිබෙන්නේ, එතුමාගේ ඒ යෝජනාවට අපේ මතය කියන්න කියලා. අපි එකඟද විරුද්ධ ද කියන්න. නමුත් අපි ඒක කියන්නේ නැතිව අද අපි වෙනත් යෝජනාවක් ආපසු ජනාධිපතිතුමා වෙත අරිනවා. හැබැයි, මේ පළාත් සභා ඉතිහාසයේ අපි කල්පනා කරලා බැලුවොත්, මේ පළාත් සභාවේ අපි කරපු යෝජනාවක් පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක කළේ කවදාද? අපි කොතෙකුත් යෝජනා මේ සභාව ඇතුළේ කරනවා. ඒ කරන යෝජනාවලට හඬක් නැහැ. මතයක් නැහැ. ඒවා මේ බිමේ, මහ පොළොවේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක තමයි ප්‍රායෝගික ඇත්ත. එතකොට ඒ ඇත්ත අපි දැක

[ගරු රජිත හපුආරච්චිගේ]

දැක, අපි ආපහු මේ අපේ යෝජනාවක් ජනාධිපතිතුමාට යැව්වා කියලා, පාර්ලිමේන්තුවට යැව්වා කියලා ඒ මතය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඉතින් එහෙම වටපිටාවක් ඇතුළේ අපි දැන දැනත්, අපව සනසා ගන්න හදනවා. අපි මේකට විරුද්ධව ඡන්දය දුන්නේ නැහැ. අපි මේකට මතයක් ප්‍රකාශ කළේ නැහැයි කියලා අර ජනාධිපතිතුමා මහ ඇමතිතුමාට කියපු, ඒ කරපු ඉල්ලීම ඉෂ්ට කරන්න තමයි අද අපි මේ සියලු දෙනාම හදන්නේ. සියලු දෙනාම හදන්නේ ඒක. කැමැත්තෙන් හරි අකමැත්තෙන් හරි. නියමින් හරි අනියමින් හරි අපි මේ කරන්න හදන්නේ, ඒ අවශ්‍යතාවය ඉෂ්ට කරන්න. මේ ආණ්ඩුව ඇතුළේ තිබෙන අර්බුදය වහ ගන්න, ඒ අවශ්‍ය කරන වට පිටාව නිර්මාණය කරලා දෙන්න තමයි අපි මේ හදන්නේ. ඒ නිසා මන්ත්‍රීවරයෙකු විධියට මම මේකට විරුද්ධයි. මගේ විරෝධතාවය මේකට තිබෙනවා. නමුත් අපට තිබෙන ගැටළුව තමයි, දැන් අපි සියලු දෙනා එකට එකතු වෙලා මට තේරෙනවා, මේ යන්නේ මේක මොකුත් - අපට කැවුම් එවන්නය කිව්වාම ගරු සභාපතිතුමනි, අපි කොකිස් අරින්නයි හදන්නේ. එවන්න කිව්වේ කැවුම්. අපි කොකිස් අරිනවා. වැඩක් නැහැ. අපේ මතය පාර්ලිමේන්තුවේදී සලකා බැලීමක් නැහැ. පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධයෙන් අපේ මතය තමයි, අපට මතයක් නැහැයි කියන එක. මොකද අපි මතයක් එකඟද? නැද්ද? කියලා අරින්නේ නැහැ. එකඟද නැද්ද කියලා මතයක් නැහැ. ඒ කියන්නේ අපට මතයක් නැහැ. ඒ නිසා මේ සංශෝධනයට අදාළව අපේ මතය සලකා බැලීමක් අදාළ වන්නේ නැහැ.

ඒ නිසා මම හිතන්නේ, අපි පළාත් සභා මන්ත්‍රීවරු විධියට ඉතිහාසයේ ලොකු වැරැද්දක් කරන්නයි හදන්නේ. අපට තිබෙන බලය අපි හිතාමතාම කැමැත්තෙන්ම ආපසු පාර්ලිමේන්තුවට දෙන්නත්, මෙතෙක් කාලයක් ජනාධිපතිවරයාට, ඒ වාගේම ආණ්ඩුකාරවරයාට, මහ ඇමතිවරයාට තිබුණු බලය අද පාර්ලිමේන්තුවට දීලා, පාර්ලිමේන්තුවෙන් අගමැතිවරයාට ඒක පවරන්න හදන්නේ. මේ අනියමින් කරන්න හදන්නේ එක්සත් ජාතික පක්ෂයට ඒ අවශ්‍ය කරන බලය පළාත් සභාවට අදාළව අපි නිර්මාණය කරලා දෙන්න. ඉතින් ඒකට අපි හවුල් වෙනවාද කියන එක අපට ලොකු ගැටළුවක්ව තිබෙනවා. ඒ නිසා ඒ වැරැද්ද කරන එක සම්බන්ධයෙන් අපි නැවත වරක් කල්පනා කරලා බලන්න ඕනෑය කියන එක තමයි මගේ මතය ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ කථික ලැයිස්තුවේ මම හිතන්නේ 30 කට ආසන්න සංඛ්‍යාවක් තිබෙනවා. ඒ නිසා තමන්ගේ කථාව සීමා කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. මීළඟට තෙබුවන පියනන්ද ස්වාමීන් වහන්සේට අවස්ථාව ලබා දෙනවා.

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව අදහස් ප්‍රකාශ කරන මේ වෙලාවේ ඉතාම කෙටියෙන් මතක් කරන්න තිබෙන්නේ, මේ සංශෝධනයේ වැඩි කොටසකට පෞද්ගලිකව මම විරුද්ධයි කියන කාරණයයි. මහ ඇමතිතුමා ප්‍රකාශ කරපු පරිදි එක දවසේ සියලු පළාත් සභාවල ඡන්දය පැවැත්වීම කියන කාරණය අපි එකඟ වන මතයක්. මොකද, පසුගිය කාලයේ අපි දැක්කා, මහජන මතය උරගා බැලීම සඳහා තමයි විටින් විට පළාත් සභාවෙන් පළාත් සභාව ඡන්ද පැවැත්වීම සිද්ධ කළේ. ඒකේදී ලොකු අගතියක් සිද්ධ වුණා. සමහර විට පළාත් සභාවක ඡන්දය පැවැත්වූවාම ඒ පවත්වන ප්‍රතිඵලය අනුව ඊළඟට පවත්වන ඒවා කෙරෙහි ඉන් බලපෑමක් යම් ආකාරයකින් සිද්ධ වුණා. ඒ නිසා එක දිනයක සියලු පළාත් සභාවල ඡන්දය පැවැත්වීම කියන මතයට අපි එකඟයි. නමුත් ඉතිරි කොටසින් සිද්ධ වන්නේ සියතින් ගෙල සිඳ ගැනීමක් කියන එකයි මගේ කල්පනාව. මොකද, මෙතෙක් අපි ස්වාධීනව කටයුතු කළා. විශේෂයෙන්ම ආණ්ඩුකාරවරයාගේ කැමැත්ත පරිදි පළාත් සභාවේ කාලය තීරණය කිරීම පිළිබඳ

කාරණය. නමුත් ඒ තත්ත්වය, ඒ මතය නැත්නම් ඒ තීරණ ගැනීමේ හැකියාව පාර්ලිමේන්තුව සතු කර ගැනීම මේ පනත හරහා සිද්ධ කෙරෙනවා නම්, ඒකට අපට කිසිසේත් එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, දැන් පැහැදිලිවම අපි දන්නවා 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඒක පටහැනියි කියන කාරණය. මොකද, පළාත් සභාවලට ස්වාධීනව කටයුතු කරන්න තිබෙන බලයක් නැවත පාර්ලිමේන්තුව සතු කර ගැනීම සඳහා තමයි ඒ හරහා ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා මේ සංශෝධනය පිළිබඳව අපට එකඟතාවය පළ කරන්න පුළුවන්කමක් නැහැ. නමුත්, දැනට පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු මේ පිළිබඳව ප්‍රකාශ කරන මත සහ විවිධ අදහස් දිහා බැලුවාම අපට අතරමං වෙන තත්ත්වයකට පත් වෙන්න සිද්ධ වෙලා තිබෙනවාය කියන එකයි මට පැහැදිලි වෙන්නේ. මොකද, සමහරවිට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අතරම මේ පිළිබඳව විවිධ මතිමතාන්තර තිබෙන බව පේනවා. ඒ නිසා එහෙම ගැටලු සහගත තත්ත්වයක් මතු වෙනවා නම්, අපට මේ පිළිබඳව ස්වාධීන තීරණයකට එළැඹීමේ හැකියාව තිබෙන්නට ඕනෑ. ඒ අනුව ඉදිරියේදී එළැඹෙන තත්ත්වය මත කටයුතු කරන්න බලාපොරොත්තු වන බව මේ වෙලාවේදී ප්‍රකාශ කරනවා.

ඉතාම කෙටියෙන් සඳහන් කරන්න තිබෙන්නේ, මේ සිද්ධ වෙන සියලු දේවල් දිහා බැලුවාම අර අපේ පැරණි සංස්කෘත කියමනක් තිබෙනවා, "*විනාශ කාලේ ළං වුණාම බුද්ධිය විපරීත වෙනවා*" කියලා. ඉතින් ඒ නිසා එබඳු විපරීත බුද්ධියකින් කටයුතු කරන්නේ නැතිව හැමදෙනාගේම ආරක්ෂාව, රැකවරණය ඇතිවන විධියට ප්‍රධාන වශයෙන් පළාත් සභාවේ ගරුත්වය - බස්නාහිර පළාත් සභාව අපේ රටේ පාර්ලිමේන්තුවට පමණක් දෙවැනි වන ප්‍රධාන ආයතනය. ඒ නිසා පළාත් සභාවේ ගරුත්වය ආරක්ෂා වන විධියට සුදුසු පරිදි ඒ තීරණය ගැනීම තමයි මම හිතන්නේ, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ වගකීම විය යුත්තේ. ඒ නිසා පළාත් සභාවේ ගරුත්වය තව කෙනෙකුට පාවා නොදී අපේ ස්වාධීනත්වය ආරක්ෂා වන විධියට කටයුතු කරන්න හැම මන්ත්‍රීවරයෙක්ම අදහස් කරගන්න කියන කාරණය විශේෂයෙන් මතක් කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. හැම දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංශෝධනයක් ගෙන එනවා නම් සංශෝධනයෙන් බලාපොරොත්තු වන්නේ පවතින ක්‍රමවේදයට හෝ සමාජයේ පවතින ප්‍රශ්නයකට විසඳුමක් ගේනවා කියන එක. හැබැයි, ඒ සංශෝධනයෙන් බලාපොරොත්තු වෙන්නේ දේශපාලන වාසියක් ගන්න නම්, මම හිතන්නේ නැහැ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක්, සදාචාරාත්මක සමාජයක් ඒකට සහාය දෙයි කියලා. ඒ නිසා අපි මේ ප්‍රස්තුථ කාරණය ගැන කථා කරන්න ඕනෑ, ඉතිහාසය දිහාත් මේ ක්‍රමවේදය ගලාගෙන ආපු විධිය දිහාත් සාධාරණ පරීක්ෂණයකට, විශ්ලේෂණයකට ගිහිල්ලා. මේ පළාත් සභා ක්‍රමය ගේන්නේ ඇයි? අපේ ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා කිව්ව කථාවේ පොඩි ඇත්තක් තිබෙනවා. මොකක්ද? පළාත් සභා ක්‍රමය ගේන්නේ මේ රටේ වෙනම දේශපාලන පරිපාලන ව්‍යූහයක් ඇති කරන්න. ඒක අපට ඇත්තටම අත් දකින්න, අත් විඳින්න පුළුවන් වුණාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒක වෙන කතන්දරයක්. හැබැයි, මේක අද ගෙවී ගිය දශක තුනකට ආසන්න කාලය තුළ, පරිපාලන ව්‍යූහයක් තුළ පළාත් සභා අපේ රටේ සාර්ථකව ක්‍රියාත්මක වුණා කියන එකයි මගේ පෞද්ගලික මතය. ඒක මගේ විශ්ලේෂණය. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා මෙදා තුර, මේ දශක තුනකට ආසන්න කාලය තුළ මේ රටේ තිබුණු කිසිම ආණ්ඩුවකට බැරි වුණා, පළාත් සභා සියල්ල රට පුරා එකවර පවත්වන්න. මේක උත්තරය, කාරණය වෙන්න පුළුවන්. වෙනත් කාරණා වෙන්න පුළුවන්. දේශපාලන කාරණා වෙන්න පුළුවන්. විශේෂයෙන් දේශපාලන කාරණා. ඒ නිසා පළාත් සභා ඡන්ද ටික එක දවසක තියන්න අපට බැරි වුණා. මෙන්න මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. මේක තමයි සැබෑ ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ජාතක කරපු අයත්, මේක පෝෂණය කරපු අයත්, මේක විනාශ කරන්න හදපු අයත් මේ කිසි කෙනෙක් මේ පළාත් සභා ඡන්දය එක දිනක තියන්න සාකච්ඡා කළේවත්, එකඟතාවයකට ආවේවත් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොකක්ද වුණේ? රාජ්‍ය බලය යොදවලා, මැර බලය යොදවලා, නීතිය අවභාවිත කරලා මේ රටේ ජනතාවගේ පරමාධිපත්‍ය බලය හැම ආණ්ඩුවක්ම කොල්ල කෑවා. මේක තමයි ඇත්ත. අපි කැමැති වුණත්, අකැමැති වුණත් මේකට අපි මුහුණ

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

දෙන්නම ඕනෑ. ඒක නිසා එකම දිනයේ පළාත් සභා ඡන්දය පැවැත්වීම පිළිබඳව කිසි කෙනෙකුට තර්කයක් නැහැ. මම විශ්වාස කරනවා, මගේ සහෝදර මන්ත්‍රීවරු සියලු දෙනාත් ඒකට අත උස්සයි කියලා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ සැබෑ අරමුණ, මේ විසි වැනි සංශෝධනයේ සැබෑ අරමුණ එකම දිනයක ඡන්දය පැවැත්වීම නම් ඉතාම පැහැදිලිව අපි ඒකට එකඟයි. ගරු මහ ඇමැතිතුමා කිව්ව කාරණා පිළිබඳව අපට එකඟතාවයකට එන්න පුළුවන්. එක වෙන්න පුළුවන්. නමුත් මේකෙන් බලාපොරොත්තු වන වෙනත් දේශපාලන වාසියක් ආණ්ඩුවට තිබෙනවා නම් මේ පළාත් සභාව නියෝජනය කරන, මේකේ කොටස් කාරයෝ හැටියට ඉන්න අපට ඒකට එකඟ වෙන්න බැහැයි කියන එක මම අවධාරණය කරන්න කැමැතියි.

එහෙම නම් මේ පළාත් සභා සඳහා ගෙනෙන මේ සංශෝධනය පැහැදිලිවම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අපි කියන්න ඕනෑ, මේකේ අරමුණ සහ සැබෑ අවශ්‍යතාවය විය යුත්තේ ක්‍රියාත්මක වන පළාත් සභා සඳහා පමණක්ම ලෙස මේ සංශෝධනය ගෙන ඒමයි කියන එක මා දැඩි ලෙස අවධාරණය කරනවා. නමුත් මෙතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මේ ප්‍රශ්නය මොකක්ද? මේ ප්‍රශ්නය තමයි, දැන් මේ ආසන්නයේදී විසුරුවා හැරීමට නියමිත පළාත් සභාවලට මොකද වෙන්නේ කියන එක. ඒ කියන්නේ අන්තර් කාලයක් ගොඩනැගෙනවා. මේ අන්තර් කාලය ඇතුළේ පළාත් සභාව පාලනය කරන්නේ කවුද? මේ අන්තර් කාලය ඇතුළේ පළාත් සභා පාලනය කිරීමේ බලය පාර්ලිමේන්තුවට යන එක මේ සංශෝධනය හරහා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වළක්වන්න බැහැ. එහෙමනම් මොකද වෙන්නේ? 1978 ව්‍යවස්ථාවේ තිබුණු නොනැමුණු බලය - මේ නොනැමුණු බලය කියන්නේ මොකක්ද? 1978 ව්‍යවස්ථාවේ නොනැමුණු බලයක් තිබෙනවා. ජනාධිපතිවරයාගේ නියෝජිතයා හැටියට ආණ්ඩුකාරවරයා හරහා පළාත් සභාවලට ලැබුණු බලයක් තිබෙනවා. ඒ බලයට මොකද වෙන්නේ? ඒ බලය පාර්ලිමේන්තුව සතුවීම වළක්වන්න බැරි වෙනවා. මේක තේ මේකේ හරය. ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා, මේක තේ මේ හරය. එහෙමනම් මේකට අපි එකඟ වෙනවාද? මෙන්න මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. මෙන්න මේ බලයට හානි කරන්න එකඟ වෙනවාද? ඒ නිසා මන්ත්‍රීවරු නැති පළාත් සභාවක් ඇතුළේ පාර්ලිමේන්තුවට බැරිද ඕනෑ දෙයක් කරන්න. කරන්න පුළුවන්. එහෙම නම් අපි මේකට ඉඩ දෙනවාද? ජනාධිපතිවරයා හරහා පළාත් සභාවට ලැබුණු ඒ සුවිශේෂ නොනැමුණු බලය අපි ආපසු දෙනවාද කියන ප්‍රශ්නය මෙතැන ගොඩනැගෙනවා. සමහර වෙලාවක මේ පළාත් සභාව විසුරුවා හැරියාට පස්සේ මේ ආණ්ඩුව අස්ථාවර වුණොත් මොකද වෙන්නේ? මේ ආණ්ඩුවට ඕනෑ විධියට අනික් පළාත් සභා සියල්ලම තමන්ගේ යටතට අරගෙන ගිලටීනයට තල්ලු කිරීම වළක්වන්න බැහැ. ඒක නිසා මේක බරපතළ තත්ත්වයක්. ඒක නිසා මේකට අපට සීමා පනවා ගන්න වෙනවා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා කිව්වා වාගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

එහෙමනම් දැන් මේ සංශෝධනයේ අපට නොපෙනෙන අනතුරු ගැන අපි කථා කරන්න ඕනෑ. මේ නොපෙනෙන අනතුර ගැන කථා කරලා අපට ලැබිලා තිබෙන මේ සුවිශේෂී බලය ආපසු දෙනවාද කියන තීරණයට එන්න ඕනෑ. ඒ නිසා මේ සැකය සාධාරණයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි සියලු දෙනා තුළ තිබෙන සැකය සාධාරණයි. මුළු රට පුරාම පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සිත්වල තිබෙන සැකය අතිශය සාධාරණයි. මොකද, අපි කැමැති වුණත් අකැමැති වුණත් පළාත් සභා ක්‍රමය පරිපාලන ව්‍යුහයක් හැටියට මේ රටේ ස්ථාපිත වෙලා ඉවරයි. අපි ඒකේ කොටස්කාරයෝ. අපි ගමට ගියාම දකිනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා එයාගේ අනන්‍යතාවය තියාගෙන එයාගේ කටයුතු කරගෙන යනවා. පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපි අපේ අනන්‍යතාවය තියාගෙන කටයුතු කරගෙන යනවා. එයාලා අපේ වැඩේට බාධා කරන්නෙත් නැහැ. අපි ඒගොල්ලන්ගේ වැඩේට බාධා කරන්නෙත් නැහැ. නමුත් මේකෙන් මොකද වෙන්නේ? අපි මේ අසාමාන්‍ය බලය පාර්ලිමේන්තුවට පැවරුවොත් මේකෙන් වෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ඉස්සරහා අපි අපේ ගමේ පළාත් පාලන ආයතනවල ප්‍රාදේශීය සභාවේ, නගර සභාවේ, මහ නගර සභාවේ මන්ත්‍රීවරයාටත් වඩා පල්ලෙහාට වැටෙන එකයි. මේක තමයි ඇත්ත. මේ අමැතිවරුන්ට මේ මන්ත්‍රීවරු කැමැති නැහැ. ඒ නිසා තමයි මේ අය මේකට විරුද්ධ වෙන්නේ. ඒ නිසා අනන්‍යතාවය රැක ගනිමින් එක්තරා දිශාවකට මේ පළාත් සභා ක්‍රමය දශක තුනකට ආසන්න කාලයක් ගමන් කළා. ඒක කිසිසේත්ම දියාරු වෙන්න ඔබත්, මමත් ඉඩ නොදෙන බව ඉතාම පැහැදිලියි. ඒ නිසා ගරු නියෝජ්‍ය

සභාපතිතුමනි, පැහැදිලිව අපි බොහොම පරිස්සමෙන් ජනතාව වෙනුවෙන් කරපු සේවය අපි අතින් ගිලිහිලා යන්න ඉඩ නොදිය යුතුයි කියලා මම මේ සභාව හමුවේ අවධාරණය කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එකක් තිබෙනවා. එකම දිනක ඡන්දය පැවැත්වීම. මේක අතිශය වැදගත් දෙයක්. වංචාව, දූෂණය සියල්ල වළක්වන්න පුළුවන්. නාස්තිය වළක්වන්න පුළුවන්. බලය අවභාවිත කරන එක වළක්වන්න පුළුවන්. එකම දිනයක ඡන්දය පැවැත්වීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකමක් ඡන්දයකට දෙන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම රටේ ප්‍රජාතන්ත්‍රවාදයට වැදගත්ම සංශෝධනයක් විධියට මේ සංශෝධනය දකින්න පුළුවන්. හැබැයි, පැහැදිලිවම කියන්න ඕනෑ. මේක එකම දිනක ඡන්දය පැවැත්වීමේ සංශෝධනය ඉදිරියේදී එන පළාත් සභා ඡන්දයට පමණක් සීමා වෙලා සිදු කළ යුතුයි කියන දැඩි ස්ථාවරයේ මා සිටින බව කියන්න ඕනෑ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට පැහැදිලියි. මේ සංශෝධනය හරහා යම් දේශපාලන වාසියක් ගන්න හදනවා වෙන්න පුළුවන්. එක්තරා පුවත්පතක තිබෙනවා මම දැක්කා. විග්නේෂ්වරන් වාගේම ඉසුර දේවප්‍රියත් පළාත් සභා රැක ගන්න ඉදිරියට ඒම හොඳ ප්‍රවණතාවයක් කියලා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගෙනාපු යෝජනාව ඉතාම හොඳයි. හැබැයි, ඒ යෝජනාව ඵල දරයිද? ඒ යෝජනාව වටිනාකමක් තිබෙයිද? ඒ යෝජනාව සැබෑ යෝජනාවක් හැටියට මේ සංශෝධනවලට එකතු වෙයිද? කියන සැකය අපට තිබෙනවා. ඒ ගැන විශ්වාසයක් අපට නැහැ. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දැඩි ලෙස විශ්වාස කරන දේ තමයි, අපි පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියට, මේකේ කොටස්කාරයෝ, නියෝජිතයෝ හැටියට ජනතාවට සමීප මන්ත්‍රීවරු හැටියට අපි පළාත් සභා ක්‍රමය රැක ගැනීම සඳහා මේ අවස්ථාවේදී බෙදීමක් නැතිව එකට සිටිය යුතුයි කියන දැඩි ස්ථාවරයක මම ඉන්නවයි කියන එක මතක් කරමින්, ඔබ සියලුදෙනාගෙන් සමුගන්නවා. ස්තුතියි.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව බස්නාහිර පළාත් සභාවේ මතය විමසලා අතිගරු ජනාධිපතිතුමා විසින් එවලා තිබෙන යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අන්තර්ගතය මොකක්ද කියන එක පිළිබඳව අපි මුලින්ම අවධානය යොමු කරන්න ඕනෑ. මේ සංශෝධනය දැක්කාම මුලින්ම අපට පේන්නේ ප්‍රධාන තැන් දෙකකට සංශෝධනයක් සිදු වෙලා තිබෙනවා කියලා. විශේෂයෙන්ම පළාත් සභා ඡන්ද විමසීම සහ පළාත් සභාවක් විසුරුවා හැරියාට පස්සේ බලය පාර්ලිමේන්තුවත් එක්ක කේන්ද්‍රගත වීමක් පිළිබඳව තමයි මේ පනතේ මූලික සංශෝධනයන් දෙක ලෙස ගෙනැල්ලා තිබෙන්නේ. මේ සංශෝධනයන් දෙක පිළිබඳව බැලුවාම 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටවනු ලැබූ පළාත් සභාවක, පළාත් සභාව සතුව කරලා තිබෙන බලය මේ වන කොට කොතැනට ගෙනෙන්න කටයුතු කරනවාද කියන එක පිළිබඳව තමයි අපට මේ භය ඇති වෙලා තිබෙන්නේ. විශේෂයෙන් අපට පෙනෙන්නේ මේ මොන සංශෝධන ගෙනාවත් මේ ආණ්ඩුවේ මූලිකම අරමුණ වෙලා තිබෙන්නේ මේ සංශෝධන නොවෙයි. මේ මාසයේ අවසානයේ, ලබන මාසයේ මුල පළාත් සභා තුනක් විසිරෙනවා. වයඹ පළාත් සභාව, උතුරු මැද පළාත් සභාව සහ නැගෙනහිර පළාත් සභාව කියන පළාත් සභා තුනේ කාල සීමාව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සබරගමුව පළාත් සභාව.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

සබරගමුව පළාත් සභාවේ කාලය මේ මාසය අවසන් වෙන කොට අවසන් වෙනවා. මේ ආණ්ඩුව අද වන විට මැතිවරණ ටික කල් දාලා දැන් අවුරුදු තුනකට ආසන්න කාලයක් ඇවිල්ලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා මේ සූදානම් වෙන්නේ, මේ පළාත් සභා මැතිවරණ තුනත් කල් දාගන්නයි. මොකද, මේ ආණ්ඩුව මැතිවරණවලට මුහුණ දෙන්න විශාල භයකින් ඉන්නේ. ජනතාවට වුණු පොරොන්දු ටික ඉෂ්ට කරගන්න බැරිව, ජනතාව අතරට යාගන්න බැරිව, ජනතාව සම්පූර්ණයෙන් කබලෙන් ලිපට ඇදලා දාලා, ජනතාව නන්නත්තාර කරලා තිබෙන ආණ්ඩුව මැතිවරණවලට තිබෙන බිය නිසා අද

[ගරු ජනක වැලිවත්ත]

ඒ මැතිවරණ බිය වහගන්න තමයි මේ පනත ගෙනත් තිබෙන්නේ. ඇත්තටම මේක ගේන්න මේ ආණ්ඩුවට උවමනාවක් තිබුණා නම්, මෙච්චර කල් තටම තටම ඉන්න ඕනෑ නැහැ. මේ ආණ්ඩුව අරගෙන තව මාස තුනකින් අවුරුදු තුනක් වෙනවා. මේ අවුරුදු තුනට ඉස්සෙල්ලා මේක ගේන්න තිබුණා. පළාත් සභා ටික එනවා කියලා දන්නවා. මේ පළාත් සභා ටික කල් දාන්න ක්‍රම බැලුවා. නඩු දාලා, අරවා කරලා, මේවා කරලා මේ පළාත් සභා තුන කල් දාන්න විවිධ ආකාරයේ යෝජනා ගෙනාවා. නමුත් 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවට දීලා තිබෙන අසීමිත බලතලත් එක්කලා පළාත් සභා කල් දාගන්න ලෙහෙසියට මේ ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ. ආණ්ඩුවට ඕනෑ ආණ්ඩුවේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න. මේ ආණ්ඩුව ප්‍රාදේශීය සභාවල් ටික කල් දාලා තමන්ට ඕනෑ සෙල්ලම, තමන්ගේ අතේ තියාගෙන තමන් කරගෙන ගියාට පළාත් සභාව හදපු නායකයෝ, පළාත් සභාව බිහි කරපු වෙලාවේ පළාත් සභාවට ඒ දීලා තිබෙන අසීමිත බලතලත් එක්ක නොහැකි නිසා තමයි මේ කූඨ ක්‍රමය අද ගෙනැල්ලා තිබෙන්නේ. මේක තමයි මේකේ යටි අරමුණ. මේක ක්‍රියාත්මක කරගන්න අවශ්‍යතාවය තමයි උඩ තිබෙන්නේ. නමුත් ඒකත් කරගන්න අද නොහැකි වෙලා තිබෙන්නේ.

මේක පාර්ලිමේන්තුවෙන් සම්මත කළාට පාර්ලිමේන්තුව තුළින් කර ගන්න බැහැ. මේ සඳහා ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනෙන්න ඕනෑ. එතකොට පාර්ලිමේන්තුවට ගෙනාවාම පළාත් සභාව සම්බන්ධයෙන් බලතල තිබෙන නිසා පළාත් සභාවේ මතය විමසන්න ඕනෑ. පළාත් සභාවේ මතය විමසන්න ගියාම එක පළාත් සභාවක් හරි විරුද්ධ වුණොත් මේක ආයේ සම්මත කරගන්න බැරි වෙනවා. 2/3 බලයක් අවශ්‍ය වෙනවා. අද අන්න එතැනට පාර්ලිමේන්තුව හිර වෙලා ඉන්න අවස්ථාවක තමයි මේ ආණ්ඩුව මේ කූඨ උපක්‍රමය කරලා, මේ රටේ ජනතාවගේ පරමාධිපත්‍ය බලය, ඡන්ද අයිතියට දෂ්ට කරන්න හදන තව ක්‍රමයක් හැටියට තමයි අපි ඒක දකින්නේ. ඒ නිසා තමයි මේ පනත ගෙනාපු මුල් අවස්ථාවේ සිට අපි මේ පනත සම්බන්ධයෙන් මේ මතය ප්‍රකාශ කළේ. අපි විරුද්ධ නැහැ. මේ රටේ ජනතාවගේ ඡන්ද අයිතිය හැම එකක්ම, ආරක්ෂා වෙන්න ඕනෑ. ඡන්ද තියන්න ඕනෑ. ඡන්ද ඔක්කොම එක දිනයට ගෙනෙන්න ඕනෑ. මේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හදන අවස්ථාවේ උතුරු - නැගෙනහිර තිබුණු තත්ත්වයත් අනුව එක දිනක පළාත් සභාව තියන්න බැහැයි කියන එක දන්න නිසා තමයි මේ පනත අනුව පළාත් සභා පිහිටුවන දිනයක් අනුව පළාත් සභා පිහිටුවීම මේ පනත් තුළ ඇති කරලා තිබෙන්නේ. නමුත් අපි ඒකට විරුද්ධ නැහැ. හැබැයි මේ කරන්න හදන්නේ, ඒ තුළ දාගෙන මේ පළාත් සභා තුනත් ඡන්ද නොතියා කල් අරින්නයි. මේ ආණ්ඩුව භයේ. දන්නවා, මේ මැතිවරණ තිබ්බොත් අනිවාර්යයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ ඒකාබද්ධ විපක්ෂය ජයග්‍රහණය කරනවා. ඒ ජයග්‍රහණයට භයේ තමයි මේ සෙල්ලම දාන්නේ. මේ පළාත් සභා තුනේ ඡන්දය කල් දාන්නේ. ඒ නිසා අපට පුළුවන්කමක් නැහැ, මේකට හිතට එකඟව කැමැති වෙන්න. අනික් එක මේ පළාත් සභාව ඊට පසුව විසුරුවන දිනය සම්බන්ධයෙන් කථා කරලා පළාත් සභාව කල් දාලා අවසාන මැතිවරණයක් දිනයක්, ඒ ගොල්ලන්ට මැතිවරණයකට යන්න පුළුවන් හොඳ දිනයක් එයි කියලා හිතන තුරු කල් දාගෙන මැතිවරණය ගෙනියන්න තමයි මේ උත්සාහ කරන්නේ. ඒකට අපට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. හැබැයි අපි එකඟයි, මේ මැතිවරණ සියල්ල එක දිනක පවත්වනවාට අපේ එකඟතාවය තිබෙනවා. නමුත් මේ කූඨ ව්‍යාපෘතියට අපි අකැමැතියි.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කල් දාන පළාත් සභාවල බලය මේ ව්‍යවස්ථා අනුව එක් කරන්න හදන්නේ කොතැනටද? පාර්ලිමේන්තුවට. මේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් බලාපොරොත්තු වුණේ ජනතාවගේ බලය බෙදා හැරීමක් කරන්නයි. ඒ ආයතන ස්වාධීන ආයතන බවට පත් කරන්න, ආණ්ඩුකාරවරයා හරහා ක්‍රියාත්මක වුණු බලතල, ජනාධිපතිවරයා හරහා ක්‍රියාත්මක වුණු බලතල නම් ක්‍රියාත්මකව පවතින්නේ - නමුත් ඒක අද සීමාසහිත කරලා නැවත පාර්ලිමේන්තුවට ගත්තොත් - 13 එහාට ගිය බලය බෙදීමක් ගැන කථා කරන ආණ්ඩුවක්. 13 න් එහාට ගිය බලය බෙදීමක් ගැන කථා කරන තැනකදී එතැනින් එහාට යනවා වෙනුවට නැවත හදන්නේ විසුරුවාට පස්සේ මේ එක තැනකට කොටු කරලා, පාර්ලිමේන්තුවේ ඉන්න කට්ටියට මේකේ බලතල පාර්ලිමේන්තුවට සීමා කරන්නයි. ඒ නිසා එතැනට අපට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ සම්බන්ධයෙන් අපේ විරෝධතාවය ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අද මේ සම්බන්ධයෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා සංශෝධන වගයක් ගේනවා. මේ සංශෝධන කොතෙක් දුරට වලංගු වෙනවාද කියන එක අපි හිතා බලන්න ඕනෑ. මේ අද සිද්ධ කරලා තිබෙන්නේ, මේ පනත පිළිබඳව අපේ පළාත් සභාවේ මත විමසීමක් පමණයි. අපට කියන්න පුළුවන් මේකේ අපි කැමැතිද? අකමැතිද? කියන එකයි. අපි කැමැති වුණොත් මේක පළාත් සභාව සම්මත වූවා සේ සලකලා ඒ තිබෙන නීති ප්‍රතිපාදන අනුව කටයුතු කරනවා. අපි විරුද්ධ වුණොත් අපේ පළාත තුළ මේ පනත සම්බන්ධයෙන් බලපාන දේවල් අපේ පළාත තුළ ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් මේ මත විමසීමට අපි සංශෝධන එකතු කරලා ඇරියයි කියලා කිසිම එලක් වෙන දෙයක් මේකේ නැහැ. අපි සංශෝධනයක් එකතු කරලා මේක ඇරියොත්, මේක එක්කෝ සම්මත වූවා සේ සැලකුවොත් මේක සම්මත වුණා. එහෙම නැත්නම් අපේ මතයක් පිළිගන්න පාර්ලිමේන්තුව බැඳිලා නැහැ. පාර්ලිමේන්තුවට සලකා බැලීමක් පමණයි කරන්න පුළුවන්. ඒ නිසා මේක අපි කරගන්න විහිළුවක්. අපේ ගෙල සිඳගෙන අපි දිවිනසා ගැනීමක්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සංශෝධන මේක්ට අදාළ තාවයක් නැහැ. එක්කෝ අපි කැමැතියි, එක්කෝ අපි අකැමැතියි කියලා ප්‍රතික්ෂේප කරලා නැවත අපේ අදහසත් එක්කලා අවශ්‍ය කරන පනත් කෙටුම්පතත් එක්ක පාර්ලිමේන්තුවත් එක්ක සලකා බලනවා මිසක් අපේ මතය අපි සංශෝධනත් එක්ක ඇරියා කියලා කිසිම එලක් වෙන්නේ නැහැ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පිළිබඳව බුද්ධිමත්ව සිතිය යුතු අවස්ථාවක්. පළාත් සභාව පිහිටෙව්වේ කුමක් සඳහාද? පළාත් සභාවලින් බලාපොරොත්තු වුණු කටයුත්ත මොකක්ද? ඒ කටයුත්තට අවශ්‍ය කරන සාධක මේ පනතේ සංශෝධන තුළින් ඇති වෙනවාද කියන එක පිළිබඳව අපි බුද්ධිමත්ව සිතා බලන්න ඕනැ. ඒ නිසා මම දකින්නේ, මේ පනත සංශෝධනය තුළ ඒ කිසි දෙයක් ආරෝපණය වෙන්නේ නැහැ. මෙහි සම්පූර්ණ අරමුණ වී තිබෙන්නේ, මේ සංශෝධන තුළ එකම දිනයක ඡන්දයක් තිබෙනවා කියන මතය පෙන්නලා වෙන දෙයක් කිරීමේ අරමුණයි තිබෙන්නේ. ඡන්දය කල් දා ගැනීම පමණයි මේක තුළ තිබෙන්නේ. ඒ නිසා පැහැදිලිවම මේ සඳහා අපට එකඟ වෙන්න බැහැයි කියන මතය මම ප්‍රකාශ කර සිටිනවා. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් අපට මේ සඳහා එකඟ වෙන්න බැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගය ඉදිරි පළාත් සභාවල අනාගතය පිළිබඳව තීරණය කරලා, තීරණය ගත යුතුයි කියලා ප්‍රකාශ කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු සුසාර දිනාල්**
Hon. Susara Dinal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව බස්නාහිර පළාත් සභාවේ මතය විමසීම පිළිබඳ කාරණාවේදී අපි මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව අප සතුව තිබෙන්නා වූ පෞද්ගලික ආකල්ප, ඒ වාගේම දේශපාලන පක්ෂ වශයෙන් මේ පිළිබඳව දකින ආකල්ප මොහොතකට පැත්තකින් තියලා පළාත් සභාවේ ජනතා නියෝජිතයින් විධියට මේ කාරණාව පිළිබඳව බැලිය යුතුයි කියන අදහසෙයි මා සිටින්නේ. විශේෂයෙන්ම 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රටට ගෙන ඒම සඳහා මූලික වුණු කාරණා මොනවාද? ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමෙන් පසුව මේ රටේ විශේෂයෙන්ම වාර්ගික පදනමක් සහිත පළාත්වල ජනතාවගේ පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නැංවීම උදෙසා ඒ ජනතාවට තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ක්‍රියාත්මක කර ගැනීම සඳහා අවශ්‍ය පදනම, අවශ්‍ය පසුබිම මේ පළාත් සභා ක්‍රමය තුළින් යම්තාක් දුරකට ඉටු වුණාය කියන විශ්වාසය මා තුළ තිබෙනවා. එවැනි තත්ත්වයක සිටිමින් මේ පළාත් සභා ක්‍රමයට නොයෙකුත් අවස්ථාවලදී නොයෙකුත් යෝජනා, නොයෙකුත් සංශෝධන ගෙන එනු ලැබුවා.

විශේෂයෙන්ම මෙසේ ගෙන එනු ලබන සංශෝධන ජනතාවගේ යහපත උදෙසා, රටේ අනාගතයේ යහපත උදෙසා වන සංශෝධන විය යුතුයි යන්නයි මාගේ විශ්වාසය. විශේෂයෙන්ම පවතින රජයේ පාර්ශවකාර දේශපාලන පක්ෂයක තනි උවමනාවට, ඔවුන්ගේ දේශපාලන බලය ආරක්ෂා කර ගැනීමේ තනි උවමනාවට මෙවැනි සංශෝධන ගෙන ඒම කිසිසේත්ම යුක්ති යුක්ත වන්නෙත් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී වන්නෙත් නැහැ. මේක පිටින් අයිසින් ගාලා ඇතුළේ පුස් තිබෙන කේක් ගෙඩියක් වාගේ කාරණාවක්. හැම කෙනෙක්ම ප්‍රායෝගික වශයෙන් අනුමත කාරණාවක්

[ගරු සුසාර දිනාල්]

තමයි එකම දිනයකදී මේ ඡන්දය පැවැත්වීමට එකඟවීම. එකම දිනයකදී පළාත් සභා සියල්ලේම ඡන්දය පැවැත්විය යුතුයි කියන කාරණාව පෙරමුණට දාලා, ඒක ඉස්සරහාට දාලා ඒක පිටිපස්සෙන් ගෙන එනවා, පළාත් සභා සතු බලතල පාර්ලිමේන්තුවට නතු කර ගැනීමේ අවශ්‍යතාවයක්. ඇයි මේ පළාත් සභාව සතු බලතල පාර්ලිමේන්තුව තුළට නතු කර ගැනීමේ යෝජනාවක් මේ මොහොතේ එළියට එන්නේ. මේක තනිකරම දේශපාලන පක්ෂයක තනි උවමනාවට, එහෙම නැත්නම් ඒ දේශපාලන පක්ෂයේ නායකයාගේ තනි උවමනාවට ගෙන එනු ලබන යෝජනාවක් බවයි මාගේ විශ්වාසය වෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමන්ට රටේ තිබෙන අනිකුත් පළාත් සභාවල බලය තමන්ගේ පාලනයට නතු කරගන්න, තමන්ගේ පක්ෂයේ පාලනයට නතු කරගන්න පවතින ඒකාබද්ධ රජය තුළ ඒක තමන්ට කරගන්න බැරි වුණාම මේ බලය අන්‍යාකාරයකින් තමන්ට නතු කර ගැනීමට කරගනු ලබන කටයුත්තක් විධියටයි මා මේ සංශෝධනය දකින්නේ.

විශේෂයෙන්ම අපි දැකලා තිබෙනවා, අපේ රටේ විවිධ රජයන් මේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පස්සේ නොයෙකුත් අවස්ථාවලදී මේ රජයන් විසින් ජනතාවගේ පරමාධිපත්‍ය අයිතියට ඇඟිලි ගසනු ලැබුවා. ඒක අන්‍යාකාරයෙන්, ඍජු ආකාරයෙන් සහ නොයෙකුත් විධිවලට මංකොල්ල කනු ලැබුවා. ඒ සෑම අවස්ථාවකදීම පීඩනයට පත් වුණේ, අසාධාරණයට පත් වුණේ මේ රටේ ජනතාව. නමුත් මේ රටේ ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී රටවල් බොහොමයකට සාපේක්ෂව තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්, තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී මතයන් ප්‍රකාශ කිරීමට යොදාගනු ලබන ඉතාමත්ම ප්‍රබලම අවිය වන තමන්ගේ ඡන්දය ලබා දීමේ බලය අන්‍යාකාරයකට පාර්ලිමේන්තුව විසින් තමන්ට අභිමත පරිදි පාලනය කිරීමට ගනු ලබන උත්සාහයක් ලෙසයි මා මෙය දකින්නේ. විශේෂයෙන්ම අද පාර්ලිමේන්තුවේ සංයුතිය දිහා බැලුවාම මෙය කිසියම් ආකාරයක විකෘති තත්ත්වයක් තිබෙන බව මේ මුළු රටම පිළිගන්න කාරණයක්. නමුත් අපි උපකල්පනය කරමු. මීට වඩා විකෘති තත්ත්වයකට ගියපු, පක්ෂයේ එහාට මෙහාට ගිහිල්ලා දේශපාලන පක්ෂවල කණ්ඩායම් දෙපැත්තට කැඩිලා ගිහිල්ලා පාර්ලිමේන්තුවේ සංයුතිය වෙනස් වනු ලබන අවස්ථාවකදී මෙවැනි සංශෝධනයක් හරහා මොනතරම් ජනතාවට අහිතකර තීන්දු තීරණ පාර්ලිමේන්තුව තුළින් ගත හැකිද?

ඒ විතරක් නොවෙයි. විවිධ පළාත් සභාවල - විශේෂයෙන්ම අපි දන්නවා, මේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මූලික වුණු පළාත් සභා දෙකක් තිබෙනවා. උතුරු සහ නැගෙනහිර පළාත් සභාවන්. මේවා වාර්ගික පදනම මත තමන්ගේ දේශපාලනය ඉටු කරන දේශපාලන පක්ෂ ඉදිරියේ සිටින පළාත් සභාවන්. මේ අයට යම් හෙයකින් පාර්ලිමේන්තුවේ සංයුතියට බලපෑමක් කරලා, පාර්ලිමේන්තුවේ සංයුතිය යම් ආකාරයකින් වෙනස් කරලා තමන්ගේ පළාත් සභාවල්වලට අනවශ්‍ය බලතල, අනවශ්‍ය උවමනා එපාකම් ඇති කර ගැනීමට මේ සංශෝධනය කිසියම් ආකාරයකින් ඉදිරියට ගෙන එන්න බැහැයි කියලා කාටවත් කියන්න පුළුවන්ද? අද දවසේදී පළාත් සභාව විසුරුවා හැරීමේ අයිතිය, පළාත් සභා පිළිබඳව තීරණ ගැනීමේ අයිතිය පාර්ලිමේන්තුවට ගන්නවා. හෙට පළාත් සභාවට පණිවුඩයක් එවනවා. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මෙන්න මෙහෙම තීන්දුවක් ගන්නවා. කරුණාකරලා මේකට අත උස්සපල්ලා. නැත්නම් අපි උඹලාව හෙට දවසේ විසුරුවා හරිනවා කියලා. එදාට සිද්ධ වෙන්නේ මොකක්ද? අද මේ විපක්ෂයට සිද්ධ වෙලා තිබෙන දේමයි විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු හෘද සාක්ෂියට එකඟව මේ යෝජනාවට විරුද්ධයි. මේ සංශෝධයට විරුද්ධයි. නමුත් පක්ෂයක නායකත්වය කිව්වොත්, පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය කිව්වොත් ඒ අයට සිද්ධ වෙනවා, පක්ෂයේ මතයට ගරු කරලා පක්ෂයේ නායකත්වයට හිස නමන්න. ඒ තත්ත්වයම අනාගතයේ ඉතාමත් නරක විධියට මේ සංශෝධනය හරහා ඇති වෙන්න පුළුවන්. පාර්ලිමේන්තුවට මේ බලතල ගියාට පස්සේ ඊළඟට තව සංශෝධනයක් ගේනවා. විසි එක් වැනි සංශෝධනය, විසි දෙවැනි සංශෝධනය කියලා පළාත් සභාවේ බලතල වෙනස් කරන්න, විකෘති කරන්න යෝජනා ගෙනාවොත් ඒවාට අත ඉස්සුවේ නැත්නම් පළාත් සභාව විසුරුවා හරිනවා කියන ආයුධය ඉස්සරහාට දැම්මොත් මේ පළාත් සභා ක්‍රමය සම්පූර්ණයෙන්ම විකෘතියක් බවට පත් වෙලා මේක තුළින් ජනතාවට ඉටු වන වැඩ කටයුතු පමණක් නොවෙයි. ජනතාවගේ පරමාධිපත්‍ය බලය ජනතාවගේ පිටින්ම තියලා ජනතාවට විරුද්ධව පාවිච්චි කරන තත්ත්වයකට මේක ගේන්න පුළුවන්.

ඒක නිසා තවත් වැදගත් කාරණයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ තමයි විධායක ජනාධිපතිවරයාගේ බලතල. අපි දන්නවා, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය විධායක ජනාධිපතිවරයාගේ විධායක බලතල සමඟ ඉතාමත්ම තදින් බැඳිලා තිබෙනවා. යම් හෙයකින් ඒ පැත්තේ අඩුවක් පෙනෙන කොට ඒක මේ පැත්තට බලපාන්න පුළුවන්. මෙහි අයිතීන් අනික් පැත්තට යන කොට ඒක වැරදි විධියට බලපාන්න පුළුවන්. මෙවැනි තත්ත්වයක් යටතේ එක් පැත්තකින් අද දවසේදී විධායක ජනාධිපතිවරයාගේ බලතල අඩු කෙරෙමින් පවතින සමයකයි අපි ජීවත් වෙන්නේ. එහි හොඳ නරක නොවෙයි මා මේ මොහොතේදී කියන්නට උත්සාහ කරන්නේ. එසේ අඩුවන වකවානුවක් තුළ, එසේ අඩු වෙන්නට යෝජනා ගෙනැල්ලා එසේ අඩු කරනු ලබන බවට ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කරලා බලයට ආපු රජයක් තුළ පළාත් සභාවේ බලතල පාර්ලිමේන්තුවට ලබා දීම හරහා ඉතාමත්ම භයානක තත්ත්වයක් කරා අපි ගමන් කරනවා.

ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාමත්ම පැහැදිලියි. මේ විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇතුළේ ඉදිරියෙන් දාලා තිබෙන, එක දිනයකදී මැතිවරණ පැවැත් වීම නම් වූ කාරණාවට මා හිතන්නේ සියලුම ගරු මන්ත්‍රීවරුන් ප්‍රසාදය පළ කරාවි. බොහෝ දෙනෙකු කැමැත්ත පළ කරාවි. නමුත් ඒක පිටිපස්සේ තිබෙන පළාත් සභාවේ බලතල පාර්ලිමේන්තුවට ලබා දීමේ කාරණාවේදී මේ කිසිඳු මන්ත්‍රීවරයෙකුට තමන්ගේ හෘද සාක්ෂියට එකඟව මේ සඳහා පක්ෂ වන්නනට හැකියාවක් නැහැ. මා දන්නේ නැහැ. ගරු මහ ඇමැතිතුමන් ඉදිරිපත් කරන ලද මේ යෝජනාවට කුමන ආකාරයේ ප්‍රතිචාරයක් අනික් පැත්තෙන් ලැබෙයිද? එහි නෛතික බලපැවැත්ම කුමන ආකාරයකින් වෙයිද? කියලා. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යවරයා ඉදිරිපත් කරන යෝජනාව පළාත් සභාවේ සුභ සිද්ධිය සඳහා නම්, පළාත් සභාවේ අනාගත අභිවෘද්ධිය සඳහා නම් එයට කිසියම් ආකාරයක බලාත්මක භාවයක් ලැබෙය කියන විශ්වාසය අපට තිබෙනවා නම් අපි එතුමන් සමඟ ඉන්නට කැමැතියි. නමුත් අනික් පැත්තට ඒ විශ්වාසනීයත්වය අපට ලැබිය යුතු වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එසේ නොවන්නට පළාත් සභාවේ මන්ත්‍රීවරුන් විධියට පළාත් සභාව තුළ සිටිමින් අපේ ගෙල සිඳ ගැනීමට අපට එකඟවන්නට හැකියාවක් නැහැ. මේ තත්ත්වය හරි පැහැදිලිව වෙන් වෙන්ව හඳුනාගත යුතු වෙනවා. මධ්‍යම රජයේ ඇත්ත උවමනාවද මේ සංශෝධනය හරහා ක්‍රියාත්මක වෙන්න කියන එකත් අපි මෙහෙදී සලකා බැලිය යුතු වෙනවා.

අපි දන්නවා, පළාත් පාලන ආයතන විසුරුවා හැරීම නිසා මේ රටේ මොනතරම් අවුල් ජාලාවක් වෙලා තිබෙනවාද කියලා. ඒ අවුල් ජාලාව සාමාන්‍ය මහජනතාවට මොනතරම් ඍජුව බලපාලා තිබෙනවාද කියලා අපි දන්නවා. ඡන්දය තියාගන්න බැරුව අද රජයත් අසරණභාවයට පත් වෙලා ඉන්නවා. ඇයි ඡන්දය තිබ්බොත් පරිදියි කියන භයට. මෙතැන තිබෙන්නේ ඡන්දය තිබ්බොත් පරිදියි කියන භය විතරක් නොවෙයි. පාර්ශවකාර දේශපාලන පක්ෂවල විවිධ මතවාද මෙතැනදී ඉතාමත්ම තීරණාත්මකව බලපාලා තිබෙනවා. එතකොට පාර්ශවකාර දේශපාලන පක්ෂවල අභිමතය නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කිරීම ඒකට පැලැස්තර දැමීමක් පමණයි කියන එකයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ විශ්වාසය. ඒක නිසා මේ අවස්ථාවේදී මේ පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට, පළමුවරට මේ පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට මම ඉතාමත්ම වගකීමෙන් යුක්තව කියනවා. එකම දිනයක මැතිවරණය පැවැත්වීමේ අදහසට, යෝජනාවට එකඟත්වය පළ කළ හැකි වුණත්, අනිකුත් යෝජනාවන්වලට කිසිසේත්ම අපට එකඟත්වය පළ කරන්න හැකියාවක් නැහැ. ඒක සියතින් ගෙල සිඳ ගන්නවා වාගේ වැඩක්. අපිව මෙතැනට පත් කරලා එවපු ජනතාවට පිටුපෑමක්. ඒ අය අපට ලබා දුන්නු ඒ අයගේ පරමාධිපත්‍ය බලය අපි අමු අමුවේ උල්ලංඝණය කිරීමක් හැටියට් මා දකින්නේ. ඒක නිසා මේ කාරණාව සම්බන්ධයෙන් නැවත වාරයක් සිතා බලන ලෙස සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය 21 වැනිදා මේ පළාත් සභාවට ආණ්ඩුකාරතුමන් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධව මේ ලියවිල්ල එව්වාට පස්සේ මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා කණ්ඩායම් නායක රැස්වීමක් කැඳවුවා. ඒකදී ඇත්තටම අපි

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

මේ සංශෝධනය සම්බන්ධව බරපතළ ආකාරයේ කරුණු දැක්කේ නැහැ. මොකද අපි දැනගෙන සිටියා, මේ මොහොතේ ආණ්ඩුවට අවශ්‍ය සරල උවමනාවක් තිබෙනවා. අන්න සරල උවමනාව ඉෂ්ට කර ගැනීමේ උවමනාවෙන් මෙන්න මේ සංශෝධන එවලා තිබෙනවා කියලා. ඒ නිසා අපේ පැත්තෙන් අපි කිව්වා, මේ සංශෝධනය එදා උදේ ඕනෑ නම් අරගෙන අදහස් විමසලා යවන්න පුළුවන් කියලා. නමුත් ඒකට එකඟ වුණේ නැහැ. ඊට පස්සේ තමයි, ඊට පස්සේ සතියේ 28 වැනි සඳුදා මේ පළාත් සභාවට මේක සාකච්ඡා කරන්න ගත්තේ. නමුත් ඒ සාකච්ඡා කරන්න ගත්තාට පස්සේ ගරු මහ ඇමැතිතුමාගෙන් යෝජනාවක් ආවා. මේ සම්බන්ධයව අදත් මේකට එකඟතාවයකට යන්න බැහැ. ඒ නිසා මේ සම්බන්ධව පක්ෂ නායක රැස්වීමක් තියන්න ඕනෑය කියලා. එතකොට ඒ රැස්වීමේදී එතුමා මේක ආපසු යවන්න හැදුවාට පස්සේ අපි කිව්වා, නැහැ. මේකේ එහෙම ගැටලුවක් නැහැ. මේක සාකච්ඡා කරලා, මන්ත්‍රීවරුන්ගේ අදහස් අරගෙන ඒ මන්ත්‍රීවරුන්ගේ අදහස් අනුව තීරණයකට එළැඹෙන්න පුළුවන්. මොකද, මේකේ ඉල්ලා සිටින්නෙත් එච්චරයි. නමුත් ඒකට එකඟ වුණේ නැහැ. ඊට පස්සේ මගේ පැත්තෙන් මම කරුණු ඉදිරිපත් කළා. එහෙමනම් මේක අද, ඔබතුමන්ලාට මේ සම්බන්ධයෙන් සැකයක් නම් තිබෙන්නේ, ඡන්දය සම්බන්ධව සැකයක් තිබෙනවා නම්, අද අපි රැස් වුණු එකේ කාලය ප්‍රයෝජනයට ගන්න ඕනෑ. ඒ නිසා අද මේ සභාවේ සාකච්ඡා කරමු. සාකච්ඡා කරලා පසුවැනිදා, ඊළඟ සභා දිනයේදී උදේට මේක ඡන්දයට ගමු. එතකොට කාලය අපතේ යැවීමක් වෙන්නේ නැහැ. නමුත් ඒක එදත් වුණේ නැහැ. ආපසු ගියා. මොකද න්‍යාය පත්‍රයේ වෙන කරුණු තිබුණෙත් නැහැ. ඊට පස්සේ සතියේ වුණෙත් ඒකයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර 21වැනිදා කරන්න තිබුණු වැඩේ අංශක 360 ක් කැරකිලා ගිහිල්ලා ආපසු එතැනටම අද ඇවිල්ලා තිබෙනවා. එදා 21 වැනිදා ඇපේ පැත්තෙන් යෝජනා කරපු වැඩේ අද මේ සභාවේ කරනවා. ඔන්න කල්පනා කරලා බලන්න තත්ත්වය මොකක්ද කියලා. ඒ නිසා මේ සංශෝධනය සම්බන්ධයෙන් ලොකු භීතියක් මැව්වා. ඇත්තටම තමුන්නාන්සේලාගේ පැත්තෙන්, තමුන්නාන්සේලා හිතන ආකාරයෙන් සමහර ඒවායේ ඒ භීතිය සම්බන්ධව සාධාරණත්වයක් තිබෙනවා. මොකද, ගිනි පෙනෙල්ලෙන් බැට කාපු මිනිස්සු කණා මැදිරි එළියටත් භයයි. එහෙම කල්පනා කරලා බැලුවොත් එහෙම එකක් මේක ඇතුළේ තිබෙනවා.

**ගරු රොජර් සෙනෙවිරත්න**
Hon. Roger Senevirathne

ගිනි පෙනෙල්ලෙන් බැට කෑවේ නැද්ද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මට පොඩ්ඩක් ඉඩ දෙන්න. තිහක් ද කොහෙද කථා කරනවා. අවස්ථාවක් ඉල්ලා ගන්න. එතකොට මේකේ තිබෙනවා, සියලුම පළාත් සභාවල මන්ත්‍රීවරුන් තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීම එකම දිනයක පවත්වනු ලැබිය යුත්තේ ය කියලා. එතකොට මේ සභාවේ කවුරුවක්වත් ඒකට අකමැති නැහැ. ඒකට කැමැතියි. එහෙමනම් මේ එකම දිනක පවත්වන්න ඕනෑයි කියන ව්‍යවස්ථා සංශෝධනයකින් මේක ගේන්න ඕනෑ වෙලා තිබෙන්නේ පෙර වැරැදි නිසා. පෙර වැරැදි තමයි මේ. එතකොට පෙර වැරැදිත් එක්ක තමයි මේ ප්‍රශ්නය එන්නේ. එතකොට පෙර වැරැදි සිද්ධ වීමේදී ඒවා කොහෙවක්වත් සාකච්ඡාවට ලක් වෙලා නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පෙර වැරැදි සිදු වුණේ කවදා ඉඳන්ද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පෙර කවදා ඉඳන්ද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒවා සම්බන්ධව කථා කරලා නැහැ. එක එක වෙලාවේදී පළාත් සභා විසිරෙන වෙලාවේ. අපි දන්නවා, පොඩ්ඩක් ඉවසන්න වෙනවා. මොකද, රීති අත්හිටුවලා තිබෙන්නේ. ඒක නිසා මට ගොඩක් කාලය යයි. ඔබතුමන්ලා ඒ විධියට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කරන්න එපා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා බාධා කරන්න එපා. හුඟක් කාලය යයි. මටත් ඔරලෝසුව බල බල ඉන්න ඕනෑ නැහැ. මට තිබෙන්නේ ඔබතුමන්ලාටත් ඉඩ දීලා, මේක කාරක සභා අවස්ථාව වාගේ සාකච්ඡාවක් යන්න වෙන්නේ. එතකොට පෙර ආණ්ඩුවේ, ඇත්තටම ඒ ගොල්ලෝ කිව්වේ ඒ දවස්වල අපේ මැතිවරණ තැටිය රත් වෙලා තිබෙනනේ. ඕනෑ වෙලාවක අපේ ලොක්කා රොටිය දානවා. පුච්ච ගන්නවා. හරී. ඒක තමයි ඒ හේතුව. එතකොට මේ ව්‍යවස්ථාවේ තිබෙනවා ඔබතුමන්ලා කියන විධියට එහෙමනම් එතකොට පළාත් සභා විසුරුවන්න ඕනෑ මහ ඇමැතිතුමා විමසලා. නේද? මහ ඇමැතිතුමා විමසුවාදවත් කියලා අපි දන්නේ නැහැ. ඒක අනුව තිබෙන්නේ මහ ඇමැතිතුමා විමසලා. දැන් හරියට ප්‍රජාතන්ත්‍රවාදය බැලුවොත් එහෙම ජනාධිපතිතුමා මහ ඇමැතිතුමා විමසුවාට පස්සේ, මහ ඇමැතිතුමා විමසන්න ඕනෑ, සභාවෙන්. ඒක නේ මහ ඇමැතිතුමා විමසනවා කියලා කියන්නේ.

දැන් මෙතුමා මේ ලියුම යවලා - මම හිතන්නේ එතුමා ජනාධිපතිතුමාත් එක්ක තිබෙන සම්බන්ධයට යවපු ලිපියක් මේක. නැත්නම් මේකේ කිසිම නීත්‍යානුකූල බවක් නැහැ. ඇත්තටම මේකේ Copy ඉල්ලන්න ඕනෑත් නැහැ. එතුමාට ලියුම් යවන්න පුළුවන් නේ. ඒ නිසා මේ ලියුමේ කිසිම තේරුමක් නැහැ. ඒ නිසා ඇත්තටම මේ ලියුම නම් මේ සභාවට සභාගත කරන්න කියලා කියන්නවත් ඕනෑ නැති එකක්. ඉතින් ඒ නිසා මේක අදාළ නැහැ. මොකද, පාර්ලිමේන්තුවට මොකක් හරි එකක් සම්බන්ධව, සංශෝධනයක් සම්බන්ධව මොකක් හරි පනතක් ආවාට පස්සේ ඒකේ ක්‍රමවේදයක් තිබෙනවා. එතකොට ඒකට පළාත් සභාවෙන් අදහස විමසන්න ඕනෑ නම් පළාත් සභාවේ අදහස විමසන්න එවනවා. ඊට පස්සේ විමසන්න එව්වාට පස්සේ ආපසු මේක අනික් පැත්තට ගන්න බැහැ. එහෙම ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා සභාවේ අදහස කියලා යවන්නයි තිබෙන්නේ. ආපසු මගදී කියන්න එපා, ආ... ඕක වැරැදියි. ඕක ආපහු එවන්න කියලා පාර්ලිමේන්තුවට කියන්න පුළුවන්ද? මේක එහෙම කරන්න බැහැ. ඒ නිසා එක්කෝ වෙන්න ඕනෑ මේක සම්බන්ධව අපි අපේ අදහස් කියලා යවලා, එක්කෝ පරද්දලා යැව්වාට පස්සේ පාර්ලිමේන්තුවට අයිතියක් තිබෙනවා, තමන්ගේ 2/3 ක ඡන්දයෙන් මේක සම්මත කරගන්න. ඒක එකක්. එහෙම නැත්නම් මොකක් හරි අධිකරණ තීන්දුවක් ආවොත්, අධිකරණයකින් මේකේ ප්‍රශ්නයක් වුණොත් එහෙම මේක ආපසු බම්ප් වෙන්න පුළුවන්. නැත්නම් මේක බම්ප් වෙන්නේ නැහැ. අපි හිතමු ජනමතයක් විමසන්න කියලා. එහෙම වුණොත් එහෙම වෙන්න පුළුවන්. ඒත් අන්තිමේදී මේක, මැදදී පස්සේ මෙක සංශෝධනය කරලා නැවත කෙටුම්පතක් එවන්න විධියක් නැහැ. ඒ ක්‍රියාවලිය සිද්ධ වුණාට පස්සේ, ඒ සියල්ල සිද්ධ වුණාට පස්සේ තමයි පාර්ලිමේන්තුවට අයිතියක් තිබෙන්නේ, නැවත කෙටුම්පතක් හදන්න. නැතුව අලුත් කෙටුම්පතක් නැවත අපට මඟදී හදලා එවන්න බැහැ. ඒ නිසා ඒ ක්‍රියාවලිය යන්න ඕනෑ. ඒ නිසා මේක සතියක් නොවෙයි. දෙකක් නොවෙයි. තව මාසයක් කල් දැම්මත් අපි අපේ අදහස කියලා යවන්නයි වෙන්නේ. වෙන දෙයක් මේකේ වෙන්නේ නැහැ. ඉතින් ඒ නිසා අපට තිබුණේ, අර 21 වැනිදාම මේ සම්බන්ධව අපේ අදහස් ටික කියලා යවන්නයි. ඉතින් ඒ නිසා අපි දන්නවා, පසුගිය කාලයේ මේ එක එක වෙලාවට පළාත් සභා විසිරෙව්වේ - ඒකේ නීතිය තිබ්බාට මහ ඇමැතිතුමා විමසන්න කියලා, ඒක නිකම්ම නිකන් ජේදයක් විතරයි.

මට මතකයි, ඔය උතුරු මැද පළාත් සභාව විසුරුවා හැරීමේදී ඒක ටිකක් අමාරු වුණා. බර්ටි ප්‍රේමලාල් දිසානායක හිටපු මහ ඇමැතිතුමා කෙලින්ම පළමුවැනි අවස්ථාවේදීම එකඟ වුණේ නැහැ. නමුත් පස්සේ තමයි හිටපු ජනාධිපතිතුමා බර්ටි ප්‍රේමලාල් දිසානායක මහ ඇමතිතුමාව මේකට එකඟ කර ගත්තේ. ඒකට එකඟ කර ගත්තේ. ඒ මහ ඇමැතිතුමා විතරයි - අද එතුමා ජීවතුන් අතර නැහැ. එතුමාට ගෞරවයක් හැටියට ඒක කියන්න ඕනෑ. එතුමා විතරයි මේ සම්බන්ධව පොඩි හරි Challenge කිරීමක් ජනාධිපතිට කළේ. වෙන කවුරුවක්වක් කළේ නැහැ. අරහේ කියන කොට දැන් ඉතින් මේක විසුරුවනවයි කියලා අනේ ලැහැස්ති වෙලා සිටියා. පළාත් සභා මන්ත්‍රීවරුන්ට කියලා කරන්න දෙයක් තිබුණේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒකට ගාණට රිටන් එක දුන්නා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒවා මම දන්නේ නැහැ. ඒවා එහෙම වෙන්න ඇති. නමුත් ඇත්ත සිද්ධ වුණේ ඔන්න ඕකයි. ඉතින් ඒක නිසා කලින් ඒ සම්බන්ධව තිබුණු තත්ත්වයන් මත තමයි මේ සම්බන්ධව ප්‍රශ්නය වුණේ. ඒ නිසා දැන් ඇත්තටම මොකද වෙලා තිබෙන්නේ? දැන් නැගෙනහිරයි, උතුරු මැදයි, සබරගමුවයි පළාත් සභා මේ ඔක්තෝබර් 02 වැනිදා වන කොට විසිරෙනවා. ඒ නිසා මේ තිබෙන නීති රීති අනුව මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයාට අනිවාර්යයෙන් ඡන්දයකට යන්න වෙනවා. ඡන්දයකට යන්න හේතුව ඒක තමයි දැන් තිබෙන තත්ත්වය. එතුමාට ඡන්දයකට නොගිහින් ඉන්න බැහැ. ඒක නිසා ආණ්ඩුවට උවමනා වෙලා තිබෙනවා, පළාත් සභා කල් දාගන්න. හරි නේ? ප්‍රධානම එක ඒකයි. ඒක ඇත්ත. ආණ්ඩුවට මේ වෙලාවේ අවශ්‍යතාවයක් තිබෙනවා, පළාත් සභා කල් දාගන්න. ඒකට අනුව තමයි මේක එන්නේ. අපි කියනවා, ඒක හරි. ඒකේ සාධාරණත්වයක් තිබෙනවා. අර මම කිව්ව ආකාරයේ පෙර වැරැදි නිසා මේක එක එක දිනවල්වලට තියලා තිබෙනවා. එහෙමනම් නිශ්චිත දිනයක් සඳහන් වෙන්න ඕනෑ. අපට මේකේ තිබෙන ගැටලුව ඔන්න ඕකයි. එහෙමනම් මේ පනතට ඇතුළත් කරන්න ඕනෑ. අන්න එතකොට ඔබතුමන්ලාට වුණත් අර සැකය අඩු වෙන තැනක් තිබෙනවා. මොකක්ද? මේ පළාත් සභා ඡන්දයට විතරයි මේක අදාළ වන්නේ කියලා. එහෙම සටහනක් නැහැ.

ඒ නිසා ඇත්තටම කිව්වොත් එහෙම අනාගතයේ දවසක වුණත් මොන මොන තත්ත්වයන් තුළ හරි මෙවැනි තත්ත්වයකට මුහුණ දුන්නොත් ඒ වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම උපයෝගී කරගන්න පුළුවන්. ඒක තමයි. නමුත් මේකට නිශ්චිත දිනයක් නම් කරලා ආවා නම් ඒ ගැටලුව එන්නේ නැහැ. නමුත් අපි පොඩ්ඩක් විශ්වාස කරනවා, එක්කෝ මේක කැමැත්තෙන්ම මඟ හැරලා තිබෙනවා. මේක අතපසුවීමක් කියලා හිතන්න බැහැ. ඒ නිසා කැමැත්තෙන්ම ඒ දිනය මඟ හැරලා තිබෙනවා. දැන් අපට තිබෙන්නේ, එහෙමනම් මේකේ නිශ්චිත දිනයක් තිබෙන්න ඕනෑ. එහෙමනම් ඒක අපි සඳහන් කරන්න ඕනෑ. අපට විශේෂයෙන් පළාත් සභා හැටියට අන්න සඳහන තිබෙන්න ඕනෑ. නිශ්චිත දිනයක් නම් කරන්න ඕනෑ. එතකොට ගරු මහ ඇමැතිතුමා අද උදේ ඉදිරිපත් කළා, එතුමාගේ සංශෝධනය කියලා. දැන් මේකේ තිබෙන්නේ, පූර්වාසන්න මාස 06 ක කාලසීමාව ඇතුළත දිනයක් කියලා. ඔබතුමාගේ කථාවේදී කිව්වේ වසරක කියලා. මම දන්නේ නැහැ, මේකේ ඇත්ත මොකක්ද කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, යෝජනාව නැවත සංශෝධනය කරලා තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මාස 06 යි. එහෙමනම් මාස 06 ක කාලයක්. ගරු මහ ඇමැතිතුමනි, දැන් මට ප්‍රශ්නයක් තිබෙනවා. මේක මාස 06 යේ ගණන හැදුවේ කොහොමද? ඇයි මාස හයක් කියලා කියන්නේ? ඒකට හේතුව මොකක්ද? දැන් මාසය හයක් නිකන් මේ ඔබතුමාට රෑ හීනෙන් මොකක් හරි කියලා, කවුරුවත් කියලා එහෙම නොවෙයි නේ. මොනවා හරි හේතුවක් තිබෙන්න එපැයි, මාස හයක් කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යමක් සූදානම් වන කාලය.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතතිතුමනි, රෑ හීන කථාවක් නොවෙයි. අපි දැන් රජයකට අදහසක් නේ දෙන්නේ. ඒගොල්ලන්ට තීන්දුවක් ගන්න පුළුවන් වන විධියට තමයි අපි මැද දිනයක්, එහෙම දාලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු මහ ඇමැතිතුමා, මැද දිනයක් නොවෙයි නේ?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඇයි? ඌව පළාත් සභාව ඉවර වෙන්නේ ඔක්තෝබර්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙමනම් වෙන්න ඕනෑ, අපි දන්නවා. දැන් පළමුවෙන්ම විසුරුවන පළාත් සභාව. දැන් ඔක්තෝබර් 02 ක විසිරෙන පළාත් සභාව. එතකොට අවසානයේම විසිරෙන පළාත්

සභාවේ දිනය. ඔය දෙක අතර නිශ්චිත මැද දිනයක් වුණා නම් අන්න ඒක අපට කියන්න පුළුවන් හරී. මේ වැඩිපුර කල් දාන්නෙත් නැහැ. වැඩිපුර ඉස්සරහාට ගන්නෙත් නැහැ. කාටත් සාධාරණයි. ඒ අතර මැද දිනය අපි තීරණය කළා. දැන් ඒකට හේතුවක් තිබෙනවා නේ. ඒක හරි සාධාරණයි නේ. අපට තර්කයක් හැටියට කියන්නත් පුළුවන් නේ. ඇයි අපි ඒ දිනය තීරණය කළේ කියලා. හැබැයි, අපට මාස හයක් කිව්වාම මොකද වෙන්නේ. අපේ දිනය එනකන් හිටහල්ලා. බස්නාහිර පළාත් සභාවේ දිනය ඉක්මවන්න ඕනෑ. ඒකද? එතකොට එහෙම නම් ඌව පළාත් සභාවට කියන්න පුළුවන්. නැහැ, අපේ දිනය ඉවර වෙනකන් ඉන්න ඕනෑ. ඒගොල්ලන්ට එහෙම කියන්න පුළුවන්. ඒක නිසා ඇත්තටම අර දැන් විසිරෙන පළාත් සභා වැඩි කාලයක් ඒ විධියට තව කාලය දීර්ඝ කරන්න දෙන එක සාධාරණ නැහැ. ඒ නිසා මේකේ හරි වලංගුතාවයක් වෙන්නේ, අපි මේ හැමදෙයක්ම සලකලා නම් මේ දිනය තීරණය කරන්නේ, අපට කියන්න පුළුවන් පළමු පළාත් සභාව විසිරෙන දිනයේ සිට අවසාන පළාත් සභාව විසිරෙන දිනය අතර හරි මැද දිනය මේ සඳහා තෝරාගත යුතුයි. අන්න හරි. එහෙම කිව්වා නම් අපට හරි තර්කයක් තිබෙනවා, බස්නාහිර පළාත් සභාව මේක බොහොම හැම පැත්තක්ම සලකා බලලා හරියට දිනය තීරණය කරලා තිබෙනවා කියලා. අන්න එහෙම වුණා නම් හරී. එහෙම නැතිව මාස 06 කියලා කියන්නේ, ඔය මොකක් විසුරුනත් කමක් නැහැ. අපේ කාලය ඉක්මවන තුරු තිබෙන්න ඕනෑ. එතකොට එන්නේ ඔන්න ඔය අදහස.

ඊළඟ කාරණය තමයි, සභා විසිරෙන දිනය පාර්ලිමේන්තුවෙන් නිශ්චය කිරීම. දැන් හරී. අර සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා මේක ටිකක් කිව්වා. ඇත්තටම දැන් පසුගිය මැතිවරණයේදී කාගෙත් අදහසක් තිබ්බා, ඡන්දය දෙන ඡන්දදායකයන්ගෙත් අදහසක් තිබ්බා ජනාධිපති ධූරය විසිරෙන්න ඕනෑ. අහෝසි වෙන්න ඕනෑය කියලා. ජනාධිපති ධූරය අහෝසි වෙන්න ඕනෑය කියලා. එතකොට ජනාධිපති ධූරය අහෝසි වෙන්න නම් අපි මෙහේ නීති හැදුවොත් නැවත ජනාධිපතිවරයාට බලතල තිබෙන විධියට අපි මේක අහෝසි කරන්න කැමැති නැහැ. ඇයි? අපි මේ නීති හදන්නේ ඉස්සරහාට. එතකොට අපි මැතිවරණයේදී එකක් කියනවා. හැබැයි, අපි මෙහෙදී තීන්දු තීරණ ගන්න කොට තව තීරණයක ඉන්නේ. ඒක වැරැදියි නේ. ඒක වැරැදියි. ඒ නිසා පාර්ලිමේන්තුව විසින් මේ දිනය නිශ්චිත කිරීම සම්බන්ධව අපට නම් කිසි ගැටලුවක් නැහැ. අපි කියනවා, ජනාධිපතිතුමාට ඒ අයිතිය දෙනවා කියලා කියන්නේ මොකක්ද? එක්කෙනෙකුට ඒ අයිතිය දෙන්නේ. මහ ඇමැතිගෙන් විමසා ජනාධිපතිට අයිතිය තිබෙනවා. අපි ඒ අයිතිය පාර්ලිමේන්තුවේ 225 කට දුන්නාම මොකද? ආණ්ඩුවක් තිබෙනවා. විපක්ෂයක් තිබෙනවා. මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය කරන හැම දේශපාලන පක්ෂයක්ම නියෝජනය වෙනවා. ඒ 225 ට අයිතිය දුන්නාම මොකද? අපි අපේ ප්‍රතිපත්තිය මත මේ පළාත් සභාවල හිටියාට කොහොමත් අපි පළාත් සභා පිළිගන්නා උදවිය නොවෙයි නේ? ඒක නිසා අපට කොහොමත් ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පළාත් සභාවේ ඉන්නවා නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා කථා කරන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ පළාත් සභාවලට විරුද්ධ වුණු දේශපාලන පක්ෂයක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. අපි විතරක් නොවෙයි. හරිද? ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තමයි -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අතපය කැපුවේ නැහැ. බෙලි කැපුවේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කරන්න එපා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සංවාදයක් කරමු. සංවාදයක් කරමු නේද? නිකන් අර ගැලරියට යන්න එපා. එහෙම යන්න එපා. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පවා මේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධ වුණු අය. හරි. නමුත් අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ඉන්නවා. අපිත් ඉන්නවා. මේ යථාර්ථය ඇතුළේ. මම කියන්නේ නැහැ නේ? නමුත් මගේ ප්‍රතිපත්තිය තිබෙනවා. නමුත් අපි මේකේ හිටියාට අපි මේ පළාත් සභා කියන එක

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

නැති වෙනවා නම් ඒකට කැමැති මිනිස්සු. නමුත් ඒක යථාර්ථයක් බවට පත් කරන්න බැහැ. ඒ නිසා අරගේ විග්නේෂ්වරන්ලා මීට වැඩිය බලතල ඉල්ලන්නේ. පළාත් සභා තිබෙන නිසා තමයි මේ මට්ටමට හරි මේ තත්ත්වය පවත්වාගෙන යන්නේ. ඒ නිසා ඒක අපට කරන්න දෙයක් නැහැ. ඒකත් බැලුවොත් එහෙම පෙර වැරැදි තමයි ඒවත්. මේක තමයි දැන් යථාර්ථය බවට පත් වෙලා තිබෙන්නේ. ඉතින් ඒක නිසා අපි කියන්නේ පාර්ලිමේන්තුවට මේ බලය පවරන එක සාධාරණයි. 225 කට බලය පවරන එක සාධාරණයි. එක්කෙනෙකුගේ අතට ඒ බලය දෙනවාට වඩා ඒක සාධාරණයි. ඒක මොන වාගේ පාර්ලිමේන්තුවක්ද කියන එක වෙනම වැඩක්. ඉදිරියේදී හැදෙන්නේ මොන වාගේ පාර්ලිමේන්තුවක්ද? කොහොමත් අපි විශ්වාස කරන්නේ නැහැ, ඉදිරියේදී හැදෙන පාර්ලිමේන්තුවට ඒ අත්තනෝමතික තීරණ ගන්න පුළුවන් පාර්ලිමේන්තුවක් හැදෙනවා කියලා. මේ තිබෙන තත්ත්වයන් අනුව කල්පනා කරලා බැලුවොත්, මේ දේශපාලන තත්ත්වයන්, මේ සමාජයීය තත්ත්වයන් කල්පනා කරලා බැලුවොත් වැරැදි වැඩක් කරන්න, වැරැදි තීන්දු තීරණ ගන්න හැදෙන පාර්ලිමේන්තුවක් කවදාවක්වත් මේ පාර්ලිමේන්තුවේ හැදෙන්නේ නැහැ. ඉදිරියේදී එන පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයෙන්, ඔය කොට්ඨාශ හා සමානුපාතික ක්‍රමයෙන් මිශ්‍රව එන මැතිවරණ ක්‍රමයෙන් කීයටවත් ඒ වැඩේ වෙන්නේ නැහැ.

ඒක නිසා අපි විශ්වාස කරනවා - ඉදිරියේදී පළාත් පාලන මැතිවරණය පවා එහෙමයි. පළාත් පාලන මැතිවරණය අලුත් ඡන්ද ක්‍රමය තුළ එන්නේ. ඒකේ අර සුපිරි සභාපතිවරයෙක් බිහි වෙන්නේ නැහැ. සුපිරි සභාපතිවරයෙකුට තමන්ගේ සල්ලි කන්දරාව දාලා මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් කළඹලා අරගෙන ඒක සම්පූර්ණයෙන්ම තමන්ගේ අතට අරගෙන ඒ ප්‍රාදේශීය සභාවේ අයිතිය ගන්න පුළුවන්කමක් ඉදිරි පළාත් පාලන මැතිවරණයේදී එන්නේ නැහැ. ඒක නිසා අන්න ඒවා එකින් එක, එකින් එක ප්‍රජාතන්ත්‍රවාදී පැත්තකට මේක හැසිරෙමින් යනවා. ගොඩක් නරක වැඩ අතරේ ඒ හොඳ ටිකකුත් වෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ. ඒක නිසා ඉදිරියේදී හැදෙන පාර්ලිමේන්තුවක් සම්බන්ධව මේකේ බලතල යනවයි කියලා නිකන් බොරු බියක් ඇති කර ගැනීමේ අවශ්‍යතාවයක් ඇති වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විධායකය අහෝසි කිරීම සම්බන්ධයෙන් -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. ඒකත් යනවා. විධායක අහෝසි කිරීම සඳහා ඒ වැඩෙත් පාර්ලිමේන්තුවේ කාරක සභාවේ තිබෙනවා. ඒ කාරක සභාවේ සාකච්ඡාව යනවා. එතැනදී ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන්ට කියන්න, විධායක ජනාධිපති ධූරය අහෝසි වීම සඳහා අවශ්‍ය සියලු සහයෝගය දෙන්න කියලා. ඒ වාගේම තමයි අර ප්‍රශ්නය තිබෙනවා. නිශ්චිත දිනයක් ඇතුළත් නොවීම. ඉතින් ඒක නිසා මෙන්න මේක තමයි ඇත්තටම අර මාක්ස් සහෝදරයා කියලා තිබෙනවා,

"*නීතිය වනාහි පාලක පන්තියේ කැමත්ත වන්නේ ය*" කියලා.

ඒ නිසා ඔය කොහොම වුණත් පාලක පන්තියේ කැමැත්තට තමයි නීති හැදෙන්නේ. ඒව කරකෝලා ගන්නේ ඒ විධියට. ඒ නිසා මෙතැන දැන් ඔබතුමන්ලා කොයි පැත්තෙන් නියෝජනය කළත්, දැන් අපට කොයි පැත්තකින් බාධා කළත් ඔබතුමන්ලා නියෝජනය කරන්නේ එකම පාලක පන්තිය. ඒකෙන් මම කියන්නේ නැහැ, ඔබතුමන්ලා අයිති ඒ පාලක පන්තියට කියලා. නැහැ, ඔබතුමන්ලා අපි වාගේ සාමාන්‍ය පන්තියට අයිති මිනිස්සු. අපි දන්නවා. නමුත් ඔබතුමන්ලා නියෝජනය කරන්නේ අර පාලකයාගේ කැමැත්ත, පාලක පන්තියේ කැමැත්ත. ඒ නිසා කෙහොමත් මේ ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරලයි කියලා ලොකු ප්‍රතිවිරෝධයක් හැදෙන්නේ නැහැ. ඔබතුමන්ලාගේ තිබෙන්නේ පොඩි මිතුරු ප්‍රතිවිරෝධයක්. දැන් මේක ආව දවසේ ඉඳන්ම පොඩි ගැටීමක් තිබුණා නේ? ඕක මිතුරුයි. ඔය ප්‍රතිවිරෝධය සතුරු ප්‍රතිවිරෝධයක් නොවෙයි. හැබැයි, මේවා සතුරු ප්‍රතිවිරෝධ බවට පත් වෙන්නේ මේ එක පළාත් සභාවකවත් බලය අර ප්‍රතිවිරුද්ධ පන්තියට ගියොත්. අන්න එදාට මේවා අර ඔබතුමන්ලා කියන විධියට වැඩ කරනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ කියන්නේ ජේ.වී.පී. එකට වාගේ ගියොත්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කියන්න බැහැ. ඒක නිසා අන්න එදාට මේවා - හරි. ඔබතුමන්ලා ඔය දකින දේවල්, සමහර හය, අන්න ක්‍රියාත්මක වෙන්නේ එදාට. ප්‍රතිවිරුද්ධ පන්තියකට බලය ගියොත්. නමුත් ඔබතුමන්ලාගේ තිබෙන මේ මිතුර ප්‍රතිවිරෝධය ඇතුළේ කවදාවක්වත් ඔය හිතන ආකාරයේ ප්‍රශ්නයක් මේක ඇතුළේ වෙන්නේ නැහැ. ඉතින් ඒ නිසා අපි කියන්නේ ඔබතුමන්ලාගේ තිබෙන්නේ ඔය මිතුරු ප්‍රතිවිරෝධයක් නේ? ඒ මිතුරු ප්‍රතිවිරෝධය ඇතුළේ අපි මොකටද ඕකේ මැද්දට පාත් වෙන්නේ. නේද? ඔබතුමන්ලාගේ බොහොම මිතුරු ප්‍රතිවිරෝධයක් තිබෙන්නේ. ඒ නිසා අපි මොකටද එන්නේ? අපට තිබෙන හොඳම දේ තමයි මේ වැඩේදී නිහඬව පැත්තකට වෙලා ඉන්න එක. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ස්තුතියි. මේ අවස්ථාවේදී සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Sirikamal Filician de Silva M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මොරිස් විජේරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසි වැනි ව්‍යවස්ථා සංශෝධනයට මාගේ අදහස් ඉදිරිපත් කරනවා. මේ වන කොට ශ්‍රී ලංකා රජයට නව ව්‍යවස්ථාවක් සම්පාදනය කරන්නට කටයුතු ඉෂ්ට සිද්ධ කරමින් පවතිනවා. 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් අපට ලබා දීපු බලතල විසි වන ව්‍යවස්ථා සංශෝධනයෙන් නැවත පවරා ගැනීමට සකස් වෙමින් පවතිනවා. මේ අනුව මට පෙනී යන එක දෙයක් තිබෙනවා. ඊයේ පෙරේදා මහනුවර සංචාරයකදී උතුරේ මහ ඇමැතිවරයා කියනවා, අපට ඕනෑ ෆෙඩරල් ක්‍රමයක් කියලා. රට කෑළි කඩන ව්‍යවස්ථාවක් ගේන්න හදන්නේ. මට හිතෙනවා. මම අනුමාන කරනවා. මේ පවතිමින් යන්නේ, මේ පළාත් සභාවල අවසාන කාලයද කියලා. එතැනින් එහාට අලුත් ව්‍යවස්ථාවක් මේ රටට සම්පාදනය වුණාට පස්සේ, ෆෙඩරල් ක්‍රමය යටතේ පවත්වන පළාත් සභාවක් හෝ ෆෙඩරල් ක්‍රමය යටතේ පවත්වන සමූහ ආණ්ඩුවක ක්‍රමයක්ද කියන එක මගේ සැකයට භාජනය වෙනවා. මෙවැනි ආකාරයේ සැක සිතෙන කරුණු ගණනාවක් අපේ සිත්වල තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය අපේ රට ගේන කොට අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්ව විධියට මේ විශාල භීෂණයක් ඇති කරමින් තමයි මේ ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. එදා උතුරු - නැගෙනහිර තිබුණු බලය බෙදා හැරීමේ ක්‍රියාදාමය තමයි 13 වැනි ව්‍යවස්ථාවෙන් දුන්නේ. ගිය ආණ්ඩුවලත් සමහර කරුණු පළාත් සභාවේ අනුමැතියට දැම්මා. පළාත් සභාවේ අනුමැතියට අරගෙන සමහරවිට අපි අනුමත කරලා යැව්වා. දැන් මේ වෙන්නේ, අපේ ධූර කාලය පිළිබඳ ප්‍රශ්නයක්. අපි එක හෙළාම පළාත් සභා මැතිවරණය එකම දිනයක තියන එකට කැමැතියි. ඒකේ කිසිම අකැමැත්තක් නැහැ. ඒ කැමැත්ත තිබෙන ගමන් මේ පළාත් සභාවල තිබෙන බලය, විසුරුවා හැරීමේ තිබෙන බලය - නාස් දෙකක් විදලා, බෙල්ලට තොණ්ඩුවක් දාලා ලණු දෙකම පාර්ලිමේන්තුවට දෙන්න හදනවා. අන්න ඒ ක්‍රමවේදයට තමයි අපේ විරුද්ධතාවය. අද යහපාලන ආණ්ඩුවක් තිබෙන්නේ. ජාතික ආණ්ඩුවක් කියන දෙක තුළ ඉදිරියේදී වෙන ආණ්ඩු එන්න පුළුවන්. ඒ වෙන ආණ්ඩු ආවත් මේ පළාත් සභාවේ පැවැත්ම තීරණය කරන්නේ, මේ පනත අනුව පාර්ලිමේන්තුවයි. අන්න ඒකට තමයි එකඟ වෙන්න බැරි කථාව තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා කියලා අපි බොහොම පුන පුනා කියන, ඕනෑ දෙයක් විවේචනය කරන්න පුළුවන් කියන මේ සමාජය තුළ මේ පනත් හරහා ගේන දේ මොකක්ද කියන එක අපි දකින්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා, අපේ ගරු මහ ඇමැතිතුමා මීට සති දෙකකට, තුනකට කලින් අපි ඇහුවා සංශෝධන යවන්න කියලා. මම පත්තරයක Artical එකක දැක්කා. මේ මැතිවරණ ළඟ එන කොට අගමැතිතුමා කියලා තිබෙනවා, මේ මැතිවරණ තියන්න කාලයක් නොවෙයි.

[ගරු මොරිස් විජේරත්න]

මේක කල් දාන්න අවශ්‍ය කටයුතු කෙරෙන්න ඕනෑය කියලා. අන්න ඒ හරහා තමයි මේ විසි වැනි සංශෝධය එන්නේ. ඒ විසි වැනි සංශෝධනය එන කොට ඒ කියන ඒවාට අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සභාවේ අවශ්‍ය කරන සහයෝගය ගන්න කථිකාවක් ඇති වෙලා තිබෙන්නේ. ඉහළ බලාධිකාරීන් කියනවා, පළාත් සභාවට. උඹලාට පක්ෂයෙන් Nomination දෙන්නේ නැහැ. මේක අනුමත කරලා එවන්න කියලා. හෘද සාක්ෂියට එකඟව මොන ආකාරයෙන් හරි මේකට අපට කැමැති වෙන්න හැකියාව තිබුණත්, එකම දිනයට කැමැත්ත තිබුණත් අපේ බලය පාර්ලිමේන්තුවට දෙන එකට අපට මොන ආකාරයෙන්වත් කැමැති වෙන්න පුළුවන් හැකියාවක් නැහැ. මෙන්න මේක තමයි අපට තිබෙන්නේ.

අනික් එක ගරු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ වන කොට ඡන්ද ක්‍රමය සකස් වෙමින් යනවා. පළාත් පාලන ආයතන ටික විසුරුවා හැරලා මේ වන තෙක් පාර්ලිමේන්තුවේ අවශ්‍ය කරන සංශෝධන ටික ගෙනැල්ලා පළාත් පාලන මැතිවරණය තියන්න මට්ටමක නැහැ. අවුරුදු දෙකක් ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. මේක ගරු ජනාධිපතිතුමා ගිය මැතිවරණ කාලයේ මැතිවරණ ක්‍රමයේ සංශෝධනය ගැන කථා කළා. කාටද මේ උවමනාව තිබුණේ, අවුරුදු 2 ½ ක් යනතුරු මේ පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනය කරලා ගේන්න. එතකොට දැන් මේ අවස්ථාවේ අපේ ඉදිරියේ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පත් කරලා, මේ කටයුතු කරගෙන යනවා. අපේ ජනතාව කවුරුත් ව්‍යවස්ථා සංශෝධනයක් ඉල්ලන්නේ නැහැ. මේක ඉල්ලන්නේ උතුරට ෆෙඩරල් ගේන්න. උතුරට ෆෙඩරල් දෙන්න කථා කරන කොට මේක සනාථ කරනවා, උතුරේ විග්නේෂ්වරන් මහ ඇමතිවරයා මහනුවර ඇවිල්ලා අපට ඕනෑ ෆෙඩරල් පාලන ක්‍රමයක් කියලා. ඒ නිසා අපට තිබෙන ගැටලුව, අපි හිතනවා එහෙම නම් පළාත් සභාවල අවසාන කාලය ඉතුරු වෙලා පාර්ලිමේන්තුවට ගියාට පස්සේ ෆෙඩරල් ක්‍රමයට අපිවත් සම්බන්ධ කරලා ඒක එයිද කියන සැකය තමයි අපට තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතින් මේක දාලා මේ කැරට් අලේ ඉස්සරහාට පෙන්නලා උතුරේ කැමැත්ත ගන්න පුළුවන්. ෆෙඩරල් ගේන්න පුළුවන්, මේක ගේන්න පුළුවන් එක කියලා. ඉතින් මේ දේවල් එක්ක අපට කථා කරගන්න හරි අමාරු තත්ත්වයක් තිබෙන්නේ. එතකොට මේ පළාත් සභාවේ තිබෙන බලය, මන්ත්‍රීවරු, මහ ඇමැතිතුමා. ආණ්ඩුකාරතුමා - දැන් මෙතුමාගේ කථාවේදී කිව්වා. මහ ඇමැතිතුමා රජයේ නියෝජිතයා. ජනාධිපති නියෝජනය වෙන්න ආණ්ඩුකාරවරයා ඉන්නවා. විසුරුවා හැරීමේ බලතල තිබෙනවා. ඕනෑ වෙලාවක කැමැත්ත අරගෙන විසුරුවා හරින්න පුළුවන්. එතකොට ඡන්ද ක්‍රමය තිබෙන මැතිවරණ ක්‍රමය තමයි අපට තිබෙන්න බැරි. මේක බොහොම සරල කාරණයක් තිබෙන්නේ. මේක දාන්නේ නැතිව ඡන්ද ක්‍රමය නිශ්චිත දිනයක තිබෙනවා කියලා එව්වා නම් අපි සියලුදෙනාම මේ වැඩේට කැමැතියි. අපි සියලු දෙනාම කැමැතියි. මේක වක්‍රාකාරයෙන් හංගලා ගහන එකට තමයි අපට එකඟ වෙන්න බැරි. ඒක තමයි අපට තිබෙන ප්‍රශ්නය. මේක අපට තේරෙන්නේ නැහැ. මොකද, අතීතය දිහා අරගෙන බැලුවාම මේ මැතිවරණ ගැන තිබෙන අත්දැකීම්, යහපාලන රජයද මන්දා අපට හිතාගන්න බැහැ. ලොකු ව්‍යසනයන් සිදු වුණා. ඩෙංගු රටම වෙලා ගත්තා. නිසි කළට මහජන නියෝජිතයන් ආයතනවල නැතිවීම තුළින්. මොකද මහජන නියෝජිතයන් පළාත් පාලන ආයතනවලට පත් කරලා තිබෙන්නේ නිලධාරීන් සමඟ මහජන නියෝජිතයන් තිබ්බාම තමයි ඒක යහපත් ආකාරයෙන් ක්‍රියාත්මක වෙන්නේ කියලා. අද ඒක අවුරුදු 2 ½ ක් තිස්සේ නිලධාරීන් පාලනය කරන්නේ. සමහර වෙලාවට වැඩක් කරගන්න ගියාට දන්නේ නැහැ. ගමේ වැඩකට ගිහින් PHI මහත්තයාව හම්බ වෙන්න කියනවා. ගමේ ඉන්න මිනිහා දන්නේ නැහැ, PHI මහත්තයා කවුද කියලා. හැබැයි, අපේ ගමේ මෙම්බර්ව දන්නවා. නාගරික මන්ත්‍රීවරයාව දන්නවා. ඔහුට ගිහිල්ලා කිව්වාම කාණු ටික සුද්ද කරනවා. කුණු ටික අද්දනවා. මේවා ටික කරනවා. ඒ වාගේම තමයි පළාත් සභා මන්ත්‍රීවරයාවත් දන්නවා. පළාත් සභාවේ ඉන්න නිලධාරීන් කවුද කියලා රටේ ජනතාව දන්නේ නැහැ. මේ ඕනෑ දිනයක, නිශ්චිත දිනයක නැතුව ඕනෑම දිනයක මේ පනත සම්මත වුණාට පස්සේ ඕනෑ දිනයක අහන්න පුළුවන්.

හැබැයි මම දැක්කා, පසුගිය දවස්වල නීතිපතිතුමා විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයට ඇවිල්ලා කියනවා පනත සම්මත වෙලා වසරක් තුළ මේ මැතිවරණ තියනවා කියලා. මෙයින් එකක් කියනවා. මොකක්ද මේ තත්ත්වය? අපේ හෘද සාක්ෂියට එකඟව අපි මහජන නියෝජිතයින් හැටියට ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන අය හැටියට පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපට එකඟ වෙන්න හැකියාවක්

තිබෙනවාද? කියලා මම අහනවා. මේ නිශ්චිත නැති අපට නාහෙට දාපු ලණුවයි, බෙල්ලට හිර කරපු තොණ්ඩුවයි පාර්ලිමේන්තුවට අපි දෙන්න කැමැති වෙනවාද? මෙන්න මේකයි අපට තිබෙන ගැටලුව. ඉතින් මේ ටික අපි හොඳට තේරුම් ගන්න ඕනෑ.

ඉතින් මේ ආකාරයේ වැඩ කටයුතු කිරීමේදී අපි මේ වන කොට අපේ රටේ උතුර පරාදයි. ඌව පරාදයි. දකුණේ පරාදයි. හැබැයි, උතුරු මැද ජයග්‍රහණය කළා. මොකද, උතුරු මැදයි, සබරගමුවයි නැගෙනහිරයි මේ කාලසීමාවේදී විසුරුවා හරිනවා. ඔවුන් කැමැතියි ඔවුන්ගේ කාලය දික් කරනවාට. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි දැන් මේක ඌවට, බස්නාහිරට කාලය අප්‍රේල් 20 තුරු තිබෙනවා. සැප්තැම්බර් අග වෙනකන් තිබෙනවා. ඌව පළාතට. මේ දෙක අතර තමයි කතන්දරය තිබෙන්නේ. මේ දේවල් කොහොමද අපි විසඳගන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 19 වැනි සංශෝධනයෙන් අපි දුන්නා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය කෙරෙන්නේ කොහාමද කියලා. ඒක ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි කරන්න බැහැ, අවුරුදු 4 කට නැත්නම්, 4 ½ ට කලින් යනවා නම්. වේලාසනින් විසුරුවා හරිනවා නම් කැමැත්ත ප්‍රකාශ කරලා ලිපියක් තිබෙන්න ඕනෑ. 2/3 කැමැත්තක් තිබෙන්න ඕනෑ. හැබැයි, ඒක පළාත් සභාවට නැහැ. ඒකයි කතන්දරය තිබෙන්නේ. පාර්ලිමේන්තුවට එක හැන්දකිනුත්, පළාත් සභාවට එක හැන්දකිනුත් බෙදන ක්‍රමය මොකක්ද මේ? කරුමෙට බිහි වුණු අවජාතක දරුවා හින්දාද පළාත් සභා ක්‍රමය තුළ මේ විධියට අරියාදුකම් කරන්නේ. ඒක හින්දා අපි පැහැදිලිව කියනවා. පක්ෂ දෙකක් එකතු වෙලා කරන මේ රජය තුළ, මේ දෙපැත්තේම ඉන්නවා ආණ්ඩු පක්ෂයයි, විපක්ෂයයි කියන එක. එතකොට මේ මතය රජයෙන් ඇවිල්ලා තිබෙන්නේ. ගරු ජනාධිපතිතුමාගේ මතය තමයි පළාත් සභාවට මේ අහලා එවලා තිබෙන්නේ. එතුමාට තිබෙන බලය. හැබැයි එතුමාට තිබෙන බලයත් පාර්ලිමේන්තුවට උදුරා ගන්නවා. පාර්ලිමේන්තුව ලබා ගන්නවා. මෙතුමා කියනවා, පාර්ලිමේන්තුවේ 225 කට යනවා කියලා. 225 ට ගියත් ක්‍රියාත්මක කරන්නේ එක නිලධාරියා. විධායක අගමැති වාගේ තමයි විධායක ජනාධිපතිකමත්. විධායක ජනාධිපතිකම පාර්ලිමේන්තුවේ විධායක අගමැති වෙලා ඉන්නවා. හැබැයි බලයක් නැතිවත් අගමැතිවරයාත් විධායක විධියට හැසිරෙනවා නම් රටේ විධායක බලය තිබෙන ජනාධිපතිවරයාට තිබෙන බලතල පාර්ලිමේන්තුවට ගන්න යනවා නම් අපි පැහැදිලි ලෙසම විරුද්ධතාවය ප්‍රකාශ කරනවා කියන එක ප්‍රකාශ කරමින්, විශේෂයෙන්ම පළාත් සභා මැතිවරණය එකම දිනයක පවත්වනවා නම් අපි කැමැතියි. ඒ වාගේම අපට තිබෙන නාස් ලණුවයි, බෙල්ලට තොණ්ඩුවයි දෙකම පාර්ලිමේන්තුවට දෙන එකට අපේ විරෝධතාවය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. වෙලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් පළාත් ආණ්ඩුවට පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් සභාවේ නිල කාලය පවත්වාගෙන යෑම සඳහා පළාත් සභා පිහිටුවීම, පළාත් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම ආදී ප්‍රමුඛ විෂයයන් පිළිබඳව අපි බොහෝ දුරට අධ්‍යයනය කරමින් මේ පළාත් සභාව පුරා වසර විසි අටකට ආසන්න කාලයක් තිස්සේ පවත්වාගෙන පැමිණ තිබෙනවා. අද සම්මුතිවාදී ආණ්ඩුවක්. ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව. විධායක ජනාධිපතිවරයා එක් පක්ෂයකත්, පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යවරයා තවත් පක්ෂයක යැයි කියමින් රාජ්‍ය පාලනය කරන සමයක විධායක ජනාධිපතිවරයාට 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පැවරී ඇති බලතල අකර්මන්‍ය කිරීම සඳහා මෙවැනි යෝජනාවක් පළාත් සභාව වෙත යොමු වීම පිළිබඳව විටෙක අපට ඇති වන්නේ විමතියක්. කෙසේ වෙතත් මට මෙම පළාත් සභාවේ පූර්ණ කාලය තුළ, පළාත් සභාවක් විසුරුවා හැරීමෙන් අනතුරුව නැවත පළාත් සභාවක් පිහිටුවන්නට යෙදෙන කාලය තුළ මෙම කාලය තුළ, පළාත් සභා බල රහිත කාලය තුළ පාර්ලිමේන්තුව මේ බලය ප්‍රාර්ථනා කිරීමේ අභිලාෂය කුමක්ද කියන එක පිළිබඳව දැවැන්ත ගැටළුවක් මතු වෙනවා. ඊට හේතුව, පසුගිය දවස්වල අපි දැක්කා පළාත් සභාවේ බලය බෙදා හැරීමේදී පනවා ඇති සීමාවන් පිළිබඳව. සංවෘත ලැයිස්තුව, ඒ වාගේම පළාත් සභා ලේඛනය සහ අපි හැමෝටම බලය බෙදා හරින සමගාමී ලැයිස්තුව පිළිබඳ කාරණා. දැන් මේ සමගාමී ලැයිස්තුවේ විෂය පද්ධතිය පිළිබඳව පළාත් ආණ්ඩුවක් තීරණය කිරීමේදී මේ වකවානුව තුළ ක්‍රියා කරන්නේ කුමන ආකාරයටද කියන එක පිළිබඳ, පැහැදිලි කිරීම් අපට තවම දකින්න නැහැ. පළාත් ආණ්ඩු හැසිරීමේදී කළ අත්තනෝමතික ක්‍රියා පිළිබඳව පසුගිය කාල

[ගරු ජගත් අංගගේ]

පරිච්ඡේදය පුරාම අපට අහන්න දකින්න ලැබුණා. ඒ සමහර වකවානුවල එවැනි ක්‍රියා කිරීමේදී විධායක ජනාධිපතිවරයා සිය ආණ්ඩුකාරවරයාගේ බලය හරහා එකවර පාලනය කරපු අවස්ථා ද අපට එමට දකින්නට ලැබුණා. නමුත්, පාර්ලිමේන්තුවක තිබෙන ව්‍යවස්ථාදායකයේ බලයේ පිහිටුවීම අනුව එවැනි තීන්දු තීරණ ගැනීමට පාර්ලිමේන්තුවට පුළුවන්කමක් නැහැ. ඔවුන්ගේ මන්ත්‍රී මණ්ඩලය වෙත යොමු කරලා, පාර්ලිමේන්තුවේ අනුමැතිය අරගෙන තමයි අග්‍රාමාත්‍යවරයාට මේ පිළිබඳව තීන්දු තීරණ අරගෙන ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය සඳහන් වෙලා තිබෙන්නේ. විධායක බලයත් අග්‍රාමාත්‍යවරයාට නැහැ. ඒ නිසා යම් හදිසි තීන්දුවක් ගැනීමට අදාළ සිදුවීමක් උතුරු නැගෙනහිර ප්‍රදේශයේ හෝ වෙනත් ප්‍රදේශයක සිදු වුවහොත් ඒ වැඩේ ඉවර වෙනකල්, ඒ වැඩේ නතර කරන්න පාර්ලිමේන්තුවට හැකියාවක් නැහැ. පාර්ලිමේන්තු ක්‍රියාදාමය තුළ. විධායක ජනාධිපතිවරයාට පළාත් සභාව සතුව තිබෙන මේ සුවිශේෂ බල අධිකාරිය පිළිබඳව අපට පැහැදිලි කර ගන්න බැරි නම්, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රසූත කරන අවස්ථාවේදී වින්නඹුකම කළ ඉන්දියන් මහ කොමසාරිස් ඩික්සිත් මහත්තයාගෙන්වත් අහන්න ඕනෑ, මේක කොහොමද කරන්න ඕනෑ කියලා. මේක ඉතාමත් භයානක කාරණාවක්. අපට පැහැදිලිව පෙනෙනවා, දැන් උතුරු නැගෙනහිර ප්‍රදේශවල සිදු වන සිදුවීම්. හමුදා කඳවුරු ඉවත් කිරීම්, හමුදාවට ප්‍රහාර එල්ල කිරීම්, මංකොල්ලකෑම්, බලයට නින්දා අපහාස කිරීම, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට - සමස්තයක් වශයෙන් රට ඇතුළේ විශ්ව විද්‍යාල පද්ධතිවල එක හා සමානව අධ්‍යාපන කටයුතුවලට යෙදීමට තිබෙන අවස්ථාවට බාධා කිරීම්. මෙවැනි ක්‍රියාවලියන් අතරතුර, මේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිවරයාට, ආණ්ඩුකාරවරයාට සහ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා සතු බලය ඔවුන්ගෙන් ඉවත් කිරීම, ගිලිහී යාම තුළ මොන තරම් ව්‍යාකූල අවස්ථාවක් මේ සමගාමී ලැයිස්තුවට සමගාමීව සිද්ධ වෙන්න පුළුවන්ද කියන කාරණාව පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ සහ සභාවේ අවධානයට ලක් කරන්න මම කැමැතියි.

විශේෂයෙන්ම මට නැවතත් මතු වන කාරණාව තමයි. සම්මුතිවාදී ආණ්ඩුවක මේ ගෙනියන වැඩ පිළිවෙළට පළාත් සභාවේ පවතින මේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඡේදයන් නොගැලපෙන්නේ මන්ද කියන කාරණාවයි. දැන් මේක අපට, මුළු රටටම පෙන්නුවේ සියලුම පළාත් සභා එක් දිනකදී පැවැත්වීමට තිබෙන අවශ්‍යතාවය පදනම් කර ගන්න ඉදිරිපත් කරන්නාවූ සංශෝධනය 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන්. ඒ පිළිබඳව කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ පළාත් සභාවේ ඉන්න සියලුම ගරු මන්ත්‍රීවරුත් එකඟයි. රටත් එකඟයි. රටේ ජනතාව ඒකට කිසිම විරෝධතාවයක් නැහැ. නමුත් අපට මතු වන ප්‍රධානම ගැටළුව තමයි රටේ ජනාධිපතිවරයාට සහ ආණ්ඩුකාරවරයාට පළාත් සභාව සතුව තිබෙන බලය පාර්ලිමේන්තුව උදුරා ගැනීමට වෙර දරන්නේ කුමන අභිලාෂයක් මුදුන් පත් කර ගැනීම පිණිස ද කියන කාරණාව. පසුගිය දවස්වල රනිල් වික්‍රමසිංහ ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු ඔහුගේ කැබිනට් මණ්ඩලය ගත් තීන්දු තීරණ අනුව මේ රටේ ඒකීයභාවයට මොන තරම් දරුණු විනාශයක් සිද්ධ වෙලා තිබෙනවාද කියන කාරණාව පිළිබඳව මම මේ සභාවට පැහැදිලි කිරීම අවශ්‍ය වන්නේ නැහැ. එය ඔබ කවුරුත් දන්නා කාරණාවක්.

රටේ සුවිශේෂී ස්ථාන, එක් එක් පළාත් සභාවට වැදගත් සුවිශේෂ ස්ථාන විදේශිකයන් සතු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග. ඒ වාගේම ආගමික වශයෙන් පවත්නාවූ විවිධ ප්‍රශ්න සඳහා යුක්තිගරුක සාධාරණ විසඳුම් ලබා දීමට තිබූ අපොහොසත් භාවය. මෙවැනි කාරණා නිසා මහා දැවැන්ත විධියට ශ්‍රී ලාංකීය ජන සමාජයට මහා දරුණු අතුල් පහරක් ඔවුන්ගේ තීන්දු තීරණ තුළ එල්ලිලා තිබෙන කාරණාව අපි කවුරුත් දන්නා කාරණාවක්. මේ තුළ මෙය ප්‍රමාණාත්මකව තව වැඩි වීමක් මිසක් කිසිසේත්ම අඩුවීමක් සිදු වන්නේ නැහැයි කියන තත්ත්වය අපි ඉතාමත් පැහැදිලිව දන්නවා. පළාත් සභාව යම් තැන්වල අත්තනෝමතිකව හැසිරීම පිළිබඳව පසුගිය දවස්වල විවිධ අදහස් යෝජනා ඉදිරිපත් වීමෙන් අපි දැක්කා. ඒ නිසා ජනාධිපතිවරයා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාද? ආණ්ඩුකාරවරයා කවුද? පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා කොයි නමින් හඳුන්වන කවුද කියන ප්‍රශ්නය අපට අදාළ වන්නේ නැහැ. අපි කථා කරන්නේ සමස්තයක් වශයෙන් පළාත් සභා ක්‍රමය සහ එහි බලය බෙදා හැරීම පිළිබඳ ප්‍රශ්නය. සංවෘත ලැයිස්තුවේ ප්‍රශ්න පිළිබඳව අපට ප්‍රශ්නයකුත් නැහැ. ගැටළුවකුත් නැහැ. ඒක මධ්‍යම රජය, විශේෂයෙන්ම ගුවන්, අධ්‍යාපනය අපි දෙපැත්තටම ක්‍රියාත්මකයි. නමුත් ගුවන් නියමුවන් පුහුණු

කිරීමේ කාර්යභාරය පළාත් සභාවට පැවරෙන්නේ නැහැ. ඒක මධ්‍යම රජයේ විෂය පද්ධතිවල රඳවාගෙන තිබෙනවා. බැරි වෙලාවක්වත් එහෙම විග්නේෂ්වරන් මහත්තයා ගුවන් නියමුවන් පුහුණු කිරීමේ අධ්‍යාපනික ආයතනයක් ආරම්භ කළොත් විධායක ජනාධිපතිවරයාට කෙලින්ම කියන්න පුළුවන්, කරුණාකරලා ඔබේ විෂය පද්ධතියෙන් මම ඒක නතර කරනවාය කියලා. ඒ සමගාමී ලැයිස්තුවේ ජනාධිපතිවරයා සතුව තිබෙන බලතල අනුව. නමුත් මට ප්‍රශ්නයක් තිබෙනවා. අද දවස වන කොට අග්‍රාමාත්‍යතුමාට සහ කැබිනට් මණ්ඩලයට මේක කියා ගන්න හයියක් තිබෙනවාද නැද්ද කියන කාරණාව. මේක මහ ලොකු ප්‍රශ්නයක්. ඔවුන් ඒ පිළිබඳව තීන්දුවක්, තීරණයක් අරගෙන මෙසේ විග්නේෂ්වරන් මහතා විසින් උතුරු ප්‍රදේශයේ ගුවන් නියමුවන් පුහුණු කිරීමේ අධ්‍යාපනික ආයතනයක් විවෘත කිරීමට සූදානම් වෙනවා. ඒකට විරුද්ධව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනැල්ලා, මත විමසීමක් කරලා මේක පිළිබඳව සේරම ලැහැස්ති කරලා එන කොට විග්නේෂ්වරන් මහත්තයා පුහුණු කරපු ගුවන් නියමුවත් එක්ක දකුණටත් ඇවිල්ලා ඉවරයි. ඒ නිසා මේ තරම් සැහැල්ලුවට සිතීම, මේ බස්නාහිර පළාත් සභාව වැනි ගෞරවනීය සභාවකට ඉතාමත් වැදගත් කාරණාවක් හැටියට මම සලකනවා. ආණ්ඩුකාරවරයාගේ, ජනාධිපතිවරයාගේ සහ ප්‍රධාන අමාත්‍යවරයාගේ බලය ඉවත් වීම පමණක් නොවෙයි. මෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය සහ අපේ රීති පද්ධතිය සමස්තයක් කොට අහෝසි කොට නැවත සංශෝධනය කිරීමට සිදු වෙනවා, මේ පනත සම්මත කර යවනවාත් සමඟම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක මහා ඛේදවාචකයක්. මෙවන් දේ සිදු කිරීම සඳහා මේ පළාත් සභාව අනුමැතිය දෙනවා නම්, ඔබ පළාත් සභා මන්ත්‍රීවරයෙකුට නුසුදුසුකමක් ලබන කෙනෙකු සේ සැලකිය යුතුයි. ඒ කිසිම අනුමාන වීමක් නැහැ. ඒ තමයි සත්‍යවාදීව සිතිය යුතු කාරණාව. මොකද හේතුව, අපි මේ පළාත් සභාව තුළ යම්කිසි අරමුණක් ඉෂ්ට කර ගැනීම සඳහා මේ පනතින් සහ 13 වන සංශෝධනයෙන් සහ මේ රීති පද්ධතිය තුළ ක්‍රියාත්මක වන - අනික් කාරණාව, උදේ ඉඳන් විවාදයට ලක් වුණු කාරණාවක්. මේ සභාව තුළ මේ පිළිබඳව කෙහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය සම්බන්ධව පාර්ලිමේන්තුව පනතක් සංශෝධනය කිරීමේදී සභාවේ මතය විමසීම පිළිබඳව පෙන්නුම් කර ඇති කාරණාව පිළිබඳව ඉතාමත් කෙටි සටහනක් තිබෙන්නේ. ඒ තුළ මෙවැනි ගැටළුකාරී තත්ත්වයක් ඇති වූ අවස්ථාවක ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ පැහැදිලි කිරීම් නැහැ. ඒ වාගේම අපේ රීති පද්ධතියෙත් එසේ වූ කාරණා පැහැදිලි කිරීම් නැහැ. එසේ නම් මේ පිළිබඳව ක්‍රියා කිරීමේදී පළාත් සභාව විසින් කරන ලද මත විමසීමකදී ගරු මන්ත්‍රීවරුන් විසින් කරන්නා වූ සංශෝධන පිළිබඳව, ඒ සංශෝධන ඉදිරිපත් කරනවා යනුවෙන් හැඳින්වෙන්නේ ඉදිරිපත් කරන මූලික පනත පිළිබඳව ඒ සභාවේ එකඟතාවයක් පවතිනවාද නැද්ද කියන කාරණාව. සමස්තයක් වශයෙන් එවන ලද පනත පිළිබඳව සභාව එකඟ වෙනවා නම්. එකඟතාවයක් තිබෙනවා නම් කිසි කථාවක් නැහැ. ඒකඡන්දයෙන් හරි, නැත්නම් ඡන්ද විමසීමෙන් හරි ඒක සම්මත කරලා යවන්න පුළුවන්. එසේ සම්මත නොකොට එහි ඉදිරිපත් කරන ලද සංශෝධන ප්‍රතික්ෂේප කරලා අප විසින් සංශෝධන ඉදිරිපත් කරනවාය යනුවෙන් හැඳින්වෙන්නේ එවන ලද පනතට මේ සභාව එකඟ නොවන බවත්, ඒ සඳහා වෙනස් විය යුතු ආකාරය පිළිබඳව පැහැදිලි කිරීමක් කර ඇති බවත්. සංශෝධිත යෝජනාවක්, ඒ සමඟ සංශෝධිත පනත් කෙටුම්පතක් අපට සකස් කිරීමේ මූලික අයිතිය මේ සභාව සතුව තිබෙනවා. එහෙම නැත්නම් අපේ මතය විමසන්න ඕනෑ නැහැ. තනියම කර ගත්තහැකි. මොකටද අපේ මතය විමසන්නේ? මතය විමසීම සඳහා අවස්ථාවක් සලසා දීම පැත්තේ පළාත් ආණ්ඩුවකට තිබෙන ස්වාධීනත්වයට ගරු කිරීමක් හැටියට. ඒ පළාත් ආණ්ඩුවක් සතුව තිබෙන ස්වාධීනත්වය පාවා දීම හෝ එය ගරු කොට සලකා ඒ අවස්ථාව ආරක්ෂා කර ගැනීම එම පළාත් සභාව නියෝජනය කරන සමස්ත මන්ත්‍රීවරුන්ගේ වගකීම වෙනවා. මේ වගකීම මේ පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන් පැහැර හරිනවාද? නැත්නම් ඔවුන් පත් කළ ජනතාවට කරන උපහාරයක් හැටියට මේ ව්‍යවස්ථාදායක සභාව, මේ ප්‍රදේශයේ ජනතාව පිළිගන්නා නිසා තමයි ඒ ව්‍යවස්ථාවට අනුකූලව මේ මන්ත්‍රීවරුන්ට ඡන්දය පාවිච්චි කරලා, ඒ ගරු මන්ත්‍රීවරුන්ව තෝරා පත් කරලා මේ පළාත් සභාවට එවලා තිබෙන්නේ.

එසේ නම්, ඒ නීති රාමුව සහ ඒ පළාත් සභාවේ නෛතික අයිතිය ආරක්ෂා කර ගෙන, ජනතාවට සේවය කිරීමට මේ ගරු මන්ත්‍රීවරුන් දිවුරා ප්‍රකාශ කොට තිබෙනවා. ඔවුන්ගේ දිවුරුම් ප්‍රකාශය අනුව, ඔවුන් ඒ කටයුත්ත පැහැර හරිනවා නම්, ඔවුන්ගේ මන්ත්‍රී ධූරය කොතෙක් දුරට ගලපා

[ගරු ජගත් අංගගේ]

ගන්න හැකිද කියන කාරණාව පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලි කර ගත යුතුව පවතිනවා. ඒ නිසා අද දවස තුළ මේ අපට ඉදිරිපත්ව තිබෙන ප්‍රශ්නයට පැහැදිලිවම පළාත් සභාවක් හැටියටත්, ජාතික මට්ටමිනුත්, ජනවාර්ගික තත්ත්වයන් තුළත් මේ රටේ මැතිවරණ ඉතිහාසයේ තිබුණු මහා බෙදවාවකයන් තුළත් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී මීට පැහැදිලි තීන්දුවක්, තීරණයක් මුළු සභාව හැටියටම - මේක එක්සත් ජාතික පක්ෂයද? මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද? එහෙම නැත්නම් මේක පොහොට්ටුවද? එහෙම නැත්නම් නෙලුම් කොළය කියන ප්‍රශ්නය නොවෙයි මෙතැන තිබෙන්නේ. පොහොට්ටුවෙන් ආවත්, කොළයෙන් ආවත්, අතෙන් ආවත්, පයින් ආවත්, මේ කටයුත්තේ අවසානයක් වශයෙන් එක්තරා ස්ථාපිත ව්‍යවස්ථාදායක සභාවක බලය පිළිබඳ කාරණාවක් තමයි අවසානයේ අපි කාටත් පොදුවේ මතු වෙන කාරණාව වන්නේ.

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය තුළ ඡන්ද විමසීමකට වඩා වැදගත් වෙන්නේ, අපි ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට - නීති සම්පාදනය කරන ආයතන දෙකයි රට තුළ තිබෙන්නේ. එකක් පාර්ලිමේන්තුව. අනික් එක පළාත් සභාව. පළාත් නවයකට කැඩිලා, එක් එක් පළාත් සභාවල ජනවාර්ගික කෝණයකින් බලලා තීන්දු තීරණ අරගෙන රට තුළ ෆෙඩරල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කර ගැනීම සඳහා වෙර දරන කණ්ඩායමක් එක පැත්තකින් බලාගෙන ඉන්නවා. ඒ අය කේන්ද්‍ර කර ගෙන රටේ නීතිය සකස් විය යුතුයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. රටේ ප්‍රතිපත්ති සම්පාදනය විය යුතුයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. හැබැයි, මේ රටේ ජීවත් වන සියලුම ජනතාවට ශ්‍රී ලාංකිකයින් හැටියට ජීවත් වීමට තිබෙන අයිතිය තහවුරු කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සහ එහි සංශෝධන තහවුරු කිරීම මේ රටේ සියලුම ව්‍යවස්ථාදායක මණ්ඩල නියෝජනය කරන සභිකයින්ගේ වගකීමක් හැටියට මම සලකනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව තීන්දු තීරණ ගැනීමේදී අපි කවුරුත් මේ පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට සලකා මිස පක්ෂ භේදයෙන් බෙදිලා, වාර්ගික භේදවලින් බෙදිලා විවිධ වූ සංයුතීන්වලට බෙදිලා තීන්දු තීරණ ගැනීම නොගැලපෙන කාරණාවක් හැටියට සලකා අපි සියලු දෙනාම පළාත් සභාවේ ගරුත්වය සහ පළාත් සභාවේ ජනතාවට සේවය කිරීමට තිබෙන බලය තහවුරු කර ගැනීමට එකට සිට ක්‍රියා කරමුයි කියන යෝජනාව ඉදිරිපත් කරමින් ඔබට ස්තූතිවන්ත වෙනවා.

## எஸ். குஹவரதன்
Hon. S. Kuhawarthan

மதிப்பிற்குரிய கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, கொண்டுவரப்பட்ட இருபதாவது சீர் திருத்தம் சம்மந்தமான இந்த விவாதத்திற்கு எனக்கு கால அவகாசம் தந்தமைக்கு உங்களுக்கு முதற்கண் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அமெரிக்காவை அண்மையில் தாக்கிய இர்மா புயல் போன்று ஒரு விடயம் எம்மை வந்து சேர்ந்திருக்கின்றது. மாகாண சபையின் அதிகாரங்களை பிடிங்கி எடுத்து அதனை பாராளுமன்றத்திற்கு தாரை வார்ப்பதற்காகவா 2015 ஆம் ஆண்டு நாங்கள் நல்லாட்சி அரசாங்கத்தை கொண்டுவந்தோம், என்பதை இத் தருனத்தில் கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

வட மாகாண சபை, கிழக்கு மாகாண சபை, ஊவா மாகாண சபை, மத்திய மாகாண சபை என்பவற்றின் கீழே பிரதிநிதித்துவப்படுத்தப்படுகின்ற சிறுபான்மை மக்களுக்கு 1987 ஆம் ஆண்டு ஜே.ஆர். ஜயவர்தன அவர்களும், ரஜிவ்காந்தி அவர்களும் கொண்டுவந்த பதின்மூன்றாவது உடன்படிக்கையின் கீழே மாகாண சபைக்கான அவ் அதிகாரங்கள்,பதின்மூன்றுக்கு அப்பால் செல்லும் என்று கூறிய பின்னர், இந்த இருபதாவது சீர் திருத்தம் எமக்கு இர்மா புயல் போன்று தலையிலே அடித்திருக்கின்றது.

இவ் இருபதாவது சீர்திருத்தத்திலே,தேர்தலை ஒரு நாளுக்கு கொண்டு வந்து மாகாண சபையில் அக் குறித்த நாளிலே அத் திகதியைத் தீர்மானிப்பது என்பது உண்மையிலேயே வரவேற்கத்தக்க விடயம். ஏனென்றால் இந் நாட்டிலே கடந்த ஆட்சிக் காலத்தில்நடைபெற்ற ஊழல், கடந்த ஆட்சிக் காலத்தில் நடைபெற்ற தேர்தல் சம்மந்தமான ஊழல்கள் இல்லாமல் ஒழிக்கப்பட்டு, புதிய இந் நல்லாட்சியில் நடைபெறுகின்ற இத் தேர்தல், ஒரே நாளில் கொண்டு வரப்படுகின்றது என்பது வரவேற்கத்தக்க விடயம். இருந்தாலும், பாராளுமன்றத்திற்குமாகாண சபையின் அதிகாரங்களை ஒரு போதும் வழங்க முடியாது என்பதில் நாங்கள் உறுதியாக இருக்கின்றோம்.

எமது நாடு, எமது நாட்டு மக்களை எவ்வாறு நேசிக்கின்றேனோ அதேபோல் எமது மாகாண சபையின் அதிகாரங்களை பாராளுமன்றத்திற்கு கொடுப்பதற்கு ஒருபோதும் நாங்கள் தலைசாய்க்க மாட்டோம். ஆனாலும் நான் ஒரு விடயத்தைக் கூறிக் கொள்ள விரும்புகின்றேன், பிரதித் தவிசாளர் அவர்களே,

கடந்த பத்து வருடங்களுக்கு மேலாக, இவ்வாறான இருபதாவது சீர் திருத்தமாக இருக்கட்டும், பதினெட்டாவது சீர் திருத்தமாக இருக்கட்டும், கடந்த ஆட்சிக் காலத்தில் இவ்வாறான ஒரு விவாதத்திற்கு, இவ்வாறான ஒரு சீர் திருத்தங்கள் மாகாண சபையிலே கொண்டு வரப்படவில்லை. ஆனால் நாம் கொண்டு வந்த இந்த நல்லாட்சியிலே இவ்வாறான சீர் திருத்தங்கள் விவாதத்திற்கு கொண்டு வரப்பட்டு, பின்னர் அது பாராளுமன்றத்திற்கு அனுப்பப்படுவது என்பது நல்லாட்சிக்குக் கிடைத்த ஒரு பாரிய வெற்றி என்பதை கூறிக் கொள்ள விரும்புகின்றேன்.

தவிசாளர் அவர்களே, எங்களைப் பொருத்தமற்றிலே சிறுபான்மை மக்கள் யுத்தத்தின் பின்னர் மாகாண சபை அதிகாரங்களை நம்பி மட்டுமே தமது வாழ்க்கை விழிம்பை கொண்டு செல்கின்றார்கள், அவர்களுக்கு வடக்காயினும் சரி, கிழக்காயினும் சரி, ஊவாவாயினும் சரி மத்திய மாகாண சபையாக இருந்தாலும் சரி, மேல் மாகாண சபையாக இருந்தாலும் சரி அவர்களுக்கு எந்த விதத்திலும் இவ் இருபதாவது சீர் திருத்தம் அநியாயம் இழைக்கக் கூடாது,என்பதை மீண்டும் ஒரு முறை சிறுபான்மை மக்களுக்கு இவ் இருபதாவது சீர் திருத்தம் ஒரு முறையிலும் அநியாயம் இழைக்கப்படாது என்பதை உறுதிப்படுத்த வேண்டும். என கௌரவ ஜனாதிபதி அவர்களையும், பிரதமர் அவர்களையும் கேட்டுக் கொண்டு இந்த இருபதாவது சீர்திருத்தத்தை மாகாண சபையின் ஒரு உறுப்பினர் என்ற ரீதியிலே, ஒரு தினத்திலே நடைபெறுகின்ற அத் தேர்தலை நான் வரவேற்பதோடு, இருபதாவது சீர்திருத்தத்தின் இரண்டாவது அம்சமாக இருக்கின்ற பாராளுமன்றத்திற்கான மாகாண சபையின் அதிகாரங்களை வழங்குவது என்பதை எதிர்ப்பதுடன், ஆனால் நல்லாட்சியை ஒரு போதும் மற்றவர்களுக்கு காட்டிக் கொடுக்க மாட்டேன் என்பதற்காக இவ் இருபதாவது சீர்திருத்தத்தை ஆதரித்து உங்களிடமிருந்து விடைபெறுகின்றேன் நன்றி வணக்கம்.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් මේ සභාව තුළ ඇති වී තිබෙන මේ සාකච්ඡාව, සංවාදය ඉතාම වැදගත්. ඒ වාගේම මේ සභාවේ අදහස් දක්වපු මන්ත්‍රීවරුන් අතර, විශේෂයෙන්ම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ඉතාම වැදගත් කරුණු ගණනාවක් අවධාරණය කරනු ලැබුවා. මේ පළාත් සභා ක්‍රමය අපට කොහොමද ලැබුණේ කියන එක පිළිබඳව පළමුවෙන්ම අපේ අවධානය යොමු කරන්න ඕනෑ. උතුරු නැගෙනහිර දෙමළ ජනතාවගේ ප්‍රශ්නයට විසඳුමක් විධියට, ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් විධියට, ඒ වාගේම දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදයට විසඳුමක් විධියට එදා බලහත්කාරයෙන් ඉන්දියාව අපි මත පටවපු මේ පළාත් සභා ක්‍රමයේ සුජාතභාවය වෙනුවෙන් අද මේ පළාත් සභාවල ඉන්න අපි මන්ත්‍රීවරු සියලු දෙනාට පෙනී සිටින්න සිදු වීම එක පැත්තකින් දෛවයේ සරදමක්. එදා මේ රටේ ස්වෛරීයභාවය අභියෝගයට ලක් කරමින්, රටේ ඒකීයභාවය අභියෝගයට ලක් කරමින්, රටේ ජාතික ආරක්ෂාව අභියෝගයට ලක් කරමින් එදා ඉන්දියාව ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ අත අඹරවලා, එතුමා බිය වද්දලා තමයි පළාත් සභා ක්‍රමය අපි මත පැටෙව්වේ. ඒකට මේ රටේ ජනතාවගේ කැමැත්ත විමසුවේ නැහැ. එදා මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂවල එකඟතාවය ගැන විමසුවේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව විධියට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එදා පැහැදිලිවම ඒකට විරුද්ධත්වය පළ කළා. මහජන එක්සත් පෙරමුණ ඒකට විරුද්ධත්වය පළ කළා. ඒ වාගේම තමයි තහනමට ලක් වෙලා සිටියත් ජනතා විමුක්ති පෙරමුණ එදා ඒකට විරුද්ධත්වය පළ කළා. ඒ නිසා රටේ විශාල කැරළිකාරී තත්ත්වයක් ඇති වුණා. විරෝධතා ඇති වුණා. කලකෝලාහල ඇති වුණා. එහි අවසාන ප්‍රතිඵලයක් විධියට රට සිවිල් යුද්ධයකට ගමන් කළා. උතුරු නැගෙනහිරට දේශපාලන විසඳුමක් ලබා දෙන්නය කියලා ගෙනාපු මේ පළාත් සභා ක්‍රමය නිසා 60,000 ක් මේ රටේ තරුණයන්ට ජීවිත පූජා කරන්න සිද්ධ වුණා, මේකට එරෙහිව සටන් කරන්න ගිහිල්ලා. නමුත් අවසාන වශයෙන් එදා ඉන්දියාව අපි මත බලෙන් පටවපු මේ පළාත් සභා ක්‍රමය, එහෙම නැත්නම් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා රටට සුගතියක් වුණාද? එහෙම නැත්නම් රටට අගතියක් වුණාද කියන එක පිළිබඳව විමසා බලන්න දැන් අපට කාලය ඇවිල්ලා තිබෙනවා.

තවමත් මේ පළාත් සභා ක්‍රමය අපේ දේශපාලන ක්‍රමය ඇතුළේ මුල් බැස ගෙන නැහැ. අපේ දේශපාලන ක්‍රමය ඇතුළේ මේක මුල් බහින්න බැරි වෙලා තිබෙන්නේ ඇයි? මේ තිබෙන මේ ආගන්තුක ස්වභාවය. මේක අපේ පොළොවෙන් ආපු දෙයක් නොවෙයි. අපට බාහිරින් පටවපු දෙයක්. එහෙම නම් උතුරු නැගෙනහිර අර්බුදයට දේශපාලන විසඳුමක් විධියට ඊනියා ජනවාර්ගික අර්බුදයට දේශපාලන විසඳුමක් විධියටයි අපි මත මේක පැටෙව්වේ. ඒ නිසයි අද අපට මේක කර ගහගෙන යන්න වෙලා

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

තිබෙන්නේ. අද මමත් මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්. නමුත් ජාතික හෙළ උරුමය විධියට පැහැදිලිවම කියන්න ඕනෑ. මේ පළාත් සභා ක්‍රමය අපි අනුමත කරන්නේ නැහැ. මොකද, මේ පළාත් සභා ක්‍රමය ඉදිරිපත් වුණු අවස්ථාවේදී, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත් වුණු අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළාම ශ්‍රේෂ්ඨාධිකරණය බෙදුනු නඩු තීන්දුවක් ලබා දුන්නේ. එහිදී වනසුන්දර වාර්තාව ඉතා පැහැදිලිව කිව්වා. මේ පළාත් සභා ක්‍රමය රටේ ඒකීයභාවයට, රටේ ස්වෛරීත්වයට, රටේ ජාතික ආරක්ෂාවට මොන වාගේ අවදානමක්, අනතුරක් ඇති කරනවාද කියලා. ඒ නිසා එදා බෙදුනු නඩු තීන්දුවක් ලබා දීලා අවසාන වශයෙන් කිව්වා. කිසියම් ප්‍රමාණයකට හෝ රටේ ඒකාග්‍රතාවය, ඒකමතිය සහ ඒකීයභාවය රැකෙන්නේ ජනාධිපතිවරයා යටතේ පත් වන නියෝජිතයා විධියට ආණ්ඩුකාරවරයා මේ පළාත් සභා සම්බන්ධයෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉෂ්ට කරන නිලධාරියෙක් විධියට ක්‍රියා කිරීම නිසාය කියලා ඒ නඩු තීන්දුවේ ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා.

එහෙම නම් ඒකෙන් තමයි මේ පළාත් සභා අටයි එදා තිබුණේ. ඒ පළාත් සභා අට අද පළාත් සභා නවයක් වෙලා තිබෙනවා. මේ පළාත් සභා නවයේ ආණ්ඩුකාරවරු නව දෙනාගෙන් තමයි අද මේ රටේ මේ ඒකාග්‍රතාවය, ඒකමතිය ගැට ගැහිලා තිබෙන්නේ. කිසියම් විධියට එක පළාත් සභාවක් මධ්‍යම රජයට අභියෝග කළොත්, ඒ වාගේම අත්තනෝමතිකව කටයුතු කළොත් විතරක් නොවෙයි ඔවුන් ස්වාධීනත්වය ප්‍රකාශයට පත් කරපු අවස්ථාවක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුකාරවරයාටයි අවස්ථාව තිබෙන්නේ, ජනාධිපතිවරයා විමසලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ඒ පළාත් සභාව විසුරුවා හරින්න. ඒ අනුව තමයි උතුරු නැගෙනහිර පළාත් සභාවේ මහ ඇමතිවරයා විධියට කටයුතු කරපු එදා ඒ මහ ඇමතිතුමාගේ ඒ ක්‍රියාකලාපයට එරෙහිව, ඊලාම් කොඩිය ඔසවපු අවස්ථාවේදී ජනාධිපතිවරයා විමසලා ඒ අනුව පළාත් සභා විසුරුවා හරින්න ආණ්ඩුකාරවයා කටයුතු කළේ. එහෙම නම් එදා ජනාධිපතිවරයාට ඒ සම්බන්ධයෙන් කඩිනමින් තීන්දු තීරණ ගන්න පුළුවන්කම ලැබුණා. ආණ්ඩුකාරවරයාට ඒ සම්බන්ධයෙන් කඩිනමින් තීන්දු තීරණ ගන්න පුළුවන්කම ලැබුණා. ඒ සම්බන්ධයෙන් පළාත් සභාවේ කරුණු, ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවෙන් අනුමත කර ගන්න හෝ පාර්ලිමේන්තුවෙන් විමසන්න ගියා නම් කොතරම් කාලයක් ගත වෙනවාද? අද ස්ථාවර පාර්ලිමේන්තුවක් නැහැ. පාර්ලිමේන්තුවේ කාටවත් බහුතර බලයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා පාර්ලිමේන්තුව අතට, විධායකය සතුව තිබෙන බලයක්, ආණ්ඩුකාරවරයා සතුව තිබෙන බලයත් පාර්ලිමේන්තුව අතට පත් වෙනවාය කියන එකේ අවධානමක්, අනතුරක් තිබෙනවා. එය රටේ ජාතික ආරක්ෂාවට, රටේ ඒකීයභාවයට, රටේ ස්වෛරීත්වයට කිසියම් ආකාරයකට අභියෝගයක්, තර්ජනයක් කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. ඒ නිසා මේ පිළිබඳව අපි සැලකිළිමත් වෙන්න ඕනෑ. පාර්ලිමේන්තුව අතට එක වාරයකට පමණක්, ඊළඟ සියලුම පළාත් සභා එක දිනයක පැවැත්වීම සඳහා පමණක් නම් මේ බලය යන්නේ, ඉන් පස්සේ ඒ කාල සීමාව ඇතුළත යම්කිසි පළාත් සභාවක් අත්තනෝමතික ආකාරයට කටයුතු කළොත්, එහෙම නැත්නම් මධ්‍යම රජයට අභියෝග කළොත් ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටද? එහෙම නැත්නම් ආණ්ඩුකාරවයාටද කියන එක මේ පනතේ කොතැනකවත් පැහැදිලි නැහැ. ඒක නිරවුල් කර ගන්න ඕනෑ.

ඒ වාගේම මම පැහැදිලිව කියන්න ඕනෑ. කිසියම් විධියකින් මේ පළාත් සභා ක්‍රමය ඇතුළේ අපි සියලු දෙනාම පිළිගන්නවා. අද මේක යථාර්ථයක් බවට පත් වෙලා තිබෙනවා. මේ මැතිවරණ පැවැත්වෙනවා. පළාත් සභා තිබෙනවා. පළාත් සභා මන්ත්‍රීවරු ඉන්නවා. මහ ඇමතිවරු ඉන්නවා. ඒ වාගේම ඇමතිවරු ඉන්නවා. මේක දැන් පවත්වාගෙන යනවා. හැබැයි, අපි සියලු දෙනාම පිළිගත යුතු එක දෙයක් තිබෙනවා. මේ මැතිවරණ එක දිනයක පැවැත්වීමේ තිබෙන වැදගත්කම. අන්න ඒ අපේක්ෂිත අරමුණ වෙනුවෙන් මේ විසි වන ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරනවා නම්, ඒකට අපේ විරුද්ධත්වයක් නැහැ. එක දවසක පැවැත්වීමේ වැදගත්කමක් තිබෙනවා. මොකක්ද ඒ වැදගත්කම? අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් අවධාරණය කළා. ඒක තමයි මේ පිරිස් බලය, ධන බලය, රාජ්‍ය බලය, යෙදවීමේ තිබෙන අවස්ථාව අඩු වෙනවා. ඒ වාගේම ජනමතය නිවැරදිව පිළිඹිබු වන අවස්ථාවක්. අපි දන්නවා, බොහෝ අවස්ථාවලදී කඩින්කඩ මැතිවරණ පැවැත්වීමේදී පළාත් සභාවලට අනික් පළාත් සභාවල ඉන්න මන්ත්‍රීවරු, ඔවුන්ගේ හිතවතුන් විශාල වශයෙන් පිරිස අරගෙන කණ්ඩායම් වශයෙන් යනවා. ඒ වාගේම අනික්

පැත්තෙන් ඒ සඳහා විශාල ධනයක්, පිරිස් බලයක් යොදවනවා විතරක් නොවෙයි, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වැඩි වෙන්නත් ඒක කිසියම් විධියකට බලපානවා. ඒ විතරක් නොවෙයි. පළාත් සභාවේ ජනමතය විකෘති වෙන්නත් ඒක කිසියම් විධියකට හේතු පාදක වෙනවා. ඒ නිසා මැතිවරණය එක දිනක පැවැත්වීමේ වැදගත්කම අපි දකිනවා. නමුත් මැතිවරණ එක දිනයකින් පැවැත්වීමෙන් පමණක් මේ ප්‍රශ්නය විසඳෙනවාද? නැහැ. මැතිවරණ ක්‍රමය වෙනස් කර ගත යුතුයි.

දැන් අපි පළාත් පාලන මැතිවරණ ක්‍රමය වෙනස් කර ගත්තා. සියලු පක්ෂවල සාකච්ඡාවෙන්, එකඟතාවයෙන්, සම්මුතියෙන් අපට පුළුවන්කම ලැබුණා 60 : 40 අනුපාතයට මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න. ඒ අනුව කොට්ඨාශ ක්‍රමයට 60% කුත්, සමානුපාත ක්‍රමයට 40% කුත් විධියට අපි පළාත් පාලන මැතිවරණ පනත සංශෝධනය කර ගත්තා. ඒ ආකාරයටම මේ පළාත් සභා මැතිවරණ ක්‍රමයත් සංශෝධනය කර ගන්න ඕනෑ. එකම ක්‍රමවේදයකට අපේ මැතිවරණ ක්‍රමය සකස් වෙන්න ඕනෑ. පළාත් පාලන මැතිවරණය 60 : 40 ට ගිහිල්ලා, පළාත් සභා ක්‍රමය තව ක්‍රමයකට යන්න බැහැ. පාර්ලිමේන්තු ක්‍රමය තව ක්‍රමයකට යන්න බැහැ. එකම ක්‍රමවේදයකට මේ මැතිවරණ ක්‍රමය සකස් කර ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය වෙනස් කර ගැනීමත් මේ විසි වන ව්‍යවස්ථා සංශෝධනයේ කෙටුම්පත තුළ අනිවාර්යයෙන් අන්තර්ගත විය යුතුයි. නමුත් ඒ ගැන මෙහි කිසිම සඳහනක් කරලා නැහැ. දැන් මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ වන කොට පෙත්සම් 13 කට ආසන්න ප්‍රමාණයක් ඉදිරිපත් කරලා ඒවා නඩු විභාග වෙමින් තිබෙනවා. ඒ පිළිබඳව අදහස්, මත පළ වෙමින් තිබෙනවා. නමුත් අපි කියන්න ඕනෑ. නීතිපතිවරයා ඉතා පැහැදිලිව කිව්වා, විසි වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගෙන වසරක් ඇතුළත පළාත් සභා මැතිවරණ සියල්ල එකට පවත්වන්න කටයුතු කරනවාය කියලා. ඒක ඉතාම වැදගත් ප්‍රකාශයක්.

මම අහන්න කැමැතියි. කොහොමද දැන් මේ පළාත් සභාවල කාල සීමාව අවසන් වෙන්නේ. සබරගමුව පළාත් සභාව 2017 සැප්තැම්බර් 26 වැනිදා අවසන් වෙනවා. ඒ වාගේම නැගෙනහිර පළාත් සභාව 2017 සැප්තැම්බර් 30 වැනිදා අවසන් වෙනවා. උතුරු මැද පළාත් සභාව 2017 ඔක්තෝබර් 01 වැනිදා අවසන් වෙනවා. මධ්‍යම පළාත් සභාව 2018 ඔක්තෝබර් 08 වැනිදා අවසන් වෙනවා. වයඹ පළාත් සභාව 2018 ඔක්තෝබර් 10 වැනිදා අවසන් වෙනවා. උතුරු පළාත් සභාව 2018 ඔක්තෝබර් 24 වැනිදා අවසන් වෙනවා. දකුණු පළාත් සභාව 2019 අප්‍රේල් 10 වැනිදා අවසන් වෙනවා. ඒ වාගේම බස්නාහිර පළාත් සභාව 2019 අප්‍රේල් 20 වැනිදා අවසන් වෙනවා. ඌව පළාත් සභාව අවසාන වශයෙන් 2019 ඔක්තෝබර් 08 වැනිදා අවසන් වෙනවා. එහෙම නම් මේ පළාත් සභා අතරින් 2017 ඔක්තෝබර් 01 වැනිදායින් අවසන් වන පළාත් සභාවත්, අවසාන වශයෙන් 2019 ඔක්තෝබර් 08 වැනිදා අවසන් වන ඌව පළාත් සභාවත් මේ අතර මධ්‍ය ලක්ෂය අරගෙන මීට සුදුසු දිනයක් තීරණය කර ගැනීම තමයි වඩා උචිත වෙන්නේ. ඒ නිසා සියලු දෙනාගේ අදහස් අවශ්‍යයි. යෝජනා අවශ්‍යයි. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. පළාත් සභා මැතිවරණ ක්‍රමය වෙනස් කරනවා වාගේම, එක දිනයක මැතිවරණය පැවැත්වීමේ වැදගත්කමත් ජනාධිපතිවරයා සතුව තිබෙන විශේෂ බලයක්. ආණ්ඩුකාරවරයා සතුව තිබෙන බලයක්. මහ ඇමතිවරයා විමසලා තමයි ඒ දේ කරන්නේ. නමුත් මහ ඇමතිවරයා විසින්ම කිසියම් ආකාරයක පළාත් සභාව හරහා අභියෝගයට ලක් කරනවා නම්, මධ්‍යම රජය. එවැනි අවස්ථාවකදී තීරණ ගැනීමේ බලය තිබෙන්නේ ආණ්ඩුකාරවරයාට. ඒ නිසා ඒ බලය පාර්ලිමේන්තුවට යාම කියන්නේ පාර්ලිමේන්තුව ස්ථාවර නම් අපට ප්‍රශ්නයක් නැහැ. පාර්ලිමේන්තුව ස්ථාවර එකක් නොවෙයි. අපේ ජනතා විමුක්ති පෙරමුණේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේක පාර්ලිමේන්තුවේ 225 ට ලැබෙන එක හොඳයි කියලා. ජනාධිපතිවරයා තේරී පත් වෙන්නේ මුළු රටේම මහජනතාවගේ ඡන්දයෙන්. එතුමාට හැට දෙලක්ෂයක් ජනතාව ඡන්දය දීලා තිබෙනවා. නමුත් පාර්ලිමේන්තුවේ ඉන්නේ එක දිස්ත්‍රික්කයකින්, එක ආසනයකින් තේරී පත් වන මන්ත්‍රීවරයෙක්. ඒ මන්ත්‍රීවරු අතරින් කොහොමද රටක් සම්බන්ධයෙන් අවශ්‍ය තීරණයකදී තීන්දු ගන්නේ. ඒ නිසා ඒ බලය තිබෙන්න ඕනෑ ජනාධිපතිවරයා සතුව සහ ආණ්ඩුකාරවරයා සතුවයි.

ඒ නිසා අවසාන වශයෙන් මම කියන්න කැමැතියි. මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව අපට ඕනෑ තරම් වාද විවාද කරන්න පුළුවන්. සාකච්ඡා කරන්න පුළුවන්. නමුත්

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

මැතිවරණය එකම දිනක පැවැත්වීම ඉතාම වැදගත් වාගේම, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමත් අවශ්‍යයි. ඒ වාගේම රටේ ඒකීයභාවය, ඒකාග්‍රතාවය, ඒකමතිය ආරක්ෂා කර ගැනීමත් අවශ්‍යයි.

උතුරු පළාත් සභාවේ මහ ඇමතිවරයා මේ සම්බන්ධයෙන් තමන්ගේ මතය පළ කරමින් කියා සිටියේ මොකක්ද? නැවත ලබා ගත නොහැකි බලයක් පළාත් සභාවලට දෙන්න ඕනෑය කියලයි උතුරු පළාත් මහ ඇමති විග්නේෂ්වරන් මහතා ප්‍රකාශ කළේ. එහෙම නම් ඔහුගේ අභිලාෂය පැහැදිලියි. ඔහුට අවශ්‍යයි වෙනම රටක්. වෙනම ෆෙඩරල් රාජ්‍යයක් හදන්නයි ඔහු මේ සූදානම් වෙන්නේ. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. පාර්ලිමේන්තුවේදී මම දැක්කා ප්‍රකාශයක් කරනවා. උතුරු පළාත් සභාවට විතරක් විශේෂ සැලකිල්ලක් කරලා වාහන බලපත්‍ර ලබා දීලා තිබෙනවා. එහෙම නම් කලින්ම පළාත් සභා තුනක කාලය අවසන් වෙන්නේ. මේ උතුරු මැද පළාත් සභාව, සබරගමුව පළාත් සභාව ඒ වාගේම තමයි නැගෙනහිර පළාත් සභාව. එහෙම නම් මුලින් ඒවාටයි සලකන්න ඕනෑ. ඒ වෙනුවට අද උතුරු පළාතට වාහන බලපත්‍රය ලබා දෙන්න විශේෂ සැලකිල්ලක් දක්වන්නේ ඇයි කියලා අපි අහන්න කැමැතියි. පාර්ලිමේන්තුවේදී අපි දැක්කා, ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරනවා. ඒ නිසා උතුරට විතරක් විශේෂ සැලකිලි දක්වන්න බැහැ. විශේෂ වරප්‍රසාද දක්වන්න බැහැ. සියලුම පළාත් සභාවලට එක සමාන විධියට එහෙම නම් සලකන්න ඕනෑ. ඒ නිසා මේකෙන් පේන්නේ මේ උතුරට විශේෂ සැලකිලි දැක්වීම පිටුපස තිබෙන්නේ, වෙනත් උවමනාවක් වෙන්න පුළුවන්. ඒ උවමනාවට අපි එකඟ වෙන්නේ නැහැයි කියන එක සියලුම පළාත් සභා මන්ත්‍රීවරු විධියට අපි, ඒ සම්බන්ධයෙන් තිබෙන අපේ අකමැත්ත, විරෝධතාවය පළ කරන්න ඕනෑය කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසි වන සංශෝධනය සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්න අපට අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම බලය බෙදීම වෙනුවෙන් පෙනී හිටපු ව්‍යාපාරයක කොටස්කරුවෙකු හැටියට, ඒ වාගේම 13 වන සංශෝධනය තුළ පළාත් සභා ගොඩ නැගීම ආරම්භ කිරීම වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරපු ව්‍යාපාරයේ කොටස්කරුවෙකු හැටියට අපි පළාත් සභාවේ තිබෙන බලතල ශක්තිමත් කර ගන්න වාගේම, ආරක්ෂා කර ගන්න හැමදාම පෙනී සිටියා වාගේම ඉදිරියටත් පෙනී සිටින්න සූදානම්ය කියන කාරණාව විශේෂයෙන්ම මේ අවස්ථාවේදී සඳහන් කරන්න අවශ්‍ය වෙනවා. ඒ වාගේම අපි දැක්කා. පළාත් සභාවේ මීට ප්‍රථම අවස්ථාවල පළාත් සභාව සතු බලතල විවිධ ආකාරයෙන් ආපසු ලබා ගන්න කටයුතු කළා. ඒ කටයුතු කරපු සෑම අවස්ථාවකදීම පළාත් සභා ක්‍රමය ආරක්ෂා කරන්න පෙනී සිටපු උදවිය හැටියට අපි එදා ඒ අවස්ථාවල අපේ විරෝධතාවය ප්‍රකාශ කරලා තිබෙනවා. එදා එවැනි අවස්ථාවලදී ඒ බලය ආපසු දෙන්න කැමැත්ත දීපු උදවියම අද ඒ ප්‍රතිපත්තිය මෙතැනදී වෙනස් කරලා තිබීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඒ අයත් මේ පළාත් සභා ක්‍රමය ආරක්ෂා කර ගන්න අද ඉදිරිපත් වෙලා තිබීම පිළිබඳව අපි විශේෂයෙන් සතුටු වෙනවාය කියන එක විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම පළාත් සභා ඡන්ද එකම දිනයක පවත්වන්නයි යෝජනා කරලා තිබෙන්නේ. එකම දිනයක පළාත් සභා ඡන්ද පවත්වන්න යෝජනා කිරීමට අපි එකඟයි. අපි ඒකට සම්පූර්ණයෙන් සහයෝගය දෙනවා. මොකද, මේක අපටත් එක අතකින් පහසුවක් බවට පත් වෙනවා. පළාත් සභා නවයේ ඡන්ද දවස් නවයක තියන කොට අපේ දේශපාලන පක්ෂවලින් අපටත් කියනවා, ඔන්න දකුණට පලයන්. වයඹට පලයන්. කට්ටියක් අරගෙන යන්නේ ඡන්ද වැඩවලට. එතකොට අපි අතේ තිබෙන සල්ලිත් වියදම් කර ගෙන, මිනිස්සුත් අරගෙන ගිහිල්ලා මේ ඡන්ද කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අද එකම දිනයක මේක තියනවා නම්, එවැනි බලපෑම් කරන්න, එහෙම නැත්නම් එක තැනකට බලය යොදලා එක තැනක බලය තමන්ට ඕනෑ විධියට ලබා ගන්න තිබෙන ඉඩකඩ අහෝසි වෙනවා. ඒ තුළ මම හිතනවා. අපට වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට මේ ඡන්ද ක්‍රමය එකම දිනයක පැවැත්වීමෙන්, අපට ඒ අවස්ථාව ඇති කර ගන්න හේතු වෙනවාය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මේ ඉදිරිපත් කරලා තිබෙන සංශෝධන තුළ සඳහන් කරලා නැහැ මේ වතාවට ඔබ්බටත් මේ නීතිය ක්‍රියාත්මක වෙනවාය කියලා. ඒක කොතැනකවත් සඳහන් කර ඇත්තේ නැහැ. ඒකේ

තියෙන්නේ, පළාත් සභාව නිශ්චිත දිනයකදී ඒ ඡන්දය පැවැත්වීමට පාර්ලිමේන්තුවට බලය දෙනවාය කියන එකයි. ඒකෙන් සඳහන් වෙන්නේ නැහැ. මම නම් විශ්වාස කරන ආකාරයට මේකේ හත් වන පළාත් සභාවටත්, අට වන පළාත් සභාවටත් මේක ක්‍රියාත්මක වෙනවාය කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. මොකද, අද මේ පිළිබඳව පෙත්සම් 13 ක් ශ්‍රේෂ්ඨාධිකරණයේ පරීක්ෂණයට ලක් වෙමින් තිබෙනවා. අපි විශ්වාස කරනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ පිළිබඳව, මේ සංශෝධනයන් පිළිබඳව යම් මතයක් පැහැදිලි කරාවිය කියලා මේකට ගැලපෙන ආකාරයට. එතකොට අපි දන්නවා. ආණ්ඩුවට සිද්ධ වෙනවා, ඒ සංශෝධනයන් ශ්‍රේෂ්ඨාධිකරණය දෙන උපදෙසකට අනුව සංශෝධනය වෙන්න ඕනෑය කියන එකයි අපි විශ්වාස කරන්නේ. දැනටමත් රජය වෙනුවෙන් නීතිපතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කරුණු ඉදිරිපත් කරලා තිබෙන්නේ, මේ පනත සම්මත වෙලා අවුරුද්දක් ගත වූ අවස්ථාවේදී සියලු මැතිවරණ එක දිනයකදී පවත්වන්න කටයුතු කරනවාය කියලා. ඒක තමයි රජයේ ස්ථාවරය හැටියට නීතිපතිතුමා ප්‍රකාශ කරලා තිබෙන්නේ. රජයේ ස්ථාවරය මේ පනත සම්මත වෙලා අවුරුද්දක් තුළ මැතිවරණවලට යනවාය කියනවා නම් මේක ඕනෑ ඕනෑ විධියට ඒක දිගින් දිගට පවත්වාගෙන යන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැයි කියලයි අපි විශ්වාස කරන්නේ කියන එක සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම එක දිනයක මැතිවරණ තියන්න යන කොට කොයි ආයතනයකට හරි ඒකේ දිනය වෙනසක් කරන්න සිද්ධ වෙනවා. හැමෝටම, හැම පළාත් සභාවකම කාලය අවසන් වුණු දවස ගන්න ගියොත් එහෙම කවදාවත් දිනයක් තීන්දු කරන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා මධ්‍යස්ථ තැනකට එන්න සිද්ධ වෙනවා. අපේ වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා දින සියල්ල ඉදිරිපත් කළා මේ විධියටයි අවසන් වෙන්නේ කියලා. ඒ අවසන් වන දින සඳහන් කරපු ආකාරයට එක අවුරුද්දක් අවසානයේදී මේ පනත සම්මත කරලා මේ සියලු පළාත් සභාවල ඡන්දය එක දිනයක පවත්වන්න යනවා නම් කියන කාරණාවේදී මම හිතනවා කාටත් සාධාරණයක් ඉෂ්ට වේවිය කියන එකයි අපි විශ්වාස කරන්නේ කියන එක සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම මෙතැන සැකයක් ඇති වෙලා තිබෙනවා පාර්ලිමේන්තුවට බලය ලබා දුන්නොත් අසාධාරණයක් කරන්න අපට පුළුවන් වෙනවාය කියලා. මේ ඡන්ද ක්‍රමය පිළිබඳව එක දිනයක ඡන්දය පැවැත්වීම පිළිබඳව පළාත් සභා පනතට සංශෝධනයක් ගෙනෙනවා මිසක් මුළු පළාත් සභා ක්‍රමය පිළිබඳව මෙතැන සංශෝධන ඉදිරිපත් වෙලා ඇත්තේ නැහැ. ඒ නිසා අපි පළාත් සභාවේ මන්ත්‍රීවරු හැටියට මුලින්ම පත් වෙන කොටත් අපි දිවුරුම් දෙනවා, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අපි කටයුතු කරන්න ලැහැස්තියි කියලා. අපි ඒ විධියට දිවුරුම් දීලයි මන්ත්‍රීවරු හැටියට කටයුතු කරන්නේ. මේ රටේ පරමාධිපත්‍ය හිමි වෙන්නේ ජනතාවටයි. පරමාධිපත්‍ය නියෝජනය කරන ආයතනය තමයි පාර්ලිමේන්තුව. එහෙම නම් අපට පාර්ලිමේන්තුව පිළිබඳව සැකයක් තියා ගෙන කටයුතු කරන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. මෙතැන සැකය ඇති වෙලා තිබෙන්නේ අද පවතින තත්ත්වය දිහා බලලයි සැකය ඇති කර ගෙන තිබෙන්නේ. අද පවතින තත්ත්වය හැමදාම පවතීවියි කියලයි කල්පනා කරන්නේ. නමුත් අපට මීට කලින් අහන්න ලැබිලා තිබෙන්නේ, පෝය දෙකයි තව මේ විධියට බලය තියා ගන්න පුළුවන් වෙන්නේ කියලා. පෝය දෙකකින් මේ බලය අවසන් වෙනවා නම්, මේ බලය හැමදාම එක විධියට තියෙන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැයි කියලයි අපි විශ්වාස කරන්නේ. ඒ නිසා පාර්ලිමේන්තුව පිළිබඳව අපට සැකයක් ඇති කර ගන්න අපි ජනතාව හැටියට අපට පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම අපට අමතක කරන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. මේ පනතේ සඳහන් වෙනවා, 154 ඔ, ඕ වගන්තිය දිහා බැලුවාම. මේකේ දැනටත් ජනාධිපතිවරයාට බලය තිබෙනවා, පාර්ලිමේන්තුවත් එක්ක කටයුතු කරලා, විසුරවීමේ බලය ලැබිලා තිබෙනවා. ඒ මහ ඇමතිතුමාගේ එකඟතාවය කියන එක නිකම් අපේ හිත් සතුටු කර ගැනීමට කෙරෙන එකඟතාවයක් විතරයි. ඒකේ එහෙම කොයිම අවස්ථාවකවත් ක්‍රියාත්මක වෙනවාය කියලා අපට සහතිකයක් නැහැ. අපට සිත් සතුටු කර ගන්න පුළුවන්. මහ ඇමතිතුමාගේ එකඟතාවය ඇතිව තමයි මේකෙ වෙන්නේ කියලා. ඊට එහා දෙයක් එතැන තිබෙනවාය කියලා අපට දකින්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවට මෙතැන විසුරුවන්න බලයක් දෙනවාය කියන එක අලුත් බලයක් නිර්මාණය කිරීමක් නොවෙයි. තිබෙන එකමයි මේකේ සඳහන් වෙන්නේ කියන එකයි අපේ අදහස වෙන්නේ. ඒ වාගේම අපි කල්පනා කරන්න වෙනවා. අපේ අතීතය පොඩ්ඩක්

[ගරු කීර්ති කාරියවසම් ]

බලන්න වෙනවා. අපි ජනවාරි 08 වැනිදා, ඒ වාගේම අගෝස්තු 17 වැනිදා මේ රටේ ජනතාවගෙන් ජනවරමක් ඉල්ලුවා. අපි ජනවරම ඉල්ලන කොට බොහොම පැහැදිලිව සඳහන් කරපු කාරණා කිහිපයක් තිබෙනවා. ඒ සඳහන් කරපු කාරණාවලටයි මේ රටේ ජනතාව ජන වරමක් දීලා තබෙන්නේ මේ ආණ්ඩුවට. ඒ ජනවරම තුළ අපි සඳහන් කරලා තිබෙනවා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි වෙන්න ඕනෑය කියන එක. ඒ වාගේම මැතිවරණ නීති ක්‍රමය වෙනස් වෙන්න ඕනෑය කියන එක අපි සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම මේ ඡන්ද එක දිනයක පැවැත්වෙන්න ඕනෑය කියන එක සඳහන් වෙලා තිබෙනවා. මේ ඡන්ද ක්‍රමය මේ විධියට වෙනස් කරලා වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට රට ඉදිරියට ගෙනියන්න ඕනෑය කියන එකටයි මේ රටේ ජනතාව ජනවාරි 08 වැනිදාත්, අගෝස්තු 17 වැනිදාත් ජනවරම දීලා තිබෙන්නේ. ඒ ජනවරමට පිටුපාන්න කාටවත් පුළුවන්කමක් ඇත්තේ නැහැයි කියන එකත් විශේෂයෙන්ම මේ අවස්ථාවේදී සඳහන් කරන්න වෙනවා. ඒ නිසා ඒ ලබා දීපු ජනවරමට අනුව තමයි මේ මැතිවරණ එක දිනයක පවත්වන්න සූදානම් වන්නේ කියන කාරණාව අපි සඳහන් කරනවා. අපි මේ 20 වන සංශෝධනයට අපේ විරුද්ධත්වයක් නැති බව ප්‍රකාශ කරනවා වාගේම, මහ ඇමතිතුමා පළාත් සභාව වෙනුවෙන් අද වෙනත් අදහසක් මේකට සංශෝධනයක් හැටියට ඉදිරිපත් කරලා තිබෙන කරුණුවලට අපි අපේ එකඟත්වය දක්වමින් අපි මේ පළාත් සභාව තුළ මේ විසි වන සංශෝධනයට ඒ සංශෝධනයන් ඇතුළුව එකඟත්වය ලබා දෙන්න එකඟ වෙනවාය කියන එක ප්‍රකාශ කරමින් සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට ලලන්ත ගුණසේකර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. එතුමා සභාවේ නැහැ. මීළඟට ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මේ අවස්ථාව සලසා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ සංශෝධනයට අදාළව 154 ඇ ඇ සංශෝධනයෙන් කරන්න හදන දේ තමයි, පළාත් සභා නවයක් දින නවයක් තුළ ඡන්දය පැවැත්වීම වෙනුවට, එක දවසක් නියම කරලා, ඒ එක දවස ඇතුළත ඡන්දය පැවැත්වීම. මෙතකදී මම දැක්කා, ගරු අගමැතිතුමා විසින් ඉදිරිපත් කරලා තිබෙන වාර්තාවක හේතු ගණනාවක් දීලා තිබුණා, ඇයි මේ එක දවසක ඡන්දය පැවැත්වීමේ අවශ්‍යතාවය කියලා. ඒකෙන් මට මතක කාරණා දෙකක් මම හිතන්නේ මේ සභාවේදී ප්‍රකාශ වුණා. මුලින්ම කියන්න කැමැතියි. පළමුවන කාරණාව තමයි, දින නවයක් තුළ විවිධ වූ පළාත් සභාවල ඡන්දය පැවැත්වීම හේතු කොට ගෙන අසීමිත මුදලක්, මහජන මුදලක් අපට වැය කරන්නට සිද්ධ වෙනවා. එක දවසක තිබුණොත් වැය වන මිනිස් පැය ගණනත්, වැය වන මහජන මුදල් ප්‍රමාණයේත් යම්කිසි සීමාවක් ඇති වෙනවා. දෙවන කාරණාව තමයි, මේ සභාවේම කියවුණු ආකාරයට එක පළාත් සභාවක ඡන්දය මගින් තවත් පළාත් සභාවකට බලපෑමක් ඇති කිරීමක් ඇති වෙන්නේ නැහැ. මොකද, හැමෝම එක දවසේ ගිහිල්ලා කතිරය ගහන්නේ. දෙවැනි කාරණාව, ඒකට සම්බන්ධ වන දෙවන කාරණාව. අද තිබෙන තත්ත්වය හැටියට බලයේ ඉන්න රජය කුමක් හෝ වේවා, විටින් විට කඩින් කඩ පළාත් සභා ඡන්දය පැවැත්වීම හේතු කොට ගෙන මුළු ආණ්ඩුවේම බලය ඒ එක් එක් තැනකට යොදා ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා ඒ අතින් බලද්දී මේ සියලු පළාත් සභාවල එක දිනයක ඡන්දයක් පැවැත්වීම මගේ මතය අනුව සුදුසු දෙයක්. කළ යුතු දෙයක්. හැබැයි, ඒක කළ යුතුයි කියලා කියන අතර මට කාරණා දෙකක් ඉස්මතු කරන්නට අවසර දෙන්න.

එකක් තමයි, මේ පාර්ලිමේන්තුව තුළින් ඒ දිනය නිශ්චය කළ යුතුයි කියන කාරණාව. මගේ මතය අනුව පාර්ලිමේන්තුවට මේක නිශ්චය කරන්නට දුන්නොත්, තම තමන්ගේ අවශ්‍යතා සහ අවස්ථානුගත කරුණු මත ඔවුන් තමන්ගේ වාසියට අනුකූලව ඒ දිනය නියම කිරීම කරනු ඇති. ඒ නිසා මම විශ්වාස කරනවා, පාර්ලිමේන්තුව මගින් ඒ දිනය නිශ්චය කරනවා වෙනුවට නීතිය මගින් ඒ දිනය නිශ්චය කිරීම වැදගත්ය කියලා. ඊට වඩා බරපතළ කාරණාවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 154 ඇ ඇ හි නිශ්චිත දිනයක් ගැන සඳහන් වෙනවා. ඒ වාගේම 154 ඉ ඉ වලත් නිශ්චිත දිනයක් ගැන සඳහන් වෙනවා. දැන් මොහොතකට

කලින් කියවුණා. මේ සංශෝධනයේ කොහේවත් කියලා නැහැයි කියලා මේ සංශෝධනයේ තිබෙන කාරණා අනාගතයට බලපානවා කියලා. මම පළමුවැනි වතාවට, බොහොම කනගාටුවෙන් මම මේ කියන්නේ. ඒ වාගේ අදහසකට ඇහුම්කන් දුන්නේ. මොකද, සංශෝධනයක් පනතකට කළායින් පස්සේ ඒ සංශෝධනය පනතේ කොටසක් බවට පත් වෙනවා. ඒක එතකොට ඒ වතාවට පමණක් සීමා වෙන්නේ නැහැ. අර පනතේම නීතියේ කොටසක් හැටියට ක්‍රියාත්මක වීමයි කෙරෙන්නේ. ඒක එක වතාවකට පමණක් සීමා කිරීමට අවශ්‍ය නම්, ඒ ප්‍රකාශිතව ඒ සංශෝධනය ප්‍රකාශ වෙන්නට ඕනෑ. මේක සීමා වෙන්නේ මේ වතාවට පමණක්ය කියලා. නමුත් මම දකින ආකාරයට. මුලින් මම කිව්වා, මේක හොඳ දෙයක්. මේ එක දවසක ඡන්දය පවත්වන එක මගේ අදහසේ හැටියට හොඳ දෙයක්. නමුත් ඒක තුළ විෂ වායුවක් අන්තර්ගත කරලා මේ සංශෝධනය ගේනවා. මොකක්ද ඒ? මේක මේ වර්තමාන පළාත් සභාවලට පමණක් සීමා වන ආකාරයට නොවෙයි, දැනට සකස් කරලා තිබෙන්නේ. යෝජනා කරලා තිබෙන්නේ.

එහෙම නම් අපි මේ පළාත් සභාවෙන් පරාජය වෙලා හෝ අයින් වෙලා ගියායින් පස්සේ අලුතෙන් එන පළාත් සභාවටත් පළාතේ ජනතාව අවුරුදු පහක කාලයක් සඳහා පත් කළත්, එවකට පවතින ආණ්ඩුව කුමක් හෝ වේවා ඒ පළාත් සභාවලට, ඒ පළාත් සභාවල ක්‍රියාකාරීත්වයට එකඟ නොවෙනවා නම් - පළාත් සභාව තේරී පත් වුණේ අවුරුදු පහක් සඳහා වුණත්, තේරී පත් වුණු දවසේ සිට සතියක් ඇතුළත, මාසයක් ඇතුළත, අවුරුද්දක් ඇතුළත, නැත්නම් ඒගොල්ලන්ට හිතෙන දවසක විසුරුවා හැරීම සඳහාත්, අනාගත පළාත් සභා විසුරුවා හැරීම සඳහාත් දිනයක් නිශ්චය කිරීමෙන් මහා විශාල වැරැද්දක් කළ හැකියි. මොකද, පළාතේ ජනතාව අවුරුදු පහකට බලය දීලා එවන පළාත් සභාව පාර්ලිමේන්තුව තීන්දුව කරනවා අපේ අවශ්‍යතාවයන්ට අනුකූලව තමුන්නාන්සේලා වැඩ කරන්නේ නැත්නම්, අපේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කරන්න සූදානම් නැත්නම් අපි අපට හිතෙන දවසක් නිශ්චිත දිනය හැටියට තීරණය කරලා පළාත් සභාව විසුරුවා හරිනවාය කියන එක. මෙන්න මේක මම හිතන්නේ, අපට පිළිගත හැකි කාරණාවක් නොවෙයි. ඒ තත්ත්වය යටතේ මම කියා සිටින්නේ, මෙන්න මේ පාර්ලිමේන්තුවට ඒ ආකාරයට අනාගතයටත් ඒ දිනයන් නිශ්චය කිරීමේ බලය ලබා දීමෙන් අපි අපේ බලතල හැල්ලු කර ගැනීමක් කරන්නේ. මොකද, අපි බොහොම අමාරුවෙන් ඡන්දයක් කරලා, පළාත් සභාවට ආවායින් පස්සේ පාර්ලිමේන්තුවට අවශ්‍ය යම්කිසි පනතක් අපි සම්මත කරන්න අපි එකඟ වුණේ නැත්නම් මේ වේවැල අපට පෙන්වලා, අපේ අවශ්‍යතාවයන්ට අනුකූලව මේ නීතිය වෙනස් කරන්න ඕගොල්ලෝ එකඟ වෙන්නේ නැත්නම් අපි ඕගොල්ලන්ව විසුරුවා හරිනවාය කියන වේවැල පෙන්වලා, අපි ඒගොල්ලන්ට ඕනෑ විධියට අපව අවනත කර ගැනීමේ හැකියාවක් මේ සංශෝධනය තුළ තිබෙනවා. වෙනත් වචනවලින් කියනවා නම්, අවසානයේදී අපි බල්ලාට ඕනෑ විධියට නැට්ට වනන තැනකට, බල්ලාට ඕනෑ විධියට වලිගය වනන තැනට අපි පත් වෙනවා. නිවට නියාලු පළාත් සභා මන්ත්‍රීවරු හැටියට පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවයන්ට අනුකූලව ඔවුන්ගේ අවශ්‍යතාවයන්වලට අවනත වෙමින් කටයුතු කිරීමත්, එසේ නොවුණොත් අපේ පළාත් සභා මන්ත්‍රීධූරය අහෝසි වීමෙත් අවධානම මත දෝලනය වෙමින් කටයුතු කිරීමට සිද්ධ වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බල්ලාට ඕනෑ විධියට තමයි වලිගය වනන්නේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

එසේ නොවුණොත් අපේ පළාත් සභා මන්ත්‍රී ධූරය අහෝසි වීමෙත් අවධානම මත දෝලනය වෙමින් කටයුතු කිරීමට සිද්ධ වෙනවා. ඒ නිසා මම ඉතාමත්ම ගෞරවයෙන්ම -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතුමා කියන්න ගියේ වල්ගෙට ඕනෑ විධියට බල්ලාව නටවනවා කියන එක තමයි කියන්න ගියේ. නමුත් අනික් පැත්තට -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

බල්ලාට ඕනෑ විධියට වලිගය නටවනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එහෙම තමයි කෙරෙන්නේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒ මේක සම්මත වුණොත්. ඒ නිසා මම ඉතාමත්ම ගෞරවයෙන් කියා සිටින්නේ, මෙන්න මේ විධානයට අපි විරුද්ධ විය යුතුයි. ඒකට එකඟ විය නොහැකියි. ඒ වාගේම මම කියනවා. දැන් මේ සංශෝධනය ක්‍රියාත්මක වුණොත්, නීතිගත වුණොත් ඇති වන තත්ත්වය බලන්න. ජාත්‍යන්තරයට ජේන්න තරු පහේ බලය බෙදීමේ ක්‍රමයක් තිබෙනවාය කියලා අපි පළාත් සභා තියා ගන්නවා. මහජන මුදල් ප්‍රකෝටි ගණන් වියදම් කරමින්. හැබැයි, මේ තරු පහේ බලතල බෙදීමක් තිබෙනවාය කියන පළාත් සභා පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවයට අනුව හෙණ්ඩුව දාලා තමන්ට ඕනෑ විධියට පාලනය කර ගැනීමේ තත්ත්වයකට අපි අනිවාර්යයෙන්ම පත් වෙනවා. මම හිතනවා. ඒ නිසා පළාත් සභාව පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කරන, ඒකට අවනත වන - අර මම නැවතත් කියන්නේ. බල්ලාට හිතෙන විධියට නැට්ට වනවන තත්ත්වයකට අපි පත් වෙනවාය කියන එකයි මම කියා සිටින්නේ. ඒ නිසා මම ඉතාමත්ම ගෞරවයෙන් මේ පළාත් සභාව තුළ සිටින ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා. අපි එකඟ වෙමු. අපි සූදානම්. එක දවසක පළාත් සභා මැතිවරණ සියල්ල පවත්වන්න ඕනෑ නම් ඒකට අපි එකඟ වෙමු. ඒකේ ගැටළුවක් නැහැ. ඒක හොඳ දෙයක්. නමුත් ඒක මේ වර්තමාන පළාත් සභාවලට පමණක් සීමා විය යුතුයි. එහෙම වුණායින් පස්සේ නැවත දින වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් ඇති වෙන්නේ නැහැ. මොකද, සියලු පළාත් සභාවන් එක දවසට ඡන්දය තිබුණායින් පස්සේ අවුරුදු පහ අවසාන වෙන්නේ එක හා සමාන දිනවලදී. එතකොට කාටවත් ඒක නිශ්චිත දිනයන් තීන්දු කිරීමේ අවශ්‍යතාවයක් ඇති වෙන්නේ නැහැ. ස්වයංක්‍රීය ක්‍රමයකට ඒක ක්‍රියාත්මක වෙනවා.

ඒ නිසා මම ඔබතුමා හරහා ඉතාමත්ම ගෞරවයෙන් මේ සභාවේ ඉන්න ගරු මන්ත්‍රීවරුන්ටයි යෝජනා කරන්නේ. අපි මේ වර්තමානයේ තිබෙන ආකාරයට මේ සංශෝධනයට එකඟ වීමෙන් වැළකී සිටිමු. ගරු මහ ඇමතිතුමා, 154 ඇ ඇ වගන්තියට සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඊට ඉස්සෙල්ලා මම කියන්න ඕනෑ. පළමුවන කාරණාව මම මේ ගරු සභාවට ඔබතුමා හරහා යෝජනා කරන්නේ. පළමු වැනි දේ තමයි මේ පවතින ආකාරයට මේ සංශෝධනයට අපි එකඟ නොවන බව ප්‍රකාශිතව සටහන් විය යුතුයි. තිබෙන ආකාරයට මේකට අපි එකඟ වෙන්නේ නැතෙයි කියන එක ප්‍රකාශිතව සටහන් කරන අතර, අපේ අදහස් ගරු මහ ඇමතිතුමා යෝජනා කරලා තිබෙන ආකාරයට අපේ අදහස් ජනාධිපතිතුමා වෙත යැවීමේ වරදක් මම දකින්නේ නැහැ. ඒ කෙසේ වුණත් 154 ඇ ඇ කියන වගන්තියේ - මම ඒක කියවන්නම්. මම හිතනවා, අඩු තරමින් එක වචනයක සංශෝධනයක් විය යුතුයි.

"සියලුම පළාත් සභාවල මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේ - මේ තුන්වන පිටුවේ තිබෙන්නේ. මන්ත්‍රීවරුන් පත් කර ගැනීමේ ඡන්ද විමසීම එකම දිනයක පවත්වනු ලැබිය යුතු අතර, - මම අර කියපු යෝජනාවට සමාන්තර යෝජනාවක් මේකේ වෙන්නේ. මේ වර්තමාන පළාත් සභාවට පමණක් මේ නිශ්චිත දිනය නියම කිරීමේ අයිතිය දෙන්නේය කියන එකට. යුතු අතර, මෙම පරිච්ඡේදයේ නිශ්චිත දිනය යනුවෙන් සඳහන් කරනු ලබන සියලුම පළාත් සභාවන්හි ඡන්දය විමසීමේ දිනය මෙම ව්‍යවස්ථාව නොවෙයි, මෙම විසි වන සංශෝධනය ක්‍රියාත්මක වීමෙන් පසු පළමුවරට පවත්වන ඡන්ද විමසීම සම්බන්ධයෙන් පමණක් වන විට එම නිශ්චිත දිනය පාර්ලිමේන්තුව තීරණය කළ යුතුයි කියලා. මම කිව්වා, පාර්ලිමේන්තුව ඒක තීරණය කරනවාට මම විරුද්ධයි. ඒක නීතියෙන් තීරණය කරනවා නම් ඊට වඩා හොඳයි. නමුත් පාර්ලිමේන්තුවෙන් ඒක තීරණය කළත්, ඒක ඉවසා වදාරගෙන ඉන්න මම සූදානම්. ඒ නිසා මම නැවතත් - මේ ගරු සභාවෙන් ඉල්ලා සිටින්නේ. අංක එක, අපි යෝජිත ආකාරයට මේ සංශෝධනවලට එකඟ නොවන බව අපි සටහන් කළ යුතුයි. දෙක, අපි අදහස් ප්‍රකාශ කිරීමේදී අපට අදහස් ප්‍රකාශ කරන්න පුළුවන් ගරු මහ ඇමතිතුමා ප්‍රකාශ කරලා තිබෙන ආකාරයට. යෝජනා කරලා තිබෙන ආකාරයට. අපි අදහස් ප්‍රකාශ කිරීමේදී යෝජිත 154 ඉ ඉ සංශෝධනයට එකඟ නොවන අතර, එය ඉවත් කළ යුතු බවත්, දෙවන කාරණාව, යෝජිත 154 ඇ ඇ වෙනුවට ගරු මහ ඇමතිතුමාගේ යෝජනාවලියේ තුන් වන පිටුවේ ඇති සංශෝධනය ඇතුළත් කිරීමට අපි යෝජනා කරන බවටත් ප්‍රකාශ කළ යුතු වන බව මම ඉතා ගෞරවයෙන් මේ සභාවට ඉදිරිපත් කරනවා. එසේ නොකළහොත් අපි අද මේ පළාත් සභාවේ ඉන්නවා. හෙට අපි මේ පළාත් සභාවෙන් ඉවත් වෙලා යාවි. නමුත් අනාගතයේ මේ පළාත් සභාවට පත් වෙලා ඉන්න මන්ත්‍රීවරු අපට සාප කරාවි. ඔවුන්ට පිට කොන්දක් තිබෙන

මන්ත්‍රීවරුන් හැටියට තමන්ගේ රාජකාරිය කරන්නට නොහැකි වන තැනකට අපි පත් කරලා මෙතැනින් ඉවත්ව ගියාය කියලා. ඒ නිසා මම නැවත වතාවක් පක්ෂ භේදයකින් තොරව. මේක මේ එක්සත් ජාතික පක්ෂයද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රී පිලද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද පිලද කියන එක නොවෙයි අපට මේ අවස්ථාවේදී වැදගත් වෙන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එහෙම පිලක් නැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

සමාවෙන්න. මහින්ද පිල සහ මෛත්‍රී පිල. මම ඒ ගැන අධ්‍යයනයක් කරලා නැහැ. ඒ නිසා කෙසේ වෙතත්. (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තියෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ නීත්‍යානුකූල පිලවල් නොවෙයි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒ මොන පිලද කියන එක නොවෙයි අපට අවශ්‍ය වෙන්නේ. අපි නියෝජනය කරන මේ පළාත් සභාවේ ගෞරවය සහ බලය අපි රැක ගන්නට අඩු ගණනේ දැන්වත් එකඟ වෙමු. එකතු වෙමුයි කියලා යෝජනා කරමින්, නැවත වාරයක් මේ අවස්ථාව සලසා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. සංශෝධනයකුත් ඉදිරිපත් කළා. මීළඟට අර්ෂාඩ් නිසාම්ඩීන් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසි වන සංශෝධනය. නමුත් අද අපි බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන් 104 ක ගෙන් 95% ක විරෝධතාවයක් බවට මේක පත් වෙලා තිබෙනවා. නමුත් මේ විසි වන සංශෝධනය කියලා ජනතාවට යවලා තිබෙන්නේ, මේ විසි වන සංශෝධනය කියන එක පිළිබඳව ජනතාවට යවලා තිබෙන්නේ කොහොමද දන්නවාද? එකම දවසේ ඡන්දය තියන එක පමණයි කියලා. නමුත් මේකේ තිබෙන අඩංගු දේ බලන කොට බලය උදුරා ගැනීමක්. මේ පළාත් සභාවේ තිබෙන බලය පාර්ලිමේන්තුවට උදුරා ගැනීමක් තමයි මේකට යොමු කරලා තිබෙන්නේ කියලා තමයි අපට පෙනෙන හැටියට තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1987 දී 13 වන සංශෝධනය හරහා පළාත් සභා පිහිටුවලා, මේ පළාත් සභාවන්ට බලතල දීලා, පළාත් සභා ක්‍රමය මගින් ජනතාවට සේවාවක් ලබා ගනිමින් තිබෙන අවස්ථාවේදී, සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තිබෙන පටු චේතනාවක් අනුව, පළාත් සභාවේ තිබෙන බලතල ටික ඔවුන් ලබා ගත්තාම මොකද වෙන්නේ? එතකොට පළාත් සභා මන්ත්‍රීවරුන්ව නිකම් දෙමළෙන් කියනවා, බොම්මලාටම් කියලා. ඒ කියන්නේ රූකඩ. රූකඩ නැටීමකට තමයි සූදානම් වෙන්නේ කියන එකයි අපේ මතය. ඉතින් මෙතැන සාකච්ඡා කළාට පස්සේ සෑම මන්ත්‍රීවරයෙකුම මේකට විරුද්ධතාවය පෙන්වනවා. මේකේ තිබෙන අඩුපාඩුකම් පෙන්වලා තිබෙනවා. අපේ මහ ඇමතිතුමා හොඳ සංශෝධනයක් දීලා තිබෙනවා රජයට. ඒ සංශෝධනයට අපි එකඟ වෙමින්, අපේ බලය පාර්ලිමේන්තුවට ලබා ගැනීමට අපි විරෝධය පාමින්, මේ විසි වන සංශෝධනයට - එකම දවසේ ඡන්දය තිබීමට අපි කැමැතියි. ඒකේ වෙනසක් නැහැ. එකම දවසේ ඕනෑම දවසක ඡන්දය තියන්න. නමුත් අපේ බලතල උදුරා ගන්න එපා. අපේ බලතල උදුරා ගෙන අපව රූකඩ බවට පත් කරන්න එපා. අපේ මහ ඇමතිතුමා කියන සංශෝධනයට කන් දීලා ඒ සංශෝධනය මගින් විසි වන සංශෝධනයට අපි එකඟ වෙනවාය කියලා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසි වන සංශෝධනයේදී එකම දිනයේ ඡන්දය පැවැත්වීම සඳහා අපගේ කැමැත්ත ප්‍රකාශ කර සිටින අතර, පළාත් සභාවලට අයිති බලය එහෙම නැත්නම් ගරු මහ ඇමතිතුමා, ගරු ආණ්ඩුකාරතුමා ඇතුළු ජනාධිපතිතුමාගේ ඒ බලය පාර්ලිමේන්තුවට ලබා දීමට අපගේ එකඟතාවයක් නැති බව අයිලෙයි ඉලංගෙයි මක්කල් කොංග්‍රස් පක්ෂයේ නායකතුමා වන කර්මාන්ත හා වාණිජ අමාත්‍ය රිෂාඩ් බදුර්දීන් ඇමතිතුමා ඇතුළු අපගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හය දෙනත් එක්ක අපගේ උත්තරීතර මණ්ඩලය රැස් වූ අවස්ථාවේදී ඒකමතිකව අපේ පක්ෂ නායකතුමා, රිෂාද් බදුර්දීන් ඇමතිතුමා කිව්වා, අපි යහපාලනයේ හිටියත් සමහර දේවල්වලට හොඳ දේට අපි පාර්ලිමේන්තුවේදී අත උස්සනවා. වැරදි දේට අපි කොන්ද පණ ඇතිව අපි වැරදියි කියන මතයට යනවාය කියන එක. ඒ නිසා ජනතාව අපට ලබා දීලා තිබෙන්නා වූ මේ අවුරුදු පහක ජනතාවට බස්නාහිර පළාත් සභාව තුළ වැඩ කරන්නට දීලා තිබෙන ජනතා වරමට හානියක් වෙනවාට කිසිසේත්ම අපි කැමැති වෙන්නේ නැහැ. ඒකෙන් අවුරුද්දක්, 2019 තිබෙන්නාවූ බස්නාහිර පළාත් සභාව, ඒක 2018 ට අඩු කරන්නත්, එහෙමත් නැත්නම් ලබන මාසේ විසිරවෙන්න තිබෙන නැගෙනහිර ඇතුළු අනෙකුත් පළාත් සභා තුනම තව අවුරුද්දකින් දීර්ඝ කරන්නටත් අපි අනුමත කරන්නේ නැහැ. ඒ නිසා ජනතාව අපට ලබා දිලා තිබෙනවා, අවුරුදු පහක ජනවරමක්. ඒ අවුරුදු පහ අපට නිශ්චිත දිනයක් වශයෙන් අපගේ කැමැත්ත ප්‍රකාශ කරනවා.

එකම දිනයේ ඡන්දය තියන එකට අපි අත් දෙක උස්සලා අපි එකඟතාවය පළ කරනවා, ඒ දිනයට ඡන්දය තියන්න. ඒකේ අපේ කිසිම විරුද්ධතාවයක් නැහැ. නමුත් අපි කියන්නේ, බස්නාහිර පළාත් සභාව තුළ මහ ඇමතිතුමාට තිබෙන්නා වූ බලතල, එහෙම නැත්නම් ආණ්ඩුකාරතුමාට තිබෙන්නා වූ බලතල, ජනාධිපතිතුමාට තිබෙන බලතල, ඒක ගිහිල්ලා පාර්ලිමේන්තුවට දෙන එක අපි විරුද්ධයි. ඒ නිසා අද මහ ඇමතිතුමා මේ විසි වන සංශෝධනය පළාත් සභාවට දෙවතාවක්. මම හිතන්නේ අද තුන් වන දවස සාකච්ඡා කරන්න ගන්න. මේක අපට දෙවන දවසේ හෝ කරන්නට තිබුණා. මහ ඇමතිතුමාගේ මේ යෝජනාව එදා අපට ගෙනැල්ලා මෙතැන දීලා තිබුණා නම්. ඒ නිසා අද මහ ඇමතිතුමා ගෙනැල්ලා තිබෙන යෝජනාවත් මම හිතන විධියට විසි වන සංශෝධනය ගැසට් පත්‍රයේ තිබෙන එකට අපි එකඟතාවයක් නැති වුණත්, ගරු මහ ඇමතිතුමා අද සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ඉදිරිපත් කරපු මේ සංශෝධනයට අපගේ එකඟතාවය පළ කරනවා. ඒත් එක්කම පළාත් සභාවට තිබෙන්නා වූ කිසිදු බලතල මම හිතන විධියට බලතල විමධ්‍යගත කරනවාය කියන එක කිව්වාට, අද බලතල තවත් කෙටි කරනවා. එහෙම නම් 13 වන ව්‍යවස්ථා සංශෝධනය, මම හිතන විධියට පළාත් සභාවේ තිබුණු බලතල, මම හිතන විධියට එකසිය ගණනක් දැන් උදුරා ගෙන හමාරයි. තව තිබෙන්නේ සීමිත ගණනක්. මම හිතන්නේ, ඒකත් මේ එක එක ගැසට් පත්‍රවලින් සංශෝධනවලින් අපව කෙටි කරන්න ගියොත් අපේ බලතල සම්පූර්ණයෙන්ම නැති වෙලා, අපි නගර සභා ප්‍රාදේශීය සභා තත්ත්වයට අපි වැටෙනවා. ඒ නිසා අපේ බලතල කිසිසේත් අපි ලබා දෙන්නට ඉඩ නොහැරෙන බවත්, පක්ෂයක් වශයෙන් අපි ඉදිරියේදී ගන්නා ලද හරි තීන්දුවලට පළාත් සභාවේ වුණත්, පාර්ලිමේන්තුවේ වුණත්, ප්‍රාදේශීය සභාවලත්, නගර සභාවල වුණත් අපි එකඟතාවය පළ කරනවා. හරි දේට හරියි කියනවා. වැරැදි දේට යහපාලන රජය යටතේ අපගේ ඇමැතිතුමා සිටියත්, පක්ෂ නායකතුමා සිටියත් අපි කොන්ද පණ ඇතිව වැරැදි දේට වැරැදියි කියන එකඟතාවය අපි පළ කරනවා. ඒ නිසා අද මේ පළාත් සභාවට ගෙනෙන ලද මේ විසි වැනි සංශෝධනයට අපේ එකඟතාවයන් නැති වුණත් අද ගරු මහ ඇමැතිතුමා ගෙනෙන ලද සංශෝධනයන්ට අපගේ එකඟතාවය ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දුන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවට මම කියන්නේ මේකේ සටහනක් තියන්න. මේ විසිවන සංශෝධනයට මගේ දැඩි විරෝධතාවයක් තිබෙන්නේ. නමුත් වර්තමානයේ මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් අපේ වගකීමක් තිබෙනවා, අර ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අනාගතයේ මේ සභාව ගෞරවණීය සභාවක් බවට පත් කිරීමේ වගකීම අපට තිබෙනවා. ඒ නිසා අර නීති විශාරද මහත්වරු, මැති ඇමැතිවරු ඔක්කොම කථා කළාට පස්සේ අපි කථා කරන එකෙන් මම හිතන්නේ වගකීම අඩු ඇති. නමුත් මම

හිතනවා, මේ මැතිවරණ එක දිනක පැවැත්වීම වඩා වැදගත් කාර්යයක්. රජයක් හෝ පවතින රජයක් තැනින් තැන මැතිවරණ පවත්වා ජනමතය බලනවාට වඩා එක වර මැතිවරණයක් තියද්දී රටේ ජනමතය විමසා ගැනීමේ අවස්ථාවක් තිබෙනවා. රටේ වියදම් සම්බන්ධයෙන්, විවිධ කරුණු සම්බන්ධයෙන් අපට යම්කිසි කථිකාවතක් තිබෙන්න පුළුවන්. නමුත් අපේ අකැමැත්ත තිබෙන්නේ මේ දීලා තිබෙන බලය නැවත උදුරා ගන්න උත්සාහ කරනවාටයි. අපි ඒකට දැඩි විරෝධතාවය දක්වන්න ඕනෑ. එහෙම අපට අවස්ථා ගණනාවකදී සිද්ධ වුණා. අපි පළාත් පාලන ආයතනවල බලය හොඹවලා මේ තැනට ආපු අය. හැබැයි, ආපසු හැරිලා බලන කොට පළාත් පාලන ආයතනවල බලය දැන් යම් යම් ආයතන උදුරා ගන්නවා. අපට වගකීමක් තිබෙනවා, ඒ බලයත් තහවුරු කරන්න. ඒ වාගේ තමයි මේ වකවානුවේත් වර්තමානය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා වශයෙන් අපේ වගකීම තමයි මේ සභාව ගෞරවනීය තත්ත්වයට පත් කරන එක. ඒ ගෞරවය තියන එක. මහ ඇමතිතුමාට, ආණ්ඩුකාරවරයාට තිබෙන බලතල තව තහවුරු කරනවා ඇරෙන්න අපට පුළුවන්කමක් නැහැ, ඒවා තව කෙනෙකුට පාවලා දෙන්න. අපට අනන්‍යතාවයක් තිබෙන්න ඕනෑ. අපට මන්ත්‍රීවරයෙක් කියලා කිව්වාම, රූකඩයක් බවට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. අපට අභිමතයන් තිබෙන්නට ඕනෑ. අපට හැකියාවන් තිබෙන්නට ඕනෑ. මහ ඇමැතිවරයාට, ආණ්ඩුකාරවරයාට තිබෙන බලතලත් එක්ක අපට පල්ලෙහාට ගලාගෙන යන්න පුළුවන්කමක් තිබෙන්නට ඕනෑ. එහෙම නැති වුණොත් අපේ තිබෙන අනන්‍යතාවය මහජන නියෝජිතයා කියන අනන්‍යතාවය ගිලිහී යන්න පුළුවන්. ඒ නිසා මේ පළාත් සභාවේ තිබෙන බලතල කොහෙත්ම කප්පාදු කරනවාට වඩා ඒවා ආරක්ෂා කරගන්න අපි කැප වෙන්නට ඕනෑ. ඒ වෙනුවෙන් අපි සටන් කරන්නට ඕනෑ. ඒ නිසයි අපි මේ සංශෝධනයට විරුද්ධ.

හැබැයි, අපි ගරු මහ ඇමැතිතුමාට අපේ ගෞරවය, ප්‍රණාමය පුද කරනවා. එතුමා ඒ අදාළ සංශෝධනයන් නියමාකාරයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සංශෝධනයන්ට යටත් කරලා, ඒ සංශෝධනයන් එක්ක මේ සංශෝධන එනවා නම්, මේ කරුණු සලකා බලනවා නම් අපේ එකඟතාවයක් ඒ ගැන දක්වන්න පුළුවන්කම තිබෙනවා. එම නිසා කල්පනා කරන්නට ඕනෑ. මේ පළාත් සභා ක්‍රමය ඇති කරන්න ගිහිල්ලා මේ රටේ මොනතරම් තත්ත්වයක් ඇති වුණාද කියලා අපි අවබෝධ කරගන්නට ඕනෑ. මේ රටේ මිනිස්සු අවිආයුධ අතට අරගෙන සටන් වැදුනු බව අපි අමතක කරන්න හොඳ නැහැ. එහෙම අපි අකැමැත්තෙන් හරි මේ ජන සමාජයට පළාත් සභා ක්‍රමය හඳුන්වා දී තිබෙනවා. ශ්‍රී ලංකාව කියන්නේ දූපතක්. මේක පුංචි රටක්. මේක පාලනය කරන්න ගැටලුවක් තිබෙන රටක් නොවෙයි. ඉන්දියාව වාගේ රටකට පළාත් සභා ක්‍රමය වැදගත් වෙනවා වෙන්න පුළුවන්. ලංකාව වාගේ රටකට පළාත් සභා ක්‍රමය අවශ්‍යතාවයක් නැති වුණත් මේ රටේ පැවැති වර්ගවාදී යුද්ධය හා වෙනත් කරුණු පදනම් කරගෙන මේක අපට පවරලා දුන්නා. එතකොට දැන් මේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත වෙලා තිබෙන්නේ. හැබැයි, යම් හරි අවස්ථාවක පාර්ලිමේන්තුව කියනවා නම් මේ පළාත් සභා ක්‍රමය අහෝසි කරන්න ඕනෑ. ලංකාවට නොගැලපෙන පාලන ක්‍රමයක් කියලා අපි එකහෙලා ඒකට අත උස්සනවා. මෙහි නියුතු වුණත් මේක රටට නොගැලපෙන, මේ රටට වැදගත් නොවන පාලන ක්‍රමයක්. මේක මීට වඩා පල්ලෙහාට ගිහිල්ලා දිස්ත්‍රික් ක්‍රමයකට ආවා නම් අපට කැමැත්ත දක්වන්න තිබුණා. නමුත් අද අපි මෙතැන ඉන්න නිසා අපේ වගකීමක් තිබෙනවා, දුන්නු දේ රැකලා තියන්න. අනාගතය වෙනුවෙන් අපි ඒ කාර්යය ඉටු කරන්න ඕනෑ. ඒ නිසා අපේ වගකීම අපි ඉටු කළ යුතු යැයි මම විශ්වාස කරනවා.

ඒ නිසා මේක අපට සුළුවෙන් හිතලා, දේශපාලන වශයෙන් හිතලා තීන්දුවක් ගන්න පුළුවන්. හැබැයි උතුරු, නැගෙනහිර මහ ඇමැතිවරු සටහන් කරන්නේ, පොලිස් බලතල ඉල්ලලා. ඉඩම් බලතල ඉල්ලලා. නැගෙනහිර පළාතත් ඒ විධියට කටයුතු කරන්නේ. ඔවුන් වෙනම රාජ්‍යයක් බවට පත් වෙලා යම් අවස්ථාවක කටයුතු කරන කොට ඔවුන් මේක ලෙහෙසියෙන් අත හරින්නේ නැහැ. ඒ නිසා ළඟ බලලා තීන්දු ගත්තොත් අනාගතයේ මේ රටේ නැවත වර්ගවාදී යුද්ධ ඇති වෙන්න, භාෂා යුද්ධ ඇති වෙන්න, ආගමික ගැටුම් ඇති වෙන්න තිබෙන අවස්ථා පිළිබඳව අපි කල්පනා කරන්නට ඕනෑ. ඒ නිසා මේ යම්කිසි සමතයකට පත් කරන්න, මේ පළාත් සභා ක්‍රමය තුළ ගෙනැල්ලා ඒ අයට යම් යම් විෂයයන් පවරලා දීලා, ඒ තුළට බලධාරීත්වය දීලා කටයුතු කරලා තිබෙනවා. එතකොට අපෙන් ගිලිහිලා ගිය දේවල් නැවත ලබා ගන්න, අපේ ප්‍රඥප්ති ඉදිරිපත් කරලා බලය තහවුරු කර ගන්නවා

ඇරෙන්න අපේ බලය ත වදුරටත් හැල්ලුවෙන්න දුන්නොත් මම හිතන්නේ, පළාත් සභා ක්‍රමයේ වැදගත්කම නැති වෙලා යනවා.

ඒ නිසා දීර්ඝ වශයෙන් කථාවක් කරන්න උත්සාහ කරන්නේ නැහැ. නමුත් මම අවංකවම අද දිනයේ සතුටු වෙනවා. මේ පළාත් සභාවේ මන්ත්‍රීතුමන්ලාට හැඟීමක් තිබෙනවා, මේ අපේ පළාත් සභාව කියලා. මේ පළාත් සභාවේ බලය අපි රැකගන්න ඕනෑය කියලා. මේ පළාත් සභා අපි අඛණ්ඩව රැගෙන යන්න ඕනෑ කියලා මේ අය හැම කෙනාටම හැඟීමක් තිබෙනවා. එහෙමනම් ඒ හැඟීම හැමදාම ඇති වෙන්න ඕනෑ. මේ වසර තුළ අවස්ථා 15 කදී මේ පළාත් සභාව ගණපූරණය නොමැතිව අත්හිටුවලා තිබෙනවා. එතකොට මේ හැඟීමක් තිබෙන මන්ත්‍රීතුමන්ලාට ඒ හැඟීම ඇති වුණා නම් අපට මේ බස්නාහිර පළාත් සභාව වැදගත්. මේ වැදගත් පළාත් සභාවෙන් වැදගත් යමක් කරන්න පුළුවන්. මේකේ තිබෙන බලය අපි රැකගන්න ඕනෑ කියලා කිව්වා නම්, අපට ඇවිල්ලා ආපසු යන්න වෙන්නේ නැහැ. ඒ හැඟීම අපි ළඟ හැමදාම තිබෙන්නට ඕනෑ. බස්නාහිර පළාතේ පළාත් සභාව පාර්ලිමේන්තුවට දෙවැනි පළාත් සභාව නම්, අපේ වගකීම හා යුතුකම මොකක්ද කියලා ජනතාවට ඔප්පු කරලා දෙන්න ඕනෑ. බලය අහිමි වෙන කොට විතරක් අපි කෑ මොර දුන්නාට වැඩක් නැහැ. තිබෙන බලය තුළින් ජනතාවට වැඩ කරලා පෙන්වන්න ඕනෑ. නුඹලා අපට ඡන්දය දීලා පත් කරලා එව්වේ, අහවල් තැනට. උඹලා මෙන් මේ විධියට ජනතාව වෙනුවෙන් වැඩ කරහල්ලා කියලා. ඒ නිසා අපේ වගකීම අපි තේරුම් ගන්නවා වාගේම පාර්ලිමේන්තුවට අද ගෙනැල්ලා තිබෙනවා. පාර්ලිමේන්තුව පත් කළාම වසර 4 ½ ක් යන තුරු පාර්ලිමේන්තුව විසුරුවා හරින්න පුළුවන්කමක් නැහැ. එහෙමනම් පළාත් සභාවටත් එහෙම ක්‍රමයක් ගෙන්න. යෝජනා කරලා යවන්න. මේ පළාත් සභා තිබුනාම අපට නියමිත ආයු කාලයක් කියන්න. ඒ ආයු කාලය තුළ මේක හොල්ලන්න පුළුවන්කමක් නැහැ. එතකොට දෙන්න පාර්ලිමේන්තුවට බලය. එතකොට අපට ස්ථාවරත්වයක් තිබෙනවා. සල්ලි වියදම් කරලා, මහජනතාව ළඟට ගිහිල්ලා අපට කියන්න පුළුවන් අපි අවුරුදු 05 ක් ඔබලාගේ නියෝජිතයා. අපට සැලසුම් තිබෙනවා. අපට හැකියාවන් තිබෙනවා. කුසලතාවයන් තිබෙනවා. අපි උඹලා වෙනුවෙන් මේ අවුරුදු ගණන තුළ සේවය කරනවා කියලා කියන්න පුළුවන්කමක් අපට තිබෙනවා. ඒ නිසා අපට අවිනිශ්චිත භාවයක් දෙන්න එපා. අපි ජනතාවට පොරොන්දු දීලා ඇවිල්ලා තිබෙනවා. අපි ඒ විශ්වාසය අඛණ්ඩව රැකගන්න ඕනෑ. ඒ නිසා එහෙම කරන්න නම් මේ පළාත් සභාව තුළ ඒ අවිනිශ්චිත භාවය නැති කරලා, මන්ත්‍රීවරයාට ගෞරවය ඇති වන - අද මොනතරම් පාර්ලිමේන්තුව තිබුණත්, විධායකය තිබුණත් පළාත් සභාවේ අපිත් ගිහිල්ලා ගමේ හයියක් අරන් ඉන්නවා. අපට යම්කිසි අනන්‍යතාවයක් ගොඩනගාගෙන තිබෙනවා. මේක හැල්ලු කරන්න, මේ පළාත් සභා තුළින් කටයුතු කරන්න එපා කියන එක ගෞරවයෙන් සිහිපත් කරමින්, ඒ සඳහා අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගත් උත්සාහයත් අගය කරමින් ඔබ සැමටම සුභ පතමින් නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සමන්මලී සකලසූරිය**
Hon. Samanmalee Sakalasooriya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා. මේ වන විට පළාත් සභාවට ඉදිරිපත් කර ඇති මෙම යෝජනාව පිළිබඳ මත විමසුමේදී සති ගණනක් තිස්සේ මේ විවාදය මේ මත විමසීම කල් දමමින් කාලය ගත්තා, අධ්‍යයනය කරලා මේ සඳහා අපි විසඳුමක් ලබා දෙනවා කියලා. විශේෂයෙන්ම මතක් කර සිටින්න ඕනෑ. අපේ මහාමාත්‍යතුමා මේ වන විට අතිගරු ජනාධිපතිතුමාට ලිපියකින් යොමු කරලා තිබෙනවා, මේ ඉදිරිපත් කරලා තිබෙන විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි සංශෝධනයක් ඉදිරිපත් කරනවා. ඒ අනුව තමයි අපි එකඟතාවය පළ කරන්නේ. අපට දැන් මේ පළාත් සභාවට යොමු කරලා තිබෙන අදාළ කෙටුම්පතට අපේ සහයෝගයක් ලැබෙන්නේ නැහැයි කියලා.

විශේෂයෙන්ම මේ ඉදිරිපත් කරලා තිබෙන සංශෝධන දිහා බැලුවාම මැතිවරණ එක් දිනක පැවැත්වීම පිළිබඳව අපි කාගේත් ප්‍රශංසාව, කැමැත්ත, මම හිතන්නේ අපි හැමෝම පක්ෂ භේදයකින් තොරව ප්‍රකාශ කළා. මැතිවරණයක් එක දිනක පැවැත්වීම තුළ මම හිතන්නේ බොහෝ වාසිදායක සහ යහපත් දේවල් මේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ මැතිවරණයකදී අපට දකින්න පුළුවන්. ඒ එක්කම එවැනි හොඳ දෙයක් ඉදිරිපත් කරමින් ඊළඟ කාරණා දිහා බැලුවාම අපි දැක්කා, මේ පළාත් සභා ක්‍රමයට හානිදායක, මේ පළාත් සභා ක්‍රමය පිහිටුවන්නට මූලික වුණු කරුණුවලින් ඔබ්බට

ගිහිල්ලා, මේ පළාත් සභාවල තිබෙන බලතල කප්පාදු කරලා ඒ පළාත් සභාවල තිබෙන ස්වාධීනත්වයට හානිකර තත්ත්වයක් උදා කරන සංශෝධන තුළින් අපි දැක්කා. ඒ නිසා එයට විරුද්ධ භාවය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මම එකඟ වෙනවා. බස්නාහිර පළාත් සභාවේ තරුණ මන්ත්‍රීවරියක් විධියට ජනතාවගේ කැමැත්තෙන්, ජනතාවගේ ඡන්දයෙන් තේරී පත් වී පැමිණියත් මම පෞද්ගලිකව විශ්වාස කරනවා. මේ විධියට ටිකෙන් ටික, අඩියෙන් අඩිය, එකින් එක පළාත් සභාවේ තිබෙන බලතල කප්පාදු කරන්නේ නැතිව, මේ පළාත් සභා ක්‍රමය ලංකාවට හඳුන්වා දෙන්න මූලික වුණු කාරණාවක් තිබුණා. මේ පළාත් සභා ක්‍රමය ලංකාවේ පිහිටුවන්නට මුල් වුණු හේතු තිබුණා. අද පළාත් සභා මේ ලංකාව තුළ ක්‍රියාත්මක වෙන්නේ ඒ හේතු මතමද කියලා අපි දන්නේ නැහැ. නමුත් අද වන විට පළාත් සභා නවයක් ක්‍රියාත්මක වෙනවා. පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු මේ පළාත් සභා ක්‍රමය සුදු අලියෙක් කියනවා මට ඇහුණා. තව කෙනෙක් කියනවා මට ඇහුණා, මේ පළාත් සභාව තුළින් කරන්න පුළුවන් සේවය ඇත්තටම අපි කරනවාද කියලා. ඉතින් මේ විධියටද අපි අපිත් දැනටමත් පළාත් සභා පිළිබඳ කථා කරමින් ඉන්න මොහොතක මේ විධියට පළාත් සභාවේ බලතල එකින් එක අඩු කරන්නට, කප්පාදු කරන්නට ආණ්ඩුකාරවරයාගේ තිබෙන බලතල, එහෙම නැත්නම් ජනාධිපතිතුමාගේ නියෝජිත ආණ්ඩුකාරතුමාගේ බලතල කප්පාදු කරලා මේවා පාර්ලිමේන්තුවට ගන්නවා කියන මේ අදහස් දිහා බැලුවාම මම පෞද්ගලිකව හිතනවා, ලංකාවට පළාත් සභා ක්‍රමය ගැලපෙනවාද කියලා අපි දැන්වත් හිතලා බලන්න ඕනෑ. පළාත් සභා ක්‍රමය ගැලපෙන්නේ නැත්නම් දැන්වත් මේ ක්‍රමවේදය අහෝසි කරලා, මගේ සහෝදර ගරු මන්ත්‍රීතුමා යෝජනා කරපු විධියට දිස්ත්‍රික් මට්ටමකටවත් යන්න පුළුවන් විධියේ ක්‍රමවේදයක් මේ ලංකාවේ ඇති කරලා මහජනතාවගෙන් නියෝජිතවරයෙක් පත් වන කොට, ඒ දිස්ත්‍රික්කයකට නියෝජිතවරයා ලෙස පත් වෙලා තමයි අපි පළාත් සභාවක් නියෝජනය කරන්නේ. මට බැහැ, ගම්පහින් පත් වෙලා කොළඹට හෝ කළුතරට වැඩ කරන්න. නමුත් අපව හඳුන්වන්නේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් විධියට. මේ විධියට පවතින පළාත් සභා ක්‍රමය තුළ තව තවත් කැළඹීම්, තව තවත් අස්ථාවර භාවයන් ඇති කරන්නේ නැතිව එක්කෝ සහමුලින්ම මේ ක්‍රමය අහෝසි කරලා දාන්න. එහෙම නැත්නම් පවතින මේ ක්‍රමය ස්ථාවරව, ජනතාවටත් මේ රටටත් ගැලපෙන වැඩක් කරන්නට පුළුවන්, මේ ක්‍රමයෙන් ප්‍රශ්නයක් විසඳන්න හැදුවා නම් ඒ ප්‍රශ්නය විසඳන විධියට වැඩ කරන්න කියන යෝජනාව මම පෞද්ගලිකව ඉල්ලා සිටිමින්, මේ ගෙනැවිත් තිබෙන යෝජනාවට අපගේ විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම සතුටු වෙනවා, ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන. විශේෂයෙන් දේශපාලනය ගැන උනන්දු වෙන, දේශපාලනය ගැන අධ්‍යයනය කරන, ඒ වාගේම සමාජ සංසිද්ධීන් යම් තර්කානුකූල විධියට විග්‍රහ කරගන්න උත්සාහ කරන ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනයේ ඉන්න වෙලාවේ කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම බොහොම සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, විශේෂයෙන් කියන්න ඕනෑ. මේ විසි වැනි සංශෝධනය සාකච්ඡා කරන අද දවස ලෝක මානව ඉතිහාසයේත්, ලෝක දේශපාලන ඉතිහාසයේත් ඉතාම වැදගත් දවසක්. මට මතකයි මීට අවුරුදු 16 කට කලින් ජාතික රූපවාහිනිය උදේ පාන්දර බල බලා ඉන්නකොට ජාතික රූපවාහිනියේ වැඩ සටහන් CNN නාලිකාවට සම්බන්ධ කරලා, එදා තිබුණු සාමාන්‍ය වැඩ සටහන් අහෝසි කරලා, CNN නාලිකාවේ ප්‍රවෘත්ති විකාශයන් ජාතික රූපවාහිනියේ පෙන්වන්න පටන් ගත්තා. අපි දැක්කා ජාතික රූපවාහිනිය බලාගෙන ඉන්න කොට ඇමරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථාන කුළුනකට ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල වෙලා, අපි බලන් ඉන්න වෙලාවේම තව ප්ලේන් එකක් ඇවිල්ලා අනික් කුළුනට එල්ල වෙලා ඒ කුළුනු දෙකම කඩාගෙන වැටිලා 6000 ක් විතර මිනිස්සු ජීවිතක්ෂයට පත් වුණා. අපි ප්‍රථමයෙන්ම අද වාගේ දවසක වුණු ඒ ඛේදවාචකයෙන් මිය ගිය සියලු දෙනාට ශෝකය ප්‍රකාශ කරන ගමන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මතක් කරන්න කැමැතියි. අද දවසේ ඇමරිකානු මාධ්‍ය ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. එදා ඇමරිකානු ලෝක වෙළඳ මධ්‍යස්ථානයට පහර දෙන්න කටයුතු කරපු ත්‍රස්තවාදීන්ට උදව් කෙරුවේ සෞදි අරාබිය කියන රාජ්‍යය කියලා.

[ගරු මහේෂ් අල්මේදා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ඇමරිකාව තීන්දු කෙරුවා ඇෆ්ගනිස්ථානය තමයි මේ පහරදීම කළේ කියලා. ඒ නිසා ඇමරිකාව ලෝකයේ තිබෙන සියලු මානව අයිතිවාසිකම් සලකන්නේ නැතිව ඇෆ්ගනිස්ථානයට දිගින් දිගට පහර දීලා ඇෆ්ගනිස්ථානයේ ළමයින්, දරුවන්, ඒ වාගේම සිවිල් වැසියෝ සිය ගණනක් මරා දැම්මාට පස්සේ, අවුරුදු 16 ක් ගිහිල්ලා අද කියනවා, සෞදි අාරාබිය තමයි එදා 11.11 ප්‍රහාරයට සහයෝගය දුන්නේ කියලා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසය විසින් දේශපාලනයේ ගන්න තීන්දු නිවැරැදි කරන කොට බොහෝ බේදවාචක ලෝකයට වෙලා ඉවරයි කියන කාරණය, ඒ සත්‍යය ඒ කාරණය හරහා පෙන්නලා තිබෙනවා.

ඒ නිසා මේ කාරණයේදීත් ඉතිහාසය විසින් තමයි අපට කවදා හරි කියලා දෙන්නේ අපි ගන්න තීන්දු තීරණ නිවැරැදියි කියලා. ඒ නිසා ඉතිහාසයේ නිවැරැදි වන තුරු අපට යුතුකමක් තිබෙනවා, අපි නිවැරැදි තීන්දු අරගෙන එදා වනතුරු බලාගෙන ඉන්නේ නැතිව, හරි දේ කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ කරන විවාදයේදී අපට පැහැදිලිවන එක කාරණයක් තිබෙනවා. ඒ තමයි 1978 ව්‍යවස්ථාව ගෙනැල්ලා අවුරුදු 40 ක් යන්තම් පිරෙන්නේ ලබන අවුරුද්දට. 2018 අවුරුද්දට. 78 ව්‍යවස්ථාවට අවුරුදු 40 යි. ඒ ව්‍යවස්ථාව අද වන කොට විසි වතාවක් සංශෝධය වෙලා තිබෙනවා. මේ විසි වැනි සංශෝධනය කියලා කියන්නේ 78 ව්‍යවස්ථාවට ගෙනෙන විසි වැනි සංශෝධනය. ලෝක ඉතිහාසයේ කිසිම තැනක ව්‍යවස්ථාවක් මේ තරම් පුංචි කාලයක, මේ තරම් ප්‍රමාණයක් සංශෝධනය වෙලා නැහැ. ඒකේ පැහැදිලි කරන කාරණය තමයි, 1978ව්‍යවස්ථාව දියාරු ව්‍යවස්ථාවක් කියන එක. ඒක මේ රටට නොගැලපෙන ව්‍යවස්ථාවක් කියන එක. ඒකේ බොහෝ කාරණා අයින් කළ යුතුයි කියන කාරණය තමයි මේ සංශෝධන හරහා අපි පැහැදිලි කරගන්නේ.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැවත වතාවක් මේ ව්‍යවස්ථාව සංශෝධනය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේකේදී අපට කියන්නට තිබෙන්නේ, මේ 13 වැනි සංශෝධනයට ගෙනාපු ව්‍යවස්ථා සංශෝධනයට තමයි නැවත වතාවක් පුංචි කැල්ලක් එකතු කරලා මේ සංශෝධනය කරන්නේ. මේකේදී අපි දේශපාලන පක්ෂයක් විදියට, ශ්‍රී ලංකාවේ කොමියුනිට්ස් පක්ෂය, අපි පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත කරන්න වෙඩි කාලා තිබෙනවා. අපි ගුටි කාලා තිබෙනවා. අපි මැරුම් කාලත් තිබෙනවා. මේ පළාත් සභාව මේ රට ඇතුළේ ස්ථාපිත කරන්න. අපට එහෙම ස්ථාපිත කරන්න උවමනා වුණේ, අපි විශ්වාස කෙරුවා මේ රට ඇතුලේ ජනාවාර්ගික ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මේ රටේ අපි සියලු දෙනා 1948 අවුරුද්දේ නිදහස දිනා ගැනීම සඳහා ජාතික නිදහස් අරගලයේදී එකට කටයුතු කෙරුවා. හැබැයි, නිදහසින් පස්සේ අපට බැරි වුණා එකට කටයුතු කරන්න. දේශපාලන බලයන් බෙදා ගන්න. ඒ නිසා අපි එකි නෙකා වෙන් වෙලා අරගල කරන්න පටන් ගත්තා. කපටි කුහක දේශපාලඥයෝ මේ අරගලය ජනතාව මත තියලා, ජනතාව පාවිච්චි කරලා විවිධ කටයුතු කරපු නිසා දේශපාලන සැකයක් උතුරේ නිර්මාණය වුණා. ඒ සැකය මත අවුරුදු 30 ක් මේ මහපොළව මත අපි සටන් කරලා තිබෙනවා. දැන් යන්තම් ඒක ඉවර වෙලා. මේකේදී අපි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

එදා 88 මේ සංශෝධනය ගෙනාවේ උතුරට පළාත් සභාවක් හදලා දේශපාලන බලයේ අයිතිය උතුරේ ජනතාවට දෙන්න. හැබැයි, ඒක අවුරුදු 20 ක් විතර යනතුරු දෙන්න බැරි වුණා. පළමුවැනි වතාවට පළාත් සභාවක් ස්ථාපිත කරලා මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි ඒ බලය උතුරට දුන්නේ. එදා මේ දකුණේ හිටපු ජාතිවාදී, වර්ගවාදී, ඒ වාගේම සිංහල අන්තවාදී දේශපාලන පක්ෂ කිව්වා, රට දැන් කැඩිලා යනවා. උතුරේ වෙනම රටක් හැදෙනවා කියලා. අපි අහනවා, එහෙම රටක් උතුරේ හැදිලා තිබෙනවාද? කියලා. උතුරේ එහෙම රටක් හැදිලා නැහැ. උතුරේ එහෙම රටක් වෙනුවට පරිපාලනයට යම් ප්‍රමාණයකට සම්බන්ධ වෙලා තිබෙනවා. අවාසනාවට උතුරේ සිද්ධ වුණේ, උතුරේ මහ පොළව පාගපු නැති මිනිහෙක් උතුරු පළාත් සභාවේ මහ ඇමැති කරපු නිසා පළාත් සභාවෙන් ලැබෙන්න ඕනෑ ප්‍රයෝජනය උතුරු පළාතේ මහජනතාවට නැතිව ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා අද පළාත් සභාව නැවත නැවතත් මේ රටේ ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව සාකච්ඡා කරන යුගයක තමයි අපි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කියන්න ඕනෑ. මේ රජය බලයට පත් වුණාට පස්සේ ජාත්‍යන්තරයට කිව්වා,

මේ රටේ බලය බෙදීම පුළුල් කරලා ජාතීන් අතර තිබෙන අසමඟිය නැති කරන්න කටයුතු කරනවා කියලා. අපට අහන්න තිබෙන්නේ, මේ ව්‍යවස්ථා සංශෝධනය හරහා මේ ආණ්ඩුව කරන්නේ ඒකද? මේ ආණ්ඩුව ජාත්‍යන්තරයට බොරු කියනවා නොවෙයිද? ජාත්‍යන්තරයට එකක් කියලා, පළාත් සභා ශක්තිමත් කරනවා කියලා ජාත්‍යන්තරයට කියලා, 13+ කියලා, නැවත වතාවක් 13 අකුළලා මේ රටේ ජනවර්ග අතර තිබෙන සමඟිය නැති කරලා දාන ක්‍රියාදාමයක තමයි මේ නිරත වෙන්නේ. ඒ නිසා කිසිසේත්ම පළාත් සභාවල බලය කපා දාන එකට දේශපාලන පක්ෂයක් විධියට අපට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ.

අපි පක්ෂ වන කාරණා තිබෙනවා. පළාත් සභා ස්ථාපිත කරපු මුල දවසේ සිට මේ රටේ කිසිම දවසක පළාත් සභා මැතිවරණ එකවර තියන්න බැරි වුණා. පළාත් සභා මැතිවරණ වෙන වෙනම තිබුණාට ප්‍රශ්නයක් නැහැ. පළාත් සභාව පිහිටුවනවා නම්. දේශපාලන අධිකාරියක් හදන්න නම් මේ මැතිවරණ තිබෙන්නේ. නමුත් කලින් කිව්වා වාගේ පළාත් සභා මැතිවරණ එක එක විට තියලා මහජන මතය උරගා බලන්න හැදුවා වාගේම අස්වාභාවික දේශපාලන බලයක් පාවිච්චි කරලා ඒ පළාත් සභාවල් ස්වාභාවිකව පිහිටුවන එක දේශපාලන පක්ෂ විසින් නැති කළා. ඒ නිසා තමයි පළාත් සභාවල මැතිවරණ එක දවසක තියන්න ඕනෑ. යම් පළාතක වෙනම ඡන්ද තියලා, ආණ්ඩුවේ බලය, මැති ඇමැතිවරුන්ගේ බලය, දේශපාලන හයිය සියල්ල පාවිච්චි කරලා අස්වාභාවික මැතිවරණ ප්‍රතිඵලයක් පාවිච්චි කරන්න හදනවා නම් එහෙම පළාත් සභා තිබෙන එකේ මේ මහ පොළවට කිසිම ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. ඒ නිසා පළාත් සභා මැතිවරණ එක දවසක තියන්න ඕනෑ. ඒ වාගේම තමයි 1978 ව්‍යවස්ථාවේ තිබුණු වැරැදිම දේ මේ අසික්කිත, අශීලාචාර මැතිවරණ ක්‍රමය. මේක වෙනස් වෙන්න ඕනෑ. මේ ආණ්ඩුව කියනවා නම් මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සඳහා තමයි පළාත් සභා කල් දාන්නේ කියලා. ඒකට යම් ප්‍රමාණයකට එකඟ වෙන්න පුළුවන් කාරණාවක් තිබෙනවා. නමුත් මැතිවරණ කල් දානවා කියන එක ඉතාම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක්. ඒ නිසා මැතිවරණ කල් දැමීමෙන් ඒක කරන්න හදනවා නම් ඒක වැරැදි වැඩක්. අපි දන්නවා, පළාත් පාලන ආයතනවල මැතිවරණ ක්‍රමය වෙනස් වෙන්න කොපමණ කල් ගියාද කියලා.

ජනාධිපති කාර්ය සාධක බලකාය මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ පත් කළේ, 2013 අවුරුද්දේ. හරියටම අවුරුදු 13 ක් ගිහිල්ලා තමයි පළාත් පාලන මැතිවරණ ක්‍රමය අද අනුමත කරලා ගෙනැල්ලා තිබෙන්නේ. ඒකත් තවම ඉවර කරලා නැහැ. තමත් මේ රජයට කියන්න පුළුවන්කමක් නැහැ, පළාත් පාලන කවදාද මැතිවරණය තියන්නේ කියලා. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න ආණ්ඩුවක් ගන්න කාලසීමාව කොයිතරම්ද කියලා අපට පේනවා, පළාත් පාලන මැතිවරණ ක්‍රමය ස්ථාපිත කරන්න ගිය වෙලාවෙන්. ඒ නිසා අවුරුද්දක් කල් දාලා මැතිවරණ ක්‍රමය හදන්න යනවා කියන කාරණයට අපට එකඟ වෙන්න පුළුවන්කමක් නැත්තේ, පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව පසුගිය කාලයේ පළාත් පාලන මැතිවරණ ක්‍රමය හදන්න ගත්ත කාලසීමාවත් එක්කයි. පළාත් පාලන මැතිවරණ ක්‍රමය හදන්න අවුරුදු 13 ක් ගියා නම් අවුරුද්දකින් පළාත් සභාවේ මැතිවරණ ක්‍රමය සමානුපාතිකයි, කේවළයි දෙක එකට නියෝජනය වන මැතිවරණ ක්‍රමයක් හදන්න කටයුතු කරනවා කියන කාරණයකට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා තමයි ඊළඟ කාරණය මතු වෙන්නේ. මේ පළාත් සභා ඡන්ද කල් දැමීම සඳහා මතුවන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මෙහි දී අපට කියන්න තිබෙන්නේ, මේකේ තිබෙන භයානකම, බරපතළම ප්‍රශ්නය තමයි මේ ඇ ඇ ව්‍යවස්ථාව ඇතුළේ කරන සංශෝධනය. ඒක මේ අපට එවලා තිබෙන කෙටුම්පතේ කියන්නේ, පාර්ලිමේන්තුවට සියලු බලතල ගන්නවා කියලා. මම මේ වෙලාවේ විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මේකට සමහරු කියයි, බටර් ගානවා කියලා. සමහරු කියයි, මේ වරප්‍රසාද ගන්න හදනවා කියලා. සමහරු කියයි, මහ ඇමැතිතුමා අල්ලගෙන වාසි ටික අරගෙන ආසනයේ ව්‍යාපෘති ටික කරගන්න හදනවා කියලා. හැබැයි, මම පැහැදිලිවම කියන්න ඕනෑ. මට අතිවිශාල සතුටක් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ගැන තිබෙනවා. ඒකට ප්‍රධාන කාරණය තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා කිහිපයක මේ සංශෝධනය පිළිබඳව ඡන්ද විමසීම කළා. උතුරේ ඡන්ද විමසීම කළා. උතුරේ ඒකමතිකව මේක පරාජයට පත් කළා. අපි දන්නවා, ඒකේ තිබුණු දේශපාලනය මොකක්ද කියලා. අද දෙමළ ජාතික සන්ධානයට පාලනය කරගන්න බැරි මහ ඇමැතිවරයෙක් උතුරේ ඉන්නවා. ඒ නිසා දෙමළ ජාතික සන්ධානයට

[ගරු මහේෂ් අල්මේදා]

අවශ්‍යා කරනවා, ඉතාම කඩිනමින් තමන්ට පාලනය කරන්න බැරි මහ ඇමැතිවරයා එළවලා දාලා තමන්ට පාලනය කරන්න පුළුවන් මහ ඇමැතිවරයෙක් හදන්න. ඒ නිසා ඒ අයට උවමනායි, පළාත් සභා විසුරුවා හරින්න තිබෙන පළමුවැනි දවසේ පළාත් සභාව විසුරුවා හැරලා දාලා, ඒ අයට පාලනය කරගන්න පුළුවන් මහ අමැතිවරයෙක් පත් කරගන්න. ඒ නිසා බහුතර බලයක් දෙමළ ජාතික සන්ධානයට තිබෙන උතුරු පළාත් සභාවේදී ඒ අය තර්කයක් නැතිව මේ යෝජනාව පරාජය කළා. එන දවසේම මැතිවරණය ගන්න. ඒ වාගේම ඌව පළාත් සභාව මේ යෝජනාව පරාජයට පත් කළා. අපි දන්නවා ඌවේ ප්‍රධාන අමාත්‍යවරයා, එතුමා පාර්ලිමේන්තුවට පත් වුණු කෙනෙක්. පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරය අයින් කරලා දාලා තමයි ප්‍රධාන අමාත්‍යවරයා බවට පත් වුණේ. එතුමාට පුළුවන්කමක් නැහැ, තමන්ට හම්බ වුණු මහ ඇමැති තනතුර තව කාලය අවුරුදු 2 ½ ක් පාලනය කරන්න තිබියදී ඒ පාලන බලය අහෝසි කරලා දාන්න. එතුමාට බරපතළ දේශපාලනයක් තේරුනේ නැහැ. එතුමා විරුද්ධ වුණා. හැබැයි, අපේ ගරු මහ ඇමැතිතුමා තර්කානුකූලව මේ කාරණයට එළැඹුණේ. ඒ නිසයි අපි සතුටු වෙන්නේ. එතුමා ජනාධිපතිතුමාට ලිපියක් ලිව්වා. මේ ලිපිය කොයිතරම් ප්‍රමාණයකට පිළිගන්නවාද? මේකට කොයිතරම් ප්‍රමාණයකට අනුමැතිය හම්බ වෙනවාද? මේකට කොයිතරම් ප්‍රමාණයකට ක්‍රියාත්මක වෙනවාද? කියන කාරණය වෙනම එකක්. හැබැයි, එතුමා මේ ලිපිය ලිව්වා. එතුමා පැහැදිලිව මේ ලිපියෙන් කිව්වා, මේ බලතල උදුරා ගැනීමට විරුද්ධයි කියලා. එතුමාට එහෙම අදහසක් තිබුණා. එහෙම දේශපාලන දැක්මක් තිබුණා.

ඒ විතරක් නොවෙයි. එතුමා අද සංශෝධනයක් ගෙනාවා. ඒක ඉතාම ප්‍රගතිශීලී සංශෝධනයක් විධියට තමයි මම පෞද්ගලිකව දකින්නේ. ඒකේ පැහැදිලිව කියලා තිබෙනවා, මේ පළාත් සභා කාල සීමාවට විතරයි මේ කාරණය අදාළ වෙන්නේ. පළාත් සභාවේ අවසානයට විසුරුවන්න තිබෙන පළාත් සභාව, විසුරුවන්න මාස 06 කට කලින් තමයි මේ නිශ්චිත දිනය බවට පත් වෙන්න ඕනෑ කරන්නේ ඒ නිශ්චිත දිනය කියලා. එතකොට අපේ කාලසීමාව ඉවරයි. බස්නාහිර පළාත් සභාවේ කාලසීමාව ඉවර වෙලා. අපි ඉවර වෙන්නේ 2019 අප්‍රේල් මාසයේ 22 වැනිදා. එතකොට අපේ කාලය ඉවරයි. එතුමා ඒක කල්පනා කරලා තිබෙනවා. ඒ වාගේම ඒ සංශෝධනයේ කියලා තිබෙනවා, මේ කාලසීමාවට විතරයි මේ විසුරුවා හැරීම අදාළ වෙන්නේ කියලා. ඒ කියන්නේ හය වැනි පළාත් සභාවට විතරයි කියලා. එහෙම සංශෝධන දෙකක් යවලා තිබෙනවා. මේ සංශෝධන කොයිතරම් ක්‍රියාත්මක වෙනවාද කියන කාරණයත් අපට අපැහැදිලියි. පළාත් සභාවක් කාලය දීර්ඝ කිරීමේ බලය ජනාධිපතිතුමාටවත්, පාර්ලිමේන්තුවටත් තිබෙනවා කියලා අපි පෞද්ගලිකව විශ්වාස කරන්නේ නැහැ. පළාත් සභාවක කාල සීමාව People's mandate එකක්. ඒක මහජන බලයක්. මිනිස්සු තමයි කියන්නේ, අවුරුදු පහයි උඹලාට බලය දෙන්නේ කියලා. මිනිස්සුන්ගෙන් අහන්නේ නැතිව ඒ බලය අවුරුදු 06 කට, 06 ½ කට, 7 කට ගෙනි යන්න මේ රටේ නීතිය ඇතුළේ පුළුවන්කමක් නැහැයි කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ. එහෙමනම් මේ සංශෝධනයට Referendum එකක්, ජනමත විචාරණයක් යා යුතුයි කියන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ඒවි කියන විශ්වාසය අපට තිබෙනවා. එහෙම නැතිව යනවා නම් ඒක මහජන බලයට පිටුපා යන එකක් විධියට තමයි අපි දකින්නේ. ඒ නිසා ඒ කාරණය අපි මේ වේලාවේ කියන්න ඕනෑ.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ අපට ඉතාම පැහැදිලිව පේනවා. මේ ඉ, ඉ කියන කාරණයේදීත් ඉතා පැහැදිලිව කියලා තිබෙනවා, 154 ඔ සහ 154 ඕ කියන ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව පළාත් සභාවේ බලතල ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය කියලා. මේකේ 154 ඔ කියන්නේ, පාර්ලිමේන්තුව තවදුරටත් අපේ බලතල භුක්ති විඳිනවා කියලා. මේකේ 154 ඕ කියන්නේ, පාර්ලිමේන්තුව පළාත් සභාව සතු බලතල දැනටත් භුක්ති විඳිමින් ඉන්නවා. ඒ නිසා මේ පළාත් සභා හදන කොටම උපන් ලපයක් විධියට තිබ්බා, මේ බෙදපු බලය නිවැරැදිව බෙදුණාද කියන කාරණය ප්‍රශ්නයක් වෙලා තිබුණා. මේ බලය තියාගෙන තමයි දුන්නේ. ජනාධිපතිතුමාගේ නියෝජිතයා විධියට තමයි ආණ්ඩුකාරවරයා පළාත් සභාව ඇතුළේ ඉන්නේ. එතුමා තමයි පළාත් සභාව විසුරුවා හැරීම සඳහා කඩදාසිය මහ ඇමැතිතුමාගෙන් අරන් ජනාධිපතිතුමාට යවන්නේ. ඊට පස්සේ පාර්ලිමේන්තුවෙන් තමයි මේක පාලනය කරන්නේ. මේකට මුදල් දෙන්නේ පාර්ලිමේන්තුව කියන දවසට. පාර්ලිමේන්තුව කියන විධියට මේකේ බලය පාවිච්චි

කරන්න පුළුවන් කියලා තමයි දැනට තිබෙන ව්‍යවස්ථාවේත් ලියලා පැහැදිලි කරලා කියලා තිබෙන්නේ. ඒ නිසා පළාත් සභාව හදන කොටම මේ උපන් ලපය තිබුණා. තවමත් බලය බෙදීම සිද්ධ වෙලා නැහැ. අපි හැමදාම කිව්වා, මූල්‍ය බෙදීම කරන්න කියලා. Financial Devolution එක අපට පෙන්වන්න කියලා. Financial Devolution කියන්නේ මොකක්ද? මේ රටේ මූලික ව්‍යවස්ථාවේ ලියන්න කියලා, රටේ ජාතික අයවැයෙන් කොයිතරම් ප්‍රතිශතයක්ද පළාත් සභාවකට ලබලා දෙන්නේ කියලා. එහෙම නැත්නම් බලය බෙදීම අර්ථවත් වෙන්නේ නැහැ. මේ දැනට තිබෙන ව්‍යවස්ථාවේ දැනුත් ලියලා තිබෙන්නේ, මුදල් ලබා දීම ජනාධිපතිවරයා විසින් සිතැඟි පරිදි කරනවා කියලා තමයි ලියලා තිබෙන්නේ. ඒ නිසා දැනුත් බලය තිබෙන්නේ, ජනාධිපතිතුමාට. දැනුත් බලය තිබෙන්නේ, පාර්ලිමේන්තුවට. මේක අමුතු එකක් නොවෙයි. ඒ නිසා මේ සංශෝධනය හරහා අමුතු දේවල් වෙන්නේ නැහැ.

හැබැයි, අපි විශ්වාස කරනවා. මේ ආණ්ඩුව වැරැදිලා හරි, මේ ආණ්ඩුවට වෙනයම් කාරණාවක් නිසා හරි මේ තිබෙන මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න උවමනාවක් තිබෙනවා නම්, ඒක අවුරුද්දක් ඇතුළත වෙනස් කරනවා නම් ඒක ඉතාම ප්‍රගතිශීලී පියවරක්. මැතිවරණ ක්‍රමය වෙනස් විය යුතුම වෙනවා. පළාත් පාලන ආයතනවලට හැදුවා වාගේම පළාත් සභාවලත්, පාර්ලිමේන්තුවෙත් කොට්ඨාශ මැතිවරණ ක්‍රමයක් හැදිලා කොට්ඨාශයට වග කියන මහජන නියෝජිතයෙක් නිර්මාණය වුණොත් එදාට මේ රටේ 90% ක් දූෂණය නතර වෙනවා කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ. ඒ නිසා එහෙම වෙනවා නම් ඒක ඉතාම යහපත් ක්‍රියාමාර්ගයක්. යහපත් පිළිවෙතක්. ඒ වාගේම තමයි, එක දිනයේ පළාත් සභා මැතිවරණය තිබෙනවා නම් ඒක ඉතාම යහපත් පියවරක්. හැබැයි, ඒ දෙක මුවාවෙන් පළාත් සභාවල ඡන්ද කල් දාලා, පළාත් සභා මැතිවරණ තියන්න තිබෙන කාලසීමාව තුළ ඡන්ද කල් දාලා මිනිස්සුන්ගේ ප්‍රධාන ප්‍රජාතන්ත්‍ර අයිතිය, ඡන්දය දීමේ අයිතිය උදුරා ගන්න හදනවා නම් ඒකට එකඟ වෙන්න කිසිසේත්ම පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ පැහැදිලි කිරීම අපට තවමත් ඇවිල්ලා නැති නිසා මහ ඇමැතිතුමා මොන සංශෝධනය යැව්වත් මේ කෙටුම්පතේ සංශෝධනය අපට ඇවිල්ලා නැහැ. ඒ නිසා කෙටුම්පත සංශෝධනය වෙනවා කියන කාරණය අපට තවමත් පැහැදිලිව තේරුම් ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ කෙටුම්පත නොමැතිකමෙන් අපට සිද්ධ වෙන්නේ, මේ එවලා තිබෙන විසි වැනි සංශෝධනයට විරුද්ධත්වය ප්‍රකාශ කරන්න. ඒ නිසා විසි වැනි සංශෝධනය දැනට තිබෙන විධියට ක්‍රියාත්මක වීමත්, එය අනුමත කිරීමත් අපට කිසිසේත්ම කළ නොහැක්කක් සේ අපි මතක් කරන්න ඕනැ. ඒ නිසා මේ තිබෙන විසි වැනි සංශෝධනයට අපි දැතම උස්සලා විරුද්ධ වෙනවා මිසක මේක අනුමත කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ආණ්ඩුව මීට වඩා පාරදෘශ්‍ය විධියට, ජේන විධියට මේ ව්‍යවස්ථා සංශෝධනයන් කරනවා කියන කාරණය අපට දැනගන්න සැලැස්සුවොත් එදාට අපට මෙයට අනුමැතිය දෙන්න පුළුවන්කම තිබෙනවා. අද තිබෙන තත්ත්වයන් යටතේ මේ තිබෙන සංශෝධනයට කිසිසේත්ම අනුමැතිය දෙන්න බැහැයි කියන කාරණය මතක් කරමින්, ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතිය, ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නියමිත දිනටම දෙන්න රජය කටයුතු කරන්න ඕනැය කියන බල කිරීමත් කරමින්, මේ කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභා ඉතිහාසයේ තවත් අපි මහජනයාගේ මුදල් කන දවසක් බවට පරිවර්තනය වුණු දිනයක් තමයි. මොකද හේතුව, මේ පනත ගැන දැන් දින තුනක් - මේ පනත ගෙනාවේ කවුද? ඉන්දියාවේ ජනාධිපති රජීව් ගාන්ධි මැතිතුමා මේ උතුරේ තිබුණු කළබලකාරී තත්ත්වයට, බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ට ඩික්ෂිත් කියන කොමසාරිස්වරයා හරහා බලය බෙදා හැරීමේ යෝජනාවක් ගෙනැල්ලා රජීව් ගාන්ධි මැතිතුමාත්, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත් ඒක අත්සන් කළා, රටට ඇඳිරි නීතිය දාලා. එතකොට මේ ඇඳිරි නීතිය දාලා අත්සන් කරපු මේ පනත, මේ යෝජනාව නිසා පළාත් සභාව දැන් සංශෝධන ගණනකට ගෙනැවිත් තිබෙනවා. දැන් බලන්න. මේ යහපාලන ආණ්ඩුව 2015 ජනවාරි 08 වැනිදා දුන් පළමුවැනි පොරොන්දු ටික මොනවාද කියලා බලන්න.

මේකේ කියනවා, පළමුවැනි පොරොන්දු අතර තිබෙනවා. මේ අයගේ යහපාලන ආණ්ඩුවේ තිබෙනවා, ජේ.වී.පී. එකේ, TNA එක, UNP එක, මුස්ලිම් කොංග්‍රස් එක ඇතුළු පක්ෂ 48 ක් එක්ක අපේ සෝභිත හාමුදුරුවොත් එක්ක එකතු වෙලා අපේ මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව පරාජය කළා.

[ගරු උපාලි කොඩිකාර ]

දැන් මේ පනතත් එක්ක චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය. දැන් ජේ.ආර්. ගෙනාපු මේ පනතේ අපට පළාත් සභාවක් කියලා එකක් ගෙනැල්ලා බලය විමධ්‍යගත කරලා උතුරු - නැගෙනහිර දෙමළ භාෂාව කථා කරන මිනිස්සුන්ට මේක විසඳුමක් හැටියට කියලා දකුණේ සිංහල බෞද්ධ පළාත් වලටත් මේක ගෙනාවා. දැන් මෙහෙම ගෙනැල්ලා අවුරුදු ගණක් ගිහිල්ලා. දැන් හයවැනි පළාත් සභාවට අපි ඇවිල්ලා තිබෙන්නේ. එතකොට හයවැනි පළාත් සභාව වන විට දැන් අවුරුදු 30 යි. තවමත් බැරි වුණා, මේක හරියට ගෙනැල්ලා මේ මිනිස්සුන්ට කරන වැඩේ මොකක්ද කියලා කියන්න.

මම දැන් කියාගෙන ආවෙ, දැන් මේ 2015 ජනවාරි 08 වැනිදා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරනවා කියලා දුන්නු පොරොන්දුව පළාත් සභාවලට විශේෂ බලතල දෙනවා කිව්ව පොරොන්දුව දැන් කෝ? දැන් අපේ මේ බුද්ධිමත් ගරු මන්ත්‍රීවරු කල්පනා කරන්න. දැන් මේ පනතට අපට අත උස්සන්න වෙයිද? අපි මේකට අත උස්සන්න මෝඩයෝද? අපි මේකට අත උස්සන්න අවුරුදු 30 ක් පළාත් සභාවේ ඉන්න ජොෂ්ඨ මන්ත්‍රීවරුද? මේකේ ඉන්නවා මේ ඇමැතිකමේ, මේ යහපාලනයට එකතු වෙලා ඒ අයට කරගන්න දෙයක් නැහැ. එහෙන් මොනවා හරි කිව්වාම මේගොල්ලෝ ආණ්ඩුවට

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

එක කරන්න ඕනෑ. හරිද? මේක තමයි -

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ වචනය කරුණාකර ඉල්ලා අස් කරගන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේ වාඩි වෙන්න කෝ. තමුන්නාන්සේගේ වෙලාවට උත්තරය කියන්න කෝ. හරිද? ඒ job එක තමයි ඒ සර්විස් එක. ආ.... සමාවෙන්න පක්කිලි සර්විස් නොවෙයි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. කරුණාකර අර කියපු වචනය ඉල්ලා අස් කරගන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නිවටයන්ගේ සේවය.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා,

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

රජකාලෙත් නිවටයෝ සිටියා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් නිශ්ශබ්දව ඉන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම මගේ වචනය අස් කරගන්නවා. නිවටයන්ගේ සේවය. හරිද? එතකොට නිවටයන්ගේ සේවය තමයි මේගොල්ලෝ කරන්නේ. අපෙත් ඉන්නවා නේ. අපි දේශපාලනය කරන පක්ෂවල නායකයෝ ඉන්නවා. මේ රටේ කොමියුනිට්ස් පක්ෂය තිබෙනවා. සමසමාජ පක්ෂය තිබෙනවා. JVP එක ඉන්නවා. එතකොට හෙළ උරුමය තිබෙනවා. මේ වාගේ පක්ෂ ගණනක් අපේ මේකත් එක්ක සම්බන්ධ වෙලා ඉන්නවා. එතකොට මේ නිවටයන් කියන දේ අපට කරන්න පුළුවන්කමක් නැහැ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි මේකට විරුද්ධව අත උස්සන්න ඕනෑ. කථා කරන්න ඕනෑ. කවදාහරි දවසක මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නිවටයා කියන වචනය අයින් කරගන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙතුමාට කථා කරන්න බැහැ. මෙතුමාට දරුවෝ නැහැ.

[සභාවේ ඝෝෂා]

අපේ බලය විමධ්‍යගත කරන්න, ප්‍රජාතන්ත්‍රවාදය රැකගන්න, මුස්ලිම් දෙමළ, සිංහල, බෞද්ධකම අපේ එක සංහිදියාවක් ඇති කරගන්න, මේ ක්‍රමය තුළ බැහැ. මේකෙන් මොකක්ද කියන්නේ? එක්සත් ජාතික පක්ෂයේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාට කොන්ද පණ තිබුණා. ඒ කොන්ද පණ තිබුණු මන්ත්‍රීවරයෙක්. ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා දක්ෂ නීතිඥවරයෙක්. අපේ තව නීතිඥ මහත්වරු ඉන්නවා. රෝස් ප්‍රනාන්දු අපේ නීතිඥවරියක්. අපේ කළුතර දිස්ත්‍රික්කයේ නීතිඥ මහත්වරු ඉන්නවා. අපේ ජනක වැලිවත්ත නීතිඥ මහත්මයා ඉන්නවා. වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාටයි, අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාටයි විතරයි මේක තේරුණු දෙන්නෙකුට ඉන්නේ. මේක තේරුණු නීතිඥවරු හැටියට ඉන්නේ. ඒ නිසා තමයි ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේ කට්ටිය කැඳවලා, අර දෙවැනි කාමරයට ගෙනිහිල්ලා උපදෙස් මාලාවක් ඔබතුමන්ලා, අපි ඔක්කොටම දුන්නා. මේකට අත උස්සන්න එපා. පළාත් සභාවේ පතෝල කොටුවට, බණ්ඩක්කා කොටුවට හිටවලා පඹයන් ගණනට යනවා කියලා එතුමා කිව්වා. හරිද? පතෝල කොටුවල, බණ්ඩක්කා කොටුවල පඹයෝ ගණනට තමයි යන්නේ.

දැන් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනය. දැන් විසි වැනි සංශෝධනය. එතකොට පළාත් සභා 13 වැනි සංශෝධනය. දැන් 13 වැනි සංශෝධනයෙන් ගෙනාපු බලතල ගෙනැල්ලා අපි ඔක්කොම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සමාවෙන්න. විනාඩියකට නතර කරන්න. සභාවේ කාලය දීර්ඝ කරන්න අවශ්‍යයි. ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. කාලය දීර්ඝ කරන්න අවශ්‍යයි.

# රීති අංක 09 යටතේ යෝජනාව
# MOTION UNDER RULE NO : 09

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, *"රීති අංක 09 ප්‍රකාරව න්‍යාය පත්‍රයේ අංක VIII හි විෂයය පිළිබඳ වැඩ කටයුතු අංක 08(5) සහ 08(6) රීතිවල විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යා යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ඉක්මණින් ඉවර කරන්න. තව ගොඩක් කථා කරන්න ඉන්නවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න 154 "ඇ" සියලුම පළාත් සභා එක දිනයක තියන්න. දැන් ඌව පළාත් සභාව ගන්න කෝ. එතකොට බස්නාහිර පළාත් සභාව ගන්න කෝ. දැන් අනික් පළාත් සභා තුනත් එන මාසයක ඉවර වෙනවා. එතකොට අපට තව 2019 වනතුරු යන්න කාලයක් තිබෙනවා. ඌවට 2019 වනතුරු යන්න කාලයක් තිබෙනවා. අපි සියලු දෙනාම යම් මුදලක් වියදම් කරලා තමයි මේ මන්ත්‍රීකම අරගෙන තිබෙන්නේ. යම් සේවයක් කරන්න. මොකක්ද මේ පනතේ කියන්නේ. ඒකේ කියනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට, මේ 154 කියනවා, මේ බලතල සියල්ලක්ම පාර්ලිමේන්තුවට ගන්වා කියලා කියනවා. එතකොට පාර්ලිමේන්තුව තමයි නිශ්චිත කරන්නේ. නීතිපතිට යවනවා. නීතිපතිට කියනවා, උසාවියට තීරණය දෙන්න. මේක අවුරුද්දකින් තියනවා. දැන් අවුරුද්දකින් තිබෙනවා නම්, ඌවේ අයට අවුරුද්දක් මෙහාට එනවා. බස්නාහිර අවුරුද්දක් මෙහාට එනවා. එතකොට 2019 යන්න ඕනෑ අයට 2018 ට එනවා. එතකොට දැන් අපට මොකක්ද වෙන්නේ. දැන්

[ගරු උපාලි කොඩිකාර ]

මේ කයිවාරු ගහන අය හිත සතුටින්ද කියන්නේ. නැහැ. මම කියන්නේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

සේවය කරන නිසා අර උඩින් මොකක් හරි කිව්වාම -

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

සේවයට යටත් වෙන්න ඕනෑ. ඕක තමයි වෙන්නේ. රාජ්‍ය සමයෙත් තිබුණා. රජ්ජුරුවන්ගේ නිවටයෝ සිටියා. විකටයෝ සිටියා. ඒ වාගේ කට්ටියක් ඉන්නවා. ජෝර්ජ් පෙරේරා මැතිතුමා මේක ඇතුළේ ඉන්න එක විකටයෙක්. එතකොට එහෙම විකටයෝ කට්ටියක් ඉන්නවා. හරිද? එතකොට මේකේ සද්ධන්ත යෝධයෝ ඉන්නවා. මෙරිල් පෙරේරා වාගේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මන්ත්‍රීවරුන්ට නිවටයෝ කියලා කථා කරන්න එපා. ඒක වැරැදියි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ආචාර්යවරු, මහාචාර්යවරු, රජතුමන්ලාට උපදෙස් දෙන කට්ටියක් සිටියා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

උපදෙස් දෙන -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මට මේක පැහැදිලි වුණේ නැහැ. නිවටද? නිහඬද? කියලා. හරි වචනය දැනගන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නිවටයා. කාටද කිව්වේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ඩික්ෂනරිය ගෙනාවේ නැහැ, ට්‍රාන්ස්ලේට් කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතකොට සිංහලෙන් මොකක්ද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඩික්ෂනරිය තිබුණේ නැහැ, ට්‍රාන්ස්ලේට් කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, සභාවේ මන්ත්‍රීවරුන්ට නිවටයෝ කියලා අපහාස කරන්න එපා ඒක වැරැදියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

විරුද්ධව එදා අත උස්සපු කට්ටිය. මේක කල් දාන්න කියලා කියපු කට්ටිය සතුටින් ඉන්නවාද අවුරුද්දක් මෙහාට දාන්න මේක. නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ ඒ වචනය හැන්සාඩ් එකෙන් අයින් කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට සතුටින් මේකේ කවුරුවක්වත් නැහැ නේ? එතකොට මේ ඉන්න අය නැවත එනවාද නැද්ද කියලා කාටවත් තීරණය කරන්න බැහැ. බලන්න අපේ නිමල් පීරිස් ගරු මන්ත්‍රීතුමා. අවුරුදු 28 න් පාර්ලිමේන්තුවට ගිය මහත්මයෙක්. අද අපේ පළාත් සභාවට එන්න වුණා. ඒ මේ ක්‍රමවේදය නිසා. ඒ මනාප ක්‍රමය. දැන් මේකේ මොකක්ද කියන්නේ? දැන් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරලා විස්සට ගෙනැල්ලා කියනවා, කොට්ඨාශවලට 60% ක් 40% ක් ලැයිස්තුවලින් දාන්න. හරිද? 60 ක් කොට්ඨාශවලින්. 40 ක් ලැයිස්තුවෙන්. කාන්තාවන් ඒකෙන් 40% ක්. හරිද? කාන්තාවෝ 40% ක්. දැන් එතකොට කාන්තාවට 40% ක් මේක ඇතුළේ ඉන්න කොට ඉන්න පළාත් සභා මන්ත්‍රීවරු 104 දෙන්නේ කොහොමද? 104 ඉල්ලන්නේ කොහෙන්ද? (බාධා කිරීම්) Law of Election. මේ පොතේ තිබෙනවා. මේකේ 36 වැනි පිටුවේ තිබෙනවා. මේක රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය දැකලා නැහැ, නීතිඥ නෝනා කෙනෙක් වුණාට. හරිද? මේකේ 36 වැනි පිටුවේ තිබෙනවා. මේකේ කියන්නේ මොකක්ද? මේකේ Law එකෙන්ම කියනවා, මේ ඡන්දය කොට්ඨාශවලට ගේනවා නම් - Law of Election බලාගන්න. හරිද? මේක තමයි නීතිය. මේක එක්කෙනෙක් හරි කියවලා තිබෙනවා නම් මම මේකේ හෙට බුදිය ගන්නවා. නැහැ. එහෙම කියන්නේ නැහැ. ගෙදර යනවා. ගමේ යනවා. මොනවාද දෙන්නේ කියලා බලනවා. දෙන දේ කනවා. ආණ්ඩු පක්ෂයෙන් මේකට කාලා ඇවිල්ලා කයිවරු ගහනවා. කෑ ගහනවා. මේක නොවෙයි කරන්න ඕනෑ සේවය.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා මේකෙන් කියනවා. මේ බලතල පාර්ලිමේන්තුවට අරන් පාර්ලිමේන්තුවෙන් දිනයක් නිශ්චිත කරලා මේ මැතිවරණයක් තියන්න කියලා තිබෙනවා. එතකොට අපි කොහොමද මේකට අත උස්සන්නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පාර්ලිමේන්තුව මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කිව්වේ මොකක්ද? 2015 ජනවාරි 08 වැනිදාට පෙර කිව්වේ මොකක්ද? බලය පළාත් සභාවට ගේන්න. බලය තවත් ශක්තිමත් කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, දැන් ඉවර කරන්න. ඇති. ඉවර කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට තව විනාඩි දෙකක් දෙන්න. ඒ එක්කම කියනවා, මහින්ද රාජපක්ෂ කියනවා, මහින්ද චින්තනයෙන් කියනවා, we are going. අපි යනවා. 19 ට එහා. බලතල දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හොඳයි. අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කියලා තිබෙනවා අපේ මහින්ද චින්තන පොතේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හොඳයි. බොහොම ස්තූතියි. වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

13 න් එහාට දෙනවා කියන්නේ කාටද මේ? උතුරු - නැගෙනහිර යුද්ධ කරලා වෙනම රටක් ඉල්ලන්න ෆයිට් කරපු අයට. ලෝකයේ ජාත්‍යන්තර වශයෙන් පදිංචි

[ගරු උපාලි කොඩිකාර ]

වෙලා ඉන්න දෙමළ ජනතාවට බලය විමධ්‍යගත කරන්න තමයි මේකෙන් දෙන්නේ කියලා. අද මේ ආණ්ඩුවට මොකද වෙලා තිබෙන්නේ? බලය විමධ්‍යගත කරනවා කියලා ගත්ත ආණ්ඩුව අපෙන් බලය උදුරා ගන්නවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හොඳයි. බොහොම ස්තුතියි. වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

සිතට එකඟව එක්කෙනෙක්වත් මේකට කථා කරන්නේ නැහැ. ඒ නිසා කාලය නැති නිසා මම මීට වැඩිය කථා කරන්න යන්නේ නැහැ. මට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින්, මේ පනතේ තිබෙන සියලුම වගන්තිවලට අත් දෙකම උස්සලා මම විරුද්ධතාවය පළ කරනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ සිටිද්දී කථා කරන්න ලැබීම භාග්‍යයක් කොට සලකනවා. අද වාගේ දවසක තමයි ම්ලේච්ඡ වියට්නාම් ආක්‍රමණයේ ලෝකයේ ප්‍රබලම ඇමරිකානු හමුදා පසුබෑස්මකට ලක් කරන්න ආරම්භ වුණු දවස වන්නේ. ඒ එක්කම පුරා වසර 40 කට ආසන්න කාලයක් තුළ අපේ රටේ ව්‍යවස්ථාවේ සංශෝධන 20 ක් ක්‍රියාත්මක වෙද්දී මේ 20 න් එක්සත් ජාතික පක්ෂයත්, අපේ රජයත්, වර්තමාන රජයත් මේ ව්‍යවස්ථා සංශෝධන ගෙනාවේ කුමක් අරඹයාද කියලා ආපසු හැරිලා බලන්න මධ්‍යස්ථව කාලය එළැඹිලා තිබෙනවයි කියලයි මම විශ්වාස කරන්නේ. ස්වකීය බලය තහවුරු කර ගැනීම වෙනුවට රාජ්‍ය ක්‍රමය, ප්‍රජාතන්ත්‍රවාදය, ඒ වාගේම රටේ අනාගතය ශක්තිමත් කිරීම සඳහා මේ ව්‍යවස්ථා සංශෝධනවලින් කොතෙක් අර්ථවත් වෙලා, ප්‍රයෝජනවත් වෙලා තිබෙනවාද කියන එකත් විමසිය යුතුයි කියන එකයි මම විශ්වාස කරන්නේ. ඒ වාගේම අපේ හුඟදෙනෙක් මේ පළාත් සභා ක්‍රමය ගැන විග්‍රහ කරන්න යෙදුණා. මුල මැද අග කරුණුවලින් මැද ඉඳගෙන. හැබැයි, මැදින් තමයි පටන් ගත්තේ. මුල අමතක කළා. මුල ගැන සඳහන් කළේ නැහැ. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන එන්නේ මේ රටේ අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඇඳිරි නීතියක් දාලා අගමැතිවරයාවක්වත් 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය දන්නේ නැහැයි කියලා තමයි එදා කිව්වේ. එහෙම නේ? හැබැයි, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ක්‍රමය ජනිත වෙද්දී මේ කථා කරන මමත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් ඒකට එරෙහිව බෝගහ ළඟ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියක් සමඟ විරුද්ධත්වය පළ කළා. තවත් පක්ෂ සමඟ.

ඒ වාගේම මේ රටේ දිස්ත්‍රික් සභා එද්දී, සමස්ත ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ වමේ පක්ෂ දිස්ත්‍රික් සභා වර්ජනය කළා. ජනතා විමුක්ති පෙරමුණ පමණක් තරග කළා. ඒ එක්කම අපි අද බෞද්ධාගම අපේ රටට ගෙනාපු, අසල්වැසි ඉන්දියාවෙන් අපට ආපු මේ පළාත් සභා ක්‍රමය ගැන කරන විග්‍රහයේදී හරි පොටද පිට පොටද ඉන්නේ කියන එක ගැන අපිම විමසිය යුතුයි කියලයි මම විශ්වාස කරන්නේ. හැබැයි සමහර අය අදහස් කරනවා, මේ පළාත් සභා ක්‍රමය බලෙන් අපේ රටට පැටෙව්වා කියලා. මම තමුන්නාන්සේලාගෙන් අහනවා. සෝල්බරි කොමිසම, ඩොනමෝර් කොමිසම, පාර්ලිමේන්තු ක්‍රමය මේ රටේ බබයියා, සිමයියා, කුසුමාවතී අක්කා, කරෝලිස් අයියා ඉල්ලාද ආවේ කියලා. හැබැයි, ඒක අපව යටත් කරගෙන හිටපු, අපව සූරාගෙන කාපු, අපේ තිබුණු ස්වයං පෝෂිත ආර්ථිකය සහමුලින්ම උඩු යටිකරු කරපු, අපේ වැව් අමුණු සියල්ල විනාශ කරපු අපේ සංස්කෘතිය උඩු යටිකුරු කරපු අධිරාජ්‍යවාදීන්ගේ මේ පාර්ලිමේන්තු ක්‍රමය අපි බදාගෙන, තුරුළු කරගෙන, ඉඹගෙන, සිඹගෙන, වැළඳගෙන හැබැයි, අපි එහි අනුහස් ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. ඩික්ෂිත්ගේ ගර්භාෂයෙන් බිහි වුණු, මේ පළාත් සභා ක්‍රමයේ එක වෙලාවක අපි කියනවා, බලවත් කරන්න කියලා. එක වෙලාවක අපි කියනවා, බලය උදුරා ගන්නවා කියලා. තව වෙලාවක කියනවා, පළාත් සභාවලට අපි විරුද්ධයි කියලා. මම දන්නේ නැහැ, මේකේ පිට පොට මොකක්ද? හරි පොට මොකක්ද කියලා. පිට පොට, හරි පොට පැටලවිලාද? පොටක් ඇතිව යනවාද? නැතිව යනවාද? අපිම කථා කරද්දී. කොහොම නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභා ක්‍රමයේ ඩික්ෂිත්ගේ ගර්භාෂයේ ඉපදිච්ච කළලයට නම් අපි හුඟක් ආදරෙයි. නේද? ගර්භාෂයට

විරුද්ධයි. පළාත් සභා ක්‍රමයට විරුද්ධයි. ඉපදුණු කළලය බොහොම ආදරයෙන් බදාගෙන මේකේ අංගෝපාංග අඩුවෙන්න දෙන්නෙත් නැතිව හැබැයි, මේකේ අංගෝපාංග අඩු වෙන්න දෙන්නෙත් නැතිව, වැඩි වෙන්න දෙන්නෙත් නැතිව අපි සාත්තු සප්පායම් කරනවා කියන එකත් කියන්න කැමැතියි. මේ පළාත් සභා ක්‍රමයේ මුක්කම අරින්න අපි නහය අතගාලා මුක්කම අරිනවා. කකුළේ තිබෙන බකලේ අරින්න කකුල අත ගාලා අපි බකලේ අරිනවා.

ඒ වාගේම අපි මතක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා ක්‍රමය මේ රටේ ඇති වුණා වාගේම පළාත් සභා ක්‍රමය ලබා දුන්නු අයත් පළාත් සභා ක්‍රමයේ බලය උදුරා ගන්නවා. පළාත් සභා ක්‍රමයට විරුද්ධ වුණු අය මේ රටේ පළාත් සභා ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යනවා අපි දකිනවා. ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරීන්, මේ පළාත් සභා ක්‍රමය යටතේ සිටියා. මේ පළාත් සභාවට තිබුණා - මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා, ජනාධිපතිතුමාගේ ආදායම් එනතුරු ඉන්න ඕනෑය කියලා. පාර්ලිමේන්තුවේ ආදායම් එනකන්. උපයන විට ගෙවීම, BTT පළාත් සභාවෙන් උදුරා ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලය පුරාවට මේ පළාත් සභාවෙන් විවිධ බලතල උදුරා ගන්නවා අපි දැක්කා. අපි ඒවාට හැබැයි කටක් ඇරලා විරුද්ධ වුණේ නැහැ. කටක් ඇරලා විරුද්ධත්වය පළ කළේ නැහැ. විවිධ පක්ෂ නියෝජනය කරපු අපි ඒවාට එරෙහි වෙන්න අපි කටයුතු කළේ නැහැ. ඒ අපට විවිධ තත්ත්වයන් තුළ කියන එක අපි මතක් කරනවා. මේක තමයි ඇත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට එක දෙයක් මතක් කරන්න කැමැතියි. අද ගරු ප්‍රධාන අමාත්‍යතුමා බොහොම ආරක්ෂිත, සියල්ල ආවරණය වන විසුරුවන්න තිබෙන පළාත් සභා විසිරෙද්දී පළාත් සභාවත් ආරක්ෂා වන අදහස් හා යෝජනා මේ සභාවේ තමුන්නාන්සේලා කොයි කාගෙත් අපෙත් එකඟත්වය මත ඉදිරිපත් කරන්නට යෙදුණා. ඒ සඳහා අපේ ගෞරවය ස්තුතිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඔබතුමා මගින් ඉදිරිපත් කරන්නට මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මතක් කරන්න කැමැතියි. අද පළාත් පාලන ආයතනත් මේ රටේ ක්‍රියාත්මක නොවන, ජනතා නියෝජිතයන් නොමැති තත්ත්වයක කලින් විසිරෙන පළාත් සභාත් නැති වුණොත් මේ රටේ ජනතාවගේ බිම් මට්ටමේ ජනතා නියෝජිතත්වය, ජනතා ප්‍රශ්න කඩිනමින් යොමුව විසඳීමේ ක්‍රමවේදයට කණ කොකා හඬනවා කියලා සඳහන් කරන්න කැමැතියි. ඒ නිසා මේ විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මැතිවරණ ක්‍රමය, ඒ වාගේම පළාත් සභා පවත්වන දිනය මෙය වෙනස් විය යුතුයි. අපි මේකට ඉඩ දිය යුතුයි.

ඇයි මම එහෙම කියන්නේ? මේ රටේ 1977 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට විරුද්ධ වුණු ප්‍රධාන කාරණා කිහිපයක් තිබුණා. ඒ කාරණා කිහිපයෙන් එකක් තමයි මේ රටේ විධායක ජනාධිපති ව්‍යවස්ථාව. ඒ වාගේම මේ රටේ මැතිවරණ ක්‍රමය. මනාප ඡන්ද ක්‍රමය. එකම පක්ෂ තුළ මරාගන්න, ඒ වාගේම සංවර්ධනය සඳහා සීමාවක් නැති - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැටක් නැතිව වගා කරන්න බැහැ. ඒ පැරැණි හේන් ගොවියා හේන කෙටුවේ තමන්ට පුළුවන් ප්‍රමාණයට. ඒ හේන කොටනකොට පරිසරයත්, රක්ෂිතයත් ආරක්ෂා කරලා බව බෝගත් වගා කළා. මේ කාලකණ්නි සංවර්ධනය මේ මැතිවරණ ක්‍රමය තුළ ඇමැතිවරයෙක්ට නොවෙයි, ජනාධිපතිවරයෙක්ටවත් තමුන්ගේ දිස්ත්‍රික්කය තෘප්තිමත් කරන්න බැහැ. මේක තමයි ඇත්ත. නැත්නම් පසුගිය කාලයේ ගම්පහට තරම් කොහෙටවත් වැඩ කළේ නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයට තරම් කොහෙටවත් වැඩ වුණේ නැහැ. අගනුවර වුණු කොළඹටවත් වඩා. හැබැයි, ගම්පහ මැතිවරණයෙන් පරාදයි. ඒක නිසා මේ මැතිවරණ ක්‍රමය තුළ, දිස්ත්‍රික් ක්‍රමය තුළ මේ රටේ වැටක් නැති සංවර්ධනයට තිත තියන්න මේ රටේ පළාත් පාලන කොට්ඨාශ ක්‍රමයට ආවා වාගේ මේ රටේ පළාත් සභාත් කොට්ඨාශ ක්‍රමයට යන්න, මේ රටේ පාර්ලිමේන්තුවත් කොට්ඨාශ ක්‍රමයට යන්න, මේ විසි වැනි ව්‍යවස්ථාවත් එක්ක මහජනතාව රටක් විධියට එකට එකතු වෙලා ඉන්න, පක්ෂ විධියට එක තීන්දුවක ඉන්න, බෙදෙන්නේ නැති, මරා ගන්නේ නැති, මරා ගන්නේ නැති -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මනාපෙන් පරාද හන්දා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මම මනාපේ පරාද නම් ඒ වචනයට මම උත්තරයක් දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පස්සේ. පස්සේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

නැහැ. දැන් උත්තරය දෙනවා. මේ කථා කරන සුමිත් විජයමුණි සොයිසා ආසනෙන් ගත්ත ඡන්ද ප්‍රතිශතය අනෙක් ආසනවලින් කී දෙනෙක් අරගෙන ඇවිල්ලාද මෙතැන වාඩි වුණේ කියලා බලන්න කියලා මම මතක් කරනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මහේෂ් වැඩියි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

හරි. ඒකට ප්‍රශ්නයක් නැහැ නේ. මගේ සහෝදරයා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා කථාව අවසන් කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සංවිධායක පරාදයි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

සංවිධායක පරදින්නේ නැතිව තිබෙනවාද? නැහැ. නැහැ. එහෙම නොවෙයි. ඒකත් කියන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කථාව කරගෙන යන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ප්‍රධාන පක්ෂ තිබෙද්දී, ආණ්ඩු කරද්දී මේ රටේ ජනතාවට අත්‍යවශ්‍යම අමාත්‍යාංශ මිනිස්සුන්ට අත්‍යවශ්‍යයි. විදුලිය අවශ්‍යයි. නිවාස අවශ්‍යයි. ජලය අවශ්‍යයි. මේ අමාත්‍යාංශ තුනම කොළඹ දිස්ත්‍රික්කයේ රටේ හදවතේ වෙනත් පක්ෂ තුනකට දුන්නාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරදින්නේ නැද්ද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක පරාදයි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඒක තමයි පැරදුණේ. මේක තමයි ඇත්ත කථාව.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා කථාව අවසන් කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

නැහැ, මට කථා කරන්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා කථා කරන්නේ නැතිව වෙන වෙන ඒවායේ පැටලෙවා නේ. ඒක නේ වෙලා තිබෙන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඒවාටත් උත්තර දෙමින් කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් යමක් කිව යුතුව තිබෙනවා. මේ පළාත් සභාවල බලය උදුරා ගැනීම පිළිබඳව කථා කරද්දී මේ රටේ සම්බන්ධීකරණ කමිටු තිබුණා. සම්බන්ධීකරණ කමිටුවල -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, මේකට අදාළව කථා කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

අදාළව කථා කරන්නේ. මේ රටේ පළාත් සභාවලට ඉතිහාසයේ කිසිම දවසක පළාත් සභා මන්ත්‍රීවරයෙක්ට සම්බන්ධීකරණ කමිටුවල සභාපතිකම කිසිදු රාජ්‍ය නායකයෙක් දුන්නේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා තමයි පළාත් සභාවලට සම්බන්ධීකරණ කමිටුවල සභාපති ධූර ලබා දෙමින් පළාත් සභා බලවත් කළයි කියන එක නැවතත් මතක් කරනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

වෙන එවුන් නැති හන්දා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මේක තමයි යථාර්ථය.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා කථාව අවසන් කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔරලෝසුවේ බට්ටා වාගේ අපි මේ රටේ මැතිවරණවලට හැම තැනම ගියා. වයඹ තිබෙන කොට වයඹ යනවා. ඌව තිබෙන කොට ඌවට යනවා. දකුණේ තිබෙන කොට දකුණේ යනවා. වෙන් වෙන්ව ඡන්ද තියන කොට අපි හැම තැනම ගිහිල්ලා අපි පක්ෂවලට, අපේ හිතවත් සහෝදර අපේක්ෂකයින්ට, පක්ෂය ජයග්‍රහණය කරන්න කැඹුරුවා. හැබැයි, අද මේ රටේ එකම දිනයක මැතිවරණ තිබෙද්දී තමුන්නාන්සේලා අපි හැම දෙනාම නිදහස් වෙනවා. මේ රටේ එකම දිනයක මැතිවරණ තියද්දී, මේ රටේ පාර්ලිමේන්තු මැතිවරණ යයි, ජනාධිපතිවරණ යයි එකම දිනයක තියන්න ඕනෑ. මේ රටේ පළාත් සභා පළාත් පාලන ආයතන එකම දිනයක තියන්න ඕනෑ. එතකොට තමයි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට, මහජන මතයට, එහෙමත් නැත්නම් රාජ්‍ය බලයට, ධන බලයට ඉඩ ලැබෙන්නේ නැතිව සැබෑ මහජන මතය ඉස්මතු වෙන්නේ කියන එක මතක් කරමින්, මම විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂයි. අර ගරු මහ ඇමැතිතුමා ඉදිරිපත් කරපු කොන්දේසිවලට එකහවත් පක්ෂයි කියන එකත් මතක් කරමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා මහතා] මූලාසනයෙන් ඉවත් වුයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Sirikamal Filician de Silva ] left the Chair and Hon. Hector Bethmage M.P.C took the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට මම ආරාධනා කරනවා. ඉතාමත්ම ගෞරවණීය ඉල්ලීමක් කරනවා. වෙලාව සම්බන්ධව සලකලා බලලා ඔබතුමාගේ කථාව කරනවා නම් යෙහෙකි කියලා මම විශ්වාස කරනවා. ගරු මන්ත්‍රීතුමා, ඔය මයික්‍රෆෝනය වැඩ කරන්නේ නැත්නම් උදේන ගරු මන්ත්‍රීතුමාගේ මයික්‍රෆෝනය ළඟට එන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉතිහාසයේ මට මතකයි 1987 කොළඹ විශ්ව විද්‍යාල තාප්පයේ අපි පාසල් යන කාලයේ වාක්‍යයක් ගහලා තිබුණා. "*ඉන්දියන් අධිරාජ්‍යවාදය තුළ ජනතාවගේ නැඟී සිටීම සහ නව යුගයක උදාව වැළැක්විය නොහැක කියලා*" බෝඩ් එකක්. ඒ එක්කම අපි දැක්කා, පිට කොටුවේ බෝ ගහ යට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඇතුළු කණ්ඩායමක් අපි ඉන්දියාවේ 61 වැනි ප්‍රාන්තය වෙනවා කියලා මේ සම්බන්ධයෙන් කථා කළා. යූ ටියුබ්වල හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා

[ගරු නිරෝෂන් පාදුක්ක ]

1987 කරපු කථාවක් තිබුණා. දැන් වුණත් තමුන්නාන්සේලාට බලන්න පුළුවන්. අපි ඉන්දියාවේ තවත් ප්‍රාන්තයක් වෙනවා කියලා. නමුත් එහෙම වෙනවා කියපු ප්‍රාන්තය එතුමාගේ සහෝදරයාගේ ලොකු පුතාව ගෙනැල්ලා මහ ඇමැති කරන්න තරම් මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව එතුමාට විශ්වාසයක් අවසානයේදී මතු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභා ක්‍රමය බොහොම අමාරුවෙන් ආරම්භ කරපු එකක්. මේකේ ඉතිහාසය ගැන කථා කරන්න ගියොත් විවිධ කථා තිබෙනවා. නමුත් මේ ඔක්කොටම වඩා මේ ඉන්න මන්ත්‍රීවරු ඔක්කොම - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතක් වුණා. එක්තරා අපේ අමාත්‍යවරයෙක් මීට දශකයකට පෙර පළාත් සභාවේ ඇමැතිවරයෙක්. තමන්ගේ අමාත්‍යාංශයේ Supplementary budget එකක් දැම්මා, ඉන්ධනවලට. ඔහු පළාත් සභා මැතිවරණයක ඔහුට ආසනයත්, දිස්ත්‍රික්කයත් භාර දීලා. ඔහු පළාත් සභාවේ වාහන ඔක්කොම අරගෙන ගියා. ගිහිල්ලා වැඩ කළා. අන්තිමේදී අමාත්‍යාංශයේ වාහනවලට ඩීසල් ගහන්න අමාත්‍යාංශයේ සල්ලි නැහැ. ඔක්කොම ගහලා අර Election එකට යන්න. ඊට පස්සේ මෙතැනට අපට අතුරු අයවැයක් ගෙනාවා. ඉසුරු දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මතක ඇති. ඉතිහාසයේ. ගෙනැල්ලා අනුමැතිය ඉල්ලුවා. අපි ඇහුවා මාස තුනකට කොහොමද මෙච්චර, අවුරුද්දක් තිබෙද්දී budget එක ඉවර වුණේ කොහොමද කියලා. ඒ නිසා මේක භාවිතා කළා. ලංකාවේ අකල් මරණ ගැන අපි අහලා තිබෙනවා. අකල් වැසි. අපි පසුගිය කාලයේ අකල් මැතිවරණ කළා. කාලෙන් කාලෙට අකල් මැතිවරණ. ඒ නිසා -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දැන් මැතිවරණ එන්නේම නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඇද්ද? Happy ද? ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා මූලාසනයට කථා කරන්න. එතකොට එතුමන්ලා කට වහගනියි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම විශ්වාස කරනවා, ගෙජ්ජි වැලක් හෝ ලාඩන් හඬක් නැතිව මගේ කථාව කරන්න ලැබෙයි කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මූලාසනයට කථා කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි ඔබතුමාගෙන් අහන්නේ මේ පළාත් සභාවේ ඉන්න අපි පළාත් සභාව සතු බලතල එපා කියලා කී පාරක් අත් ඉස්සුවාද? අපේ ප්‍රධාන ආදායම අපි එපා කියපු කට්ටියක්. දුම් සහතික ආදායම පළාත් සභාවට ඉන්න ඕනෑය කියලා මම මේකේදී කථා කරද්දී, අපේ මන්ත්‍රීවරු කවුද කථා කළේ? අපට මේ ආදායම ඕනෑය කියලා. ප්‍රධාන අමාත්‍යවරයා, මේ අමාත්‍ය මණ්ඩලවලට ආදායම් කොච්චර ඕනෑද? පළාත් සභාව තුළ දුවන්න. හැබැයි, අපි අපේ ආදායම් වැඩි කරගන්න, අපි එක වෙලාවකට කථා කරනවා. පක්ෂ නායකයා කිව්වාම අපි ආදායම් එපා කියනවා. ඒගොල්ලෝ ඕනෑ කිව්වාම ඒක කරනවා. මම හිතනවා, අදෝ මුඛයෙන් කථා නොකර කට වහගෙන හිටියොත් හොඳයි කියලා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගෙන් මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ. මේ යෝජනාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා මතු කරනවා - මෙතැන අපිත් එක්ක ජනවාරි 08 වැනිදා ඒ දේශපාලන වෙනස කරන්න දායක වුණු සමහරු දැන් ඒක අමතක වෙලා කථා කරනවා. අපේ අංක 01 විධායකය අහෝසි කරනු ලැබේ. ජනාධිපතිතුමා නිදහස් චතුරශ්‍රයේ සිට කිව්වා, මම ආයිත් මේ රටේ ජනාධිපති පුටුවට ඉල්ලන්නේ නැහැයි කියලා. මතක තියාගන්න. අපි කිව්වා, මේ කාලකණ්ණි මැතිවරණ ක්‍රමය එපා. මේ මනාප ක්‍රමය එපා. එහෙම තමයි අපි කිව්වේ. ඒ අතර කිව්වා, එයාපෝර්ට් වහනවා. හොරු අල්ලනවා කියලා. හැබැයි, මේක තමයි මූලික පරමාර්ථය

වුණේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි විධායකය අහෝසි කරනවා නම්, විධායකය සතු බලතල පාර්ලිමේන්තුවට දෙන්න ඕනෑ නැද්ද? අපි ක්‍රම ක්‍රමයෙන් විධායකය අහෝසි කරන්න නම් එන්නේ, විධායකය සතු බලතල අපි කොහෙටද දෙන්නේ? ඒක පාර්ලිමේන්තුවට දෙන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒක හරි. ඒක හරි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඇත්ත කථා කරමු. හංගලා ගහන්නේ. සමහර අයගේ දේශපාලන න්‍යාය පත්‍ර මාස දෙකෙන්, තුනෙන් හතරෙන්, හයෙන්, වෙනස් වෙනවා. සමහරු ඉදිරියේදී විවිධ යෝජනා ගෙනෙයි. අපට විධායකය ඕනෑ. විධායකය එපා. ඒ නිසා මේවා නොවෙයි කාරණා. දැන් මේ මැතිවරණ. මේ ඇමතිවරු කී දෙනෙක් අපි හම්බ වෙනවාද පාරේදී. අපි කී දෙනෙක් කථා කරනවාද? අපි එකට කනවා බොනවා. කොහේද? වෙන ආසනවල ඡන්දවලට ගිහිල්ලා. කී ලක්ෂයක් අපි වියදම් කර ගන්නවාද? මේ ලංකාවේ එක දවසක ඡන්දය තියන්න කියලා අපි ඉල්ලන්නේ. ගරු සභාපතිතුමනි, ස්වීඩනය නමැති රටේ Election තුනම එක දවසේ. නගර සභා, පළාත් සභා, පාර්ලිමේන්තු ඡන්ද තුනම එකම දවසේ. Ballot paper තුනක් පාට තුනකින් තිබෙන්නේ. එහෙම තමයි තමන්ගේ රටේ පාලකයෝ තෝරා ගන්නේ. සෞඛ්‍ය කවුද මෙහෙය වන්නේ. අධ්‍යාපනය කාටද දීලා තිබෙන්නේ. ඒ නිසා එහෙම තමයි වෙලා තිබෙන්නේ. ඇයි අපට ඒක කරන්න බැරි? මට මතකයි, මැතිවරණ කොමසාරිස්තුමා කියනවා, එක පළාත් සභාවක් විතරක් තියන්න මිලියන 400 ක් 600 ක් අතර ගියා කියලා. මේ කාගේ සල්ලිද? ඉතිහාසය පුරා මේ රටේ අහිංසක ජනතාවගේ බදු මුදල් මේ මැතිවරණවලට වියදම් කළේ. ඒ නිසා අද අපි එක දවසක මැතිවරණයකට යනවා නම් මේ ඉන්න මන්ත්‍රීවරු ඔක්කොම කැමැති වෙයි. මේ මන්ත්‍රීවරුන් කාටවත් ප්‍රශ්නයක් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ, පිටිපස්සේ ඉඳන් අපට බලපෑම් කරන පක්ෂ නායකවරුන්ට. මේ ඉන්න එක මන්ත්‍රීවරයෙක්වත් හෘදය සාක්ෂිය මේක නොවෙයි කියන්නේ. අපි ඔක්කොම ඩුවෙල් සීම්. ඇයි? පක්ෂය කියනවා එකක්. ගැවාම දිලිසෙන්නත් ඕනෑ. සමනල තටු වාගේ තිබෙන්නත් ඕනෑ. ඒක තමයි මේ ඔක්කොටම වෙලා තිබෙන්නේ. නැත්නම් මේ පට්ට වාමාංශික නායකවරු මේකට විරුද්ධයි. පට්ට වාමාංශික නායකවරු මේකට විරුද්ධයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි පියවරක් ඉදිරියට යන්න ඕනෑ. එතකොට මේ මැතිවරණය එක දිනයේ තියනවාට මම හිතන්නේ නැහැ කිසිම මන්ත්‍රීවරයෙක් අකමැත්තක් දක්වනවාය කියලා.

එහෙම නම් සංශෝධන පිළිබඳව කථා කරමු. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා එතුමාගේ මතය කිව්වා. මහ ඇමතිවරයා දැන් අපට ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, දැන් හැමෝටම ප්‍රශ්න තිබෙනවා. දැන් පළාත් සභාවක් පත් කරලා මාස හතරෙන් පවරා ගත්තොත් ඉතිරි ටික කවුද කරන්නේ? ඉතිරි අවුරුදු හතර කවුද කරන්නේ? මේ පිළිබඳව පැහැදිලි කිරීම් අවශ්‍ය වෙනවා. ඒ නිසා මේ සියල්ලම කරන්න ඕනෑ. හැබැයි ගරු සභාපතිතුමනි, කවදාවත් අපි ඔකේකාම සංසිඳවලා කරන්න බැහැ. මේ එක නායකයෙකුවත් - සුමිත් විජයමුණි මන්ත්‍රීතුමා කිව්වා වාගේ, සෝල්බරි කොමිසම අපට දුන්නේ, ඒ ව්‍යවස්ථාව අපි ඉල්ලලා නොවෙයි. 72 ව්‍යවස්ථාව ඉල්ලුවේ නැහැ. 77 ව්‍යවස්ථාව ඉල්ලුවෙත් නැහැ. නායකයෝ, පාලකයෝ අපට මේවා දෙන්නේ, අරගෙන යන්න කියලා. ජනතාව පාරට බැහැලා ඉල්ලුවේ නැහැ. ජනමතයක් දුන්නාම, පාලකයෝ ඒ ජනමතය පාවිච්චි කරනවා, ව්‍යවස්ථා හදන්න. ඒ නිසා කැමැති වුණත් අකමැති වුණත් මේ රටේ ජනතාව ඉදිරියට ලබන අවුරුද්දේ ජනමත විචාරණයක් එනවා. මේ රටේ ජනතාව ඉදිරියට ජනමත විචාරණයක් එනවා. මේ සියලුම කාරණා ගැන කථා කරන්න. එකින් එකට නොවෙයි. සියලු කාරණා සහිතව රටේ ජනතාවට එයි. මේ උත්තරයක් සොයන්න ඕනෑ. ඉන්න තැන ඉන්නවාද? නැත්නම් අපි ඉස්සරහාට යනවාද කියන එක ගරු ප්‍රධාන ඇමතිතුමනි.

අපි කාටද මේ බලය දෙන්න යන්නේ. ඇයි අපි සැක? දැන් චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියව මේ පළාත් සභාව බිහි කළා. බලය බෙදනවා නම්, පළාත් සභා ක්‍රමය ගැන කථා කරනවා නම්, ඊට වඩා වෙන කවුද හිටියේ? මේ පළාත් සභාව තුළින් බිහි කරපු, බස්නාහිර පළාත් සභවේ ප්‍රධාන අමාත්‍යවරිය මේ රටේ ජනාධිපතිනිය වුණා. හැබැයි, එතැනට ගියාට පස්සේ මේ ගැන කථා කළේ නැහැ. මේකේ

[ගරු නිරෝෂන් පාදුක්ක ]

හිටිය මන්ත්‍රීවරු කී දෙනෙක් ඉන්නවාද? දැන් පළාත් සභා මන්ත්‍රීවරු වෙලා හිටියාය කියලා කියන්න අකමැති අය. ඒ නිසා පළාත් සභා ක්‍රමය අපි ඉදිරියට යන්න ඕනෑ. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කොහොමද මෙතැනින් ඉස්සරහාට යන්නේ කියන එකයි කාරණය. ඒ නිසා ඡන්ද කඩ කඩා තියන්න ඕනෑ නැහැ. අනික මේ ඡන්ද ක්‍රමය එන්නේ ඇයි? පළාත් සභා ආවේ ඇයි? උතුරේ අර්බුදයට විසඳුම් සොයන්න. උතුරේ අර්බුදයට විසඳුම් සොයන්න ඇවිල්ලා දැන් අපටත් ශරීරගත වෙලා. දැන් දකුණේ අපිත් පළාත් සභා හදා ගෙන, මේ පළාත් සභා ඇතුලේ ඉඳගෙන දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කරනවා. නායකයෝ කිව්වාම, සෙංකෝලය උස්සාගෙන යනවා. සෙංකෝලය කඩනවා. සභාව අපකීර්තියට පත් කරනවා. ඒ නිසා මේ කාරණා සියල්ලම ගත්තාම මේ පළාත් සභා මන්ත්‍රීවරු විධියට අපි සියලු දෙනාම එකඟයි. හැබැයි, අපේ මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ අභිමානය රැකෙන්න ඕනෑ. මේ මන්ත්‍රීවරුන්ගේ අභිමානය රැකෙන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් ගරු ප්‍රධාන අමාත්‍යවරයා මේකේ සියලුම මන්ත්‍රීවරුත් එක්ක - මම සතුටු වෙනවා. ප්‍රථම වතාවට අපි පළාත් සභාවක් විධියට සියලුම මන්ත්‍රීවරු එකඟතාවයකට ඇවිල්ලා යෝජනාවක් ඉදිරිපත් කළා. ඒක හොඳ ආදර්ශයක්. අනිකුත් පළාත් සභාවලට. මේ පළාත් සභාව ඇතුළේ ඉන්න කොට කොළද, නිල්ද, රතු ද නොවෙයි. අපි ඔක්කොම එකතු වෙලා එක අරමුණක, එක දැක්මක ඉස්සරහාට යන්න ඕනෑ. එහෙම ගත්තාම අද බස්නාහිර පළාත් සභාව ආදර්ශයක් දීලා තිබෙනවා. අපි මොකක්ද මේ විසි වන ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් දරන මතය හා අදහස කියලා. ඒ නිසා අපි ඔක්කොම මේකට විරුද්ධ නැහැ. අපි ඔක්කොම එක දවසේ මැතිවරණයක් තියනවාට කැමැතියි. මුළු රටේම එක දවසේ තියන්න කැමැතියි. ඒ නිසා ඒකට ගිහිල්ලා අපි මෙතැනින් ඉදිරියට යමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රමයට අනුගත වෙද්දී ඩග්ලස් දේවානන්ද ආයුධ අත හැරලා මේ ක්‍රමයට ඇතුළු වෙනවා. ඒ විතරක් නොවෙයි. මේ රටේ පළාත් සභා ක්‍රමය ඇති කරද්දී ජීවිත පරිත්‍යාග කරපු දේශපාලඥයෝ මේ පළාත් සභාවේ හිටියා. මේ පළාත් සභා ක්‍රමය වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළා. ඒ නිසා මේ සියලු දෙනා වෙනුවෙන් ගෞරවය රැක ගෙන අපි මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සියලුම දේශපාලන පක්ෂවල සාමාජිකයන්ට මම ස්තුති කරන ගමන් මම ඉල්ලා සිටිනවා. මතක තියා ගන්න. අපේ ශරීරය ඇතුළේ අපේ පක්ෂ නායකවරු ඉන්නවා. අපේ ශරීර ඇතුලේ ඔබට අවංක දේ කරන්න දෙන්නේ නැහැ. ඔබේ ශරීරය ඇතුළේ ඔබේ නායකවරු සෙවනැලි වාගේ ගමන් කරනවා. ඒ නිසා ඒ ඔවුන් ගමන් කරන්නේ, ඔවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය ජයග්‍රහණය කර ගැනීම පිණිස මිස, පළාත් සභා ක්‍රමය දියුණු කිරීම උදෙසා නොවෙයි. මේක තමයි යථාර්ථය. තිත්ත යථාර්ථය. ඒ නිසා ඒක අයින් කරන්න. නායකවරුත් වයසට යනවා. අපිත් වයසට යනවා. හැබැයි, ඉතිරි කරලා යන්නේ ඔබ රටට, ජාතියට කරපු දේ විතරයි. ඒ නිසා කවුද හරි නොවෙයි. මොකක්ද හරි තැන, එහි ඉන්නය කියලා සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලීමක් කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බස්නාහිර පළාත් සභාවේ ඉතාමත්ම වැදගත් යෝජනාවක් පිළිබඳව, විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ප්‍රධාන අමාත්‍යතුමා මේ සභාව ආරම්භ කරන මොහොතේ කරපු ප්‍රකාශය මම විශ්වාස කරනවා, මුළු පළාත් සභාවේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් එතුමාගේ කථාව අගය කරනු ඇතැයි කියලා. අද බස්නාහිර පළාත් සභාවක් හැටියට පළාත් සභාව සතු බලතල වෙනත් අයෙකුට පැවරීමට කටයුතු කරනවාට කිසිම මන්ත්‍රීවරයෙකු කැමැති වෙන්නේ නැහැ. ඒක ප්‍රධාන අමාත්‍යවරයාගෙන් පටන් ගත්තාම, සෑම මන්ත්‍රීවරයෙකුම තමන්ගේ කාල සීමාව තුළ, පළාත් සභාව තුළ රැඳී සිටින්න ජනතාව බලයක් අපට ලබා දීලා තිබෙනවා. හැබැයි, මෙවැනි සිදුවීම් අතීතයේ සිදු වෙලත් තිබෙනවා. මට මතකයි. පසුගිය රජයන් කාලේ අපේ පළාත් සභා මාස හත අටක් තිබෙද්දී මේ පළාත් සභා විසුරුවා හැරියා. මම එවකටත් ඇමතිවරයෙකු හැටියට කටයුතු කරපු කාලයක්. ඔබතුමාත් එතකොට අමාත්‍යවරයෙක් හැටියට කටයුතු කළා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ කාලේ කවුරුවත් objection දැම්මේ නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ඒවාට objection තිබුණේ නැහැ. සමහර මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම මත. අද ඒ මන්ත්‍රීවරු මේ පළාත් සභාවේත් නැහැ. ඒ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම මත මාස හත අට තිබෙද්දී මේ පළාත් සභා විසුරුවා හැරියා. එහෙම කරපු යුගයක් මේ රටේ තිබුණා. මේක සර්ව සාධාරණව මම කථා කරන්නේ. ඒ වාගේම තමුන්නාන්සේලාට මතක ඇති. අපේ පක්ෂයේ වුණත් වයඹ පළාත් සභා මැතිවරණය. වයඹ පළාත් සභා මැතිවරණය අපි ජයග්‍රහණය කළේ කොහොමද කියන එක අපේ හිතට එකහව අපි දන්නවා. ඒ නිසා මේ පළාත් සභාව තුළ ඉන්න එක්සත් ජාතික පක්ෂය වෙන්න පුළුවන්. වෙනත් පක්ෂවල මැති ඇමතිවරු වෙන්න පුළුවන්. අපිත් එදා අපේ පක්ෂයේ හිටියා. අද අපට තේරුණා මොන තරම් වැරැද්දක්ද? ජනතාවගේ ඡන්ද අයිතිය මගදී උදුරා ගත්ත කාලයක්. අපේ රජයන් කාලේ වුණු සිදුවීම්. එහෙම වෙන්න හේතුව තමයි, එක්තරා මුළු ලංකාව පුරාම සෑම පළාත් සභාවක්ම එකවර නොතිබීමේ විපාක තමයි ඒ. එක පළාත් සභාවක් තිබුණාම ඒකට ආණ්ඩුවේ සම්පූර්ණම හයිය යෙදෙව්වා. ආණ්ඩුවේ හැම දෙයක්ම ඒ වෙනුවෙන් වැය කරනවා. මන්ත්‍රීවරු අනන්ත අප්‍රමාණ වියදම් කරනවා. ආණ්ඩුව වියදම් කරනවා. තමන්ගේ බලය පෙන්වනවා. මොන ක්‍රමයකින් හෝ තමන්ගේ බලයේ සිටින ආණ්ඩුවක් පළාත් සභාව ජයග්‍රහණ කරන්න වැඩ කටයුතු කරනවා. ඒ අනුව මේ සංශෝධනය තුළ අපි විශ්වාස කරනවා. මේ සංශෝධනය තුළින් එක්තරා ක්‍රමයකට අපට සතුටු වෙන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා. ඒ මොකද එකම දිනයක මේ මැතිවරණ පැවැත්වීම. කොට්ඨාශ ක්‍රමයට සහ අනුපාත ක්‍රමයට මේ මැතිවරණ පැවැත්වීම සඳහා ඉදිරියේදී කටයුතු කරනවාය කියන එක අපට දැන ගන්න ලැබිලා තිබෙනවා.

මම දැන් ටික වෙලාවකට ප්‍රථම අපේ හිතවත් පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ මළ ගෙදරකට ගියා. ඒ මළ ගෙදරට ගිය වෙලාවේ ගරු සභාපතිතුමනි, අපේ පක්ෂයේ සන්ධානයේ ලේකම්තුමා ආවා. මෙතැනත් දැන් ඉන්නවා මන්ත්‍රීවරු කිහිප දෙනෙකු අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයම නියෝජනය කරන, පොහොට්ටුව ලකුණට සහයෝගය ලබා දෙන මන්ත්‍රීවරු කිහිප පස් දෙනෙකුත්, මමත් අපේ සන්ධානයේ ලේකම්තුමා සමඟ අපි පොඩි සාකච්ඡාවක් කළා. එතුමාට මේ බස්නාහිර පළාතේ වර්තමාන සිදුවීම අපි කිව්වා. ඇත්තෙන්ම ප්‍රධාන අමාත්‍යවරයා හැටියට - සමහර විට හිතන්න පුළුවන්, ළඟ තියා ගෙන වර්ණනා කරනවාය කියලා. නමුත් කිව යුතු දේ කියන්න වෙලා තිබෙනවා. මම එවෙලේ අපේ සන්ධානයේ ලේකම්තුමාට කිව්වා. අපි ඉතාමත්ම හොඳ වැදගත් තීන්දුවක් ගත්තා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා සියලුම පක්ෂ නියෝජනය වන විධියේ කථාවක් කළා. කථා කරලා මේ තුළින් අපට ඇති වන ලාභය සහ ප්‍රයෝජනය පිළිබඳව අපි දැනුවත් කළා. ඒ තුළ අද විසි වන සංශෝධනය ජයග්‍රහණය කරනවාද? පරාජය කරනවාද කියන එක නොවෙයි අපේ යුතුකම. අපි මේ තුළට සංශෝධන කිහිපයක් එකතු කරලා, ඒ සංශෝධන තුළින් අපට යමක් ලබා ගන්න පුළුවන් නම් ඒක තමයි අපි කර ගත හැකි හොඳම දේ. දැන් මේ මොහොත වන කොටත් අපි දන්නවා. මම හිතන්නේ අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කථාවේදී කියයි. මම ඒ ගැන සඳහන් කරන්න යන්නේ නැහැ. දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය, ඊයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගත් තීන්දු තීරණ පක්ෂයක් හැටියට මේ ලංකාදීප පත්තරේ සඳහන් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා කිව්වා නම්, විස්සට සහයෝගය ලබා දෙන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කොන්දේසි දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා. සියලුම පළාත් සභා මැතිවරණ තියන්න ඕනෑ 2018 දෙසැම්බර් මාසේ 31 වැනිදායින් පස්සේ. 2018 දෙසැම්බර් මාසේ 31 වැනිදායින් පසුව තමයි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පත්තරේ කියන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

පත්තරේ කියන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අදහස. අදහස කියන්නේ, මේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් වෙන්න නොවෙයි මෙතැන තිබෙන්නේ. රනිල් මහත්තයාගේ ආණ්ඩුවක් විතරක් නොවෙයි තිබෙන්නේ. රනිල් මහත්තයලාගේ ආණ්ඩුව තුළ සිදු වුණු වැරදි සම්බන්ධව ජනාධිපතිතුමා තීන්දු තීරණ ගත්තා. පාක්ෂිකයෝ කථා කරන එකක් නොවෙයි මම මේ කියන්නේ. මම මේ සත්‍ය කියන්නේ. එක්සත් ජාතික පක්ෂයේ මැති ඇමතිවරු කිහිප දෙනෙක් ඉන්න පුළුවන් යම් යම් වැරදි කරපු අය. ඒ වැරදි නිසා තමයි අද ආණ්ඩුව

[ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා ]

මේ තත්ත්වයට වැටිලා තිබෙන්නේ. එහෙම නැත්නම් මේ ආණ්ඩුවට යම්කිසි පුද්ගලයෙකුට කථා කරන්න පුළුවන් හයියක් නැහැ. මේ ආණ්ඩුව වැරදි වැඩ කරලා නොවෙයි. ඇමතිවරයෙකු, දෙන්නෙක් කරපු වැරදි නිසා තමයි අද ආණ්ඩුවට මේ දේ සිද්ධ වෙලා තිබෙන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් ඒ වාගේ. එකතු වෙලා ඉන්න අපිටත් ඒ වාගේ. එක්සත් ජාතික පක්ෂයටත් ඒ වාගේ. මේ සියලුම මන්ත්‍රීවරු ඒවා විශ්වාස කරන්නේ නැහැ.

ඒ වාගේම අද පැහැදිලිව එතුමා කිව්වා, අපි දෙසැම්බර් 31 වැනිදායින් පසුව තමයි මේ පළාත් සභා මැතිවරණය තියන්න කටයුතු කරන්නේ කියලා. ඒ නිසා ඒක විසි වන සංශෝධනය පිළිබඳ තවත් හැඟීමක් තිබෙනවා. මේක පාර්ලිමේන්තුවට බලය දෙනවාය කියලා. නමුත් ඊයේ පෙරෙයිදා කථා කරලා තීන්දුවක් අරගෙන තිබෙනවා පළාත් ඡන්ද දින තීන්දුවේ බලය කොමිසමට කියලා. මැතිවරණ කොමිසමට කියලා. ඉතින් ඒ නිසා මේක මේ යම්කිසි එක්තරා ප්‍රමාණයකින් අපට මේ බියක් ඇති කර ගන්න අවශ්‍ය වෙලා නැහැ. එහෙම කථා කරනවා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභාවේ හිටපු ඇමතිවරු, මහ ඇමතිවරු සිය ගණනක් අද පාර්ලිමේන්තුවේ ඉන්නේ. පාර්ලිමේන්තුවේදී කථා කරන්නේ කොහොමද? පළාත් සභාව ගැන අපි පාර්ලිමේන්තුවට ගිය වෙලාවකදී කියන්නම් කියනවා. ඔය කිසි කෙනෙකුට පළාත් සභාවක මතකයක්වත් තිබෙනවාද? රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා පළාත් සභාවේ හිටියේවත් නැහැ. එහෙම බලනවා නම්. හිටපු අය කොයි තරම් ඉන්නවාද? එක මන්ත්‍රීවරයෙකුවත්, එක ඇමතිවරයෙකුවත් මේ පළාත් සභා ගැන කථා කරනවාද? ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අඩුපාඩු තිබෙන්න පුළුවන්. අඩුපාඩු තිබුණාය කියලා මේ පක්ෂයක් හැටියට අපේ බලයේ ඉන්න පක්ෂයටම ගහන එක නොවෙයි වැඩේ. අද ජනාධිපතිතුමාත් යම් යම් තීන්දු තීරණ - මම දන්නවා මේ පසුගිය පැය කිහිපය තුළම අපේ ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක කථා කළා. මම ඊයේ සන්ධානයේ ලේකම්තුමාත් එක්ක දුරකථනයෙන් කථා කරන කොට මට එතුමා කිව්වා, දැන් ඔන්න ජනාධිපතිතුමා ප්‍රධාන ඇමතිතුමාත් එක්ක කථා කරනවාය කියලා. අද ගරු මහ ඇමතිතුමා ඉතාම වැදගත් තීන්දුවක් ගත්තේ. ඒ වැදගත් තීන්දුව තමයි කියන්නේ, අද සියලුම දෙනාට එකට එකතු වෙලා මේ සංශෝධන සහිතව - අනික් පළාත් සභාවලත් මේ තත්ත්වයම වෙන්න පුළුවන්. එතුමාගේ කථාවේදී කියයි. (බාධා කිරීමක්) අද යම් යම් අඩුපාඩු තිබෙන්න පුළුවන්. මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මේ විනාඩි දහයේ පහළොවේ දේශපාලනය කථා කරන්න යන්නේ නැහැ. අපි සියලුම දෙනා එකතු වෙලා, ගත්ත තීන්දුව ඉතාම වැදගත් තීන්දුවක්. ඉතිහාසගත තීන්දුවක් කියන එක මම මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. අපි දන්නවා. පක්ෂවල ඕනෑ තරම් අඩුපාඩු තිබෙනවා. ලෝකයේ කිසිම රටක නැති විධියට මේ ආණ්ඩුවක් අපි කර ගෙන යන්නේ. එක්සත් ජාතික පක්ෂයේ අය කියනවා, ඒගොල්ලන්ට කිසිම දෙයක් කර ගන්න බැහැයි කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය කියනවා, ඒගොල්ලන්ට යමක් කරන්න - පෞද්ගලික දේවල් නොවෙයි. අපි බලාපොරොත්තු වෙන්නේ ඉදිරි කාලයේදී හරි මේ රට ස්වයං පෝෂිත කරන්න විශාල වැඩ කොටසක් අපේ අතින් ඉෂ්ට වෙලා දීලා තිබෙනවා. ඒ නිසා අපේ තනතුරු පමණක් නොවෙයි. අපේ තනතුරුත් ආරක්ෂා කර ගෙන ජනතාවට සේවාවක් කරන්න හැකියාවක් ඇති විධියට පළාත් සභාව තුළ අපි සියලු දෙනාම එකතු වෙලා යන මේ ගමනේදී මම ඉතාමත් - සියලුම පළාත් සභාවලට ආදර්ශයක් ලබා දීමට බස්නාහිර පළාත් සභාව කටයුතු කරලා තිබෙනවා. අපිත් කැමැති නැහැ මේ වාගේ සිදුවීම් වෙනවාට. ජනතාව අපට කාලයක් දීලා තිබෙනවා. අවුරුදු පහක කාලයක් දීලා තිබෙනවා නම්, ඇයි අපට අවුරුදු පහ ඉන්න බැරි? අතීතයේත් මෙවැනි සිදුවීම් වෙලා තිබෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, මෙයට යම්කිසි සාර්ථක පිළිතුරක් අපට රජයෙන් ලැබෙයි කියලා. බොහොම ස්තුතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ මන්ත්‍රීවරු උදේ ඉඳලා ඉන්න කොට මේ සභාවට ලැයිස්තුවක් ඉදිරිපත් කළා. දැන් මේ ලැයිස්තුවේ පිළිවෙළට යන්නේ නැතිව තම තමන්ට ඕනෑ විධියට කථා කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නැහැ. ගරු මෙරිල් මන්ත්‍රීතුමා, මෙතැන ලිපියක් තිබෙනවා. ඒකේදී කියලා තිබෙන්නේ නම් වශයෙන් කියනවා නම්, සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාගේ පියාගේ මරණයට සහභාගී වෙන්න මන්ත්‍රීවරු යන නිසා සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන්න. නැත්නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉන්න මන්ත්‍රීවරු කිව්වාට, සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමා ඉන්න වෙලාවේත් කථාව දුන්නේ නැහැ. පහුවෙලා කථාව දුන්නා. ඒ එක. දෙවැනි එක තමයි දැන් ගාමිණී තිලකසිරි ඇමතිතුමා දැන් කථා කළා. අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් වැරැද්ද කවුරු වුණත් කියන්න ඕනෑ. එතකොට මේකත් බලතල පාවිච්චි කරලා තමන්ට ඕනෑ විධියට කථා කරන්න පටන් ගන්නවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් සභාව දිහා මම බැලුවා. මට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙහෙම නේ? දැන් උදේ ඉඳලා මන්ත්‍රීවරු ඉන්න කොට, එහෙට මෙහෙට ගිහිල්ලා මන්ත්‍රීවරුන්ට දෙනවා නම් කථා කරන්න, එතකොට ඒ සභාවේ තිබෙන තත්ත්වය මොකක්ද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මගේ කථාව මුලින්ම දාලා තිබුණේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාගේ මුලින්ම දාලා නැහැ. ඔබතුමාට තිබුණේ අන්තිම කථාව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වැරදි වැඩක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කවුරු වුණත් වැරදියි. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ කෘෂිකර්මාන්තය පිළිබඳව රටේ වැටිලා තිබෙන තත්ත්වය පිළිබඳව ජනාධිපතිතුමා විශාල සාකච්ඡාවක් දාලා තිබෙනවා. බස්නාහිර පළාත පමණක් නොවෙයි. මුළු රටේම පළාත් සභාවල ඉන්න කෘෂිකර්ම ඇමතිවරු සවස තුනට හදිසියේ කැඳවලා තිබෙනවා. ඒ නිසා මම කාරුණික ඉල්ලීමක් කළා. ඔබතුමාට පෙර හිටපු සභාපතිතුමාගෙන් මට වෙලාවක් ලබා දෙන්න. මෙතැන වචනයක් කථා කරලා යන්න ඕනෑය කියලා. (බාධා කිරීම්) මට ඒක ප්‍රසිද්ධියේ කියන්න වුවමනාවක් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමන්ලා, මේක තේරුම් ගන්න. සීලාචාර සමාජයේ අපේ සම්ප්‍රදායක් තිබෙනවා, කෙනෙකුගේ - (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේකේ පිළිවෙළක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිළිවෙළට කථා කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. මීළඟට සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි හෘදය සාක්ෂියට එකඟව මෙතැන ඉන්න පළාත් සභා මන්ත්‍රීවරු කථා කරනවා නම්, මම හිතන්නේ මේ විසි වන සංශෝධනයට අපි හැමෝම විරුද්ධයි. නමුත් මම හිතන්නේ, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ දේශපාලන නායකත්වයේ තිබෙන බලපෑම් මත එතුමන්ලාට ස්වාධීන තීන්දු ගන්න පුළුවන්කමක් නැහැ. නමුත් මම මෙහි වෙන පැතිකඩක් පැහැදිලි කරන්න බලාපොරොත්තු වෙන්නේ. මොකද, විශේෂයෙන්ම පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපි ගෞරවයෙන් අපේ ප්‍රදේශවල ගිහිල්ලා කටයුතු කරනවා. පක්ෂ භේදයෙන් තොරව. නමුත් ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, දැන් මේ විසි වන සංශෝධනයත් එක්ක පළාත් සභාවේ අපට තිබෙන ඒ අයිතිය ඒ අපට තිබෙන අභිමානය මේ පාර්ලිමේන්තුවට මේ බලය ගියාට

[ගරු සභත් ප්‍රදීප් විතාන]

පස්සේ මේක නැති වෙනවා. මම උදාහරණ කිහිපයක් කියන්නම්. මොකද, අපි දන්නවා. දැන් මේ පළාත් පාලන මැතිවරණය ඉතාමත් ළඟ දිනයක තියන්න බලාපොරොත්තු වෙනවා. එතකොට මේ පළාත් පාලන ආයතන පාලනය වන්නේ, පළාත් සභාවේ මහ ඇමතිතුමාගේ නායකත්වයෙන්. පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ අධීක්ෂණය යටතේ. එතකොට පළාත් පාලන මැතිවරණය තියලා සභිකයෝ තෝරා ගත්තාට පස්සේ මේ පළාත් සභාව විසුරුවා හැරියොත් මේ තිබෙන සංශෝධනය අනුමත වෙලා, පාර්ලිමේන්තුව ඒ අනුව කටයුතු කළොත් එතකොට පළාත් පාලන ආයතනවල පරිපාලන කටයුතු සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තුවට පැවරෙනවා. එතකොට පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපට ගෙදරට වෙලා බකන් නිලාගෙන බලාගෙන ඉන්න සිද්ධ වෙනවා. අපට ජනතාව වෙනුවෙන් කිසිම වැඩක් කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට වෙන්නේ අසරණයෝ වාගේ පැත්තකට වෙලා ඉන්න. ඒකයි මේ කරන්න හදන්නේ. මේ පළාත් පාලන ආයතනවල මැතිවරණය තියලා එක පැත්තකින් ඒ ප්‍රජාතන්ත්‍රවාදය පෙන්වන්න හදනවා වාගේම පළාත් සභාවල ඉන්න ඒ මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රී ධූර අහෝසි කරලා, ඒ බලය පාර්ලිමේන්තුවට ගන්න සූදානම් වන්නේ. අනික් එක තමයි පළාත් සභාව විසුරුවා හැරියාට පළාත් සභාවට ලැබෙන ආදායම අඩු වන්නේ නැහැ. ඒක ලැබෙනවා. එහෙම නම් පළාත් සභාවට ලැබෙන කෝටි ගණන් මුදල්වලට මොකද වෙන්නේ. ඒවා කවුද පාලනය කරන්නේ? සභාපතිවරයා විතරයි ඉතිරි වෙන්නේ, මේක විසුරුවා හැරියාට පස්සේ. එහෙම නම් ඒ මුදල් පරිහරණය කරන්නෙත් පාර්ලිමේන්තුව.

ඒ නිසා පළාත් සභාවට අපට තිබෙන ඒ බලය අපේ මන්ත්‍රීවරයෙකුට මේ ජනතාවගෙන් ලැබුණු ඡන්දයෙන් ඒ වැඩ කරන්න තිබෙන අයිතිය නැති වෙනවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. හැබැයි, අද විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මහ ඇමතිතුමා තුන් පාරක් මේක කල් දැම්මේ එතුමාත් මේ විසි වන සංශෝධනයට විරුද්ධයි. ඒ නිසයි එතුමාත් කල් දැම්මේ. නමුත් එතුමා ගිරයට අහු වුණු පුවක් ගෙඩිය වාගේ එතුමාටත් මහ ඇමති ධූරයත් එක්ක මේක කර ගෙන යන්න සිද්ධ වෙනවා. ඒ නිසා එතුමා සංශෝධන කිහිපයක් ගෙනැල්ලා තිබෙනවා. ඒ එතුමා ගෙනැල්ලා තිබෙන සංශෝධන ඒ අපිත් එකඟ වන සංශෝධන. පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපි සියලු දෙනා එකඟ වන සංශෝධන කිහිපයක් තමයි එතුමා ගෙනැල්ලා තිබෙන්නේ. එතුමාට අපි අවස්ථාවක් දෙනවා ඒ සංශෝධන ජනාධිපතිතුමාට දීලා, මේක වෙනස් කරන්න පුළුවන්කමක් තිබෙනවා නම්, ඒක වෙනස් කරන්න අපි අවස්ථාවක් දෙන්න ඕනෑ. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා කියනවා නම් අපි ඡන්දවලට භයයි කියලා, මම පුංචි උදාහරණ දෙකක් කියන්නම්. අපි දන්නවා. උතුරු මැද පළාත් සභා මැතිවරණය. ඒ වාගේම සබරගමු පළාත් සභා මැතිවරණය. 2015 දී තමුන්නාන්සේලාට පැහැදිලිව කියන්නට ඕනෑ, 2015 දී ජනාධිපතිතුමා ඡන්දය ඉල්ලන වෙලාවේ සබරගමුව පළාත් සභාවේ ඒ දිස්ත්‍රික්ක දෙක එක් ලක්ෂ දොළොස් දාහකින් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කණ්ඩායම ජයග්‍රහණය කරලා තිබෙනවා.

ඒ වාගේම 2015 ඒ මැතිවරණයේදී උතුරු මැද පළාත් සභාවට අයිති දිස්ත්‍රික්ක දෙක තමයි අනුරාධපුරය සහ පොළොන්නරුව. පොළොන්නරුව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ජයග්‍රහණය කරන කොට අනුරාධපුරය මහින්ද රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණය කරලා තිබෙනවා. මේ දෙක එකට එකතු කළාම ඡන්ද 400 කින් දිනලා තිබෙන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඒ නිසා එදා තිබුණු තත්ත්වයයි, අද තිබුණු තත්ත්වයයි සංසන්දනය කරලා බලන කොට පැහැදිලි ජයග්‍රහණයක් ගන්නේ කවුද කියන එක තමුන්නාන්සේලාට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ඒ නිසයි මේ පළාත් සභා කල් දාන්න හදන්නේ. එහෙම නැතිව වෙන දෙයක් නොවෙයි. එහෙම පළාත් සභා කල් දාන කොට අනික් පැත්තෙන් පළාත් සභාවේ අපේ මන්ත්‍රීවරුන්ට තිබෙන අයිතිය අහිමි කරන්නයි සූදානම් වෙන්නේ. අන්න ඒකටයි අපි විරුද්ධ වෙන්නේ. ඡන්ද එක දවසේ තියන එක හොඳයි. හැබැයි, අපේ මේ පළාත් සභාව ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලා අපි හැමෝම දුක් වෙන්න ඕනෑ දවසක් එනවා. මොකද, අපට ජනතාව ඒ වරම දුන්නේ අවුරුදු පහකට. ඒ වරම තුළ අපි විශාල වැඩ කොටසක් අපේ ගම්මානවල තමුන්නාන්සේලා හැමෝම පක්ෂ භේදයෙන් තොරව කරනවා. නමුත් අද පළාත් පාලන ආයතනවල තමුන්නාන්සේලා ගිහිල්ලා වැඩ කරන්නේ භය නැතිව මහ ඇමතිතුමාගේ හයිය අරගෙන. අපට ආසන සංවිධායකවරු විරුද්ධ වෙද්දී පක්ෂ භේදයෙන් තොරව

මහ ඇමතිතුමාගේ හයියෙන් ගිහිල්ලා අපි වැඩ කරනවා. උදව් කරනවා. මිනිස්සුන්ගේ දුකට ඇහුම්කන් දෙනවා. නමුත් ඒ අයිතිය අපට නැති වෙනවා. පළාත් සභා විසුරුවා හැරියොත්. ඒක කරන්නයි මේ සූදානම් වෙන්නේ. පාර්ලිමේන්තුවේ ඉන්න 225 ම කැමැතියි, පළාත් සභාව නැතිව පළාත් සභාවේ සල්ලි ටිකයි, පළාත් පාලන ආයතනවල තිබෙන සල්ලි ටිකයි, බලයයි සියල්ල අරගෙන පාර්ලිමේන්තුව වියදම් කරලා ඒගොල්ලන්ගේ බලය තහවුරු කර ගන්න. ඒ නිසා තමුන්නාන්සේලා අපි ඔක්කොම හෘදය සාක්ෂියට එකඟව විසි වන සංශෝධනයට විරුද්ධ වෙන්න ඕනෑ. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා යම් සංශෝධන ටිකක් පළාත් සභාවේ අපි කවුරුත් කැමැති සංශෝධන ටිකක් එතුමා ඉදිරිපත් කරන්න හදනවා නම්, ජනාධිපතිතුමාට ඒක යවලා, මේකට වෙනසක් කරන්න පුළුවන් ඒ සඳහා අවස්ථාව දෙන්න අපි සූදානම් කියන එකත් මතක් කරමින් තමුන්නාන්සේ ලබා දුන් අවස්ථාවට ස්තුතිවන්ත වෙනවා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන වෙලාවේ, බොහොම පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි. මේ විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ පනත් කෙටුම්පතට පෞද්ගලිකව මගේ විරුද්ධත්වය ප්‍රථමයෙන් පළ කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එහෙම සඳහන් කරන්නේ මේ සභාවේ බොහෝ ගරු මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කළා වාගේ අපට මහජනතාවගේ ඡන්දයෙන් අවුරුදු පහකට මහජන නියෝජිතයෝ හැටියට අපව පත් කරලා තිබෙනවා. මේ සංශෝධනය හරහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කැමැත්ත මත ආණ්ඩුකාරතුමා හරහා අතිගරු ජනාධිපතිතුමාට තිබෙන බලය ඉවත් කිරීම තුළ පාර්ලිමේන්තුවට මේ පනත සම්මත වූ සැනින් ඕනෑම පළාත් සභාවක් විසුරුවන්න පුළුවන් හැකියාව, බලය මේ පනත හරහා ලැබෙනවා. අන්න ඒ සම්බන්ධයෙන් තමයි අපේ බලවත් විරෝධතාවය තිබෙන්නේ කියන කාරණාව සඳහන් කරන්න කැමැතියි. මේ පනතේ සඳහන් කළාට සියලුම පළාත් සභා - මේ පනතේ මූලික අරමුණ වී තිබෙන්නේ, සියලුම පළාත් සභා එකවර ඡන්දය පැවැත්වීමයි. ඒ සම්බන්ධයෙන් මේ සභාව නියෝජනය කරන කිසිම මන්ත්‍රීවරයෙකුගේ ගැටළුවක් නැහැ. සියලුම මහජන නියෝජිතයෝ හැම කෙනාම එකඟයි පළාත් සභා මැතිවරණය එකවර රටේ පැවැත්වීම සම්බන්ධයෙන්. හැබැයි, ඒ කාරණාව ඉෂ්ට කර ගන්න ගිහිල්ලා ඒ හරහා සිද්ධ කරන්න යන්නේ සැබෑවටම ඒ අරමුණ පමණක්ද කියන සැකය අප තුළ තිබෙනවා. මේ වර්තමාන ආණ්ඩුවේ ක්‍රියා කලාපය දිහා බැලුවාම. මම කියන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපට මතකයි පසුගිය සති දෙකකට තුනකට මත්තෙන් පළාත් පාලන පනත පාර්ලිමේන්තුව තුළ සම්මත කළා. පළාත් පාලන පනත සම්මත කරන කොට මම හිතන්නේ, ලංකා ඉතිහාසයේ කවදාවත් සිද්ධ නොවුණු සිදුවීමක් සිද්ධ වුණා. මේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන හරි ලොකු ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන කථා කරන උදවිය හැබැයි, ප්‍රජාතන්ත්‍රවාදය පැත්තකට දාලා තමයි පසුගිය සති තුනකට ඉස්සෙල්ලා පළාත් පාලන පනත පාර්ලිමේන්තුවේ සම්මත කළේ. සංශෝධන 52 ක්. මන්ත්‍රීවරුන්ට ඒවා දකින්න, අධ්‍යයනය කරන්න කිසිම අවස්ථාවක් නොදී සංශෝධන 52 ක් ගෙනැල්ලා ඉතාම සූක්ෂම විධියට, කුමන්ත්‍රණකාරී විධියට ඒ පනත සම්මත කිරීම තුළම මේ ඉදිරිපත් කරලා තිබෙන විසි වන සංශෝධන පනත මේකේ මූලික අරමුණ පමණක්ද ඉෂ්ට කරන්න යන්නේ කියන කාරණාව අපට පැහැදිලිව සැකය මේ ආණ්ඩුවේ ක්‍රියා කලාපය තුළ තිබෙනවාය කියන කියන එක මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. තවදුරටත් සඳහන් කළොත් අපට මේ වාගේ කාරණා, මේ ආණ්ඩුව තුළ සිද්ධ වෙන කාරණා බොහොමයක් සඳහන් කරන්න පුළුවන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ පිළිබඳව අපට විශ්වාසය නැති තත්ත්වයක් ඇති කරලා තිබෙන තත්ත්වයක් තුළ තමයි මේ පනත පිළිබඳව අපට තිබෙන සැකය බලවත් වෙලා තිබෙන්නේ. (බාධා කිරීම්) මට මේ තනතුරේ ප්‍රශ්නයක් නැහැ. තනතුර ප්‍රධාන අමාත්‍යතුමා දුන්නා. එතුමා අයින් කළොත් මම අයින් වෙනවා. මට මේක තිබුණත් එකයි. නැතත් එකයි. ඒක මට ගැටළුවක් නැහැ. මගේ ආත්මය පාවා දෙන්නේ නැහැ, මම ඒකට. තමුන්නාන්සේලාට තනතුරු ලොකු වුණාට අපට තනතුරු ලොකු වුණේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බලමු කෝ විරුද්ධව ඡන්දය දෙනවාද කියලා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

එතකොට ඒ විශ්වාසය ඇති නිසා එතුමා ඒ තනතුර මට දුන්නා. ඒ නිසා මම ඒක භාර ගත්තා. ඒක වෙනම කාරණයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම නම් ඡන්දය දෙන්න විරුද්ධව.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

තනතුර ඕනෑ නම් තියා ගන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපේ හෘදය සාක්ෂියට එකහව අපේ අදහස් පළ කරන්න ඕනෑ. එතුමා සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. ඒකට අපි එකහයි. ඒක වෙනම කාරණයක්. හැබැයි, සියතින් අපට ගෙල සිඳගන්න බැහැ. මේ ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පත හරහා අපට අවුරුදු පහකට යන්න තිබෙන පාලන කාලය මේ පනත සම්මත වූ සැනින් ඕනෑ වෙලාවක මේ පළාත් සභාව විසුරුවන්න පාර්ලිමේන්තුවට බලය ලැබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම තමයි. මහින්ද දෙකක් වෙලාසන දුන්නේ. ඕක මොකක්ද? හයක් තියාගෙන හතරෙන් -

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මහින්ද රාජපක්ෂ මැතිතුමා නොවෙයි. මේ පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපි මුහුණ දීලා තිබෙන, මේ පනත හරහා මුහුණ දෙන තත්ත්වය මම පැහැදිලි කරන්නේ. තමුන්නාන්සේලාට තිබෙන අවුරුදු පහක පාලන කාලය මග තියා ගන්න කැමැති නම් තමුන්නාන්සේලා එකහ වෙලා ඒක කරන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. (බාධා කිරීම්)

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

සැසිවාර පහම -

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

සැසිවාර පහ මාස ගණනක් අඩුවෙන් යන්න ඇති. හැබැයි, මේ පළාත් සභාව ගත්තොත්, 2019 අප්‍රේල් මාසය දක්වා මේ පළාත් සභාව යන්න ඕනෑ. එහෙම නම් තමුන්නාන්සේලා මේ යෝජනා කරන විධියට ලංකාවේ කවදාවත් එක විට පළාත් සභා මැතිවරණ තියලා නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා ඡන්දයට හයයිද?

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ඡන්දයට හය නැහැ. තමුන්නාන්සේලා තමයි ඡන්දයට හය. මේ පනත සම්මත කිරීම හරහා කරන්නේ පළාත් පාලන මැතිවරණය අවුරුදු දෙකහාමාරක් තියන්නේ නැතිව ඇද්දා වාගේ, පළාත් සභාවත් අවුරුදු ගණනක් අදින්න යන වැඩ පිළිවෙළක් තමයි මේ ආණ්ඩුව කරන්න යන්නේ කියන කාරණාවත් මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. ඒ නිසා මේ ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව අපට කිසිම පැහැදීමක් නැහැයි කියන කාරණාව මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බලමු කෝ විරුද්ධව ඡන්දය දෙයිද කියලා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ඒකට ඡන්දය විමසන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විරුද්ධව දෙන්න කෝ?

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

විරුද්ධව තමයි දෙන්නේ. ඡන්දය විමසන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සංවිධායකතුමා, ඔබතුමා මූලාසනයට කථා කරන්න. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා තමයි සම්පූර්ණයෙන්ම මේ සභාවේ කෑ කෝ ගහන්නේ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරලා තිබෙන සංශෝධන සම්බන්ධයෙන් අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. අපි ඒ සංශෝධනවලට එකඟ වෙනවා. හැබැයි, මේ පනතට අපට එකඟ වෙන්න බැහැයි කියන කාරණාව බොහොම පැහැදිලිව කියන්නට ඕනෑ. විශේෂයෙන් මම පෙර කිව්වා වාගේ, පළාත් පාලන මැතිවරණ සංශෝධන පනත අනුමත කරන වෙලාවේ විශේෂයෙන් මේ රටේ තරුණයන්ට පළාත් පාලන ආයතනවලට ඉදිරිපත් කරන්න තිබුණු අවස්ථාව සම්පූර්ණයෙන්ම මේ ආණ්ඩුව මග හරවලා තිබෙනවා. පනතෙන් දීලා තිබුණු ඉඩකඩ, තරුණයෝ වෙනුවෙන් තිබුණු ඉඩකඩ මේ ආණ්ඩුව නැති කළා. ඒ වාගේම ක්ෂේත්‍ර නිලධාරීන්ට, රාජ්‍ය සේවයේ ඉන්න ක්ෂේත්‍ර නිලධාරීන්ට මේ පළාත් පාලන ආයතනවලට ඇතුලත් වෙන්න තිබුණු අවස්ථාවත් මේ ආණ්ඩුව කුමන්ත්‍රණකාරී විධියට ඉවත් කරලා තිබෙන තත්ත්වයක් තමයි අද ඇති වෙලා තිබෙන්නේ. අපට සමෘද්ධි අය නැතෙයි කියලා දිනන්න බැරි නැහැ. තමුන්නාන්සේලා ඡන්දය තියන්න. ඇයි ඡන්දය තියන්නේ නැත්තේ? අවුරුදු දෙකහාමාරක් තිස්සේ ඡන්දය තියන්නේ නැත්තේ ඇයි? මේ පළාත් සභාවට කරන්න යන්නෙත් මේ පනත හරහා පාර්ලිමේන්තුවට බලය අරගෙන පළාත් සභා ඡන්දත් තියන්නේ නැතිව, පළාත් සභා ක්‍රමය සංශෝධනය කරනවා කියලා පළාත් සභාවත් දිගටම ඇදගෙන යන තත්ත්වයක් තමයි මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන්න හදන්නේ කියන කාරණාවත් මම මේ වෙලාවේ මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභා මැතිවරණ ලංකාවේ එක දවසක තියන එකට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, විසි වන සංශෝධනය හරහා කොට්ඨාශ ක්‍රමය පළාත් සභා තුළට ඇති කරයි කියලා. මම හිතන විධියට අපි සියලුම මන්ත්‍රීවරු ඒ ක්‍රමයටත් කැමැතියි. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොට්ඨාශ ක්‍රමය ඇති කරන්න යනවාය කියලා පළාත් සභාවටත්, ප්‍රාදේශීය සභාවට වාගේ පාර්ලිමේන්තුවට මේකේ බලය අරගෙන අවුරුදු ගණනක් ඡන්ද නොතියා ඇද ගෙන යන්න වැඩ පිළිවෙළක ආරම්භය තමයි මේ ආණ්ඩුව මේ පනත හරහා ගෙනැල්ලා තිබෙන්නේ කියන කාරණාවත් මම මේ වෙලාවේ මතක් කරනවා. අපි ඡන්දවලට භය නැහැ. තමුන්නාන්සේලා ඡන්දවලට භය නිසා තමයි ප්‍රාදේශීය සභා ඡන්දය අවුරුදු දෙකහාමාරක් තිස්සේ ඇද ගෙන ගිහිල්ලා තිබෙන්නේ. ඒ වාගේම තමයි මේ පළාත් සභා මැතිවරණයත් නොපවත්වා අවුරුදු ගණනක් ඇද ගෙන යන වැඩ පිළිවෙළක ආරම්භය තමයි මේ වෙලා තිබෙන්නේ කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. ඒ වාගේම තමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරේ මහ ඇමති විග්නේෂ්වරන් මහත්තයා ඊයේ පෙරෙයිදා අපේ මහ නායකවරු හම්බ වෙන්න ගිහිල්ලා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මම එකපාරක් අවවාද කළා. දෙවැනි සැරෙත් අවවාද කරනවා. තුන් වන සැරෙත් ආපහු මේක කළොත් මම නම් කරනවා. ඔබතුමා කථා කරන්න.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරේ ප්‍රධාන අමාත්‍ය විග්නේෂ්වරන් මැතිතුමා අපේ මහා නායක හාමුදුරුවරු හම්බ වෙන්න ගිහිල්ලා කියලා තිබුණා, මේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනය තුළ උතුරට ෆෙඩරල් ඕනෑය කියලා. ඒකීයත්වය අයින් කරලා එක්සත් ඇතුළත් කරලා ෆෙඩරල් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ජාතිවාදය.

**ගරු ගුණසිරි ජයනාත්** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ඒ ගැන කථා කරන කොට ජාතිවාදී. ඇයි අපට අපේ අයිතිය කථා කරන්න බැරිද? ඒක විතරද ජාතිවාදය? විසි වන සංශෝධනයට ඒක අදාළයි. ඒක ජාතිවාදියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා මූලාසනය අමතන්න.

**ගරු ගුණසිරි ජයනාත්** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ෆොන්සේකා එක්ක ඉන්න නිසා වෙන්න ඇති ජාතිවාදය. දැන් මොනවාද ෆොන්සේකලා කරන්නේ? දැන් අපේ රට රැක්ක රණවිරුවෝ පාවා දෙනවා. මේ ආණ්ඩුව විග්නේෂ්වරන්ලාගේ අවශ්‍යතාවය ඉෂ්ට කරනවා තමයි. ඒක තමයි ඇත්ත වෙලා තිබෙන්නේ. ෆොන්සේකාත් ජාතිවාදියෙක් එහෙම නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විග්නේෂ්වරන් ප්‍රධාන අමාත්‍යවරයා මහා නායකවරු හම්බ වෙලා බොහොම පැහැදිලිව සඳහන් කළා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ ඒකීයත්වය අයින් කරලා එක්සත් කියන වචනය ඇතුළත් කරලා ෆෙඩරල් ක්‍රමය අවශ්‍යයි කියන කාරණාව. අපට සැකයක් ඇති වෙනවා, මේ පළාත් සභාව තුළ ගරු ප්‍රධාන අමාත්‍යවරයා සහ ආණ්ඩුකාරවරයා හරහා ජනාධිපතිවරයාට තිබෙන ඒ බලය අයින් කරලා පාර්ලිමේන්තුව හරහා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ ඇති වන සංශෝධනත් එක්ක මේ ෆෙඩරල්වලට අවශ්‍ය බලය නිර්මාණය කරන වැඩ පිළිවෙළක් ද තවත් පැත්තකින් මේ සිද්ධ වන්නේ කියන කාරණාවත් මම මේ වෙලාවේ පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. අනික් පැත්තෙන් අද රටේ ඉන්න ඇතැම් නායකයෝ සහ හිටපු නායිකාවෝ කියා ගෙන යනවා අපේ පාසල් විෂයෙන් ඉතිහාසය කියන විෂය, ආගම මේ සියල්ල අයින් කරන්න ඕනෑය කියලා. ඒ නිසා මෙවැනි පසුබිමක් තුළ අපට මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ තුළ සැක සංකා ගණනාවක් ඇති වෙලා තිබෙන තත්ත්වයක් තුළ තමයි මේ විසි වන සංශෝධනය පළාත් සභාවට ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මෙවැනි පසුබිමක් තුළ මේ ආණ්ඩුවේ පසුගිය ක්‍රියා කලාපයන් දිහා බැලුවාම මේ ආණ්ඩුව කියන කාරණා සම්බන්ධයෙන් කිසිම විශ්වාසයක් අපට තියන්න බැහැයි කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් අදහස් ප්‍රකාශ කරද්දී කිව්වා, පසුගිය මහින්ද රාජපක්ෂ පාලන කාලය තුළ පළාත් සභාවේ තිබුණු යම් යම් බලයන් උදුරා ගත්තාය කියලා. හැබැයි, අපි කියනවා, එහෙම යම් යම් බලයන් පසුගිය කාලයේ උදුරා ගත්තා නම්, පසුගිය කාලයේ උදුරා ගත්ත නිසා දැනුත් උදුර ගන්න අත අරිනවාද කියන කාරණාව මේ ගරු මන්ත්‍රීවරු කල්පනා කරන්න ඕනෑ. එදා උදුරා ගත්තා නම් අදත් ඒකට ඉඩකඩ දෙනවාද කියන කාරණාව තමුන්නාන්සේලා කල්පනා කරලා බලන්න ඕනෑ. පළාත් සභාවට තිබෙන බලය බොහොම පැහැදිලිව මේ සංශෝධනය හරහා පාර්ලිමේන්තුවට අරගෙන - මම බොහොම පැහැදිලිව සඳහන් කරනවා, ප්‍රාදේශීය සභා මැතිවරණ අවුරුදු දෙකහාමාරක් තිස්සේ තියන්නේ නැතිව ඇද ගෙන යනවා වාගේම, මේ සංශෝධනය හරහා පාර්ලිමේන්තුවට බලය අරගෙන පළාත් සභා මැතිවරණයත් තියන්නේ නැතිව දීර්ඝ කාලයක් ඇද ගෙන යන වැඩ පිළිවෙළක් නිසයි අපි බොහොම පැහැදිලිව මේ පනතට විරුද්ධ වෙන්නේ. එසේ වුවත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉතා හොඳ සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සංශෝධනයට එකඟයි. මේ පනතට විරුද්ධයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සංශෝධනයට එකඟයි. මේ පනතට විරුද්ධයි කියන කාරණාව බොහොම පැහැදිලිව කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. පළාත් සභාවේ මන්ත්‍රීවරු 104 දෙනෙක් සිටිනවා. දවල් කෑම 104 දෙනෙකුට ලැහැස්ති කරන්න ඕනෑ. දැන් අපි දවල්ට කන්න ගියාම කෑම නැහැ. 104 දෙනෙකුට කෑම ලැහැස්ති කරනවා නම්, 104 දෙනෙකුටම කෑම තිබෙන්න ඕනෑ. දැන් 104 දෙනෙක් මෙතැන ඇවිල්ලත් නැහැ, උදේ ඉඳලා. දැන් අපි එතැනට ගියාම කෑම කන්න, කෑම නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. මොකද, මේක පැහැදිලිව කියන්න ඕනෑ. මේ අරගෙන ඉන්න ආපන ශාලාව දැන ගන්න ඕනෑ කෑම තියන්න. මෙතැන මන්ත්‍රීවරුන්ට එන්න

කියලා අද වාගේ දවසකත් එතැනට ගියාම කන්න කෑම නැත්නම් මොකක්ද ඇති තත්ත්වය?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම ඒක ලේකම්තුමාගෙන් සොයලා බලලා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ ගැන ප්‍රකාශයක් ඉදිරිපත් කරයි කියලා විශ්වාස කරනවා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

36(1) යටතේ තවත් වරප්‍රසාද ප්‍රශ්නයක්. ආහාර කිසිම රහක් නැහැ. අනික කිසිම ගුණයක් නැති කෑම තිබෙන්නේ. සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ලබා දෙන්නය කියලා අපි ඉල්ලා සිටිනවා. මෙවැනි එකක් නැතිව.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය මෙතෙක් කාලා තිබෙන කෑම රහ නැහැයි කියලා එතුමිය කියනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මහජනතාවගේ බදු සල්ලි. මම කියනවා, අද දින ඒ කෑම වේලේ මුදල් ගෙවීම අත්හිටුවන්නය කියලා. ගෙවන්න එපාය කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ කථාව ඇත්ත. උදේට දෙන කෑම එකත් අන්තිම අන්තිමයි. අද තිබුණේ මාලු පාන් එකක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මේ වැදගත් පනතක් පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේ කෑම පිළිබඳව කථා කිරීම මම හිතන්නේ එතරම්ම -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේක වැදගත් වෙන්නේ බඩ පිරුණොත් විතරයි. දැන් මේක හවස පහ වන තෙක් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හැබැයි, තමුන්නාන්සේ ජනතාවට ඇවිල්ලා කියලා තිබෙන්නේ එහෙම නොවෙයි. මේ සභාව තුළ බඩ ගැන නොසලකා කථා කරන්නම් කියලා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එහෙම බැහැ. බඩ පළමු කොට.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හැබැයි, කිසිම මන්ත්‍රීවරයෙකුට හෝ මන්ත්‍රීවරියෙකුට බඩජහරි තත්ත්වයට පත් වෙන්න බැහැ. ඊට වඩා ජනතා සේවය තමයි වැදගත් වෙන්නේ. මීළඟට අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ පළාත් සභාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ලැබුණු පළාත් සභාවේ මේ විසි වන සංශෝධනය ගැන කථා කරන කොට මට මතක් වුණා, මම ඉස්කෝලේ යන කාලයේ කැම්පස් එකේ ළමයි කවියක් ලියලා තිබුණා. සින්දුවක්. මේ පළාත් සභා ක්‍රමය ගැන. ඒකේ කෑල්ලක් මම කියන්නම්. ජේ.ආර්. ජයවර්ධන මහත්තයායි, ප්‍රේමදාස මහත්තයායි සංවාදයක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හැබැයි, ඒක අසභ්‍ය කවියක් වෙන්න බැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපෝ නැහැ. එහෙම නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මට තමුන්නාන්සේ විශ්වාස නැහැ. ඒකයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ජේ.ආර්. මහත්තයායි ප්‍රේමදාස මහත්තයායි අතර සංවාදයක්. ඒකේ තිබෙනවා,

ජේ.ආර් ජයවර්ධන මහත්තයා කියනවා, කැම ගෙනත් බලෙන් දාපු රජීව් ව දන්නවා නේද?

ප්‍රේමදාස මහත්තයා කියනවා, අපොයි මොකද මම නොදන්නේ තමුසෙ ඌට හයයි නේද?

එතකොට ජේ.ආර්. ජයවර්ධන මහත්තයා කියනවා, මම කළ දෙයක් නොවෙයි. මට බණින්න එපා ප්‍රේමේ. කැම වාගේ අත්සනටත් බලෙන් ඇවිල්ලා. කියලා කියනවා.

එතකොට ප්‍රේමදාස මහත්තයා කියනවා, ඕකනේ මම කියන්නේ. මමත් බල බලා උන්නේ තෝ පන්නා රජ වෙන්නේ කොහොමද කියලා.

ඒ කියන්නේ මේක අර වඩමාරච්චියට කැම බලෙන් දැම්මා වාගේ ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට රජීව් ගාන්ධි බලෙන් දාපු දෙයක් තමයි මේ පළාත් සභාව. හැබැයි, ඒ පළාත් සභා බලෙන් දැම්මත්, මම ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට අදත් ගරු කරන කෙනෙක්. මොකද, ඒ උතුරු නැගෙනහිරට පළාත් සභාව එන කොට ජේ.ආර්. ජයවර්ධන මහත්තයා මුළු ලංකාවටම පළාත් සභා ගෙනාවා. සමහර අය කියයි, ඒ පළාත් සභා ලංකාවටම හරියන්නේ නැහැයි කියලා. නමුත් ගරු සභාපතිතුමනි, මේ උතුරු නැගෙනහිරට විතරක් මේ පළාත් සභා දුන්නා නම්, සමහර විට මෙහෙම ෆෙඩරල් ක්‍රමය කරා යන කොට අද පළාත් සභාවත් මේ උතුරු නැගෙනහිර වෙන් වී යන්නත් තිබුණා. නමුත් ජේ.ආර්. ජයවර්ධන මහත්තයා එදා කල්පනා කරලා මුළු ලංකාවටම මේ පළාත් සභා ක්‍රමය දැම්මා. ඊයේ විග්නේෂ්වරන් මහත්තයා කිව්වා, උතුරු නැගෙනහිරට විතරක් නොවෙයි. ෆෙඩරල් ඕනෑ නම් ලංකාවේ ඉතිරි පළාත් සභාවලටත් ගන්නය කියලා. මේ පුංචි ලංකාව. ලංකාව කියන්නේ ඉන්දියන් සාගරයේ නැවක් වාගේ. ඉන්දියාවේ ඉදන් බලන කොට. මේ පුංචි ලංකාව කැලි නවයකට කැඩෙන කොට උතුර ඉල්ලුවොත් කැල්ලක් වෙනම වෙන් වෙන්න ඕනෑය කියලා. අපිත් කියනවා, අපට වෙන් වෙන්න ඕනෑය කියලා. එතකොට කැලි නවයකට මේක කැඩෙනවා. කැඩෙන කොට ලංකාවට වෙන් වෙන්න ජාත්‍යන්තරය ඉඩ දෙන්නේ නැහැ. අපි ඉඩ දෙන්නෙත් නැහැ. ඒ නිසා එදා කල්පනා කරලා කැලි නවයක් පළාත් සභා නවයක් ගෙනාපු එක ගැන මම අද සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු. අපේ තිබෙන බලය ඇත්තටම පාර්ලිමේන්තුවට දෙන එක වැරදියි. නමුත් මේ අපේ අයට තේරෙන්නේ නැහැ. අපේ අය ඔක්කොම හිතාගෙන ඉන්නවා, මේ පාර්ලිමේන්තුවට බලය ගන්න එනවාය කියලා. නැහැ. මේ ළඟ එන පළාත් සභා මැතිවරණයට මේ ආණ්ඩුවට මුහුණ දෙන්න බැරි නිසා අර පළාත් පාලනය වාගේ මේක කල් දාන්න බැරි හන්දා, පළාත් පාලනය කල් දැම්මා වාගේ පුළුවන් නම් කල් දානවා. ව්‍යවස්ථාවෙන් එහෙම දාන්න බැහැ. ඒ නිසා මේ දහන්ගැටය ගෙනැල්ලා මේක කල් දා ගන්නවා. තමන්ට අවශ්‍ය දවසට කල් දා ගෙන ඊළඟට කරන්නේ මොකක්ද? ෆෙඩරල් එක්කලා දෙන්නේ. නිකම් නොවෙයි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පුද්ගලිකව කැමැති දෙයක් තමයි ජනාධිපති ක්‍රමයට. එහෙම නැත්නම් බහු ජාතික, බහු ආගමික, බහු පාර්ශවික රටක මේ පාර්ලිමේන්තුවට බලය ගියාම එක එක ජාතීන් කේවල් කරලා ඒ කැලි කඩා ගන්නවා. නමුත් සැමට ඉහළින් හිරු තිබෙනවා වාගේ, ජනාධිපති ක්‍රමය ඉහළින් තිබුණොත් මේක ඒකීය රාජ්‍යයක් වෙයි. නැතන්ම් අර විග්නේෂ්වරන් මහත්තයා කියන්නා වාගේ එක්සත් කියන කැල්ල ඇතුළු වෙනවා. එක්සත් කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙන් වුණු මිනිස්සු තමයි එක්සත් වෙන්නේ. ඒකීය කියන්නේ එකයි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වැඩිය කථා කරන්නේ නැහැ. මේ පළාත් සභාවේ ගොඩක් අය මේ ගැන කථා කළා. මම මගේ පුද්ගලික යෝජනාවක් වශයෙන් මම මේකට විරුද්ධයි. නමුත් (බාධා කිරීම්) අපේ මහ ඇමතිතුමා යෝජනා කරලා තිබෙනවා, ඒ සංශෝධනවලට එකහයි. ඒත් ඔය සංශෝධන හරියන්නේ නැහැ. ඕවා හරියන්නේ නැහැ. පාර්ලිමේන්තුව ගණන් ගන්නෙත් නැහැ. නමුත් මහ ඇමතිතුමා, කොන්ද කෙළින් තියා ගෙන සංශෝධන

ඉදිරිපත් කරලා තිබෙනවා. (බාධා කිරීම්) ඒ ආවොත් අපි කැමැතියි. එහෙම නැත්නම් මේ යෝජනාවට අපි විරුද්ධයි. මොකද, අනාගත පළාත් සභාවට ශාපයක් මේක.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මුළු රටේම ආන්දෝලනයකට පත් වෙලා තිබෙන මේ විසි වන සංශෝධනය පිළිබඳ අපේ අදහස් දැක්වීමට කැඳවලා තිබෙන විවාදයේ මටත් අවස්ථාවක් ලබා දීම ගැන මම ඔබතුමාටත්, අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත්, ඒ වාගේම මෙපමණ වෙලාවක් බලා සිටින අපේ සියලුම මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක එක දවසට ඡන්ද තියන එකට එදා සිටම විරුද්ධ වූ මන්ත්‍රීවරයෙක් තමයි මම. මොකද, ඒක වැරදියි. මොකද, එහෙම ඡන්ද තිබීම හරිම නිවට ක්‍රමයක්. මොකද, මෙතැන ගොඩක් මන්ත්‍රීවරුන්ගේ කටින් කියවුණා වාගේ, ඒකෙන් ආණ්ඩු බලය තිබෙන පක්ෂයකට වැඩි අසාධාරණ අවස්ථාවක් ඒකට ලැබෙනවා. මොකද, සියලුම ආණ්ඩු බලය, තමන්ගේ සියලු බලය, මුදල් සියලුම දේ එකම පළාත් සභාවකට නතු කරලා, එහෙම නැත්නම් පළාත් සභා දෙක තුනකට නතු කරලා, තමන්ට ජන මතය විකෘති කිරීමේ හැකියාවක් කඩින් කඩ ඡන්ද තිබීමේ ක්‍රමය හරහා මේ අයට ලැබෙනවා. ඒක නවත්වන එක ගැන මෙතැන ඉන්න ගරු මන්ත්‍රීවරු බොහොමයක් වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් සතුටුයි.

ඒ වාගේම මම තව දෙයකට සතුටු වෙනවා. මේ දේවල් පසුගිය ආණ්ඩුවල වෙන කොට, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ වේවා, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ වේවා. වෙන කොට ඒ දේවල් වැරදියි කියපු නැති කට්ටිය අද මෙතැන වැරදියි කියලා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක ලොකු දෙයක්. ඒ කියන්නේ නිදහසේ කථා කරන්න, තමන්ගේ මතය ප්‍රකාශ කරන්න ශක්තිය ඇවිල්ලා තිබෙනවා. ඒක හරි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ විසි වන සංශෝධනයට එවලා තිබෙන යෝජනාවේ ඒ කොටසට මම එකඟයි. ඡන්දය එකම දවසේ රටේ තියන යෝජනාවට මම එකඟයි. ඒකේ කිසිම ගැටළුවක් නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, මේ යෝජනාව අද මාධ්‍යවලිනුත් හැම තැනින්ම කියලා තිබෙනවා, මේක රටේ එක දවසේ ඡන්ද තිබීමේ සංශෝධනයක් තමයි මේ කරන්න යන්නේ කියලා. නමුත් ගරු සභාපතිතුමනි, එතැනට එහා ගිය දෙයක් මේක ඇතුළේ තිබෙනවා. අර සිංහලෙන් අපි කියනවා නම්, නංගි පෙන්වලා ඇන්ටි දෙනවා වාගේ මේක.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අක්කා නොවෙයි.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

නැහැ. අක්කා නොවෙයි. ඇන්ටිව දීලා තිබෙන්නේ. මොකද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - (බාධා කිරීම්) අම්මාගේ නංගිව කොහොම හරි. පුංචි අම්මා. (බාධා කිරීම්) මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඇතුළේ තිබෙනවා, 1987 ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මේ පළාත් සභා ක්‍රමය හදන කොට ඉතාම සාධාරණ විධියකට පාර්ලිමේන්තුවට පළාත් සභා පාලනය කරන්න බැරි වෙන්න, ඒ අත්තනෝමතික බලයක් එන්නේ නැති වෙන්න අපට 13 වන සංශෝධනය ඇතුලේ පළාත් සභාවල ස්වාධීනත්වය රැකෙන්න දාලා තිබෙනවා. පළාත් සභාවක් විසුරවනවා නම්, ජනාධිපතිවරයා, ආණ්ඩුකාරවරයා, මහ ඇමතිවරයාගේ කැමැත්ත විමසලා විසුරුවන්න පුළුවන්ය කියලා සඳහන් වෙනවා. ඒකෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට, හැම පළාත් සභාවකටම විශාල ස්වාධීනත්වයක් ඇවිල්ලා තිබෙනවා. ඒක හරහා අපි පාර්ලිමේන්තුවට යටත් විය යුතුයි කියන දේ අහෝසි වෙලා තිබෙනවා. අපට ස්වාධීනව අපි අපේ පළාත් සභාවල, අපේ දිස්ත්‍රික්වල ජනතාවගේ අයිතීන් වෙනුවෙන් සටන් කරන්න. ස්වාධීන ශක්තියක් අපට ඒකෙන් ලබා දීලා තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව හරහා මේ සභාවට විතරක් නොවෙයි. ඉදිරියට එන මේ රටේ හැම පළාත් සභාවකටම ඒ බලය මේ යෝජනාවෙන් නැති කරලා තිබෙනවා. ඒ කියන්නේ, මීට පස්සේ පාර්ලිමේන්තුව අකමැති දෙයක් පළාත් සභාව කළොත් පාර්ලිමේන්තුවට ඕනෑම පළාත් සභාවක් ඕනෑම වෙලාවක විසිරවීමේ - ඡන්දය අද නම්, හෙට අනිද්දා වුණත් විසුරුවන්න ඒ හැකියාව දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවගේ පරමාධිපත්‍යයට එතැනින් මොකක්ද වෙන්නේ? අපි බස්නාහිර පළාත උදාහරණයකට ගත්තොත්, අපේ

[ගරු අනුරාධ විමලරත්න ]

බස්නාහිර පළාතේ ජනතාවගේ ඒ තිබෙන පරමාධිපත්‍යයට සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තුවෙන් පහරක් එල්ල වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක කොහෙත්ම අනුමත කරන්න බැහැ. කොයි පක්ෂයෙන් - අපේ නායකයෝ මේක අනුමත කරන්න කිව්වත්, ඒකට මේවා වෙන්න බැහැ. මොකද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද හෙට නොවෙයි. තව අවුරුදු විස්සකින් දවසක පළාත් සභාවක් එයි. පළාත් සභාවක් ඇවිල්ලා ඒ පළාත් සභාවට පාර්ලිමේන්තුවට නතු වෙන්න ඕනෑ වුණොත්, ඒ පළාත් සභාවල මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තුවේ මතයට එහායින් තමන්ගේ පළාත්වල, දිස්ත්‍රික්කවල ජනතාවගේ අයිතීන් ආරක්ෂා කරන්න බැරි වුණොත්, එදාට මෙතැනම ඉඳගෙන මන්ත්‍රීවරයෙක් කියයි, අර අද අපි කියනවා වාගේ කවුද දිවි නැගුම පනතට අත උස්සපු නිවටයෝ, කවුද 18 වන සංශෝධනයට අත උස්සපු නිවටයෝ කියලා මේ පළාත් සභාවේ ඉඳන් මන්ත්‍රීවරයෙක් අහන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නම් කියවෙන්න හොඳ නැහැ. අද මම දන්නවා. අද එහෙම පුද්ගලයෝ ඉන්නවා. මේ ආණ්ඩුව ඇතුලෙත් එහෙම පුද්ගලයෝ ඉන්නවා. අද ඒගොල්ලෝ ඇවිල්ලා කියනවා, අපි හයේ හිටියේ. එදා තිබුණු තත්ත්වය අනුව අපට අත උස්සන්න නැතිව ඉන්න බැරි වුණා. අපි කෙළින්ම කියනවා, ඒ පුද්ගලයෝ නිවටයෝ කියලා. මේ රජයේ ඇමතිකම් කරන පුද්ගලයෝ එහෙම ඉන්නවා. නිවටයෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කථාව මම අහන්න කැමැති නැහැ.

ඒ විතරක් නොවෙයි. මේ වෙලාවේ අපේ උගත්. ගොඩක් බුද්ධිමත්. මට වඩා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ගෙනෙන තර්කයක් තමයි තුන් දෙනෙකුට විසුරුවන්න බලය තිබනෙ ඒක 225 කට දුන්නොත් කොහොමද කියලා අහනවා. හරි ෂෝක්. ඔව්. තුන් දෙනෙකුට තිබෙන දේ 225 කට යනවා කියන්නේ, ඇත්තටම ප්‍රජාතන්ත්‍රවාදයත් එක්ක බලනවා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොඳයි. හැබැයි, ඔබතුමා මට කියන්න. මම 1980 දී ඉපදුනේ. මගේ ජීවිත කාලය ඇතුළත නම් මම කවදාවත් දැකලා නැහැ ස්වාධීන පාර්ලිමේන්තුවක් තියෙනවා. මේ රටේ හැමදාම 1980 සිට මම දන්න කාලයේ සිට නම් පාර්ලිමේන්තුව හැමදාම තිබුණේ එක පුද්ගලයෙක්, නැත්නම් දෙන්නෙකුගේ යටතේ. ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ කාලයේ - මම දන්නේ නැහැ කියනවා. ඇත්තද බොරුද කියලා. අස්වීමේ ලිපිය අත්සන් කර ගෙන තමයිලු මන්ත්‍රීවරුන් පුටුවේ වාඩි වුණේ. ඇත්තද බොරුද මම දන්නේ නැහැ. ඉපදුනු දවස්වල. මම දන්නේ නැහැ. හැබැයි, එහෙම කථාවක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. චන්ද්‍රිකා මැතිනියගේ කාලයේත් ඒ විධියටමයි තිබුණේ. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ තිබුණේ සම්පූර්ණයෙන් විකෘති වුණු පාර්ලිමේන්තුවක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ෆයිල් තිබුණේ.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ෆයිල් ටික තිබුණා. ඒ විතරක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයේත්, අනික් පක්ෂවලත් දේශපාලන අනාථයෝ තමන්ගේ පක්ෂයට අරගෙන, තනතුරු දීලා, ඒ විතරක් නොවෙයි මන්ත්‍රීවරුන්ට වරප්‍රසාද දීලා සම්පූර්ණයෙන්ම ජන මතය විකෘති වුණු පාර්ලිමේන්තුවක් තිබුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද මොකක්ද තිබෙන්නේ? ඒකම තමයි. ඒකේම පොඩි නංගි දැන් ඉන්නේ. ඇයි? පැරදුණු මිනිස්සු ජාතික ලැයිස්තුවෙන් ගෙනැල්ලා, සුදුසු නැති මිනිස්සුන්ට ඇමතිකම් දීලා. ඒ විතරක් නොවෙයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වරප්‍රසාද, වරදාන කොයි තරම් දීලා තිබෙනවාද? අපි දැනට දන්නවා. ආණ්ඩු පක්ෂයට අත උස්සන මන්ත්‍රීවරුන්ට ලක්ෂ පහක ද, හයක ද දීමනාවක් වැටෙනවා වාහනයකට කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තිබෙන්නේත් කප්පම් දිදී, මන්ත්‍රීවරුන්ට කප්පම් දිදී ගෙන යන පාර්ලිමේන්තුවක්. ඔබතුමන්ලා හොඳටම දන්නවා. අපි අද පාර්ලිමේන්තු සැසිවාරයක් බැලුවොත් හැම මාසයකටම යෝජනාවක් එනවා. පරිපූරක ඇස්තමේන්තුවක්. මොකටද එන්නේ? මන්ත්‍රීවරුන්ට මොනවා හරි එකක් දෙන්න. ගිය සතියෙත් තිබුණා නේ? ජනතාවට සහන දෙන ඒවා කොහොම වෙතත් මන්ත්‍රීවරුන්ට සහන දෙන ඒ විධියට ජන මතය විකෘති කර ගත්ත පාර්ලිමේන්තුවක් තමයි අදත් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක වෙනස් වෙනවා නම් දවසක අනේ කමක් නැහැ 225 කට මේ බලය දෙනවාට. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක

මේ රටේ වෙයි කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ. මොකද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාව දියවන්නාවේ තිබෙන පාර්ලිමේන්තුව පාවිච්චි කරන්නේ වැසිකිලියක් වාගේ. ඔබතුමන්ලා බලන්න. පාර්ලිමේන්තු ඇරලා තිබෙන - අපේ පළාත්වල, ඔබතුමන්ලාගේ පළාත්වල ඕනෑම ලැයිස්තුවකින් බලන්න. ගමේ තියා ගන්න අකමැති එකාව තමයි පාර්ලිමේන්තුවට ඇරලා තිබෙන්නේ. ඔව්. වැසිකිලියට වාගේ. ජරාව ටික දාලා යවනවා එහාට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙමයි වෙලා තිබෙන්නේ. ඉදිරියටත් මේකේ වෙනසක් වෙයි කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හැබැයි, හැමෝම නොවෙයි නේද?

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

බහුතරයක් කියලා අපි කියමු.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒක හරි. එතැන පොඩි සංශෝධනයක් දාමු.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

කොළඹ ලැයිස්තුව ගන්න. ගම්පහ ලැයිස්තුව ගන්න. කළුතර ලැයිස්තුව ගන්න. අපේ ලැයිස්තුත් එහෙම තමයි. නැතිව නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔන්න ඕකයි තත්ත්වය. ඉතින් ඒ වාගේ තැනකට අපේ විශ්වාසය, අපේ පළාත් සභාවේ අනාගතය තීරණය කිරීමේ හැකියාව එහෙම තැනකට දෙන්න මගේ කිසිම කැමැත්තක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මීට වැඩිය මම මේ ගරු සභාවේ කාලය ගන්න අකමැති වුණත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දේ කියනවා.

අපේ මහ ඇමතිතුමා ගෙනැල්ලා තිබෙන යෝජනා සංශෝධනවලට මම එකඟයි. එතැනින් පොඩ්ඩක් ඔබ්බට යන්නත් මම එකඟයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ඡන්ද එක දවසේ තියන්න වුවමනා නම්, හෙට පළාත් සභාව විසුරුවන්න කියන්න. ඒ යෝජනාවට මම අත උස්සලා එකඟ වෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කුහකයෙකුත් නොවෙයි. ඉදිරියේ දවසක තියන කල් සබරගමුවටයි, මධ්‍යමටයි කාලය දික් කරලා දෙන්නය කියන්න. ඒකටත් මම එකඟ වෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවදාවත් මේ යෝජනාව, මේ එවලා තිබෙන ව්‍යවස්ථාවේ මේ සංශෝධනයට මේ තිබෙන විධියට මගේ කැමැත්ත ප්‍රකාශ කරන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකද, මේකට සංශෝධන එකතු කරන්න අපට අයිතියක් නැහැ. මේක ගැන කථා කරන්න පුළුවන්. මේකට අපි විරුද්ධයි. මහ ඇමතිතුමා කියන සංශෝධන හරි. එතැනින් ඔබ්බට ගිය සංශෝධන හරි කරලා ඉවර වෙලා නැවත වාරයක් මේක පළාත් සභාවේදී මත විමසුමකට එව්වොත්, එදාට එකඟ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නැත්නම් අනාගතයේදී දවසක මෙතැන ඉන්න මන්ත්‍රීවරයෙකු හරි වෙනත් පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු හරි මගේ නම කියලා අහවල් නිවටයාත් මේකට අත ඉස්සුවාය කියන ඒ නම ගාවා ගන්න මම කැමැති නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එසේ කියමින්, මගේ ස්ථාවරය මේකයි කියමින්, සියලුම දෙනාට මගේ ස්තූතිය පිරිනමමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එතුමාගේ කථාව ඉතාමත්ම අගනා කථාවක්. තරමක් දුරට හැඟීම්බරයි. එතුමා බලාපොරොත්තු වන පාර්ලිමේන්තුව හරි, පළාත් සභාව හරි ඉදිරියේදී බිහි වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. මීළඟට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. මම වැඩිදුර කථා කරන්න උත්සාහ කරන්නේ නැහැ. ගොඩක් වෙලාව ගිහිල්ලා තිබෙනවා. අපි කොහොම කථා කළත් අපි සියලු දෙනාම එකම තැන තමයි ඇත්තටම කැරකෙන්නේ. මේ යෝජනාවට අපි එකඟ නැහැ. වෙනස් වෙලා එනවා නම් අපි එකඟයි කියන එක තමයි අපි හැමෝගේම මතය තිබෙන්නේ. ඒක අද හෘදය සාක්ෂියත් එක්ක තමයි මේ සියලුම ගරු මන්ත්‍රීවරු කථා

කරන්නේ. නමුත් අර ගොඩක් මන්ත්‍රීවරු කිව්වා වාගේ පක්ෂයේ තිබෙන ඉහළ නායකත්වයේ, ඉහළ තැන්වලින් ලබා දෙන විධියට ක්‍රියාත්මක කරන කොට හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන්නේ නැති වෙන වැඩ පිළිවෙළ අපි වහ ගන්න, ඒකේ ලිස්සලා යන වැඩ පිළිවෙළක් තමයි මෙතැන ඇත්තටම අද ක්‍රියාත්මක වෙන්නේ. එහෙම වුණත් කමක් නැහැ. අනුරාධ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අනාගතයේ දරුවන්ගෙන්, ඒ අයගෙන් අපි කතන්දරයක් නාහා ඉන්න අපි වැඩ කටයුතු කරන්න ඕනෑ. එහෙම ලිස්සලා ගියත් අපි ඒකට එකඟයි කියලා විශ්වාස කරනවා. මොකද, මේ වැඩ පිළිවෙළට කොහෙත්ම අපි කැමැති නැහැ. නමුත් ඇත්තටම මේ ආණ්ඩුව ඇවිල්ලා සංවර්ධනය ගැන මවා පාලා, නොයෙකුත් වැඩ පිළිවෙළවල්, නොයෙකුත් දීමනා ගැන කථා කරලා ආපු ලස්සන සුරංගනා ලෝකය නොවෙයි අද ඇත්තටම අපට පේන්නේ. දවසින් දවස, මාසයෙන් මාසය මොනවා හරි පෞද්ගලික වෙන්නත් පුළුවන්. නැත්නම් තමන්ගේ මේ වටපිටාව හදා ගන්න පුළුවන් යෝජනාවක් පාර්ලිමේන්තුවට ගේනවා. ගෙනැල්ලා ඒක තුනෙන් දෙක තිබෙන හින්දා, බහුතරයක් තිබෙන හින්දා සම්මත කර ගන්නවා. ඒක මේ රටේ ජනතාවට අවශ්‍ය දෙයක් නොවෙයි. නමුත් කාගේ හරි පවුලක කෙනෙකුට ගහන්න, එහෙම නැත්නම් යම්කිසි සමාගමකට ගහන්න, එහෙම නැත්නම් යම්කිසි කොටසකට ගහන්න මේ පනත හදාගෙන සම්මත කර ගන්නවා. අර ඉන්න ඔක්කොම තුනෙන් දෙකේ බලයට යටත් වෙලා ඒක අනුමත කරනවා. නමුත් මේ රටේ අනාගතය වෙනුවෙන්, මේ රටේ අභිවෘද්ධිය වෙනුවෙන් කිසිම, මෙතෙක් කල් කිසිදු යෝජනාවක් ගෙනැල්ලා නැහැයි කියන එකයි අපි දකින්නේ.

හැබැයි, දැන් එහෙම ගිහිල්ලා දැන් මේ ආණ්ඩුවට පොඩි ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. දැන් මේ වර්තමානයේදී, මෑතකදී තුනෙන් දෙකේ බලය නැහැයි කියන තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. එහෙම වෙලා ඉන්න කොට මේ හෙට අනිද්දා විසුරුවෙන්න එන පළාත් සභා තුනේ නැඟෙනහිර, සබරගමුව, උතුරු මැද පළාත් සභා තුනේ ඡන්දය තියන්න බිය කමක් තිබෙනවා. ඒ බියකම කෙසේ වුණත්, ඒ බියකම තුළ ඡන්දය නොතියා කොහෙත්ම ඉස්සරහාට යන්න ක්‍රමයක් නැහැ. ක්‍රමයක් නැති නිසා, ක්‍රමයක් හැටියට තමයි මේ යෝජනාව අපට ගෙනැල්ලා තිබෙන්නේ. ඒ තුනෙන් දෙකක් නැහැ. මේක දික් කර ගන්න ක්‍රමයකුත් නැහැ. මොකද, මීට ඉස්සෙල්ලා හිටපු අපේ චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ, එහෙම නැත්නම් ප්‍රේමදාස මහත්තයා ජනාධිපති කාලයේ මේවා දික් කරන්න ක්‍රම සෙව්වාට උසාවිය තුළ එහෙම තීන්දු තීරණ, එහෙම ප්‍රතිපාදනයක් තිබුණේ නැහැ. ජනතා මතයකට යන්න ඕනෑ. ජනතා මතයක් එක්ක යන්න ඕනෑ නිසා මේවා සංශෝධනය වෙන්න නම්. ඒ නිසා මේ වෙනත් විකල්පයක් තුළින් තමයි මේ ගේන්න හදන්නේ. මේ කෙසේ වෙතත් එක දිනයේ ඡන්ද තියන එකට අපි සියලු දෙනාම, හැමෝම කිව්වා වාගේ එකඟයි. හැබැයි, වහලා ගහලා වැඩක් නැහැ. මේකට ඇත්තට මහ ලොකු දේවල් ඕනෑ නැහැ. මේකට කරුණු දෙකක් ඇතුළත් වුණා නම් හරි. මෙන්න මේ දිනයට තමයි අපි ඡන්දය තියන්නේ. මේ වකවානුවට විතරයි. මොකද, ඒ දිනයට අපි ඡන්දය තියන්න පටන් ගත්තාම ඒ අවුරුදු පහ ඊට පස්සේ හැමදාම එකට පිරෙන්නේ. එතකොට දිනයක් තිබෙනවා හැමදාම. දිනයක් තිබෙනවා. ඉතින් එහෙම නැහැ. මේ වහලා ගහලා තිබෙන්නේ. අර පළාත් පාලන ආයතනවලට වුණු දේම තමයි මේ පළාත් සභාවට වෙන්නේත්. මේ පළාත් සභාවට කරන්න හදන්නෙත් අන්න ඒ කාර්යය තමයි. තමන්ට ඕනෑ විධියට.

හැබැයි, මේකේදී කනගාටු වෙනවා. තමන්ට බලය තිබෙන කොට බලය රැක ගන්නයි, බලයේ වට පිටාව හදා ගන්නයි රීති ගෙනාවාම බලය නැති වෙන කොට ඒක එහෙම වෙනවා. ඇත්තටම මම එකඟයි. මෙතුමා කිව්වා, පළාත් සභාවේත් අපේ කාලයේත් මීට පෙර අපේ ආදායම්වල ප්‍රශ්නයක් තුළ අපි එහෙම වුණා. ඇත්ත ඒක. බොරු නොවෙයි. අද අපි පළාත් සභාව එතැනට වැටිලා තිබෙනවා. හැබැයි, හැමදාම මෙහෙම වෙන්න ඕනෑ නැහැ. හැබැයි, මේ ආපු සුරංගනා ලෝකය. යහපාලනය. නොයෙක් දේවල් කියලා, මේ ආණ්ඩුවල තිබුණු ඒවාට බැණලා, දොස් කියලා, මේක හරියන්නේ නැහැයි කියලා තමයි යහපාලනය ගෙනාවේ. හැබැයි, ඇවිල්ලා කරන්නේ ඊටත් එහා ගිය දේවල්. ඇයි රැකෙන්න එපැයි. රැකෙන්න විධියක් නැති කමට ඊටත් එහා ගිය දේවල් තමයි මේ ආණ්ඩුව ඇත්තට කරන්නේ. ඒ නිසා කොහොම කළත් මේ මැතිවරණ ක්‍රමයත් එක්ක මම හිතන්නේ, මේ මැතිවරණ ක්‍රමය වෙනස් වෙනවාට සමහර තැන්වල අපි කැමැතියි අර මුලින් කිව්වා වාගේ, පළාත් පාලන මැතිවරණය තුළ අපි හදපු කොට්ඨාශ ක්‍රමයම තමයි මේගොල්ලෝ ඉස්සරහාට ගෙනාවේ. ගෙනාවාට

හැබැයි, ඒකේ අර තරුණයන්ට තිබුණු තැන, ඒ හිමි තැන නැති කරලා තිබෙනවා. එහෙම කරලා තමයි කටයුතු කරන්නේ.

ඇත්තටම මේ පළාත් සභා ක්‍රමවේදය අපේ අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ උතුරට තමයි ගෙනාවේ. හැබැයි, උතුරට තමයි නැති වුණේ ඒක. ගිය ආණ්ඩුවෙන් තමයි උතුරටත් ඡන්දය තියලා, ඒවාට ප්‍රජාතන්ත්‍රවාදය දෙන්න පුළුවන් වුණේ. නමුත් මේක මහා සුදු අලියෙක් කියලා කවුරු කොහොම කිව්වත්, මේක වැඩක් නැහැයි කියලා කොපමණ ගැ ගැහුවත් මේකෙන් වෙන සේවාව - මම නම් දෙවැනි වතාව. මම දැක්කා. ඒ සේවාව බලාගෙන ඉන්න බැරි නිසා තමයි සමහර වෙලාවට පාර්ලිමේන්තුවේ ඉන්න අයට මෙවැනි දේවල් ගේන්න උවමනා වෙලා තිබෙන්නේ. අද අපේ බස්නාහිර පළාත ගත්තොත් වැඩිම පාසල් සංඛ්‍යාව තිබෙන්නේ, බස්නාහිර පළාත් සභාව සතුව. වැඩිම ඉස්පිරිතාල සංඛ්‍යාව තිබෙන්නේ, බස්නාහිර පළාත් සභාව සතුව. ජනතාවට වඩාත්ම ළං වෙන්න පශු වෛද්‍ය කාර්යාල වේවා, MOH එක වේවා, ඒ සියලුම දේවල් වැඩියෙන්ම සම්බන්ධ වෙලා තිබෙන්නේ මේ පළාත් සභාව තුළ. ඒකෙන් විශාල සේවාවක් වෙනවා. හැබැයි, විශාල සේවාවක් වෙන්නේ, ඉන්න නායකයෝ, ඉන්න ඇමතිවරුන්ගේ දක්ෂතාවයන් නිසා තමයි. අපට මතකයි. ඉස්සෙල්ලා පළාත් සභාව තුළ අධ්‍යාපනය විතරක් තිබුණාම ඇති එන්න. ඇත්තටම එදා ඊළඟ වටය ආවාට මන්ත්‍රීවරයෙකු බවට පත් වෙන්න අධ්‍යාපනය විතරක් තිබුණා නම් ඇති. අපි ඒ තුළින් තිබුණු වැඩ පිළිවෙළවල් ටිකෙන් අපි හොඳ ජනතාවට සේවය කරලා, අපේ ජනප්‍රියත්වයත් අපි ගොඩ නගා ගෙන ගියා. ඒක තිබෙන්නේ ඒක මෙහෙයවන නායකයෝ අතේ කියන එකයි අපි දකින්නේ. ඒ වැඩ පිළිවෙළ තුළ ජනතාවට වඩාත් සුභවාදී වැඩ පිළිවෙළක් අපට පළාත් සභාව තුළින් කර ගන්න පුළුවන් වුණා. නමුත් මේ ආණ්ඩුව ආවාට පස්සේ නම් ඇත්තටම ගොඩක් නීති රීති දාලා, චක්‍රලේඛ වෙනස් කරලා, වැඩ කරන නිලධාරීන්ව රිමාන්ඩ් ගත කරලා, ඒ වාගේ වැඩ පිළිවෙළවල් එක්ක කොහොමත් ආපස්සට යන වැඩ පිළිවෙළක් අපි දකිනවා. විශේෂයෙන්ම අද අධ්‍යාපනය වුණත් අපට සන්තෝෂ වෙන්න පුළුවන් මට්ටමක නැහැ. අධ්‍යාපනයවත් ඒ ආකාරයට නැහැ. ඒ නිසා ඒවා හැදිය යුතුයි. ඒවායි හැදිය යුත්තේ. මම මීට වඩා කථා කරන්න උත්සාහ කරන්නේ නැහැ. කෙසේ වෙතත් අර අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, හරි විධියට එන්න. හරි විධියට ආවොත් අපි අත් දෙකම උස්සලා ඒ සහයෝගය දෙනවා. නැත්නම් ඇත්තටම මේ වහෙන් ඔරෝ ඇවිල්ලා, වටෙන් ඇවිල්ලා, අයිසින් පෙන්වලා එන යෝජනාවලට අපි කොහොමත් කැමැති වෙන්නේ නැහැයි කියලා අපි මේ අවස්ථාවේ මතක් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [හෙක්ටර් බෙත්මගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Hector Bethmage M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne ] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. කරුණාකර ගරු සභාව නිශ්ශබ්ද වන්න. අනවශ්‍ය ඝෝෂා කිරීම් කරන්න එපා. මේක විහිළුවක් නේ? සභාව තුළ අනවශ්‍ය විධියට හැසිරෙන්න එපා. බොරුවට කෑ ගහනවා. එහාට මෙහාට වීරයෝ වාගේ. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අද දවස තුළ ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් මේ විසි වැනි සංශෝධන පනත ගැන කථා කරන අවස්ථාවේ තමුන්නාන්සේ සභාපති හැටියට නැවතත් පැමිණ මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. අපි මුලින්ම කථා කළ යුත්තේ, මෙම මධ්‍යම ආණ්ඩුවෙන් සහ පාර්ලිමේන්තුවෙන් විසි වන පනත පළාත් සභා නවයටම එවපු හේතුව මොකක්ද කියලා. අපි කවුරුත් දන්නවා, මේ වන කොට මුළු ලංකාවේම පළාත් පාලන ආයතන 335 ක් මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා හැටියට විසුරුවලා අවුරුදු 2 1/2 ක කාලසීමාවක් වෙනවා. ඒ වාගේම ඒවා විසුරුවන්න ප්‍රධාන හේතුව වුණෙත්

[ගරු මෙරිල් පෙරේරා ]

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, ඒ වාගේම අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් දෙදෙනාම සාකච්ඡා කරලා මේ 335 න් 280 කට වැඩි ආසන සංඛ්‍යාවක් පළාත් පාලන ආයතන තිබුණේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයට. ඒ නිසා ඒ කාලසීමාව තුළදී ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් සාකච්ඡා කරලා මේ ආයතන 335 ම වරින් වර විසුරුවන්න වැඩ කටයුතු ක්‍රියාත්මක කළා කියන එක අපි කවුරුත් දන්නවා. ඒ නිසා අද නැවතත් මේ පළාත් සභා නවය තුළම, විසි වන සංශෝධන පනත, මේ කෙටුම්පත එවලා අද බලාපොරොත්තු වෙන්නේ - මොකද, අපි හොඳාකාරවම දන්න දෙයක්. උතුර, නැගෙනහිර පළාත හැර අනික් පළාත් 07 ම තිබෙන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාලනය යටතේ. මේ පළාත් සභා නවය විසුරුවා හැරීමේ බලය පාර්ලිමේන්තුව ගත්තාම නැවත පළාත් සභාව පිහිටුවන තුරු පාලනය කිරීමේ බලය පාර්ලිමේන්තුව ලබා ගැනීම තමයි මේ විසි වැනි සංශෝධන පනතෙන් ඉදිරිපත් කරන්නේ. එතකොට අපි පැහැදිලිව දන්න දෙයක්. අද මෙතැන සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඒ වාගේම ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීමන්ලා කිව්වා අද මේ ආණ්ඩුව - සම්මුති ආණ්ඩුවක් හැටියට, ජාතික ආණ්ඩුවක් හැටියට පිහිටුවා ගත්ත ආණ්ඩුව අද මැතිවරණ නොතියා දවසින් දවස කල් ගත කරනවා. පළාත් පාලන මැතිවරණය සීමා නිර්ණයන් ඉදිරිපත් කරලා, පළාත් සභා අමාත්‍යාංශය පනත ඉදිරිපත් කරලා අද ඡන්දයක් පැවැත්වීම දවසින් දවස කල් දාගන්න අවස්ථාවක තමයි අද මේ විසි වැනි සංශෝධනය එවන්නේ.

එතකොට දැන් පළාත් සභා තුනක් විසිරෙනවා. සබරගමුව, උතුරු මැද සහ නැගනෙහිර. 2017 සැප්තැම්බර් මාසය සහ ඔක්තෝබර් 01 වැනිදා වන කොට සභා තුනක කාලසීමාව ඉවරයි. ලබන අවුරුද්දේ, 2018 මධ්‍යම, වයඹ, උතුර පළාත් සභා තුනක කාලය ඉවරයි. ඒ වාගේම 2019 දකුණ, බස්නාහිර, ඌව පළාත් සභා තුනක කාලය ඉවරයි. එතකොට අද මේ පළාත් සභා තුනේ කාලසීමාව ඉවර වෙන කොට මැතිවරණයකට යන්න අවශ්‍ය නිසා අනික් පළාත් සභාවලට විසි වන සංශෝධන පනත ගෙනැල්ලා කල් දමා ගැනීමේ ක්‍රියාවලියක් තමයි මේ ක්‍රියාත්මක කරගෙන යන්නේ. ඒක අපි පැහැදිලිව දන්නවා. නැගෙනහිර පළාතේ ඡන්දය විමසුවොත් එහෙම එක්සත් ජාතික පක්ෂයටවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටවත්, වෙනත් පක්ෂයකටවත් ජයග්‍රහණය කරන්න පුළුවන්කමක් නැහැ. මුස්ලිම් කොංග්‍රස් පක්ෂය සහ දෙමළ ජාතික සන්ධානය එකතු වීමෙන් තමයි නැගෙනහිර පළාත හැමදාම ජයග්‍රහණය කරන්නේ. ඒ වාගේම සබරගමු පළාත විමසන්න ඡන්දයකට ගියොත් මේ පළාත් සභා විසුරුවායින් පස්සේ එදා 2015 ජනාධිපතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ සියලු පක්ෂ එකතු වෙලා පොදු අපේක්ෂකයා හැටිය ඡන්දය ලබා දුන්න අවස්ථාවේත් මහින්ද රාජපක්ෂ මැතිතුමා සන්ධානයක් යටතේ ඉල්ලලා එක් ලක්ෂ දොළොස් දහස් එකසිය තිස් හයකින් ජග්‍රහණය කරලා තිබෙනවා. ඒ වාගේම උතුරු මැද පළාත. දිස්ත්‍රික්ක දෙකේම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා පොදු අපේක්ෂකයා හැටියට සියලු පක්ෂ එකතු වෙලා ඉල්ලන කොටත් මහින්ද රාජපක්ෂ මහත්මයා පළාතක් හැටියට 420 කින් ජයග්‍රහණය කරලා තිබෙනවා. අද මීට වැඩිය හාත්පසින් වෙනස්. අද මේ උතුරු මැද පළාතයි, සබරගමු පළාතයි ජයග්‍රහණය කරන්න බැරිව ගියොත් ඒකට මුහුණ දෙන්න වෙන්නේ එක්සත් ජාතික පක්ෂයටයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටයි. මොකද අපි හොඳාකාරවම දන්නවා. උතුරු මැද පළාතේ අද විසුරුවලා ඡන්දයකට ගිහිල්ලා ඡන්දය පරාජය වුණොත් එක පැත්තකින් පක්ෂ දෙකකටම බලපානවා. පක්ෂ දෙකේ නායකයෝ දෙන්නාම වග කියන්න ඕනෑ. අන්න ඒ නිසා මේ විසි වැනි සංශෝධන පනත් කෙටුම්පත එවලා, මේ විසුරුවීමේ බලය නිශ්චිත දිනයක් නැතිව ලබා දෙන ලෙස ඉල්ලීම කරන්නේ, මේ පළාත් සභා නවයම අත්‍යවශ්‍ය වෙලාවක අවසන් දිනය නිශ්චිත දිනයක් හැටියට නම් කරලා පළාත් සභා නවය විසුරුවා හරින්නයි.

මොකද, අද රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා තැනින් තැන රැස්වීම්වලට ගියාම ප්‍රකාශ කරනවා, තව අවුරුද්දකින් පළාත් සභා විසුරුවනවා කියලා. පළාත් සභා විසුරුවලා පළාත් පාලනය තිබෙන ක්‍රමයටම මැතිවරණ සංශෝධනය කරලා, කොට්ඨාශ ක්‍රමයට ඡන්දය පවත්වනවා කියලා එතුමා පැහැදිලිව කියනවා. එතකොට ලබන අවුරුද්දේ මේ පළාත් සභා නවය විසුරුවා හැරියොත් යම්කිසි දිනක නැවත පනත සංශෝධනය කරලා මැතිවරණ ක්‍රමය වෙනස් කරලා තිබෙන තුරු කාලසීමාවක් නැහැ. ඒ කාලසීමාව මේ පළාත් පාලනය වාගේම අවුරුද්දක්, දෙකක්,

දෙකහාමාරක්, තුනක් වෙන තුරු යන්න පුළුවන්. ඒ බලය තමයි පාර්ලිමේන්තුව ඉල්ලන්නේ. එතකොට කාටද කියන්න පුළුවන් 2017 හෝ 2017 දෙසැම්බර් මාසයේ 31 වැනිදා ඡන්දය තිබෙනවා කියලා නිශ්චිතව ප්‍රකාශ කරන්නේ කවුද? මේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා පත්තරයක් දිහා බලාගෙන කිව්වාට, තවත් මන්ත්‍රීවරු දින වකවානු කිව්වාට, ගරු ප්‍රධාන ඇමැතිතුමා මාස 06 ක් පෙර ගන්න කියලා කිව්වාට කාටද නිශ්චිතව එහෙම කියන්න පුළුවන්, පළාත් සභාව විසුරුවන දවස කවදාද කියලා. නිශ්චිත දිනයක් නැහැ. නිශ්චිත දිනයක් නැති නිසා තමයි බලය ඉල්ලන්නේ, ඕනෑම අවස්ථාවක මේක විසුරුවා අරින්න.

අනික ඉතිහාසයේ අපි ගත්තොත් එහෙම ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලසීමාව තුළ දී, රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලසීමාව තුළ දී, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාලසීමාව තුළ දී, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලසීමාව තුළ දී එකම පළාත් සභාවක්වත් එකම දිනයක කවදාවක්වත් පවත්වලා නැහැ. එක්සත් ජාතික පක්ෂය 1988 පළාත් සභා පිහිටුවන අවස්ථාවේ මැතිවරණ පැවැත් වූයේ වයඹ, උතුරු මැද, ඌව, සබරගමුව 1988.04.28 වැනිදා. බස්නාහිර, මධ්‍යම පැවැත් වූයේ 1988.06.02 වැනිදා. දකුණ පැවැත් වූයේ 1988.06.09 වැනිදා. උතුර සහ නැගෙනහිර පැවැත් වූයේ 1988.11.19 වැනිදා. මේ පළාත් සභාව තිබුණත් පළාත් සභාව පිහිටෙව්වේ - අපි කවුරුත් දන්නවා, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනැල්ලා උතුර - නැගෙනහිර ජනවාර්ගික ප්‍රශ්නයට මේ පළාත් සභා පිහිටුවන්න අත්‍යවශ්‍ය වුණත් අවුරුදු 20 ක් නැගෙනහිර පළාත් සභාව පිහිටුවලා තියාගන්න බැරිව ගියා. අවුරුදු 25 ත් උතුරු පළාත් සභාව තියාගන්න බැරිව ගියා. 1988 පළාත් සභාව පිහිටුවලා නැගෙනහිර පළාත, උතුරු පළාත 11 වැනි මාසයේ 19 වැනිදා අවුරුද්දකට වැඩි කාලයක් තුළ දී පළාත් සභාව විසිරුවා හැරියා. නැවත නැගෙනහිර පළාත් සභාව පිහිටෙව්වේ 2008.04.10 වැනිදා. දෙවැනි පාර තිබුණේ 2012.09.08 වැනිදා. උතුරු පළාත් සභාව නැවත පිහිටෙව්වේ අවුරුදු 25 කට පස්සේ 2013.09.21 වැනිදා. ඒ නිසා -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මහජන නියෝජිතයන් නම් කළේ. පළාත් සභා තිබුණා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඡන්දයක් තිබ්බද මහජන නියෝජිතයන් පත් කරන්න? ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි කල්පනා කරන්නේ මේ වාගේ මැතිවරණ එකම දිනයක පවත්වනවා නම් හිටපු ජනාධිපතිවරුන්ගේ කාලසීමාව තුළ දී අද වන කොට පළාත් සභා පිහිටුවලා අවුරුදු 30 ක්. මේ අවුරුදු 30 තුළම කිසිම කෙනෙකුට උවමනාවක් වුණේ නැහැ, එකම දිනයක පවත්වන්න. දැන් මේ ඉල්ලන්නේ ඇයි? දැන් මේ ඉල්ලන්නේ වෙන මොකුත් නොවෙයි. පළාත් පාලන මැතිවරණය කල් දදා පළාත් පාලන ආයතන විසුරුවා හැරියා වාගේම මේ පළාත් සභා නවයත් විසුරුවලා, කල් අරගෙන මැතිවරණ නොපවත්වනවා කියන එක පැහැදිලිව අද ඔප්පු වෙලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා විරුද්ධයිද මේකට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විරුද්ධයි. අපි එදත් විරුද්ධයි. අපි පළමුවැනි දවසේ අපි මහ ඇමැතිතුමාට කිව්වා - අද ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කියපු එක හරී. 21 වැනිදා මේ පනත සම්මත කරන්න මතය විමසන්න කියලා ගෙනාපු දවසේ, අපි එදා කථා කරලා මේක විමසමු කියලා කිව්වා. දවස් 14 න් 14 ට දෙපාරක් කල් දා ගත්තා. එතුමා කිව්වා වාගේ අද වන විට නැවතත් කැරකිලා ආවේ එතැනටම තමයි. අපි එදා විරුද්ධ වුණේ ඇයි? කල් දානවාට විරුද්ධ වුණා. ගිය පාර ආණ්ඩුකාරතුමා ලිඛිතව ලිපියක් එවපු නිසා අපි ඒකට කැමැති වුණා. නමුත් අද අපි පැහැදිලිව කියනවා. මේ පළාත් සභා විසිවන සංශෝධන පනතට අපි විරුද්ධයි. සංශෝධන ගෙනාවත්, නැති වුණත් අපි මේ පනතට විරුද්ධයි. පනතට විරුද්ධ වන්නේ වෙන මොකුත් නිසා නොවෙයි. මෙතැන ඉන්න සියලු ගරු මන්ත්‍රීවරු කථා කළා. මීට ඉහත මේ පළාත් සභාවේ බලය ලබා ගැනීමට එක එක පනත් ඉදිරිපත් කළා කියලා. ඒ බලය ගත්තේ එක එක විෂයයන්වලට වෙන්න ඇති. නමුත් මේ බලය ගන්නේ ඒකට නොවෙයි. මේ බලය ලබා ගන්නේ නිශ්චිත දිනයක් ඇතුළුව මේ පළාත් සභා විසිරීමේ බලය, පළාත් සභා විසුරුවායින් පස්සේ නැවත පිහිටුවන තුරු පරිපාලනය

[ගරු මෙරිල් පෙරේරා ]

කිරීමේ බලය ඒ වාගේම මේ හයවැනි පළාත් සභාවට විතරක් නොවෙයි. අපේ අධි නීතිඥ ගරු පළාත් සභා මන්ත්‍රී නාත් ම.පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඉදිරියේ එන සෑම පළාත් සභාවකටම විසුරුවා හරින්න බලයත් එක්ක තමයි මේ බලය ගන්නේ. එක බලයක් නොවෙයි. නිශ්චිත දිනයක් නැතිව පාර්ලිමේන්තුව බලය අරගෙන විසුරුවා හැරීමේ බලය, නැවත පිහිටුවීමේ බලය කාලසීමාව තුළ පරිපාලනය කිරීමේ බලය, හත්වැනි පළාත් සභාව පිහිටෙව්වොත් එයත් විසුරුවා හැරීමේ බලයත් එක්ක තමයි මේ පළාත් සභාවේ බලය ගන්නේ කියන එක පැහැදිලිව ගරු මන්ත්‍රීවරුන්ට මතක් කරනවා.

ඒ නිසා අපට මේකට එකඟ වෙන්න බැහැ. මෙතැන ගරු මන්ත්‍රීවරු කිව්වා, ඒ කාලසීමාවේ හිටපු පක්ෂ නායකයන්ගේ ඉල්ලීම්වලට එක් එක් පනත්වලට, විෂයයන්වලට ඡන්දය ලබා දුන්නා. අද ඒක තමයි එක්සත් ජාතික පක්ෂයටත් කරන්න වෙලා තිබෙන්නේ. අපි එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ, එතුමාගේ ආණ්ඩුව කාලයේ මහ ඇමැතිතුමාට මෙතැන පනතක් සම්මත කරන්න කිව්වාම එක සම්මත කළා. අපි නැහැයි කියන්නේ නැහැ. අද මෙතුමාට එවලා තිබෙන්නෙත් ඒ නිසාම තමයි. නමුත් මේ පළාත් සභාවේ බලය පාවා දීමේ - එක පැත්තකින් ජනාධිපතිතුමාට, එක පැත්තකින් ආණ්ඩුකාරතුමාට, එක පැත්තකින් මහ ඇමැතිතුමාට අවසරය ඇතිව, කැමැත්ත ඇතිව විසිරීමේ බලය තිබෙන එක අද ගෙඩිය පිටින්ම පාර්ලිමේන්තුවට ලබා දෙනවාට අපි විරුද්ධයි. අපට කවදාවත් මෙහෙම පනතක් ඉතිහාසයේ ඇවිල්ලා නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පළමුවැනි දවසේ අපි කල් දානවාට විරුද්ධ වුණා. නැවතත් කියනවා, දෙවැනි දවසේ ගරු ආණ්ඩුකාරතුමාගේ ලිපිය සලකලා අපි කල් දුන්නා. නමුත් අද අපි සියලුම මන්ත්‍රීවරු හැටියට - මම දන්නේ නැහැ. මගේ මතය නම් මම සම්පූර්ණයෙන්ම විරුද්ධයි. සංශෝධන තිබුණත්, නැතත් විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාටම බොහොම ස්තූතියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ඉතා විද්වත් මන්ත්‍රීතුමන්ලාගේ සාකච්ඡා, විවාද රාශියකට මුහුණ දීලා ඒවා හොඳාකාරව අහගෙන ඉඳලා, ඒ වාගේම පරිණත දේශපාලන නායකයින්ගේ කථා රාශියකට ඇහුම්කන් දීලා මේ කථාව කරන්න අවස්ථාවක් ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. දැන් මා පළමුකොටම කියන්න ඕනෑ. මේ එකසිය ගණනක් මන්ත්‍රීවරු සිටියත් මම හිතන්නේ අද 100 ක්වත් සහභාගි වෙලා නැහැ. පළාත් සභාව ගැන ඉතාම උනන්දුවෙන්, ඉතාම වගකීමෙන් කරුණු රාශියක් ඉදිරිපත් කෙරුවා. මා පළමුකොටම පුදුමයට පත් වෙන්නේ නැහැ. මේ පළාත් සභාව 1987 ගේන්න හදන කොට බිම පෙරළිලා බඩ පිනුම් ගහලා මේක එපා කියපු කට්ටිය අද මේ පළාත් සභාව විසුරුවා හැරපු අවස්ථාවක පාර්ලිමේන්තුව මේකේ යම්කිසි බලයක් අතට ගන්නවා කියලා කෑ මොර ගහනවා. මම හිතන්නේ දෛවයේ සරදම දැන් අද කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා, මේ සියලුදෙනාටම පළාත් සභා ශක්තිමත් කරන්න ඕනෑ. මේ බලය ආරක්ෂා කරන්න ඕනෑ කියලා.

ගරු සභාපතිතුමනි, මම මේ ගරු මන්ත්‍රීතුමන්ලාට කියන්න කැමැතියි. අපි අවුරුදු ගණනකට එහා පැත්තේ දුර දැකලා, මේ එක්සත් ජාතික පක්ෂය අවුරුදු ගණනකට එහා දුර දැකලා තමයි මේ පළාත් සභා පිහිටෙව්වේ. එදා මේකට බඩ පිනුම් ගහපු මිනිස්සු තමයි දැන් මේ පාර්ලිමේන්තුව පොඩි කාලයකට යම්කිසි පාලනයක් කරන එකට විරුද්ධව කථා කරන්නේ. එහෙමනම් තමුන්නාන්සේලාගේ හෘද සාක්ෂියෙන් අහන්න. එදා බඩ පිනුම් ගැහුවේ දන්නේ නැතිවද? එහෙමනම් දැන් බඩ පිනුම් ගහන්නේ දන්නේ නැතිවද? කියලා. ඒ වාගේම මම කියන්න ඕනෑ. නීතිමය වශයෙන් ගත්තොත් මේ රටේ ඒකීය රාජ්‍යයක් පවතින කොට උත්තරීතර පාර්ලිමේන්තුව තමයි බලගතු වෙන්නේ. උත්තරීතර පාර්ලිමේන්තුවට පුළුවන් ඒ රටට අවශ්‍ය වන අවස්ථාවන්වලදී යම් යම් තීන්දු ගන්න. මේ කවුරු මොනවා කිව්වත් අපේ රටේ සම්ප්‍රදායක් තිබෙනවා, නළුවෙක් ඡන්දය ඉල්ලුවොත් ආයි ලස්සනයි. ඇස් සුදුයි. මුහුණ අත ගාලා ඡන්දය දානවා. නිළියක් ඡන්දය ඉල්ලුවොත් ආයි බබා ෂෝක් මටත් හදිස්සියකට ගෙන්න ගන්න පුළුවන් කියලා ඡන්දය දානවා. ඒ වාගේ තමයි මේ මුළු පළාත් සභාවම අද මේ බලතල ගැන කථා කරනවා. ඉතින් එහෙම මානසිකත්වයක් තිබෙන තැන්වලින් තමයි මේ මන්ත්‍රීවරු පත් වෙලා ඇවිල්ලා ඉන්නේ. එහෙම මානසිකත්වයක් තිබෙන පළාත්වලින් තමයි ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා හායි ගාලා කවුරු හරි කියන කොට හා...යි. කියලා ඒකට එකඟ වෙනවා.

එහෙමනම් මම කියනවා, මම මීට වැඩිය වෙනස් මතයක් දරන්නේ. එහෙමනම් බලන්න ඉතිහාසයේ මේ ලංකාව පිටරැටියන්ට යටත් වෙලා තිබෙන කොට හයිය තිබෙන මිනිස්සු තමයි රට පාලනය කෙරුවේ. ශක්තිය තිබෙන ආණ්ඩු තමයි ඇවිල්ලා රාජ්‍යයන් අත්පත් කරගෙන තමුන්ගේ බලය ප්‍රකාශ කෙරුවේ. 1948 අපි නිදහස ගත්තා කියලා කිව්වාට එතකොටත් අපේ වරායවල්වල, එතැනින් එහාට ගුවන් තොටුපලවල්වල බ්‍රිතාන්‍ය යම් අධිකාරියක් පවත්වාගෙන ගියා. නිදහස දුන්නා කිව්වාට. ඊට පස්සේ අපි ක්‍රම ක්‍රමයෙන් ව්‍යවස්ථා හැදුවා. 1972 ව්‍යවස්ථා හැදුවා. 78 හැදුවා. දැන් විසි වන සංශෝධනය ඇවිත් තිබෙනවා. 78 ව්‍යවස්ථාව ගේන කොටත් බඩ පිනුම් ගැහුවා, මේ විධායක බලය අහෝසි කරන්න ඕනෑය කියලා. මේ රජයේ පරමාධිපත්‍යය ගැන කථා කරන්න ගිහිල්ලා තමුන්නාන්සේලා - අනේ! මේ කථා කරපු මන්ත්‍රීතුමන්ලාට මේ සුපිරිසිදු දේශපාලනය බඩ යනවා. හැබැයි, 2005 දී දෙමළ මිනිස්සුන්ට ඡන්දය දාන්න දුන්නේ නැහැ. දාපු එක මිනිහාගේත් අත කැපුවා. එහෙම මිනිස්සු තමයි මෙතැන මේ සුපිරිසිදු දේශපාලනය ගැන කථා කරන්නේ. අත කපලා දැම්මා. එහෙමනම් මම කියන්න කැමැතියි ගරු සභාපතිතුමනි, 2005 ජනාධිපතිවරණයේ එක ඡන්ද ලක්ෂයකින් තමයි බලය අරගෙන අවුරුදු 20 ක්, දශක දෙකක් මේ රට පාලනය කළේ. අද අපි අවුරුදු දෙකයි මේ පාලනයට ඇවිල්ලා. ඊත් හවුල් ආණ්ඩුවක් තිබෙන්නේ. අද මේ අත දික් කරලා කෑ ගහන්නේ මේ ආණ්ඩුවට.

එහෙමනම් මම කියනවා ගරු සභාපතිතුමනි, මෙතැන මේ නීතියවත්, සංශෝධනයවත් නොවෙයි වැරැද්ද තිබෙන්නේ. විධායක ක්‍රමයේවත්, එහෙම නැත්නම් මේ බලය කෙහෙද තිබෙන්නේ කියලවත් නොවෙයි. යම්කිසි පුද්ගලයෙක් බලයට පත් වුණාම ඒ පුද්ගලයා ක්‍රියා කරන ආකාරයෙයි බලය තිබෙන්නේ. විධායක බලයේ වැරැද්දක් නැහැ. හැබැයි ඒ විධියක බලය ක්‍රියාත්මක කරන්න බැරි වෙලාවක්වත් නුසුදුස්සෙක් ආවොත්, එතැනින් තමයි රජය වැරැදි විධියට ක්‍රියා කරන්නේ. එතැනින් තමයි මහජනයාට අහිතකර තීන්දු ගන්නේ. එහෙමනම් ගරු සභාපතිතුමනි, අපි කියන්න කැමැතියි. මම මේ ගරු මන්ත්‍රීතුමන්ලා කියපු කථා සියල්ලටම ඇහුම්කන් දුන්නා. මේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කියනවා, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කියනවා, මේ පළාත් පාලන ඡන්දය කල් ගත්තා වාගේ පළාත් සභා ඡන්දය දිගටම ඇදන් යන්න යනවා කියලා. මම කියනවා මේ එවපු සංශෝධනය හරියට කියෙව්වා නම් මේකේ තිබෙනවා. "*අවසානයට විසිරෙන පළාත් සභාවේ දිනයට පසු දිනයක් වෙන්නේ නැහැයි*" කියලා. ඒ කියන්නේ මේ කිසිම වෙලාවක ඇදගෙන යන්නේ නැහැ. ඇදගෙන යන්න බැහැ. ඒ වාගේම මේකේ කියනවා, මේ නිශ්චිත දිනය. නිශ්චිත දිනය දක්වා තිබෙන පළාත් සභා දික් වෙනවා. හැබැයි, ආණ්ඩුකාරවරයා මැදිහත් වෙලා, මහ ඇමැතිවරයා විමසලා එහෙම නැත්නම් පරිපාලනය අඩාල වුණොත්, ඒ විසුරුවන අවස්ථාවක විතරයි පාර්ලිමේන්තුව මැදිහත් වෙන්නේ. හොඳයි මම අහනවා. අපි නිශ්චිත දිනයක් නියම කරලා අපි ඡන්දය තියනවා. හදිසියේ පරිපාලනය අඩාල වෙලා යම් පළාත් සභාවක් විසුරුවා හරින්න සිද්ධ වෙනවා. එදාට ඒ පළාත් සභාවේ බලය එහෙමනම් කවුද ගන්නේ? එදාට මේ නීතිය හරියට සම්මත කරලා තිබුණේ නැත්නම් එදාට තව නීතියක් සම්මත කරන්න වෙනවා. එහෙමනම් ඒ උත්තරය තමයි මේ පනත සංශෝධනය කරලා තිබෙන්නේ. අපි හිතමු, අප්‍රේල් මාසයේ 25 වන කොට හැම අවුරුද්දේම හැම පළාත් සභාවක්ම තියනවා. එදා අයවැය පරිදිනවා. පවත්වාගෙන යන්න බැරි වෙනවා. විසුරුවන්න වෙනවා. එදාට පාලනය කරන්නේ කවුද? එදාට ඒ පළාත් සභාවේ වැඩ බලන්නේ කවුද? එලෙස බැරි වෙන වෙලාවකදී තමයි පාර්ලිමේන්තුව අත දානවා කියලා කියන්නේ. අනික් හැම වෙලාවේම අවුරුදු පහෙන් ඡන්දය තියනවා. මේක වටහා ගන්න තරම් මොළයක් මේ කට්ටියට තිබුණේ නැති එක ගැන මට කනගාටුවක්, ඇත්ත වශයෙන්ම.

ඒ වාගේම ගරු සභාපතිතුමනි අපි කියන්නට ඕනෑ, මේ ව්‍යවස්ථා සම්මත කිරීම ගැන අද මේ පාරම්බාන කට්ටිය 18 වන සංශෝධනය ලංකාවේ ගේන කොට අනේ දෙසැරයක් ජනාධිපති වෙලා ඊට පස්සේ බැහැයි කියලා කියන කොට, ජීවිතාන්තය දක්වාම ජනාධිපති වෙන්න

අවශ්‍ය නීති සම්මත කරගන්න කොට, මේ වාගේ කෑ කෝ ගහන අතිශය ප්‍රජාතන්ත්‍රවාදය කථා කරන මේ වාමාංශික පක්ෂවල කාටවත් ඇස් තිබුණේ නැද්ද? කන් තිබුණේ නැද්ද? කියලා අහන්න සිද්ධ වෙනවා. අපට අහන්න සිද්ධ වෙනවා. එහෙමනම් මම කියන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, අපි මෙතැන දේශපාලන පක්ෂයකට ලකුණු දාන්න නොවෙයි. අපි මෙතැන කරන්න ඕනෑ මොකක්ද? මහජනතාව ලක්ෂ ගණනක් වියදම් කරලා මේ පළාත් සභාව පවත්වනවා. ලක්ෂ ගණනක් වියදම් කරලා පාර්ලිමේන්තු පවත්වනවා. 1948 සිට අපි තවමත් ව්‍යවස්ථා හදනවා. අද මම ගරු ජනාධිපතිතුමාගේ, ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරන්නේ, මේ වෙලාවේ ජනතාව බලය දීලා තිබෙනවා නම් එතුමන්ලා මේ රටේ ඉස්සරහාට ගන්න ඕනෑ. මේ ආණ්ඩුව අද කරන්නේ මොකක්ද? දශක දෙකක් විකෘති කරලා තිබුණු, දශක දෙකක් තිස්සේ විනාශ කරලා තිබුණු ඒ දේශපාලනය යථා තත්ත්වයට පත් කරනවා. ප්‍රකෘති තත්ත්වයට පත් කරනවා. ඒකයි මේ කරන්නේ.

ගරු සභාපතිතුමනි, මම කියනවා. යම්කිසි ළමයෙක් ඉපදුණාම මේ ළමයාව කළුවර කාමරයක තියලා අරාබි භාෂාව විතරක් අහන්න සැලැස්සුවොත් අරාබි භාෂාව විතරයි කථා කරන්න පුළුවන්. සමාජය දකින්නේ නැහැ. වෙන භාෂාවල් කථා කරන්න බැහැ. ඒ වාගේ දශක දෙකක් තිස්සේ මේ අයව වහලා තිබ්බා. ඒකයි කොඩිකාර මන්ත්‍රීතුමාගේ භාෂාව අපට තවමත් තේරුම් ගන්න බැරි කියලා මම කියනවා. ඒ නිසා තමුන්නාන්සේලාට මම කියනවා. ඇස් දෙක ඇරලා බලන්න. හොඳට කන් දෙකෙන් ඇහුම්කන් දීලා බලන්න. තමුන්නාන්සේලා කළුවර කාමරයක අවුරුදු 20 ක් හිර වෙලා හිටපු මිනිස්සු. අද තමයි මේ මන්ත්‍රීතුමන්ලාට වාගේ ප්‍රජාතන්ත්‍රවාදී අදහස් කියන්න, එකම පක්ෂය අස්සේ ඉඳගෙන ඕනෑ දෙයක් කියන්න ඉඩ දීලා තිබෙන්නේ කියලා අපි තමුන්නාන්සේලාට කියනවා. තමුන්නාන්සේලා කළුවර කාමරයෙන් තවම ජනේලය ඇරයා විතරයි. තවම -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමා, කළුවර කාමරයේ සැප වැඩියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තවම ජනේලෙන් එබෙනවා. (බාධා කිරීම්) ඒ නිසා කියනවා. එදා පළාත් සභාවල් වෙන වෙනම තිබෙන කොට රජයේ වාහන ටික ගෙන ගියා. අපට මතකයි, සිල් රෙදි බෙදුවා. අපට මතකයි, අයන් එක බෙදුවා. අපට මතකයි, ෆෑන් එක බෙදුවා. අපට මතකයි, මේ පළාත් සභාවේ ඇමැතිවරු ලොරි ගණන් බඩු ගෙනිහින් බෙදුවා. එහෙම තමයි ඌවට ගිහිල්ලා ඡන්දය දිනුවේ. එහෙමනම් ගරු සභාපතිතුමනි, මම කියනවා. ලොරි ගණන් බඩු පටවලා තැන් තැන්වල ගිහින් ඡන්දය දිනන්න බැරි වෙන්නයි, මේ ආණ්ඩුව මේවා කරන්නේ. එහෙමනම් මීට පස්සේ තමුන්නාන්සේලාට ලොරි ගණන් බඩු ගෙනියන්න දෙන්නේ නැහැ. සල්ලි මිටි ගණන් ගෙනි යන්න දෙන්නේ නැහැ. සිල් රෙදි ගෙනියන්න දෙන්නේ නැහැ. එහෙමනම් තමුන්නාන්සේලාට අපි කියනවා. අර නිලියක් එන කොට හායි ගාලා ඡන්දය දෙනවා වාගේ විරුද්ධ වෙන්නත් යන්න එපා. නළුවෙක් එන කොට හූයි ගාලා ඡන්දය දෙනවා වාගේ එකහ වෙන්නත් එපා. බුද්ධියෙන් මේ දිහා බලන්න කියමින් සියලු දෙනාටම බුද්ධිමත් දේශපාලනයක් පහළ වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඉතාමත් වේගවත් කථාවක් කළා. හැබැයි, කියපු දේවල් ගොඩක් මට තේරුණේ නැහැ. කොඩිකාර ගරු මන්ත්‍රීතුමා වාගේම තමයි කථා කළේ. අවසාන පිළිතුරු කථාවට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ආරාධනා කරනවා. ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අපේ පළාත් සභාවේ දිනක කරන ලද විවාදයක් සම්බන්ධයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගම විවාදය.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දිගම විවාදය පැවැතුණේ මම හිතන්නේ අද තමයි. ඒකෙන් පැහැදිලි වෙනවා, මේ විසිවන සංශෝධනය පිළිබඳව පාලක පක්ෂය වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේත් විශාල උනන්දුවක් මේ සම්බන්ධයෙන් තිබිලා තිබෙනවා. අපිත් ඒකට එකඟ වුණා. මොකද, හැම මන්ත්‍රීවරයෙක්ටම තමන්ගේ අදහස මේ යෝජනාව සම්බන්ධයෙන් සටහන් කරන්න ඕනෑ කියලා. මොකද, මේ යෝජනාව අපි හෙට කෙටුම්පත් කරලා මේක අපි අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ වාගේම පාර්ලිමේන්තුවටත් යවනවා. ඒ නිසා අපි මෙතැනට, අද මේ සභාවට පැමිණිනු සෑම මන්ත්‍රී කෙනෙක්ටම ඒ සඳහා අපි අවස්ථාවක් දුන්නා. ගරු සභාපතිතුමනි, දීර්ඝ වශයෙන් කථා කරන්න මම උත්සාහ කරන්නේ නැහැ. අපි දීර්ඝව විවාදයකට මේක පත් කරපු නිසා. ඒ නිසා මම හිතන්නේ අද උදෑසන ඔබතුමා විසින් න්‍යාය පත්‍රයානුකූලව විමසන කාරණයට අනුව ඉතාමත්ම පැහැදිලි සංශෝධන යෝජනාවක් මා විසින් මේ සභාවට ලබා දුන්නා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා. අපි උදේ එකඟ වුණු පරිදි බෙදීමකින් තොරව - මේ විසිවන ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව බස්නාහිර පළාතේ මතය අතිගරු ජනාධිපතිතුමා වෙත යැවීම සඳහා මේ සභාවේ එකඟතාවය බෙදීමකින් තොරව ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

*අ.භා. **03.27** ට විවාදය අවසන් විය.*
*General debate came to a close at 03.27 p.m*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමාට බොහොම ස්තුතියි. කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා ආසනවලට යන්න. මෙතුමා අවසානයට කථා කරලා තිබෙන්නේ. ආයේ කථා කරන්න බැහැ නේ. එතුමා කථා කරලා අවසානයි නේ. එතුමාට දුන්නේ අපි. හරි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීමෙන් පසුව මම හිතන්නේ පළාත් සභාවේ මෑත ඉතිහාසය තුළ දීර්ඝ වශයෙන්ම සාකච්ඡා වුණු යෝජනාවක් වශයෙන් සනිටුහන් වෙනවා. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා රාශියක් කතා කළා. හරවත් දේශන කිහිපයකට ඇහුම්කන් දෙන්න ලැබුණා. ඒ වාගේම ආණ්ඩු පක්ෂයෙනුත් කථික ලැයිස්තුව මම හිතන්නේ 30 ක් විතර ලබා දීලා තිබුණා මුලින්ම. නමුත් මම විශ්වාස කරනවා, සෑහෙන පිරිසක් කථා කළා. අදහස් දැක් වූවා. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමා අවසාන වශයෙන් ඉල්ලා සිටියා. මේ සම්බන්ධව සභාවේ බෙදීමකින් තොරව මේකට එකඟ වෙන්නය කියලා ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කළා. ඒ නිසා මේ අවස්ථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව සභාවේ බෙදීමක් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඔබතුමා හිටියේ නැහැ. කථා පවත්වන හැමකෙනාම - මේකේ සමහර අය විරුද්ධයි. සමහර අය විරුද්ධ නැහැයි කිව්වා. අපි විරුද්ධත්වය ප්‍රකාශ කරලා තිබෙන්නේ. ඒ නිසා එතුමා සංශෝධනයන්ට යටත්ව සභාගත කරනවා නම් අපි සභාවෙන් නැඟිටලා යනවා. මොකද අපි එදා පළමුවැනි දවසේ කරපු විරුද්ධත්වය එහෙම ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ නිසා අපි එතුමා සභාගත කරලා එතුමාගේ සංශෝධනයන්ට යටත්ව මේක සභාගත කරලා කැමැත්ත ප්‍රකාශ කරනවා නම් කැමැත්ත ප්‍රකාශ කරන්න. අපි සභාවෙන් පිටව යනවා. අපි විරුද්ධයි. අපි විරුද්ධයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බෙදීමක් තිබෙනවා කියලා කෙලින් කියන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කෙලින් කියන්න. කෙලින් තමයි කථා කරන්නේ. අපිත් කෙලින් තමයි කථා කරන්නේ. හැංගී හොරා ඕනෑ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕක ඔච්චර දුරදිග යන්න ඕනෑ නැහැ. ඔච්චර දුරදිග යන්න අවශ්‍ය නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ සභාවට පනත නේ ඉදිරිපත් කෙරුවේ. එතකොට පනත සංශෝධන කරන්න බැහැ. ඒක පැහැදිලිවම මේ හැම මන්ත්‍රීවරයාම කිව්වා නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බෙදීමක් ඉල්ලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමාත් ඉල්ලා සිටියේ ඒකයි. මේ බලතල සම්බන්ධව සභාවේ බෙදීමකින් තොරව එතුමාට දෙන එකඟතාවය. ඒ නිසා මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පැහැදිලියි එතුමාගේ විරෝධතාවයක් තිබෙන නිසා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මට ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට සිද්ධ වෙනවා, සභාවේ එකඟතාවය ගන්න. මට ඒක -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

*[නැඟී සිටියේය. ]*
*[Stood.]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. ඔබතුමා වාඩි වෙන්න කෝ. නැහැ, නැහැ, මේ වෙලාවේ කථා කරන්න දෙන්න බැහැ. මේ වෙලාවේ කථා කරන්න දෙන්න බැහැ. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. වාඩි වෙන්න. වාඩි වෙන්න. වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා, වාඩි වෙන්න. මම මේ ගරු සභාවෙන් ඉතාමත්ම පැහැදිලිව අහන්නේ - මට ගරු සභාවෙන් තවම පැහැදිලි වීමක් නැහැ. දැන් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන්නේ ඔබතුමා බෙදීමක් -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

වැරැදීමක් තිබෙන්නේ. මේ සභාවේ බෙදීමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔව් ඉතින් -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හරි. ඒ සංශෝධනයට එකඟයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා බෙදීමක් ඉල්ලනවා නේ?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, සභාවේ බෙදීමක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි බෙදීමක් නොවෙයි කිව්වේ. අපි විරුද්ධත්වය ප්‍රකාශ කරලා තිබෙන්නේ. ඔබතුමාගේ තමයි ඡන්දය විමසන එක. අපි බෙදන්න ඉල්ලලා නැහැ නේ? අපි විරෝධය පළ කරලා යනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම ලෙස්සලා යන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විරුද්ධයි කියන්නෙත් බෙදීමක් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔව්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙරිල් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පක්ෂ නම්, පක්ෂයි කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බෙදීමක් ඉල්ලන්නද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොරුවට ලෙස්සලා යන්න -

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම බෙදීමක් ඉල්ලුවේ නැහැ නේ? මම මෙතැනින් යනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විරුද්ධ නම්, විරුද්ධ වෙන්න. පක්ෂ නම්, පක්ෂ වෙන්න. ලෙස්සලා යන්න එපා. ලෙස්සලා යන්නේ ඇයි? මොකද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි විරුද්ධත්වය ප්‍රකාශ කරලා තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකක්ද දෙකක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බෙදීමක් නැත්නම් අපට -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙත් බෙදීමක් නැහැ නේ? මෙහෙත් නැහැ නේ? එච්චරයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

බෙදීමක් නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

බෙදීමක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පක්ෂයි. පක්ෂයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ යෝජනාව සම්බන්ධව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔක්කොම පක්ෂයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බෙදීමක් නැහැයි කියලා ගරු විපක්ෂ නායකතුමාත් කියනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විසිවන සංශෝධනයට ඔක්කොම පක්ෂයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂ නැහැ අපි. පක්ෂ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔක්කොම පක්ෂයි. සියලු දෙනා පක්ෂයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂ නැහැ. පක්ෂ නැහැ, අපි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එහෙමනම් බෙදීමක් ඉල්ලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පක්ෂ නැහැයි කියනවා නේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියනවා බෙදීමක් නැහැයි කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙරිල් මන්ත්‍රීතුමා හැර අනික් ඔක්කොම පක්ෂයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

බෙදීමක් නැහැ. මේ අපි කාගෙවත් බෙදීමක් නැහැ. හරි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි විරුද්ධයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

විරුද්ධ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොරුවට විරුද්ධයිලු.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, පැහැදිලිව අහගන්න. අපි එවපු පනතට විරුද්ධයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි නොවෙයි. මම.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි ඔය පනතට විරුද්ධයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි නොවෙයි. මම, මම.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතකොට කියලා දෙන්න එපැයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි,

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම බැහැ. මම විරුද්ධයි කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සංශෝධන පනතට විරුද්ධයි. මහ ඇමැතිතුමා ගේන එකට ඡන්දය දෙනවා. ඒකට ඡන්දය තියන්න කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම විරුද්ධයි කියන්න. අපි විරුද්ධයි කියන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි,

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි,

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි පැහැදිලිව කථාවේදී කිව්වා, අපි මේ විසි වැනි සංශෝධන පනත මෙතැනට ගෙනාවට, ඒකට මත විමසන එකට විරුද්ධයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ආ...ඉතින්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විරුද්ධයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එයා පක්ෂයි ඒ කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමා ඉල්ලීම කරන්නේ මේක බෙදීමකින් තොරව සභා සම්මත කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මහ ඇමැතිතුමාගේ සංශෝධනවලට, ඒකට ඡන්දයක් විමසන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකයි උවමනාව තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මත විමසනවාට විරුද්ධයි කියන්නේ පක්ෂයි. මත විමසනවාට විරුද්ධයි කියන්නේ පක්ෂයි නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂ නැහැ. විරුද්ධයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඕක තමයි මහ ඇමැතිතුමාට - බෙදීම ඉල්ලන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මත විමසනවාට විරුද්ධයි කියන්නේ ඔයා පක්ෂයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

බෙදීමක් ඉල්ලන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මත විමසන්නේ නැත්නම් පක්ෂයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඡන්දයක් තියන්න කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බෙදීමක් තිබෙනවා. සභාපතිතුමා බෙදීමක් තිබෙනවා. බෙදීමක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමා, අපි කථාවේදී පැහැදිලිව -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

බෙදීමක් තිබෙනවා කියලා කියනවා නේ? තියන්න. අපි දෙනවා සහයෝගය. –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා මෙතැන මේ මූලාසනය -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම මේ කරන ලද යෝජනාවට මේ සභාවේ අති බහුතරයක් එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එකඟයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඉතින් ඔබතුමා එකඟතාවය විමසන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් විමසුවා නේ? මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් මන්ත්‍රීතුමා තදින්ම කියනවා නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඡන්දයක් තියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හරියට තේරුම් ගන්න මේක. එතුමා ගෙනාපු සංශෝධනවලට එකඟයි. පනතට විරුද්ධයි අපි .

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් ඡන්ද දෙකකට යන්න ඕනෑ මට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඡන්ද දෙකක් විමසන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංශෝධනවලට එකඟතාව -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පොඩ්ඩක් ඉන්න කෝ. දැන් අපි ඉල්ලුවේ -

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමා,

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමා, සභා රීතිවලට අනුව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හරි. හරි. මෙරිල් විරුද්ධයි. අනික් ඔක්කොම පක්ෂයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, සභා රීතිවලට අනුව විවාදයක් අවසානයේදී -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර පොඩ්ඩක් වාඩි වෙන්න. පොඩ්ඩක් වාඩි වෙන්න. පොඩ්ඩක් ඉන්න. ගරු මන්ත්‍රීතුමා

කරුණාකරලා වාඩි වෙන්න. වාඩි වෙන්න. කරුණාකර පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, යෝජනා දෙකට ඡන්ද දෙකක් විමසන්න. මහ ඇමැතිතුමා ගෙනාපු සංශෝධනයට පක්ෂයි. පනතට විරුද්ධයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා නායකතුමා, පොඩ්ඩක් වාඩි වෙන්න කෝ. පොඩ්ඩක් වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

ඔබතුමා කිව්වාට විපක්ෂ නායකතුමා කියනවා නේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ඔබතුමා ජෝර්ජ් මන්ත්‍රීතුමා කියපු එක අහන්නේ නැතිව මේ ව්‍යවස්ථාවේ තිබෙන, මේ රීතිවල තිබෙන විධියට වැඩේ කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් මහ ඇමැතිතුමාගේ එකඟතාවය එතුමා ලබා දුන්නා. ඔබතුමා ලබා දුන්නා. නමුත් එක්සත් ජාතික පක්ෂයේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා බෙදීමක් ඉල්ලනවා. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් බෙදීමක් ඉල්ලනවා. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විරුද්ධතාවය දක්වනවා. ඒ විරුද්ධතාවය කියන්නේ බෙදීම තමයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අපි පැහැදිලිව මේ විවාදය කථා කරන කොට කිව්වා, විසිවන පනත සංශෝධන කෙටුම්පත එව්වාට මේකට අපි විරුද්ධයි. විරුද්ධයි නේ? කිව්වා නේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

විරුද්ධයි කියන්නේ බෙදීම.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂ නැහැ. විරුද්ධයි.

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

බෙල් එක ගහන්න. අද පෙන්වන්න බලය.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ විසිවන සංශෝධනය ඉදිරිපත් කරපු එක ගැන - මහ ඇමැතිතුමා ගෙනාපු සංශෝධනවලට පක්ෂයි. අපි පනතට විරුද්ධයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමා, විපක්ෂ නායකතුමයි මමයි එකඟ වෙනවා. මම කරපු සංශෝධනයට ඔබතුමා ඡන්දයක් ගන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සංශෝධන ඇතුළු සම්පූර්ණ වාර්තාවට.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඔව්. හරි. ගන්න ඉතින්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගන්න ඉතින්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සංශෝධන ඇතුළු සියලු වාර්තාවන්ට අපි සහයෝගය දෙනවා, මහ ඇමැතිතුමාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. කරුණාකර වාඩි වෙන්න. නිශ්ශබ්ද වන්න. තමන්ගේ ආසනවලට කරුණාකර යන්න. සීට්වලට යන්න. ගරු මන්ත්‍රීතුමන්ලාගේ ආසනවලට යන්න. ආනන්ද මන්ත්‍රීතුමා කරුණාකර ගිහින් වාඩි වෙන්න. මහේෂ් මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පුහුල් හොරා කරෙන් දැනේ, තමයි දැන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් මන්ත්‍රීතුමා ඔබතුමා ගිහිල්ලා වාඩි වෙන්න. වාඩි වෙන්න. ඔබතුමන්ලා ගිහින් වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අන්න මාරු වෙනවා. අන්න මාරු වෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද විසිවන සංශෝධනය පනත් කෙටුම්පත සහ සංශෝධන ඇතුළත්ව -

[සභාවේ ඝෝෂා]

කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමා, කියන එක ඇහෙන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභාව නිශ්ශබ්ද වන්න. කරුණාකර වාඩි වෙන්න. මන්ත්‍රීතුමන්ලා ආසනවලට යන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පනත් කෙටුම්පත පිළිබඳව එතුමාම සංශෝධන කිහිපයක් ඉදිරිපත් කළා. එතකොට ඒ සංශෝධන පිළිබඳව සභාවේ එකඟතාවය මට ඉදිරිපත් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඒක වැරැදියි නේ? දැන් අපි කිව්වා නේ. විසිවන සංශෝධන පනත ඉස්සෙල්ලා ගන්න ඕනෑ. ඒකට විරුද්ධද? නැද්ද? කියලා අහන්න ඕනෑ. එකට යන්න බැහැ නේ. ඒක මාර කථාවක් නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එච්චා බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒවා බැහැ. ඒවා බැහැ.

[සභාවේ ඝෝෂා]

***එවලේ ගරු මන්ත්‍රීවරු විසින් විරෝධය පළ කරමින් සභා ගර්භය මැදට පිවිසෙන ලදී.***
*At that moment, Hon. Members walked to the center of the chamber by protesting.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ආසනවලට යන්න. වාඩි වෙන්න කෝ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ජය වේවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, විසිවන සංශෝධන පනත් කෙටුම්පතට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම බලාපොරොත්තු වුණේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමා කරුණු කියන්න ඕනෑ. මූලාසනය අසරණ වෙනවා. හරි වැරැදියි මේක.

[සභාවේ ඝෝෂා]

මන්ත්‍රීතුමන්ලා ආසනවලට යන්න.

[සභාවේ ඝෝෂා]

මන්ත්‍රීතුමන්ලා ආසනවලට යන්න. මන්ත්‍රීතුමන්ලා ආසනවලට යන්න.

[සභාවේ ඝෝෂා]

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වන්න. අසුන්වලට යන්න. නැවත වරක් සීනුව නාද කරන්න.

කරුණාකර ගරු සභාව නිශ්ශබ්ද වන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව සැහෙන වෙලාවක් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා අවසානයේදී මම තමයි සම්පූර්ණයෙන් එතැනදී මැදි වෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ආයිත් පටන් ගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පටන් ගන්නේ නැතුව බැහැ නේ. කියන්න ඕනෑ. මම ඉතාමත් ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මූලාසනය අසරණ කරන්න එපා. මම ස්වාධීනයි. මම කිසි පක්ෂයක් ගන්නේ නැහැ. මම ඒකාබද්ධ විපක්ෂයද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද, එක්සත් ජාතික පක්ෂයද, අලුත් පක්ෂයද මට එහෙම බේදයක් නැහැ. මම එදත් වචනයක් අහ ගත්තා. මගේ කොන්ද පණ නැහැ. මම මෙහෙ වුණ නිසා. මම නිතරම බලන්නේ මේ සභාවේ තිබෙන සුහදශීලීත්වය. මිත්‍රත්ත්වය. ගරුත්වය ආරක්ෂා කරන්න ඕනෑ. අපි ඔක්කොම එකට ඉන්න මන්ත්‍රීවරු. මෙතැන බොරුවට වාද වෙනවා. කෑ ගහනවා. නැඟිටිනවා. එළියට ගියාට පස්සේ ඔක්කොම යාළුවෝ. අපි ඔක්කොම එකට ඉමු. මම කියන්නේ ඒකයි. ඒ නිසා මාව අසරණ කරන්න එපා. මම සභාපතිවරයා වශයෙන් රීතිවන තිබෙන දේවල් ක්‍රියාත්මක කරන්නේ. ප්‍රධාන අමාත්‍යතුමා මට යම් යම් දේවල් කථා කරනවා. විපක්ෂ නායකතුමාත් කථා කරනවා. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් කථා කරනවා. මම ඔක්කොටම ඇහුම්කන් දෙනවා. ඇහුම්කන් නොදී ඉන්නේ නැහැ. ඒ නිසා එතුමා ඉදිරිපත් කරපු සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධව සභාවේ විවිධ මාතෘකා යටතේ කථා කළා. සමහරු විරුද්ධත්වය

[ගරු සභාපතිතුමා ]

ප්‍රකාශ කළා. සමහරු කැමැතියි කිව්වා. ඒ නිසා මට දැන් සිද්ධ වෙනවා, මේ පිළිබඳව ඡන්දයකට යන්න. ඒ නිසා මුලින් මම ගන්නවා - විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට බෙදීමක් නැහැයි කියලා මුලින්ම කිව්වත් පසුව, බෙදීමක් තිබෙනවා කියලා ප්‍රකාශ වුණා. ඒ නිසා ඒ පනතට පක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා නැඟී සිටින්න. පනතට - අපි පස්සේ සංශෝධනයට ගමු. දෙකක් ගන්න වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එකක් ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කරන්න බැහැ නේ? මම රීතිවලට අනුව පනත නේ ගෙනාවේ. මේකට ඇහුම්කන් දෙන්න. දෙකකට යන්න එපැයි. කොහොමද කරන්නේ ඉතින්. පනත නේ සම්මත කරන්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමා මේ සභාව ඉල්ලන්නේ, මම විසින් ඉදිරිපත් කරපු සංශෝධනයට ඡන්දය ගන්න කියලා. ඔයා ඒක ඉල්ලන්න කෝ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන දැන් ප්‍රශ්නයක් තිබෙනවා නේ? මහ ඇමැතිතුමා සංශෝධන ඉදිරිපත් කළා. එහෙමනම් ගරු මන්ත්‍රීතුමන්ලා සංශෝධන සහිතව ඉදිරිපත් කරපු යෝජනාවට පක්ෂ මන්ත්‍රීතුමන්ලා නැඟිටින්න.

***ඊට අනුකූලව, ගරු මන්ත්‍රීවරුන් අසුනින් නැඟී සිටින ලදී.***
*Accordingly, Hon. Members Stood up.*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේක පැහැදිලිව කියන්න.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, සංශෝධන සහිතව - සංශෝධන ඉදිරිපත් කරන්න බැහැයි කියලා මේකේ කථා කළා. හරි. ඉස්සෙල්ලා ගන්න ඕනෑ විසිවන සංශෝධන පනතට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැයි කිව්වාට ගන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එයත් පක්ෂයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂ නැහැ. පක්ෂ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පක්ෂ නැත්නම් ඉඳගන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉස්සෙල්ලා පනතට ගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පක්ෂ නැත්නම් ඉඳගන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂ නැහැ අපි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පක්ෂ නැත්නම් ඉඳගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමා, මේ සභාවේ මීට පෙරත් ඒ වාගේ ඡන්දවලට ගිහිල්ලා තිබෙනවා. සංශෝධන සහිතව දීලා තිබෙනවා අපි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සංශෝධන සහිතව නොවෙයි. ඉස්සෙල්ලා පනත ගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගණන් කරන්න කෝ. ඇයි ගණන් කරන්නේ නැත්තේ?

[සභාවේ ඝෝෂා]

***එවලේ යළිත් ගරු මන්ත්‍රීවරු විසින් විරෝධය පළකරමින් සභා ගර්භය මැදට පිවිසෙන ලදී.***
*At that moment, again Hon. Members walked to the center of the chamber by protesting.*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම බැහැ. එහෙම බැහැ. එයාට ඕනෑ විධියට කරන්න බැහැ. මෙයා කවුද? එහෙම බැහැ.

[සභාවේ ඝෝෂා]

එකයි. සංශෝධන සහිතව පනත ගත්තේ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් කරන්න දෙයක් නැහැ. දෙකෙන් එකක් ඉවර කරන්න අපි නැඟිටමු. දෙකෙන් එකක් කරන්න වෙනවා දැන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙරිල් මන්ත්‍රීතුමාට ඕනෑ විධියට සභාව ගෙනියන්න දෙන්න බැහැ. එහෙම ගෙනියන්න දෙන්න බැහැ, සභාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංශෝධනයක් ගෙනාවා නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. නැහැ. ඔබතුමන්ලා නීති හදන්නේ නැහැ. පනත ගෙනත් තිබෙන්නේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංශෝධන ගේන්න පුළුවන් නේ. ඒවා අපි අහන්න එපැයි ඉතින්.

[සභාවේ ඝෝෂා]

මම මෙම ගරු සභාව විනාඩි 10 කට කල් තබනවා. විනාඩි 10 කට මම සභාව කල් තබනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉන්න. මම විනාඩි 10 කට සභාව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 04.17 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 04.17 p.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද විසිවන ආඥාපනත්ක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධව සභාවේ දිගින් දිගටම සාකච්ඡා වුණා. සභාවේ දිගින් දිගටම යම් යම් ගැටලු ප්‍රශ්න ඇති වුණා. ඒ හැම ප්‍රශ්නයක් තුළම අසරණ වුණේ සභාපතිතුමා. මූලාසනය. ඒ නිසා -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒවා කියන්න ඕනෑ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒවා පොඩ්ඩක් මම කියන්නේ නැතුව බැහැ. ඒ නිසා දැන් මෙතැන - උත්සාහ කරන්නේ -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමා, ඔබතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔයා ඉන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ඡන්දය විමසලා ඡන්දය ගණන් කරන්නේ නැතිව නැඟිටලා ගියා. ඊට පස්සේ මේ අනං මනං කථා කියන්න එන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ඔයා ඉන්න. ඔයාට අනං මනං කථා කරන්න පුළුවන්. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා. වාඩි වෙන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

සභාපතිතුමාට එහෙම කථා කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමා මෙතැන-

[සභාවේ ඝෝෂා]

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම පනත් කෙටුම්පතට සංශෝධනත් උදේ සාකච්ඡා කළා. ඒ අනුව මම හිතන්නේ සභාවේ බහුතර එකඟතාවය තිබෙන්නේ, එම සංශෝධන සහිත පනත් කෙටුම්පතට සභාවේ එකඟතාවය අහන එකයි. ඒ නිසා මේ අවස්ථාවේදී එම සංශෝධන සහිත පනත් කෙටුම්පත -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අපි අහන්නේ දැන් ඔබතුමාට -

[සභාවේ ඝෝෂා]

අහන්න අයිතිය තිබෙනවා නේ? අහන්න අයිතියක් තිබෙනවා නේ? අපට අහන්න අයිතියක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමන්ලාගේ මතය -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාගෙන් අහන්නේ ආණ්ඩුකාරතුමා 21 වැනිදා එවපු පනත -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාගේ රාජකාරිය කරන්න. විරුද්ධයි නම් ඡන්දය දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකත් එක්කම තමයි ඉතින්. ඒකත් එක්කම.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

21 වැනිදා එවපු පනතට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඒ පනත ඒක ඇතුළේම තිබෙනවා නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පනත දැන් දවස් තුනක් කියෙව්වා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පනත මේක ඇතුළේ තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දවස් තුනක් පනත කියවලා කල් දාගෙන අද ඒ පනතට සම්බන්ධව ඡන්දය විමසන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විරුද්ධ අයගේ ඡන්දය ගන්න. එච්චරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පනත තිබෙනවා නේ මේක ඇතුළේ ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විරුද්ධයි කියන අයගේ ඡන්දය ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉස්සෙල්ලා පනතට ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. පැහැදිලියි. මේ සම්බන්ධව විපක්ෂ නායකතුමා අදහස් දැක් වූවා. ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට පක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා නැඟී සිටින්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඔබතුමා කරන්නේ වැරැදි වැඩක්. වැරැදි වැඩක් කරන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි කරන්නේ.

[සභාවේ ඝෝෂා]

හරි. දැන් වාඩි වෙන්න කෝ. මෙරිල් මන්ත්‍රීතුමා පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පනත ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. ඔබතුමා ඉල්ලුවේ ඒක නේ ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩුකාරතුමා එවපු පනතට ඉස්සෙල්ලා ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පනතට තමයි ගන්නේ. අහන් ඉන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගණන් කරන්න. ඡන්දේ ගණින්න.

[සභාවේ ඝෝෂා]

***ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 45 යි, විරුද්ධව 28 යි, වැළකුණු 04 යි යනුවෙන් බෙදුණේය.***
*Question put and the Council divided as per Rule No 61 (3), 45 for, 28 against and 04 decliners.*

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ජය වේවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා.04.24 ට, 2017 සැප්තැම්බර් මස 19 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 04.24 p.m till 09.30 a.m, on 19.09.2017.*